# ඉමාම් අල් නවවිගේ හදීස් වදන් 40 පිළිබඳ විවරණය - 1වන කොටස

[ සිංහල – Sinhala – سنهالي ]

මහාචාර්ය ජමාල් අහමද් බදී
පොදු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලය
මැලේෂියාව

සිංහල පරිවර්තනය
ජාසිම් ඉබ්න් දඉයාන්

2013 - 1435

IslamHouse.com

# شرح الأربعين النووية

## الجزء ١

« باللغة السنهالية »


د/ جمال أحمد بادي


ترجمة: **جاسم بن دعيان**


2013 - 1435

IslamHouse.com

# ඉමාම් අල් නවවිගේ හදීස් වදන් 40 පිළිබඳ විවරණය

## පළමු වන කොටස


කර්තෘ

මහාචාර්ය ජමාල් අහමද් බදී

පොදු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලය
මැලේෂියාව

සිංහල පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්

# විෂය සටහන

1. සියලු ක්‍රියා චේතනා මත විනිශ්චය කරනු ලැබේ
2. ඉස්ලාමය, ඊමානය, ඉහ්සානය සහ කද්ර් (දෛවය)
3. ඉස්ලාමයේ කුලුනු පහ
4. ඉස්ලාමයේ පස් වන කුලුන මිනිසාගේ දෛවය - අල් කද්ර්
5. ඉබාදාව සහ බිද්අා හෙළා දැකීම
6. හලාල් සහ හරාම් පැහැදිලි කිරීම
7. නසීහා
8. ජිහාද් හී සංකල්පය
9. සිය හැකියාවට එකඟව යහකම් කිරීම
10. පිරිසිදුව සිටීම (අත් තය්යිබ්)

# 1. සියලු ක්‍රියා චේතනා මත විනිශ්චය කරනු ලැබේ.

මුහම්මද් රසූල් (සල්) තුමාණෝ මෙසේ පැවසූ බව මූමින්වරුන්ගේ නායක උමර් ඉබ්න් අල් ඛත්තාබ් (රලි) වාර්තා කරයි.

"සියලු ක්‍රියාවන් චේතනාව (නිය්යතය) මත විනිශ්චය කරනු ලැබේ. එකිනොකා තම චේතනාව මත ප්‍රතිඵලය හිමි කර ගනී. කෙනෙක් අල්ලාහ් සහ ඔහුගේ රසූල් තුමාණෝ (සල්) වෙනුවෙන් දේශාන්තරය කරන්නේ නම්, ඔහුගේ දේශාන්තරය අල්ලාහ් සහ ඔහුගේ රසූල් තුමාණෝ (සල්) තුමාණෝ උදෙසා ය. කෙනෙක් සම්පත් ලබා ගැනීමේ හෝ කාන්තාවක් හා විවාහ කර ගැනීම සඳහා දේශාන්තර කරන්නේ නම්, ඔහුගේ දේශාන්තරය ඔහුගේ චේතනාව උදෙසා ය." බුහාරි සහ මුස්ලිම් වාර්තා කරයි

## පසුබිම

කාන්තාවක් හා විවාහ කරනු පිණිස මිනිසෙක් මක්කාවේ සිට මදීනාවට දේශාන්තරය කළ අවස්ථාවේ නබි (සල්) තුමාණෝ මෙම වදන පැවසූහ. මේ පිළිබඳව ඉමාම් අහ්මද් මූලික ප්‍රතිපත්තීන් තුනක් පදනම් කර ඇත.

- සිතෙහි ක්‍රියාව - අභ්‍යන්තර කාර්යයවේ
- අවයවය මගින් ක්‍රියා - බාහිර කාර්යයවේ
- මිනිස් අතර අන්‍යෝන්‍ය ක්‍රියා - අපගේ දෛනික ක්‍රියා (මිනිසුන්ගේ මුආමලාත්)

මෙම ප්‍රතිපත්ති තුනම ඉමාම් නවවිගේ හදීස් 40 යටතේ රැස් කර ඇත. වාර්තා කළේ බුහාරි සහ මුස්ලිම්.

හදීස් අංක 1. සියලු ක්‍රියා විනිශ්චය කරනු ලබන්නේ චේතනාව (නිය්යතය) මතයි. එනම් සිතෙහි ක්‍රියාව.

හදීස් අංක 5. අපගේ (ඉස්ලාමිය) කටයුතු වල, ඒවාට අයිති නොවන යමක් කවරෙක් හෝ ඇතුළත් කරන්නේ නම්, එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

හදීස් අංක 6. ඇත්තෙන්ම නීත්‍යානුකූල දේ පැහැදිලියි. නීති විරෝධි දේ පැහැදිලියි. මේවා දෙක අතර මිනිසුන් නොදන්නා සැක සහිත දේ තිබේ

මේ හදීස් වදන් හී සඳහන් කරුණු මුස්ලිම් වරයෙකු ගේ ක්‍රියා හා කථා අඩංගු දෛනික ඉබාදා සියල්ල ඇගයීම් කරන මිණුම් තුලා තුනක් වශයෙන් පෙනේ.

නිය්යතය යන චේතනාවට අර්ථ දෙකක් තිබේ

- සලාහ්, උපවාසය වැනි ඉබාදා ඉටු කිරීමට පෙර වූ චේතනාව;
- එවැනි ක්‍රියා ඉටු කිරීමට තිබෙන කැමැත්ත;

මෙයින් ඉගෙන ගන්නා පාඩම්

නබි (සල්) තුමාණෝ ආරම්භයේ මෙම හදීසයේ ප්‍රතිපත්තිය සඳහන් කළහ. (සියලු ක්‍රියා චේතනාව (නිය්යතය) මත විනිශ්චය කරනු ලැබේ). ඊට පසුව ප්‍රායෝගික නිදසුන් තුනක් සඳහන් කළහ. ඉස්ලාමයේ පණිවුඩය පවසන විට නබි (සල්) තුමාණෝ යොදා ගත් ක්‍රම වේදය මෙයයි. නිදසුන් මගින් ප්‍රතිපත්තිය කියා දීමෙන්, ඒවා පහසුවෙන් වටහා ගන්නට හා එවැනි

අවස්ථාවන් හි ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න දැන ගත හැක.
ඉහත සඳහන් නිදසුන් අතර එකක් යහපත් චේතනාව වන අතර, (අල්ලාහ් සහ ඔහුගේ රසූල් තුමාණෝ (සල්) වෙනුවෙන් සංක්‍රමණය කිරීම). අනිත් දෙක වැදගත් කමින් අඩු චේතනා සඳහා වේ. (ලෞකික වාසියක් හෝ විවාහයක් පතා)

මෙම හදීසය අල්ලාහ්ට පමණක් අවංක වීම සහ අල්ලාහ් වෙනුවන් යමක් ඉටු කිරීම යන අර්ථය දෙන ඉඛ්ලාස් හී වැදගත්කම ගැන සඳහන් කරයි. සෑම යහ ක්‍රියාවක්ම අල්ලාහ් විසින් පිළිගනු ලබන්නට ඉඛලාස් යන කොන්දේසිය අවශ්‍යයයි. ඉස්ලාමීය නීතිය වන ෂරීආවට එකඟව එම ක්‍රියාව ඉටු කිරීම මෙහි අනෙක් කොන්දේසිය වේ. මේ ගැන පස් වන හදීසය සඳහන් කරයි.

මෙම කොන්දේසි දෙකම එකිනෙකට සාධක වන ආකාරය මුස්ලිම් වරයෙක් ප්‍රකාශ කරන ෂහාදා වෙහි ඇතුළත් වේ.

1. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත යන ප්‍රකාශයෙන් අල්ලාහ් වෙනුවෙන් පමණක් අපගේ සියලු කටයුතු සිදු කරන බව සනාථ කිරීම.

2. මුහම්මද් (සල්) තුමාණෝ අල්ලාහ්ගේ සංදේශක වරයෙක් යන ප්‍රකාශ යෙන්, කුර්ආනය පෙන් වූ මාර්ගයේ ජීවත් වූ එතුමාගේ ආදර්ශය අනුගමනය කරන බව සනාථ කිරීම. එමගින් නැමදුම්, අඛ්ලාක් නම් සදාචාරය, සහ මුආමලාත් නම් ගනු දෙනු ක්‍රමය යන සියල්ල එතුමා ගේ සුන්නාහ්වට එකඟ ව සිදු කිරීම.

ඉඛ්ලාස් නම් අවංක භාවය ලබා ගැනීමට, ෂිර්ක් නම් අල්ලාහ්ට යමක් ආදේශ කිරීම නොකළ යුතුයි. ෂිර්ක් තුළින් කුහකකම හට ගනී. කපටිකමේ මුල, තණ්හාව යන අල් හවා බව අල් හෑරාවි නම් ඉමාම් වරයෙක් පවසයි.

එනිසා තණ්හාව පදනම් කර ගෙන කිසිවක් සිදු නොකළ යුතුයි.

තණ්හාව වර්ග 7කට අයත් බව ඉමාම් හෑරාවි පවසයි.

1. අන් අයගේ සිත් තුළ යහපත් කෙනෙක් බව පෙනී සිටීම

2. අන් අයගේ පැසසුම පැතීම

3. අන් අයගේ දෝෂාරෝපණයට ලක්වීමෙන් මඟ හැරීම

4. අන් අයගෙන් ගෞරව සම්මාන පැතීම

5. අන් අයගේ ධනය/සම්පත් වලට ආශා කිරීම

6. අන් අයගේ ආදරය හෝ සේවය පැතීම

7. අන් අය තමාට උදව් කළ යුතු යයි සිතීම.

ඉඃඛ්ලාස් නම් අවංකභාවය ලබන්නට විවිධ උපක්‍රම තිබේ.

- යහ ක්‍රියා අධිකව කරන තරමට අපි අල්ලාහ්ට සමීප වෙමු. එතුළින් අපි තව තවත් අවංක බවට පත් වන්නෙමු.

- දැනුම සෙවීම. යහ ක්‍රියාවක් ඉටු කරන්නට පෙර ඒ ගැන දැනුම සෙවීම. අපේ ක්‍රියාව ෂරීආවට එකඟව තිබෙනවා දැයි සනාථ කර ගැනීම සඳහා අදාළ දැනුම සෙවීම.

- අන් අයගේ සිත් තුළ වැරදි හැඟීමක් ඇති කිරීමෙන් වැළකීම. අපගේ ක්‍රියාවක් අයහපත්ව තිබිය දී, එය යහපත් ක්‍රියාවක් බවට පෙන්වී මෙන් වැළකීම.

- අපගේ චේතනාව කුමක් දැයි පරීක්ෂා කිරීම. “ඔබ යමක් කරන්නට පෙර, ඔබේ චේතනාව කුමක් දැයි පරීක්ෂා කරන්න. මෙම ක්‍රියාව මම ඉටු කරන්නේ අති උතුම් අල්ලාහ් වෙනුවෙන් දැයී විමසන්න.“ යනුවෙන් ඉමාම් අහමද් පැවසීය.

අපි ඉටු කරන ඕනෑම ක්‍රියාවක්ම පහත සඳහන් හේතුන් මත අසම්පූර්ණ බවට පත් වේ.

1. අන් අය අප දෙස බලා සිටින බව අවබෝධයෙන් යමක් ඉටු කිරීම.

2. වාසියක් බලාපොරොත්තුවෙන් යමක් ඉටු කිරීම.

3. තම තෘප්තිය පමණක් පතා ක්‍රියාවක යෙදීම.

ඉඛ්ලාස් නම් අවංකභාවයට ළඟා වන උදාහරණ සමහරක් දෙස බලමු.

- නියමිත වේලාවට පෙර හා ඉමාම් වරයාට පෙර අපි මස්ජිදයට පැමිණි විට හා සලාහ් සඳහා පළමු වන පේළියේ සිට ගත් විට, ඒ හේතුවෙන් අන් අයට වඩා අපි උසස් බව සිතා උඩඟු නොවිය යුතුයි. ඒ වෙනුවට එය පහසු කළ අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතුයි.

- සෑම සලාතයකට පසුව, අනිත් සලාතය මෙයට වඩා අළංකාර ව ඉටු කළ හැකි වන්නේ යයි සිතේ තබා ගත යුතුයි.

යම් ක්‍රියාවක යෙදී සිටිය දී, අපගේ නියයතය (අධිෂ්ඨානය) වෙනස් වුයේ නම් කුමක් කළ යුතුද? එනම් “අල්ලාහ් වෙනුවෙන් පටන් ගත් යම් ක්‍රියාවක යෙදී සිටිය දී නියයතය වෙනස් වුයේ නම් එයින් වරදක් නොවන

නමුත් ක්‍රියාවේ අවසානයේදී, නිය්යතය වෙනස් වුයේ නම් අනිවාර්යයෙන්ම තව්බා කළ යුතුය." යි ඉබ්න් රජබ් දන්වයි.

කෙනෙකුගේ ඉඛ්ලාසයට පටහැනි කරුණු හතරක් ඇත.

1. මඃසීය්යාත්- පාප ක්‍රියාවක් සිදු කිරීම. මෙය ඉඛ්ලාසය දුර්වල කරයි.

2. ෂිර්ක් ක්‍රියාව - අල්ලාහ් සමඟ තවත් කෙනෙක් එකතු කිරීම.

3. රියා - ලෝකයාට පෙන්වනු පිණිස ඉබාදාවක් ඉටු කිරීම.

4. නිෆාක් - කුහක කම නොහොත් ආත්ම වංචනික ක්‍රියාව.

අපේ සියලු ක්‍රියා ඉඛ්ලාසයට පටහැනි නොවිය යුතු අතර, ඇතැම් ක්‍රියාවන් යහපත් අරමුණකින් කළ බව ඉබේම ගණන් ගැනේ. ඉස්ලාමයේ දැනුම සෙවීම, සමාජයට උපකාර කිරීම, දඃවා වෙහි යෙදීම වැනි කටයුතු එවායින් සමහරකි.

හදීස් වදන් පදනම් කර ගෙන, මේ පිළිබඳව විද්වතුන් පහත සඳහන් ලෙස නිගමනය කර ඇත.

- කෙනෙක් අල්ලාහ්ගේ නාමයෙන් දිවුරන නමුත්, ඔහුගේ අරමුණ එය නොවේ නම්, එයින් කිසිදු ඵලක් නොමැත. ඇතැම් සමාජයන් හි මෙය ඉබේම සිදු වන ආකාරය අපි දකිමු. මුස්ලිම්වරයෙක් මෙයින් වැළකී සිටිය යුතුයි.

- දිවුරුම් දෙන අවස්ථාවන් හි කෙනෙකුගේ නිය්යතය මත ඔහුව විනිශ්ච කරනු ලැබේ.

- ඉබාදාවක් ඉටු කිරීම සහ ඉගැන්වීම අතර අරමුණු කිහිපයක් තිබිය හැක. ඉබාදා අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටු විය යුතු අතර, අන් අයට ඉගැන්වීමද එයින් සිදු විය හැක. නිදසුනක් වශයෙන් මුහම්මද් (සල්) වරය හජ් වන්දනාව අල්ලාහ් වෙනුවෙන් ඉටු කළ අතර, ඒ පිළිබඳව සහාබා වරුන්ට එහි වතාවත් ඉගැන්වුයේ ද එම නිය්යතය මතය.

- කෙනෙක් දික්කසාද කිරීමේ කටයුතු උසාවිය තුළ හෝ බැහැරව කර ගෙන යන නමුත්, එය වළංගු වන්නේ ඔහුගේ චේතනාව මතයි.

- කෙනෙක් කේලාම් කියන බව පෙනෙන නමුත්, එහි අරමුණ කුමක්දැ යි යනු වැදගත් වෙයි.

## අවසාන නිගමනය:

අපගේ සියලු ක්‍රියාවන් පිළි ගැනීම හෝ ප්‍රතික්ෂේප කරනු ලබන්නේ චේතනාව මතයි. එනිසා අපේ චේතනාව කුමක්දැයි සොයා බැලිය යුතුයි. අති උතුම් අල්ලාහ්ගේ තෘප්තිය පතා සියලු ක්‍රියා ඉටු කිරීමට වග බලා ගත්තේ නම්, ඒවා පිළි ගනු ලබන අතර, ඒවාට සුදුසු ත්‍යාග අල්ලාහ්ගෙන් ලැබෙනු ඇත.

# 2. ඉස්ලාම්, ඊමාන්, ඉහ්සාන් සහ කද්ර් පිළිබඳ විස්තර

උමර් (රලි) මෙසේ දන්වයි.

දිනක් රසූල් (සල්) තුමාණෝ සමඟ අපි වාඩි වී සිටියෙමු. එවිට ආගන්තුකයෙක් අප අතරට පැමිණියේය. ඔහු සුදෝ සුදු වස්ත්‍ර යෙන් සැරසී සිටියේය. ඔහුගේ හිස කෙස් තද කළු පැහැති වර්ණයෙන් යුක්තය. ගමන් මහන්සිය ඔහු තුළ දක්නට නොතිබුණු අතර, අප අතර කිසිවෙක් ඔහු නොහඳුනමු.

ඔහු (අමුත්තා) නබි (සල්) තුමාණන්ගේ දණහිස තම දනහිස ගෑවෙන තරමට සමීපව වාඩි වී, "අහෝ මුහම්මද්! (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ඉස්ලාම් දහම පිළිබඳව මට අනුශාසනා කරන්න." යි කීය. එවිට මුහම්මද් (සල්) තුමාණෝ "ඉස්ලාම් යනු නැමදුම් කිරීමට අල්ලාහ් හැර වෙන දෙවියෙක් නැත යනුවෙන්ද මුහම්මද් (සල්) අල්ලාහ්ගේ සංදේශක තුමාණෝ බවද සාක්ෂි දැරීම, සලාහ්තය ඉටු කිරීම, සකාත් ගෙවීම, රමදාන් මස උපවාසයේ නිරත වීම, සහ හැකියාවක් ඇත්නම් හජ් වන්දනාව ඉටු කිරීම." යනුවෙන් පිළිතුරු දුන්හ. "ඔබ පැවසුවේ සැබෑය."යි අමුත්තා කීය.

නබි තුමාණන් (සල්) ගෙන් ප්‍රශ්නයක් අසා, "ඔබ පැවසුවේ සැබෑය" යනුවෙන් කියනු අසා අපි විස්මයට පත් වුයෙමු. පසුව "ඊමානය (දේව විශ්වාසය) පිළිබඳව අනුශාසනා නරන්න." යනුවෙන් අමුත්තා කීය. එයට නබි තුමාණෝ (සල්) "අල්ලාහ් තආලා, ඔහුගේ මලාඉකාවරු, ඔහුගේ රසූල්වරු (ඔවුන් ගෙන ආ) ඔහුගේ ග්‍රන්ථයන්, අවසාන දිනය කෙරෙහි ද සහ අල්ලාහ්ගේ මනාපය පරිදි

හොඳ හා නරක සිදු වන බවද විශ්වාස කිරීම.'' යනුවෙන් කීහ. ''ඔබ පැවසුවේ සැබෑය.'' යනුවෙන් අමුත්තා කීය.

''ඉහ්සාන් ගැන මට දන්වන්නැ.''යි අමුත්තා පැවසූ විට, රසූල්තුමාණෝ (සල්) මෙසේ පිළිතුරු දුන්හ. ''අල්ලාහ් ඔබේ දෑසට නොපෙනෙන නමුත්, ඔහුට ඔබව පෙනෙන බව විශ්වාසය සහිතව නැමදුම් කිරීම. මන්ද, ඔහුට ඔබව පෙනෙනු ඇත''. පසුව ''අවසාන පැය ගැන පවසනු.'' යන ප්‍රශ්නයට නබි තුමාණෝ (සල්) ''ප්‍රශ්නය අසනු ලබන්නා, ප්‍රශ්න අසන්නාට වැඩියෙන් කිසිවක් දන්නෙක් නොවේ.'' යනුවෙන් පැවසුහ. ''එහි සලකුණු කුමක් දැයි'' ඇසූ විට, නබි තුමාණෝ (සල්) ''වහල් සේවිකාව තම ස්වාමි දුව ප්‍රසූත කරයි. පාවහන් නොපලඳින අඩ නිරුවත් (දුප්පත්) එඬේරු, සමාජයේ උස් ගොඩනැගිලි තැනීමට තරඟ කරනු ඔබ දකින්නේය.'' යි නබිතුමාණෝ පිළිතුරු දුන්හ. ඉන් අනතුරුව, අමුත්තා එතැනින් නැගිට ගියේය.

සුළු වෙලාවක් බලා සිටියෙමි. නබිතුමාණෝ (සල්) ''යා උමර්! මගෙන් ප්‍රශ්න කළේ කවුරෙක්දැයි ඔබ දන්නවාදැ?'' යි විමසුහ. ''අල්ලාහ් සහ ඔහුගේ නබි තුමාණෝ හොඳාකාරව දනිති.'' යනුවෙන් පිළිතුරු දුන්නෙමි. එවිට, ''ඔහු තමයි ජිබ්රීල්. නුඹලාට ආගම උගන්වන්නට පැමිණියේය.'' යි නබි තුමාණෝ (සල්) පැවසුහ. වාර්තාව සහීහ් මුස්ලිම්.

## මෙහි පසුබිම

ඉමාම් මුස්ලිම් මෙසේ දන්වයි. 'අබ්දුල්ලාහ් ඉබ්න් උමර් (රලි) ගේ ජීවිත අවසාන යුගයේ, දෙදෙනෙක් පැමිණ ඉරාක් දේශයේ අල් කදරියියා නමින් අලුත් නිකායක් ආරම්භවී තිබෙන බවද, ඔවුන් අල් කද්ර් නම් (දෛවය) ප්‍රතික්ෂේප කරන බවද දැන්වූහ. එවිට අබ්දුල්ලාහ් ඉබ්නු

උමර් (රලි), කද්ර් නම් දෛවය දේව විශ්වාසයේ කුලුනත් බව සඳහන් කරන මෙම හදීසය ඔවුන්ට පැවසුවේය.

## මෙයින් ඉගෙන ගන්නා පාඩම්.

මෙම හදීසය දැනුම සෙවීමේ දී අනුගමනය කළ යුතු ආදාබ් නම් ආචාර ධර්මය උගන්වයි.

- අපි පිරිසිදුව සිටිය යුතු අතර, පිරිසිදු ඇඳුම් ඇඳ ගත යුතුයි.
- අපි ගුරු තුමාණන්ට සමීපව හරියාකාරව වාඩි විය යුතුයි.
- ගුරුතුමාණන් ගෙන් කරුණු දැන ගනු පිණිස සුදුසු ප්‍රශ්න ඇසිය යුතුයි.
- නිවැරදි දැනුම නිසි බලධාරීන්ගෙන් ලබා ගත යුතුයි

## ප්‍රශ්න ඇසීම තුළින් දැනුම වර්ධනය කර ගැනීමේ ක්‍රමය

- දැනුම ලබා ගැනීමට සාධක වන ප්‍රශ්න පමණක් අපි ඇසිය යුතුයි. එනම් ඒවා අගනා දැනුමට හා යහ ක්‍රියාව සඳහා මාර්ග විවෘත කරන ප්‍රශ්න විය යුතුයි.
- අදාළ ප්‍රශ්න ඇසීම ඉගෙන ගැනීමට සහ ඉගැන් වීමට සාධක වේ. එනම් ප්‍රශ්න වලට සවන් දෙන අනෙක් අයද වැදගත් යමක් ඉගෙන ගන්නට හැකි වනු ඇත.
- උසස් විද්වතෙක් වන ඉබ්න් අබ්බාස් (රලි) තුමාගෙන් මෙතරම් දැනුම ලැබුවේ කෙසේදැයි විමසූ විට, ‘‘ප්‍රශ්න ඇසීමට ආශා කරන දිවෙන් සහ කල්පනා කරන සිතෙන්‘‘ යනුවෙන් පිළිතුරු දුන්නේය.

- නබි (සල්) තුමාණන්ද, යමක් කියා දෙන්නට පෙර, ඒ ගැන ප්‍රශ්න අසන බව බොහෝ හදීස් මගින් දැක ගත හැක. ප්‍රශ්න ඇසීමෙන්, දැනුම ලබන්නට කෙනෙකුගේ හදවත සූදානම් ව සිටියි. එනම් ඉගෙන ගැනීමට සහ ඒවා සිතෙහි ස්ථිරව තැන්පත් කර ගැනීමට සූදානම් වීම.

- අල් කුර්ආනයේ පවා 1,200 ට අධික ප්‍රශ්න අසා තිබේ. මේවා නොයෙක් හේතු සාධක මත අසනු ලැබේ. එනම්, ඒවා කුර්ආනය කියවන්නන් ගේ සිත් පොලඹ වන්නට හා කල්පනා කරන්නට මග සලසයි.

අවස්ථා දෙකක අල් කද්ර් ගැන දැක ගත සහ අවබෝධ කර ගත හැකි බව විද්වතුන් පවසති

1. තම මැවීම් සිදු කරන සියලු ක්‍රියා පිළිබඳව, ඒවා සිදු කිරීමටත් පෙර සම්පූර්ණ දැනුම අති උතුම් අල්ලාහ් සතු බව අපි විශ්වාස කරමු. මෙම විස්තර සියල්ල 'ලව්හුල් මහ්ෆූල්' යන ආරක්ෂා ලැබූ එලකයේ සටහන් කර තිබෙන බවද විශ්වාස කරමු.

2. අල්ලාහ්ගේ අනුමැතියෙන් මේවා කෙසේ හෝ - හොඳ හෝ නරක හෝ වුවත් - සිදු වන බවද අපි තරයේ විශ්වාස කරමු.

සියලු කීර්ති හිමි අල්ලාහ්, අප මවා, අපහට ක්‍රියා කරන්නට සීමිත නිදහස ද හැකියාව ද දී ඇත. එනිසා යමක් කිරීමට නම් කැමැත්ත හා හැකියාව තිබිය යුතු වේ. එහෙත්, අපි තෝරා ගන්නා ක්‍රියාව සඳහා අපි වග කිව යුත්තෝ වෙමු.

## අල් කද්ර් පිළිබඳ වැරදි අවබෝධය

තමන් කරන්නට යන ක්‍රියාව අල් ලව්හ් අල් මහ්ෆූල් හී ලියැවී අවසාන බව බොහෝ මුස්ලිම්වරු විශ්වාස කරති. මෙ මගින් කර්ම ශක්තිය සහ සම්බන්ධතාවය අතර අවුලක් ඇති කර ගෙන ඇත. අති උතුම් අල්ලාහ් අපගේ ක්‍රියාව සිදු කළේ නැත. ඒ වෙනුවට අපගේ ක්‍රියා අපගේම වුවමනාවෙන් අප විසින්ම සිදු කරනු ලැබූ දේය. අපි කරන්නට යන දේ පිළිබඳව අල්ලාහ්ගේ සම්පූර්ණ දැනුමෙහි දැනටමත් සටහන් වී අවසානයි. අල්ලාහ් අභිමත කළේ නම්, යහකම් කළ මිනිසුන් සියලු දෙනාම ස්වර්ගයේ ද අයහපත් කළ සියලු මිනිසුන් අපායෙහි ද තැන්පත් කළ හැක. එහෙත් අල්ලාහ් අතිශයින්ම ධර්මිෂ්ඨයි.

අපි තෝරා ගන්නා මාර්ගය පිළිබඳව අල්ලාහ් අපව පරීක්ෂණ කරයි. අප ක්‍රියා කළේ, අපේම වුවමනාවකින් මිසක් අල්ලාහ්ගේ බලපෑමෙන් නොවේ. මේ හේතුවෙන් අපගේ ක්‍රියා වලට අපම වග කිව යුතුයි.

## යහ මග පෙන්වීම සහ නොමග යැවීම

හිදායා නම් යහ මග, අති උතුම් අල්ලාහ්ගෙන් ලැබෙන ත්‍යාගයකි. අප සියලු දෙනා මවා, නිවැරදි හා වැරදි මාර්ග අතර තිබෙන වෙනස අවබෝධ කරගන්නට බුද්ධිය දුන්නේ අල්ලාහ්ය. සත්‍ය ප්‍රිය කරන හා අසත්‍ය අප්‍රිය කරන ෆිත්රා නම් පිරිසිදු ස්වාභාවය අපහට දුන්නේ ද අල්ලාහ්ය. යමක් කිරීමට හැකියාව ද ශක්තිය ද දුන්නේ අල්ලාහ්ය. රසූල්වරු එවා අප ජීවිතයේ යහ මඟ පෙන්වන්නට සැලැසුම් කළේ අල්ලාහ්ය. ඒවායින් සමහරක් වටහා ගැනීමට පවා අපට අපහසුය. එනිසා යහ මඟ යනු, අල්ලාහ් විසින් අපහට දෙන ලද ත්‍යාගයකි.

නොමඟ යෑම අල්ලාහ් විසින් නොදෙන ලද එකක් වන අතර, එය අපගේම ක්‍රියාවක් බව දැන ගත යුතුයි. වැරදි ක්‍රියාවක යෙදෙන විට, එය අපගේම නිදහස් කැමැත්තෙන්,

අපගේ හැකියාවෙන් සිදු කරන දෙයකි. යහ මාර්ගයෙන් ඉවතට යන කෙනෙක් සිය කැමැත්තෙන් අසත්‍ය කරා යයි. උඩඟුකම නිසා ඔවුහු නොමඟ යති. ඔවුහු යහ මාර්ගයේ නිවේදනයන්ට පවා සවන් නොදෙති.

*"වරද කරන අය අල්ලාහ් යහ මඟ නොයවන්නේය."* සූරා අස් සෆ්: 5

ඒ අතර, නොයෙකුත් හේතු නිසා ඉස්ලාමයේ පැහැදිලි නිවේදනය නොලැබූ හෝ ලැබීමට අවස්ථාවක් හෝ නොමැති මිනිස් පිරිසක් ද සිටිති. අහ්ල් අල් ෆත්රා ලෙස හැඳින්වනු ලබන මේ ජනතාව, නොමඟ ගිය ද, දඬුවම් නොලැබෙන අතර, අල්ලාහ්ගේ සමාව ද හිමි කර ගනිති.

## අල් කද්ර් පිළිබඳව අපට යමක් කළ හැකි ඇතැම් අවස්ථාග

- අසනීප වීම කද්ර් වන නමුත්, එයට ප්‍රතිකාර සොයන ලෙස රසූල් (සල්) තුමාණෝ අපට උපදෙස් දුන්හ. ප්‍රතිකාර සෙවීමද කද්ර් වන හෙයින්, එක් කද්රයක් තවත් කද්රයක් මගින් විසඳිය හැක.

- රැකියාව අහිමි වීම වැනි අවාසනාවක් සිදු වුවහොත්, එය කද්ර් යනුවෙන් පවසා පරාජිත සිතුවිලි සහිතව කිසිවක් නොකර සිටිය නොයුතුයි. කද්ර් පිළිබඳව සුබවාදී කල්පනාවෙන් වෙනත් රැකියාවක් සෙවිය යුතුයි. තවත් රැකියාවක් සෙවීමද කද්ර්ය.

උමර් ඉබ්න් අල් කෘත්තාබ් (රලි) තුමාගේ පාලන කාලයේ, එතුමා පිරිසක් සමඟ ගමනක යෙදුණේය. එක් නගරයකට ළඟා වන විට එහි බෝවන රෝගයක් පැතිර තිබෙන බව ආරංචි විය. ගමනේ ඉදිරියට යන්නේද, නැතහොත් ආපසු හැරී මදීනාවට යා යුතු දැයි උමර් (රලි) තම පිරිසගෙන් අදහස් විමසීය. බහුතර පිරිසක්

මදීනාවට හැරී යා යුතු යැයි අදහස් දැක් වූ නමුත්, සුළු පිරිසක් ඉදිරියට යන්නට කැමැත්ත දැක් වූහ. ඒ පිරිස අතර සහාබා වරයෙක්, "යම් පළාතක බෝවන රෝගයක් පැතිරෙන බව ආරංචි වුවහොත් එතැනට නොයනු."යැයි නබි (සල්) තුමාණෝ දුන් උපදේශය මතක් කළේය. උමර් මදීනාවට හැරී යන්නට තීරණය කළේය. එවිට තවත් සහාබා වරයෙක් කද්ර් සිට (දෛවයෙන්) උමර් මිදී දුවනවා දැයි විමසීය. එයට උමර් (රලි) තුමා එක කද්ර් සිට තවත් කද්ර් කරා යන බව පිළිතුරු දුන්නේය.

මේ නිසා ප්‍රශ්නයක්, අභියෝගයක් හෝ පීඩාවක් පැමිණියහොත්, එය විසඳීමට හෝ  අවම කිරීමට හෝ ඉවත් කිරීමට ක්‍රියා කළ යුතුයි. ඉමාම් අල් ජීලානි වැනි විද්වතුන්, මෙම පියවරට "කද්රය ජය ගැනීම" යනුවෙන් නම් කර ඇත.

"ඔබට යහපතක් ගෙන දෙන දේ පිළිබඳව උනන්දු වන්න. අල්ලාහ්ගේ සහය පතන්න. නොසැලකිලිමත්ව කටයුතු නොකරන්න." යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ.  ඕනෑම දෙයක් නිසියාකාරව ඉටු කරන ලෙස මෙම හදීසය අපට අවවාද කරයි.

"අපගේ  ඕනෑම ක්‍රියාවකට අප වගකිව යුතුයි." යනු කද්ර් හී නිවැරදි සංකල්පය වේ.

උදාහරණයක් වශයෙන්, අවධානයෙන් තොරව වාහනයක් පදවා අනතුරක් සිදු කර, කෙනෙක් මිය ගිය හොත්, ඔහුගේ කද්ර් නිසා ඔහු මරනයට ලක්වූ බව කිව නොහැක. එසේ කීම කද්ර් යන වචනයෙන් අපගේ වැරදි ක්‍රියාව ආවරණය කිරීමක් වේ. ඇත්තෙන්ම අනතුර සිදු වූයේ කද්ර් නිසා වුවත්, අපගේ දඩබ්බර ක්‍රියාවෙන් අපේ අතින් එය සිදු වූ බව පිළි ගත යුතුය. මේ නිසා උසාවියේදී වැරදිකරුවෙක් බවට පත් ව දඬුවම විඳිය

යුතුයි. එසේ නැතිනම් කද්ර් යන වචනයේ මුවා වෙන් නොයෙක් වැරදි හා සොරකම් කිරීම පවා සිදු කළ හැක.

තම වගකීම නිසියාකාරව ඉටු නොකරන කෙනෙක් කද්ර් සංකල්පය අයුතු ලෙස භාවිත කරයි. කද්ර් යන වචනයෙහි සැබෑ සංකල්පය වනුයේ, කෙනෙක් තමන්ට හැකි උපරිම වෙහෙස දරා ක්‍රියා කළ නමුත්, වැළැක්විය නොහැකි හේතුවෙන් ඔහුගේ පාලනයෙන් බැහැරව යමක් සිදු වී, තම අරමුණ ඉටු කළ නොහැකි වන විට, ඒ සඳහා ඔහුට සමාවක් ඇත. ශිෂ්‍යයෙක් මහන්සි වී ඉගෙන ගෙන විභාගය ළඟා වන විට අසනීපයක් සෑදී විභාගයට හරියාකාරව පිළිතුරු නොලියා, අසමත් වුව හොත්, එය ඔහුගේ කද්ර් ලෙස කිව හැක.

ආගමික වගකීමද එය හා සමාන වේ. ඇතැම් මුස්ලිම්වරු මෙන්, අප පාප ක්‍රියාවන් හි යෙදුනේ නම් අපගේ වැරදි ක්‍රියා සියල්ල සඳහා අපම වගකිව යුතුයි. ඊමාන් දුබල වීමෙන් පාපයන් සිදුකළේ නම් හෝ අත්‍යවශ්‍ය ආගමික වතාවත් ඉටු නොකළේ නම්, පාපෝච්චාරණය කර යහ මඟට හැරී එන්නට ඉස්ලාම් ප්‍රායෝගික පියවර පෙන්වා ඇත.

මෙම හදීස් හ, නබි (සල්) තුමාණෝ ඉස්ලාමය කුලුනු පහකින් සමන්විත බව පවසා, බාහිර ක්‍රියා පහක් සහ ඊමාන් නම් අභ්‍යන්තර විශ්වාසය ගැනද පැවසීය. ඉහ්සාන් යනු එහි උච්චතම ස්ථානය බව පෙන්වූහ. ඊමාන් වනාහි කොටස් හැත්තෑවකට අධික බව නබි (සල්) තුමාණෝ පවසා ඇත්තාහ.

ඉස්ලාම් යන වචනයෙහි ඊමාන්, ඉස්ලාම් සහ ඉහ්සාන් අඩංගුය. මෙම හදීසයේ දීන් නම් ඉස්ලාමීය ජීවන මාර්ගයේ ඉස්ලාම්, ඊමාන් සහ ඉහ්සාන් යන කරුණු අඩංගු වී තිබෙන බව නබි (සල්) තුමාණෝ දන්වති.

ඊමානය දුබල වුයේ නම්, එය ඉස්ලාමයට (එනම් යහ ක්‍රියාවන්ට) බලපාන බව මතකයේ තිබිය යුතුය. ඊමානය හා ඉස්ලාමය යනු වචන දෙකක් වුවද ඊමානය අත්‍යවශ්‍යයෙන් ක්‍රියාවෙහි යෙදිය යුතු බව ඉමාම් අබු හනීෆා පවසයි.

දේව විශ්වාස නොමැති අය අතර මුස්ලිම්වරු පරදේශිකයෙකු ලෙසද, මුස්ලිම්වරු මූමින්වරු අතර පරදේශිකයෙකු ලෙසද, මුහ්සින්වරු මූමින්වරු අතර පරදේශිකයෙකු ලෙසද සැලකෙන බව ඇතැම් විද්වතුන් අදහස් දක්වති.

ඉහ්සාන් නම් ස්ථානය අති උතුම් අල්ලාහ්ට බිය වීම සහ ඔහුට ගෞරව සම්මාන කිරීම වේ. මෙමගින්, අපගේ ආගමික කටයුතු අවංකව හා වැඩි වැඩියෙන් ඉටු කිරීමට දිරිගැන් වේ. අල්ලාහ් කෙරෙහි ආදරය දැක්වීම, ඔහුට බිය වීම, ඔහුගේ සරණ පැතීම, ඔහු ගැන විශ්වාසය තැබීම, ඔහු අපහට කරුණාව දක්වා, යහ මඟ ඔස්සේ රැගෙන යන බව ඔහු කෙරෙහි සම්පූර්ණ විශ්වාස තැබීම යන සියල්ල ඉහ්සාන් මගින් සිදු වේ.

අවසාන දිනය ගැන ජිබ්රීල් (අලෛ) ප්‍රශ්න කළ විට, තමාද ඔහුද ඒ ගැන කිසිවක් නොදන්නා බව නබි (සල්) තුමාණෝ පිළිතුරු දුන්හ. එතරම් විශාල දැනුම තිබෙන නබි (සල්) තුමාණෝ, තමා සියල්ල නොදන්නා බව පැවසීය. ඉමාම් මාලික් තුමාගෙන් කෙනෙක් ප්‍රශ්න 40ක් ඉදිරිපත් කළ විට, ඒවායින් බොහෝ ප්‍රශ්න වලට ‘මම නොදනිමි. අල්ලාහ් සියල්ල දනී.‘ යනුවෙන් කීවේය. ඒ මිනිසා එයින් පුදුමයට පත් වු බව දුටු ඉමාම් මාලික්, ඔහුගේ ගමට ගොස් ඒ බව ජනතාවට කියන ලෙස ඔහුගෙන් ඉල්ලීමක් කළේය. වැරදි පිළිතුරු දීමෙන් අන් අය නොමඟ යන්නට තමා හේතු නොවිය යුතු බව ඉමාම් තරයේ විශ්වාස කළේය. කෙනෙක් ගුරුවරයෙක් හෝ මඟ පෙන්වන්නෙක් වශයෙන් පත් වුයේ නම්, තමා නොදන්නා

දේ එලෙස පිළිගන්නට ආත්ම ශක්තියක් තිබිය යුතුයි. වැරදි තොරතුරු ඉගැන්වීමෙන් අන් අය නොමඟ යන්නට අප හේතුවක් නොවිය යුතුයි.

අවසාන දිනය ගැන මෙහි දී සඳහන් වී ඇත, අයහපත් ක්‍රියාවන් එහි ඇතැම් සලකුණු වන හෙයින් අපි ඒවායින් ඉවත්විය යුතයි.

## අවසානය නිගමනය

මෙම හදීසය මගින්, ඉස්ලාමයේ කුලුනු පහ, ඊමානයේ කරුණු, ඉහ්සාන් නම් තත්ත්වයේ වැදගත්කම සමඟ දැනුම සෙවීම සහ ඉගැන් වීමේ නිසි ක්‍රමය කුමක් දැයි පෙන්වා දී ඇත.

# 3. ඉස්ලාමයේ කුලුනු පහ

අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ මේ අයුරින් පැවසූ බව අබූ අබ්දුල් රහ්මාන් අබ්දුල්ලාහ් බින් උමර් බින් අල් හෑත්තාබ් මෙසේ වාර්තා කරයි.

"ඉස්ලාමය කුලුනු පහක් මත ගොඩ නගා තිබේ. නැමදුමට සුදුසු අල්ලාහ් හැර අන් කිසිවෙක් නැති බවට සහ මුහම්මද් (සල්) තුමාණෝ අල්ලාහ්ගේ සංදේශකවරයෙක් බවට සාක්ෂි දැරීම, (සලාහ්) නැමදුම් කිරීම, සකාත් ගෙවීම, මක්කාවට ගොස් හජ් (වන්දනාව) ඉටු කිරීම සහ රමදාන් මස උපවාසයේ යෙදීම." වාර්තා කළේ බුහාරි සහ මුස්ලිම්

## පසුබිම

මෙම හදීසය හදීස් අංක 2හි කොටසක්ය. ඉස්ලාමයේ කුලුනු පහ කෙතරම් වැදගත් දැයි පෙන්වනු පිණිස, මෙම කොටස නැවත වරක් ඉමාම් නවවි සඳහන් කළ බව විද්වතුන් බොහෝ දෙනෙක් අදහස් දක්වති.

බාහිර වතාවත් පිළිබඳව මෙම හදීසය සඳහන් කරයි. ගොඩනැගිල්ලකට කුලුනු අත්‍යවශ්‍ය මෙන්, මෙම ක්‍රියාවන් දහම යන නිවස ශක්තිමත් කරයි.

යමෙක් මෙම කුලුනු පහ ඉටු කරන්නට අපොහොසත් වුවහොත්, ඔහුගේ ඊමාන් නම් සම්පූර්ණ ගොඩනැගිල්ල තර්ජනයට ලක්වෙයි. ඔහු කෙතරම් දුරට කුලුනු පහෙන් ඈත් වන්නේද ඒ තරමට එහි බැරෑරුම් තත්ත්වය පෙනේ. එහෙත් ෂහාදා නම් දේව විශ්වාසයෙන් ඔහු ඈත් වන්නේනම් එය මහත් භයානක තත්ත්වයකි.

# මෙයින් උගත් වන පාඩම්

## උපමා පෙන්වීම

මෙම හදීසය ඇතැම් වැදගත් කරුණු පෙන්වනු පිණිස (ඉස්ලාමය ගොඩනැගිල්ලක කුලුනු වැනි) උපමා පෙන්වයි. මෙලෙස නිදසුන් පෙන්වීම අල් කුර්ආනයේ සහ හදීස් වදන් හි දක්නට ඇත. ඒවායින් සමහරක් මෙසේය.

- සූරා තව්බා 109 වන වාක්‍ය මූ මින් වරයෙකුගේ දහම ශක්තිමත් අත්තිවාරමක් මත ගොඩ නඟා ඇත යනුවෙන් පවසයි. එහෙත්, මුනාෆික් (වංචනිකයා) වරයෙකුගේ දහම දුබල පොළොව මත තනා ඇති හෙයින් එය කඩා වැටී ඔහු අපාය ගත වේ.

- සූරා අන් නූර් වාක්‍ය අංක 35 අල්ලාහ්ගේ ආලෝකය විශ්වාසීන් ගේ හදවතට මඟ පෙන්වීමක් බව පවසයි.

- සූරා අල් ජුම්ආ වාක්‍ය 5 තම වගකීම ඉටු නොකරන අයට දොස් කීම. තව්රාත් ග්‍රන්ථයෙන් දෙන ලැබු අණ නිසියාකාරව ඉටු නොකළ ඉස්රායිල් ජාතීන්, පිටේ පොත් පොදි බැඳගෙන යන නමුත් එම පොදියෙන් කිසිවක් අවබෝධ නොකර ගත් බූරුවන්ට උපමා කරනු ලබති. තමන්ට පවරන ලද වගකීම නිසියාකාරව ඉටු නොකරන අනිකුත් ජාතීන්ටද මෙම උපමාව ගැළපෙන බව විද්වතුන් අදහස් දක්වති.

තම අනුගාමිකයන් වර්ග තුනකට නබි (සල්) තුමාණෝ වෙන් කළහ. ඔවුන් නම්, ඉස්ලාමීය නිවේදනයෙන් ප්‍රයෝජන ලත් පිරිස, ඉස්ලාමීය නිවේදනයෙන් සුළු වශයෙන් ප්‍රයෝජන ලත් පිරිස සහ එයින් කිසිදු ප්‍රයෝජනයක් නොලැබූ පිරිස යන අය වේ. අහසින් වැටෙන වර්ෂාවට මෙවැනි පිරිස නබි (සල්) තුමාණෝ උපමා කළහ.

මෙවැනි උපමා හා ආදර්ශයන් මගින් අල් කුර්ආනය සහ නබි (සල්) තුමාණන් අනුගාමිකයින් ගේ සිත් තුළ නොයෙක් අවබෝධ සිදුකරයි.

## ඉස්ලාමයේ ප්‍රථම කුලුන

**ඉස්ලාමීය ෂහාදාවෙහි ප්‍රථම කොටස අල්ලාහ් හැර නැමදුම සඳහා අන් කිසිවෙක් සුදුසු නැත යන ප්‍රකාශයයි.**

ෂහාදාවෙහි අත්‍යවශ්‍ය කරුණු හතක් අඩංගු වී ඇති බව විද්වතුන් අදහස් දක්වති.

1. දැනුම - එහි තේරුම කුමක් දැයි දැන සිටීම

2. ස්ථිරභාවය - අල් කුර්ආනයේ හා සුන්නාහ්වෙහි සඳහන් සියලු කරුණු සනාථ කිරීමෙහි කිසිදු සැකයක් නොමැතිකම.

3. පිළිගැනීම - මුවෙන් ප්‍රකාශ කර හදවතෙහි පිළිගැනීම

4. අවනත වීම හා එයට එකඟව ක්‍රියා කිරීම. එනම් ක්‍රියාවෙන් යටහත් භාවය තහවුරු කිරීම.

5. සත්‍යවාදී භාවය - ෂහාදා ප්‍රකාශ කිරීමේදී අවංකව හා ඍජුව පැවසීම

6. අවංක භාවය - අල්ලාහ් වෙනුවෙන් පමණක් ඕනෑම දෙයක් සිදු කිරීම

7. ආදරය - ෂහාදාවට ආදරය, එහි අර්ථයට, එහි අවශ්‍යතා ප්‍රායෝගිකව ඉටු කිරීමට ආදරය දැක්වීම.

ෂහාදා යනු මුවින් ප්‍රකාශ කිරීම පමණක් නොවේ. එහි කොන්දේසි ඉෂ්ට කළ යුතුයි. අප අවංකව ෂහාදා ප්‍රකාශ කළේ නම්, කිසි විටක එයට එරෙහි වන හෝ එය කඩ කරන කිසිවක් අප කරන්නේ නැත.

## ෂහාදාවෙහි දෙවන කොටස මෙසේය.

- නබි (සල්) තුමාණෝ කෙරෙහි, එතුමා පැවසූ සියල්ල සහ අපට ගෙන දුන් නිවේදන සියල්ල මත සම්පූර්ණ විශ්වාසය තැබීම.

- නබි (සල්) තුමාණෝ දුන් අණ සියල්ලට අවනත වීම.

- නබි (සල්) තුමාණෝ තහනම් කළ සියල්ලෙන් වැළකී සිටීම.

• ඉබාදා නම් නැමදුම් ක්‍රියා, අඛ්ලාක් නම් සදාචාර සහ ජීවන ක්‍රමය යන සියල්ලෙහි නබි (සල්) තුමාණෝ අනුගමනය කිරීම.

• අප වෙත, අපේ පවුලේ සාමාජිකයන් වෙත හෝ මෙලොවේ සියල්ලන් වෙතට වඩා එතුමාට ආදරය දැක්වීම.

• අපට හැකි අයුරින් එතුමාගේ සුන්නාව නම් ආදර්ශය අවබෝධ කර ගැනීම සහ පිළිපැදීම. තවද ඒවා අවුල් නොකිරීම සහ ඒවායේ නමින් වෛරය හෝ අනර්ථය වැනි දේ සිදු නොකිරීම.

## දෙවන කුලුන - සලාහ් නම් නැමදුම ස්ථාපිත කිරීම:

සලාහ් නම් නැමදුම ඉටු කිරීමට, ඊට වඩා පුළුල් අර්ථයක් තිබෙන බව ඇතැම් විද්වතු පවසති.

• වුදු දෝවනය කිරීම.

• නියමිත වේලාවන් හී සලාහ් ඉටු කිරීම.

• තනිවම සලාහ් කිරීමට වඩා පිං 27 ක් අධිකව ලැබෙන හෙයින් සමූහයක් වශයෙන් සලාහ් ඉටු කිරීම.

• සලාහ් වෙහි කොන්දේසි හය නිසියාකාරව ඉටු කිරීම.

• සලාහ් වෙහි දැක් විය යුතු නිහතමාන භාවය සහ යටහත් භාවය අනුගමනය කිරීම.

- සලාහ් වෙහි සුන්නාහ් නම් වෛකල්පිත ක්‍රියා ඉටු කිරීම.

ඉකාමත් අල් සලාහ් යන දෙවන කුලුන ඉටු කිරීමට නම්, ඉහත කොන්දේසි පිළිපැදීම ඉතා වැදගත්ය. අල්ලාහ් අපහට පනස් වේල සලාහ් නියම කළ නමුත් අවසානයේ ඒවා පස් වේලට අඩු කරන ලදී. මෙම පස් වේල ඉටු කරන්නේ නම්, එයින් පනස් වේල සලාහ් කළ පිං ලැබේ. මෙම සලාහ් වේලාවන් සාධාරණව දවස පුරා පැතිර තිබෙන හෙයින් අපේ පෞද්ගලික රාජකාරිය ඉටු කරන අතර, සලාහ්වට සහභාගි වීමට ද හැක. මෙ මගින් සුහද සමාජයක් ගොඩ නගී. මේ නිසා, සලාහ් ක්‍රියාව බරක් ලෙස සැළකිය නොයුතුය.

## තුන්වන කුලුන සැකාත්ඃ

කෙනෙක් තමා සතු වත්කම් මත කිසියම් කොන්දේසිවලට එකඟව ප්‍රතිශතයක් ගෙවිය යුතු බද්ද සකාත් යනු හැඳින් වේ. කෙනෙක් යම් ධනයක් හිමි කර ගත්තේ නම් ඔහු සකාත් ගෙවීම අවශ්‍ය බව විද්වතුන් පවසති. ගොවි, වෙළඳ හා දේපළ අයිතිකරු යන පිරිස ඇතැම් කොන්දේසි මත මෙම බද්ද ගෙවිය යුතුයි.

## හතරවන කුලුන හජ් වන්දනාවඃ

කෙනෙක් මක්කාවේ තිබෙන කඅබා වෙතට හජ් වන්දනා සඳහා තම ජීවිත කාලයේ එක් වරක් හෝ යෑම. එයට අවශ්‍ය කොන්දේසි නම් ආර්ථිකව, ශාරීරකව හැකියාව තිබෙන අය ගමනට පහසුකම් තිබෙන්නේ නම්, හැකි ඉක්මනට මෙම කර්තව්‍ය ඉටු කළ යුතුයි.

මෙම වන්දනා ගමනේ නිරතවන අය රසූල් (සල්) තුමාණන්ගේ සුන්නාව සහ එක් එක් ස්ථානයන් හී සිදු කළ යුතු වතාවත් නිසියාකාරව දැන සිටිය යුතුයි. මේවා

හරිහැටි ඉටු කිරීමෙන්, එහිදී සිදු විය හැකි අනතුරු අවම කළ හැකියි.

## 5. වන කුලුන සව්ම් නම් උපවාසයඃ

මුස්ලිම්වරු යහ ක්‍රියාවන් වැඩි වැඩියෙන් ඉටු කිරීමට පුහුණු කරන්නේ රමදාන් මාසයයි. එ නමුත් රමදාන් නොවන මාසයන් හී ද මෙම යහ ක්‍රියවන් ඉටු කිරීමට අපි වගා බලා ගත යුතුයි. මස්ජිදයේ සලාහ් ඉටු කිරීම, තහජ්ජුද් සහ කියාම් අල් ලයිල් වැනි අමතර සලාහ්, අල් කුර්ආනය පාරායන කිරීම, අන් අයට සැලකීම මෙවැනි ක්‍රියාවකි.

අල් කුර්ආනය පාරායන කිරීමේ හොඳම ක්‍රමය කුමක් දැයි ප්‍රශ්න කළ විට අල් කුර්ආනය මාසයක් තුළ පාරායන කර අවසන් කිරීමය යි නබි (සල්) තුමාණෝ පිළිතුරු දුන්හ. එනම් දවසකට එක් ජුසුවක් පාරායන කිරීම වේ. මෙම ක්‍රියාව රමදාන් මාසයට පමණක් සීමා නොකර, සැමදාම ඉටු කළ යුතුයි. එසේ කළ නොහැකි නම් දිනකට පිටුවක් හෝ දෙකක් කියවීමට වග බලා ගත යුතුයි.

එමෙන්ම, රාත්‍රි නැමදුම් වන තහජ්ජුද් අනිකුත් දිනයන් හී ද ඉටු කළ යුතුයි. ඉස්ලාමිය ෂරීආ අනිවාර්ය නොකළ වතාවත් අප මත පටවා ගෙන, අපහසුතාවට පත් වීමෙන් වැළකිය යුතුය. මෙසේ කිරීමෙන් තමන්ටම බර පටවා ගෙන අපහසු තත්ත්වයට පත්වීම නුසුදුසුය. මෙවැනි අනිවාර්යය නොවන වතාවත් කෙනෙකුට තිබෙන පහසුතාවය අනුව සිදු කළ හැක. කලාතුරකින් ඉටු කරන බර සහිත වතාවත් වෙනුවෙන් සැහැල්ලු යමක් නොකඩවා ඉටු කිරීම වඩා සුදුසුය.

## නිගමනය

ඉස්ලාමයේ කුළුනු සියල්ලට නීති රීති සහ ක්‍රමයක් ඇත. එනිසා නීති රීති ගැන අවබෝධය ලැබීම ඉතා වැදගත් එකකි. එනිසා යම් ආගමික වතාවත් ඉටු කිරීමට පෙර තමා ෂරීආවට එකඟව ඒවා සිදු කරන්නේ දැයි කල්පනා කර අවබෝධ කර ගත යුතුයි.

## 4. ඉස්ලාමයේ පස්වන කුළුන - මිනිසාගේ දෛවය - අල් කද්ර්

අල්ලාහ් ගේ රසූල් (සල්) තුමාණෝ මෙසේ දැන්වූ බව අබූ අබ්දුර් රහ්මාන් අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) වාර්තා කරයි.

“ඔබ අතර ඕනෑම කෙනෙක් මවගේ කුසයේ එක් රැස් කරනු ලබන විට ඔබේ මැවීම සිදු වේ. පළමු දින 40 තුළ ඔහු දියර බින්දුවක් වේ. ටික කලකට පසුව එය ලේ කැටියක් බවට පත් වේ. පසුව ඒ හා සමාන කාලයකට සපා දමන ලද ගුලියක හැඩයක් බවට පත් වේ. ඉන් පසුව මලාඉකාවරයෙක් ඔහු වෙත එවනු ලැබ, ඔහු තුළට ප්‍රාණය පිඹිනු ලබයි. ඔහුගේ නියමන් හතරක් ලිවීමට මෙම මලාඉකාවරයා අණ කරනු ලබයි. ඒවා නම් ඔහුගේ ආහාර පාන පිළිබඳව, ඔහුගේ ආයුෂ කාලය පිළිබඳව,

ඔහුගේ ක්‍රියා රටාව පිළිබඳව සහ ඔහු යහපත්ද අයහපත්ද යන විස්තර ය.“

“අල්ලාහ් මත දිවුරා කියමි. ඔහු හැර නැමදුමට සුදුසු වෙන කෙනෙක් නැත. නියත වශයෙන්ම ඔබලා අතරින් කෙනෙකු ස්වර්ග වාසියෙකුට ආවේණික වූ චරිතයකින් හැසිරෙනු ඇත, නමුත් ස්වර්ගයට ප්‍රවිෂ්ට වීම සඳහා බාහුවක ප්‍රමාණයෙක දුරක් තිබෙන තත්ත්වය යටතේ ඔහුගේ දෛවය පිළිබඳ ලේඛනය ක්‍රියාත්මක වී ඔහු අපාය වැසියෙක් මෙන් හැසිරෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේදී ඔහු අපාය ගත වනු ඇත. තවද, ඔබලා අතරින් කෙනෙකු අපාය වැසියෙකුට ආවේණිකවූ චරිතයකින් හැසිරෙනු ඇත, නමුත් නිරයට ප්‍රවිෂ්ට වීම සඳහා බාහුවක ප්‍රමාණයක දුරක් තිබෙන තත්ත්වය යටතේ ඔහුගේ දෛවය පිළිබඳ ලේඛනය ක්‍රියාත්මක වී ඔහු ස්වර්ග වාසියෙකු මෙන් හැසිරෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේදී ඔහු ස්වර්ග ගත වනු ඇත.“ වාර්තා කළේ බුහාරි සහ මුස්ලිම්

## පසුබිම

බුහාරි, මුස්ලිම් සහ අනිකුත් විද්වතුන් මෙම හදීසය වාර්තා කර ඇත. අබ්දුල්ලාහ් ඉබ්න් මසූද් (රලි) තුමාට අමතරව තවත් සහාබා වරුද මෙම හදීසය දන්වා ඇත.

නුත්ෆා යන වචනය ඉමාම් නවවි එකතු කර ඇත. මවගේ කුසය තුළ දරුවාගේ වර්ධනය අදියර තුනකින් සිදු වේ. සෑම අදියරකටම දින 40ක් ගත වේ. මේ අනුව දින 120කට පසුව කළලය තුළට ප්‍රාණය පිඹිනු ලබයි. කළලයේ ආහාර, ජීවිත කාලය, එහි කල් ක්‍රියා සහ දෛවය වැනි දේ මෙහි අඩංගු වේ.

කෙනෙක් ස්වර්ගයට අයත් අයගේ ක්‍රියාවන් හී නිරත වන බව ජනතාවට පෙනී සිටින බව පවසන වාක්‍යයෙහී

මුනාෆික්වරු (වංචනික අය) ගැන පැවසේ. ඔවුන් මූමින්වරුන් ගේ හැසිරීමේ නිරත වන බව පෙන්වන නමුත්, ඔවුන් ගැන අල්ලාහ් හොඳින් දන්නා හෙයින් ඔවුහු අපායට ඇතුළු වෙති. මෙම හදීසයේ මෙම අදහස සැඟවී තිබෙන බව අපි දැන ගත යුතුයි.

## ඇතැම් වැදගත් විවරණ.

මෙම හදීස් පහදා දීමේදී “කෙනෙක් ජනයාට පෙන්වීම පිණිස ස්වර්ගයට හිමි අයගේ ක්‍රියාවන් හි නිරත වේ.“ යනුවෙන් ඇතැම් හදීස් විද්වතුන් විවරණය කරති. එනම් මුනාෆික්වරු යන වංචනික අය මූමින්වරුන්ගේ ක්‍රියාවන් කරන බව ජනතාවට පෙන්වුවත්, ඔවුන්ගේ අරමුණ කුමක් දැයි සර්ව බලධාරී අල්ලාහ් දන්නා හෙයින් ඔවුන් අපායට වීසි කරනු ලබති. මුනාෆික්වරු, අල්ලාහ්ගේ නිවේදනය ඔවුන් සිත් තුළින් ප්‍රතික්ෂේප කරති. එ නිසා ඔවුන්ගේ ක්‍රියා සියල්ල බොරුවක් බවට පත් වේ. මෙම විවරණය තුළින් මෙම හදීසය වටහා ගත යුතුයි.

## මෙයින් ඉගෙන ගන්නා පාඩම.

1. මෙම මාතෘකාව පිළිබඳ පවසන ලද වෙනත් හදීස් වදන් තුළින් එහි සැබෑ කරුණු අවබෝධ කර ගැනීම.

හදීස් වදනක් ගැන විස්තර කරන විට, එම මාතෘකාව යටතේ තිබෙන තවත් හදීස් වදන් කිහිපයක් ගැන දැන සිටිය යුතුයි. මෙම හදීසයේ අඩංගු අදහස නිසියාකාරව තේරුම් නොගන්නා ඇතැම් අසරණ මුස්ලිම්වරු, තමන්ද එහි සඳහන් මුනාෆික්වරුන්ගේ තත්ත්වයට පත් වන බව බිය වෙති. මෙය අනවශ්‍ය බියකි.

2. අල්ලාහ් වෙත අවංක වීම සහ බලාපොරොත්තු තැබීම.

වරක් මුස්ලිම්වරුන්ට එරෙහිව සිදු වූ සටනක, සහාබාවරයෙක් තම ගෙලට හී පහරක් වැදී පසාරු කර ගෙන පිටෙන් ආ යුතු බවද, ඒ හේතුවෙන් මරනයට පත්වීමට ද ආශා කළේය. එවිට අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ "ඔබ අල්ලාහ් කෙරෙහි අවංක වන්නේ නම්, ඔහුද ඔබට අවංක වන්නේය," යනුවෙන් කීහ. එම සහාබා වරයාද තමා පැතූ ආකාරයෙන්ම ගෙලට පහර වැදී මරනයට පත් විය.

මෙහිදී රසූල් (සල්) තුමාණෝ යොදාගනු ලැබුවේ පොදුවේ උපයෝගී කරන වචන වූ අතර, ඒවා ඕනෑම අවස්ථාවකට සුදුසු ය. අපි සැබැවින්ම අල්ලාහ්ට අවංක වුවා නම්, ඔහු අපට උදව් කර, අප යහ මඟ ඔස්සේ රැගෙන යයි. අල්ලාහ්ට අපි වැඩියෙන් සමීප වන තරමට ඔහුද අපට වැඩියෙන් උදව් කර, තව තවත් යහ මගෙහි රැගෙන යන්නේය. මේ හේතුවෙන්, ඉහත සඳහන් හදීසය පවසන ආකාරයට, මුනාෆික්වරු කිහිප දෙනෙකුට පමණක් එය අදාළ වන බව සලකන්න.

නමුත්, බලාපොරොත්තුව තුළින් පමණක් අපි ජීවත් විය යුතු බව මෙයින් අදහස් නොකෙරේ. බලාපොරොත්තුවීමට අල්ලාහ්ට බියබැතිමත් වීමද එකතු විය යුතුයි. මේ නිසා, අල්ලාහ්ට නැමදුම් කරන විට බලාපොරොත්තතුව සමඟ බිය බැතිමත්කම ද තිබිය යුතුයි. අල්ලාහ් කෙරෙහි බියබැතිමත්කම අධික වන තරමට, අපි අල්ලාහ්ට සමීප වන්නෙමු. මෙමගික් අප තුළ සාමය සහ සන්සුන්භාවය වර්ධනය වේ. එය වෙනුවට අනතුරක් හෝ භයානක සතෙකුට තිබෙන බිය නිසා අපි ඒවායින් හැකි තරම් ඈත්ව සිටීමට උත්සාහ දරන නිසා, එය වෙනත් ආකාරයක බියක් බව සලකන්න.

## 3. ආදරය, බලාපොරොත්තුව හා බිය බැතිමත්කම

අල්ලාහ් වෙත අප තබන බලාපොරොත්තුවට සමානව අප තුළ බිය බැතිමත්කම තිබිය යුතු බව විද්වතුන් පවසති. මේ තුළින් අපි ඊමානයේ තවත් ශක්තිමත් තත්ත්වයට ළඟා වන්නෙමු. සීමාවට වඩා බලාපොරොත්තු නොවීම නිසා විශ්වාසය බිඳ වැටීමට අවශ්‍යතාවක් නොමැත. එ සමඟ කම්මැළිකම සහ වගකීම මඟ හැරීම සිදු වේ. එනිසා අල්ලාහ්ට නැමදුම් කිරීමේදී, බලාපොරොත්තුව, බිය බැතිමත්කම සහ ආදරය යන කරුණු අඩංගු වේ.

## 4. අල් කද්ර් - දෛවය නොහොත් දෛවය

ඉහත සඳහන් හදීසය අල්ලාහ්ගේ මැවීම සහ කද්ර් නම් දෛවය ගැන සඳහන් කරයි. කෙනෙකුට ලියන ලද නියමය ක්‍රියාවට නැගේ යන වචන මාලාවට අයහපත් තේරුම නොව ධනාත්මක තේරුම ගත යුතුයි. අංග සම්පූර්ණ ඥානයෙන් අල්ලාහ් අනාගත සිදුවීම් සියල්ල දැන සිටියි.

ලව්හ් අල් මහ්ෆූල් හී ලියැ වී තිබෙන දේ දන්නේ අල්ලාහ් පමණි. ඒවායේ දැනුම අපහට නොමැත. අප අතර කිසිවෙක් තම දෛවය, තම රිස්ක් නම් ජීවනෝපාය (ජීවිතය අවශ්‍ය ආහාර පානාදිය) සහ තම අවසානය කවදාද, කොතැනකදී දැයි නොදනී. අපහට මේවා අල් ගෙයිබ් නම් සඟවන ලද විස්තර වේ. මලාඉකාවරු විසින් ලියන ලද දේ අප ජීවිතයේ බලපාන බව මෙම හදීසය පෙන්නුම් කරන බව කවුරුත් සිතයි. නමුත් එහි කියැවෙන්නේ අල්ලාහ්ගේ අංග සම්පූර්ණ දැනුම ගැන බව වටහා ගත යුතුයි. අපහට ලියන ලද දේ නිසාම අපි කිසිවක් නොකරන්නෙමු. පෙර ලියනු ලැබූ හේතුවෙන්, ඇතැම් ක්‍රියාවන් හි අප අනිවාර්යයෙන් නිරත විය යුතු

බව ඇතැම් මුස්ලිම්වරුන්ගේ විශ්වාසය වේ. මෙය වැරදි අවබෝධයකි.

ඇත්ත වශයෙන්ම, කෙනෙකුගේ දෛවය කලින් ලියැවී අවසාන නමුත්, කෙනෙකුගේ ක්‍රියාව ඔහුගේම සම්පූර්ණ වගකීමෙන් සිදු වන දෙයක් වේ.

## 5. ක්‍රියාවට වගකීම

අපි තෝරා ගන්නා හා ඉටු කරන සියලු ක්‍රියාවන් සඳහා අපි වගකිව යුතුයි. හදීස් හී අවසාන කොටස සඳහන් කරන, අවසාන මොහොතෙහි කෙනෙකුගේ අවසාන දෛවය වෙනස් වෙයි යනුවෙන් සඳහන් කෙරේ. තම ජීවිතයේ අවසාන මොහොතේදී ඉස්ලාමය පිළි ගත් බොහෝ දෙනෙකුගේ ජීවිත කථා ගැන අපි දනිමු. රසූල් (සල්) තුමාණන්ගේ ජීවිත කථාවෙහි, ඉස්ලාමයට පිවිසී එක් යහ ක්‍රියාවක් පවා නොකළ තැනැත්තෙකු, කෙළින්ම යුද පිටියට ගොස් තම ප්‍රණාය පුද කර, ස්වර්ගයට හිමිකම් ලැබූ බව දනිමු. අයහපත් ලෙස කාලය ගත කර, අවසාන මොහොතෙ හී අල්ලාහ්ගෙන් සමාව ඉල්ලා යහපත් මාර්ගයට පිවිසීමෙන් ස්වර්ගය ලැබූ වාසනාවන්ත පුද්ගලයන් ගේ කථා ගැන අපි දනිමු. ඉස්ලාමයට පිවිසූ නව මුස්ලිම්වරු තමන් කළ පාපයන්ට අල්ලාහ්ගෙන් සමාව ලබන බවද අපි දනිමු.

තම ජීවිත කාලය මුළුල්ලේ යහ ක්‍රියාවන්හි නිරත වී, අවසානයේ පාප ක්‍රියාව ඉටු කළ හේතුවෙන් අපායට ඇතුළු වූ අය ගැනද අසා ඇත්තෙමු. මෙම පිරිස ඉතා සුළු ප්‍රමාණයක් වන අතර, ඒවා සිදු වන්නේ ඔවුන්ගේම නිදහස් තීරණය නිසාය. මෙම පිරිසට ආත්ම වංචනිකයින් යන මුනාෆික් අයද ඇතුළත් වෙති.

## 6. අල් කුර්ආනයේ සහ හදීස්හි දේවත්වය

අල් කද්ර් පිළිබඳ වැඩි අවබෝධය ලබන්නට අපි මිනිසාගේ මැවීම් ගැන තව බොහෝමයක් දැන ගත යුතුයි. මවගේ ගර්භාශය තුළ කලලයේ වර්ධනයේ විවිධ අදියර පිළිබඳව වෛද්‍ය විද්‍යාවේ සොයාගැනීමට වසර 1430 ට පෙර හදීස් වදන් පැවසීම මවිතයට කරුණකි. මෙවැනි වදන් අල් කුර්ආනයේ පවා වෙනත් ආකාරයෙන් සඳහන් වී ඇත. විද්‍යාඥයෝ සිය වසර තුන හතරකට පෙර සොයා ගත් තොරතුරු අල්කුර්ආන් සහ හදීස් වදන් ශත වසර 14 කට පෙර පැවසීමෙන් ඒවා දේවත්වය ලැබූ බවට පෙන්නුම් කරයි.

ටික කලකට පෙර, යුරෝපයේ මැවීම් පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවතුණු අවස්ථාවේ, මැද පෙරදිගට අයත් ඇතැම් ආගමික විද්වතුන් එයට සහභාගි වූහ. එහිදී මවගේ ගර්භාශය තුළ  කලලයේ වර්ධනය පිළිබඳව අල් කුර්ආන් සහ හදීස් පවසන කරුණු ඔවුන් පහදා දුන්හ. එයට සවන් දුන් උගත් පිරිසක්, ඒවා දේව වාක්‍ය බව නිසැකව අවබෝධ කර ගෙන, මුස්ලිම් බවට පත් වූහ.

## 6. මිනිසාගේ ධාර්මික අංශය

අල් කද්ර් යන දෛවය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබනු පිණිස මිනිසාගේ ධාර්මික කොටස ගැන දැන ගත යුතුයි.

- මිනිසාගේ අක්ල් නම් ස්වභාවික බුද්ධිය අපේම කොටසකි. ඒ තුළින් හොඳ හා නරක අතර වෙනස දැන ගත හැක. යොවුන් වියට පත් යහපත් සිහිය ඇති කෙනෙක් මුකල්ලෆ් ලෙස හැඳින් වේ. මානසිකව අස්ථාවර කෙනෙක් මුකල්ලෆ් නොවෙයි.

- අල් ෆිත්රා නම් සහජ බුද්ධිය සහිතව උපත ලැබූ ඕනෑම කෙනෙක් හොඳ හා නිවැරදි දේ ප්‍රිය කර,

අයහපත් සහ වැරදි දේ පිළිකුල් කරයි. මෙය ප්‍රිය කිරීම හා පිළිකුල් කිරීම වේ. ෆිත්රා යන මෙම ගුණාංගය දෙමාපියන්, පරිසරය, හා ඇති දැඩි කිරීම් වැනි බාහිර බලපෑම් නිසා වෙනස් විය හැක. නපුරට නැඹුරු වූ ෆිත්රා නිසා, කෙනෙක් අයපත් දෙයක් පවා ප්‍රිය කරනු ඇත. එහෙත් කෙනෙක් තුළ මූලාරම්භයේ තිබුණු ෆිත්රාව තවමත් තිබෙන බව විද්වතුන් විශ්වාස කරති. එම ෆිත්රාව යළි අවදි කළ හැකි නම්, යහ දේ ප්‍රිය කිරීමට සහ වැරදි දේ පිළිකුල් කිරීමට කෙනෙක් පටන් ගනී.

- අපේ මෙලොව උපතට පෙර, අල්ලාහ්ට නමදින බව අපි දුන් පොරොත්දුව මෙම ෆිත්රාවට අයත් වේ. මේ හේතුවෙන්, හොඳ දේවල් ප්‍රිය කරන්නට සහ නරක දේවල් පිළිකුල් කිරීමට අප තුළ ස්වාභාවිකව හැඟීම් නැගේ.

- එමෙන්ම මිනිසා ආශාව සහිතව මවනු ලැබූ අතර, අප තුළ තිබෙන අත් දැකීම මත, හොඳ දෙයක් හෝ නරක දෙයක් කිරීමට අපව මෙහෙයුම් කළ හැක.

- අභ්‍යන්තර අභියෝගය නම් ආශාව නිසා අපේ කැමැත්ත සහ හැකියාව විවිධ බලපෑමට ලක්වෙයි. අභ්‍යන්තර අභියෝග යනු:

1. ශහවාත් නොහොත් හවා යන සිය කැමැත්ත. (ආශාව)

2 අන් නෆ්ස් නම් මමත්වය. මෙය කොටස් තුනකට අයත් වේ.

- අන් නෆ්ස් අල් අම්මාරා බිසු - මෙය නරක දේ කරන්නට පොලඹවයි.

- අන් නෆ්ස් අල් ලව්වාමා - අපේ අයහපත් ක්‍රියාවන්හට හෝ අයහපත් අදහස් වලට ඊමාන් සහ දැනුම (තිබේ නම්) එය අපටම චෝදනා නගයි. උදාහරණයට මත් පැන් බීමට ආශා කිරීම ගැන නුඹට ලැජ්ජාවක් නැද්ද? යයි අපේ නෆ්ස් අපෙන් ප්‍රශ්න කරයි.

- අන් නෆ්ස් අල් මුත්මඉන්නා - ශාන්ත, සන්සුන් හා නිශ්චල නෆ්ස්.

මෙම නෆ්ස් තුන් කොටසම අප තුළ එකම අවස්ථාවක ක්‍රියා කළ හැක. නිදසුනක් වශයෙන් වැරදි ක්‍රියාවක් කිරීමට සිතන විට එය නෆ්ස් අල් අම්මාරා බිසු වන අතර, නෆ්ස් අල් ලව්වාමා වන අල්ලාහ් කෙරෙහි තිබෙන බිය බැතිමත්කම නිසා එය ඉටු නොකිරීමෙන්, ශාන්ත හා සන්සුන් භාවයට අපි පත් වෙමු.

අභ්‍යන්තර සිතුවිලි වලට බාහිර අභියෝගද පැන නැගිය හැක.

- දැන් පවතින තහනම. පළමු වන අංශයේ නෆ්ස් අප තුළ තණ්හාව පොලඹවන නිසා තහනම් ක්‍රියාවෙහි නිරත වීමට ආශාවක් ඇති වෙයි.

- වස්වාසාහ් නම් සාතාන්ගේ කෙඳිරීම. අපට බලපෑම් කරන්නට සාතාන්ට නොහැකි නමුත් අපේ සිත් තුළ කොඳුරන්ට ඔහුට හැකිය. අයහපත් ක්‍රියාවක් අළංකාර එකක් ලෙස පෙන්වන්නටද යහපත් දැයක් ඉටු කිරීම ප්‍රමාද කරන ලෙසද සාතාන් උත්සාය දරයි. නිදසුනක් වශයෙන්, අපි යහපත් මුස්ලිම්වරු වුවත්,

සලාත් ඉටු කිරීම ප්‍රමාද කරන ලෙසත්, සදකා ගෙවීම අර්ථික පරිහානියක් බවත් පෙන්වන්නට සාතාන් උත්සාහ දරයි. මෙම අවස්ථා දෙකේම යහපත් හා අයහපත් ක්‍රියාව අතර වෙනස අපැහැදිලි වෙයි.

ඇතැම් මිනිසුන් අපට උපකාර වන අතර, තවත් පිරිසක් අපට එරෙහි වෙති. ෆිත්රා සහ අක්ල් නම් යහපත් ගුණාංග අපහට යහ ක්‍රියාවන් ඉටු කිරීම සඳහා දිරිමත් කරයි. එහෙත් කල්පනා කිරීමේ හැකියාවට සීමාවක් ඇත. මේ හේතුවෙන් අති උතුම් අල්ලාහ්, ඔහුගේ නිවේදන සමඟ වක්තෘ වරුන් කිහිප දෙනෙක් මිනිස් සමාජයට එව්ය. අල්ලාහ්ගේ යහ මඟ පෙන්වීම තුළින් යහපත් දේ කුමක්ද, අයහපත් දේ කුමක්ද, ෂෙයිතාන්ගේ බලපෑමෙන් මිදී ජීවත් වන්නේ කෙසේද යන කරුණු පැහැදිලි වනු ඇත. සිත සම්පූර්ණව යොමු කර අල් කුර්ආනය කියවන්නේ නම්, එය තුළින් බසීරා නම් තීක්ෂණ බුද්ධිය ලැබ අන් නෆ්ස් අල් මුත්ම ඉන්නා යන තත්ත්වය ලබා ගත හැකි වනු ඇත.

**ජීවිතය යනු පරීක්ෂණයකි.**

පරීක්ෂණයට මුහුණ දෙනු පිණිස අපි මවනු ලැබූ බව අල් කුර්ආනය පවසයි.

*"ඔබගෙන් කවරෙකු ක්‍රියාවෙන් ඉතා ලක්ෂණදැ යි ඔබ පිරික්සනු පිණිස මරනයත් ජීවිතයත් නිර්මාණය කළ ඔහු, අධික බලසම්පන්නය අධික ක්ෂමාන්විතය."* (සූරා අල් මුල්ක් - වාක්‍ය අංක 2)

අපි පරීක්ෂණයට ලක් කරනු ලබන බව ඉහත සඳහන් වාක්‍යයෙහි අල්ලාහ් පවසයි. අපේ අධිෂ්ඨානය පරීක්ෂණයට ලක් කරන බව අල්ලාහ් දන්වයි.

තීක්ෂණ බුද්ධිය තිබේ නම්, අල් කුර්ආනය පාරායනය කරන්නේ නම්, අල්ලාහ්ට අපි සමීප වුවා නම්, නුවණ

තිබේ නම්, අපි නොමඟ නොයන්නෙමු. ෂෙයිතාන් අපට ළං නොවනු ඇත. ඔහුගේ බලපෑමට අපි භාජන නොවන්නෙමු. මෙවැනි තත්ත්වයක අපි සිටියේ නම් අපට බලපෑමක් කළ නොහැකි හේතුවෙන් ෂෙයිතාන් අපට ළඟා වන්නේ නැත. මෙම දෘෂ්ටි කෝණයෙන් බලන විට ජීවිතය අභියෝගයකි. තවද ජීවිතයේ අපි නිතර පරීක්ෂණයන්ට ලක් වන්නෙමු.

## තව්ෆීක් නම් ආශීර්වාදය

අති කාරුණික අල්ලාහ් අපහට පිරිනැමූ දායාද සියල්ල තිබුණ ද අපි ඔහුගේ ආශීර්වාදය ලබා ගත යුතුයි. මෙම තව්ෆීක් නොමැතිව, ෂෙයිතාන්ගේ ග්‍රහණයට හසුවීම නිසා හෝ අපේම ආශාවන් නිසා හෝ අප නොමඟ යත හැක. එනිසා අපි අල්ලාහ්ට බොහෝ සමීපව ජීවත් විය යුතුයි. අප නිතරම අල්ලාහ් ගෙන් දුආ ඉල්ලා ඔහුගේ සහය, රැකවරණය සහ යහ මඟ පැතිය යුතුයි. අපව යහ මඟ කරා රැගෙන යනු මැනවී යනුවෙන් අප දිනකට අවම වශයෙන් 17 වරක් පවසන්නේ මේ නිසාය. නැවත නැවත අල්ලාහ්ගේ යහ මඟ අපට අවශ්‍ය වේ. අපේ අවශ්‍යතාව යහ මඟ පෙන්වන ලෙස පමණක් පැතීම නොව එම මාර්ගයේ රැගෙන යන ලෙසටයි.

## අල්ලාහ්ගේ කරුණාව

දීර්ඝ හදීස් වදනක කොටසක් මෙහි සඳහන් කරමු. කෙනෙක් වසර 70ක් පාපයෙන් තොරවූ යහපත් ජීවිතයක් ගෙවා, එම ජීවිතය සහ නැමදුම මත ස්වර්ගය අපේක්ෂා කරන්නේ නම්, ඒවා සියල්ල අල්ලාහ් විසින් ඔහුට දෙනු ලැබූ ආශීර්වාදයක් වන ඔහුගේ දෑසේ පෙනුමට ඒවා සමාන නොකළ හැකි බව අපි වටහා ගත යුතුයි.

## නිගමනය

අපගේ ඊමානය, දැනුම සහ යහ මාර්ගය අපි ලබා ගන්නේ රසූල් (සල්) තුමාණන්ගේ හදීස් වදන් නම් උල්පතින් ය. හදීස් වදන් ඉගෙන ගැනීම සහ පහදා ගැනීම තුළින් අපගේ තීක්ෂණ බුද්ධිය සහ ක්‍රියා මාර්ගය උනන්දු කරනු ලැබෙන අතර, අපේ හදවත ආලෝකමත් කර අපගේ ආත්මාවද අභිවෘද්ධිය කරා ගමන් කරයි. අති කාරුණික අල්ලාහ්ගෙන් අපහට යහ මාර්ගය පෙන්වන ලෙසට දුආ කරමු.

# 5. ඉබාදාව සහ එහි බිද්ආ (ආගමේ නැති නවීන වත් පිළිවෙත්) ඇතුළු කිරීම හෙළා දැකීම

මුහම්මද් (සල්) තුමාණෝ වරක් "අපගේ කටයුත්තට (ඉස්ලාමයට) (බිද්ආවක්) ඉස්ලාමයේ නොමැති නවීන ක්‍රම සහ විධි කවරෙකු හෝ ඇතුළු කරන්නේ නම්, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ." යනුවෙන් දේශනා කළ බව අයිෂා (රලි) තුමිය දන්වයි. වාර්තා කළේ අල් බුහාරි.

සහීහ් මුස්ලිම් දක්වන වාර්තාව අනුව, "අප දහමට අදාළ නොවන දෙයක් ක්‍රියාවට නංවන්නේ නම්, එය ප්‍රතික්ෂේප කරනු ලැබේ." යනුවෙන් පවසයි.

## පසුබිම

මෙම හදීසය කෙතරම් වැදගත්ද යත් මෙය සෑම මුස්ලිම්වරයෙකුම කට පාඩම් කර ගත යුතු යැයි ඉමාම් නවවි පවසා ඇත.

බාහිර ක්‍රියා සහ වතාවත් පිළිබඳ පරීක්ෂා කරන මිනුම් දණ්ඩක් වශයෙන් මෙම හදීසය උපයෝගි වේ. මෙම හදීසයේ වගන්ති අනුව, යම් ක්‍රියාවක් ෂරීආවට හෝ මුහම්මද් (සල්) තුමාණන්ගේ සුන්නාහ්වට එකඟ නොවුයේ නම්, එම ක්‍රියාව අල්ලාහ් විසින් පිළි ගනු නොලැබේ. හදවතෙ හි සිදු වන චේතනාව මත කෙනෙකුගේ ක්‍රියාව මනිනු ලබන බව පවසන 1 වන හදීසය මෙම හදීසය සම්පූර්ණ කරයි. කෙනෙකුගේ ක්‍රියාවක් පිළි ගනු ලබන්නේ පහත සඳහන් කොන්දේසි දෙකක් මත බව විද්වතුන් අදහස් දක්වති.

1. චේතනාව - අල්ලාහ් වෙනුවෙන් යමක් කරන බව අවංක චේතනාව අවශ්‍යයයි.

2. සුන්නාහ්ව හා එකඟ විය යුතුයි. එනම් රසූල් (සල්) තුමාණන්ගේ ඉගැන්වීම් හා ආදර්ශයට අනුකූලව තිබිය යුතුයි.

මෙහි සඳහන් හදීසයට අමතරව සූරා කහ්ෆ් වාක්‍ය 110 දෙස බලමු.

රසූල් (සල්) තුමාණන්ගේ ආදර්ශයට එකඟ වීම, අල් කුර්ආනයේ අණට එකඟ ව ක්‍රියා කිරීමකි.

*“සැබැවින්ම, අල්ලාහු ද, අන්තිම දිනයද අපේක්ෂාකොට ඔහු බෙහෙවින් මෙනෙහි කරන අයට අල්ලාහ්ගේ රසූල් තුමාණන් කෙරෙහි ඔබට ලක්ෂණ ආදර්ශයක්මය.“* සූරා 33: 21

*“අහෝ ආදම්ගේ දරුවනි! සියලු නැමදුම් ස්ථානයන් හි ඔබගේ ලක්ෂණ ගනිව්. තවද, ඔබ අනුභව කරවු. පානය කරවු. නාස්ති නොකරවු. ඇත්තෙන්ම ඔහු නාස්ති කරන්නන් ප්‍රිය නොකරන්නේය.“* සූරා7: වාක්‍ය 31

## ඉගෙන ගන්නා පාඩම්

ඉස්ලාමයේ වැදගත් පදනම ගැන මෙම හදීස් සාකච්ඡා කරයි. සුන්නාහ් අනුගමනය කිරීමේ වැදගත්කමද, එම විශ්වාසයට පටහැනිව ක්‍රියා කිරීමෙන් බිද්ආ නම් උල්ලංඝනයට මඟ පෙන්වීම සිදු වන බවද මෙහිදි පෙන්නුම් කරයි.

## 1. සුන්නාහ්ව

නබි (සල්) තුමාණන්ගේ සුන්නාහ් දෙවර්ගයට අයත්ය.

1. ඉබාදා නම් අල්ලාහ්ට නැමදුම සඳහා කළ ක්‍රියා.

2. ඉබාදාවට බාහිරව කළ ක්‍රියා. - එනම්, චාරිත්‍ර, සංස්කෘතික හා ක්ෂණිකව සිදු කරන ලද ක්‍රියා.

මේවා අතර තිබෙන වෙනස පහත සඳහන් වේ.

## 1.1 ඉබාදාහ් නම් නැමදුම් හෝ වතාවත් වශයෙන් ඉටු කරන ක්‍රියා:

මෙවැනි ක්‍රියාවන් ෂරීආ නොහොත් රසූල් (සල්) තුමාණන්ගේ සුන්නාහ්වට එකඟ ව පමණක් සිදු කළ යුතුයි. මෙවැනි ඉබාදා ඉටු කරන විට කරුණු පහක් පිළිබඳ අවබෝධය තිබීමෙන් අපගේ ක්‍රියා ෂරීආව හෝ සුන්නාහ්වට එකඟ වන බව වග බලා ගත හැක.

1. ඒවා ඉටු කරන කාලය හා වේලාව:

බොහෝ ඉබාදා ක්‍රියාවන් නියමිත වේලාවට හෝ කාලයේ ඉටු කළ යුතුයි. දිනපතා සිදු කරන පස් වේල සලාහ්, රමදාන් මාසයේ අනිවාර්ය උපවාසය සහ හජ් වන්දනා ඉටු කිරීම මේවායින් සමහරකි.

2. ඉබාද ඉටුතරක ස්ථානය:

ඇතැම් ඉබාදා නියමත ස්ථානයන් හී සිදු කළ යුතු බව ෂරීආව කියයි. උදාහරණ, ඉහ්තිකාෆ් සිටින ස්ථානය, ඉහ්රාම් ඇඳ ගැනීමේදී මීකාත් නම් මායිම් යනාදිය වේ.

3. ඉබාදා ඉටු කිරීමේ ප්‍රමාණය: සලාහ් කිරීමේදී රකආ ප්‍රමාණය කොපමණදැයි ෂරීආව සඳහන් කර ඇත. තවාෆ් කිරීමේදී කඅබාව වටා යන්නේ කොපමණ වරක් දැයි සඳහන් වී ඇත. එම ප්‍රමාණය ඉක්ම වන්නට අපට අනුමැතිය නැත.

4. ඉබාදා ඉටු කරන ආකාරය: අනුගමනය කිරීමට ඉතාමත් උතුම් ආදර්ශය රසූල් (සල්) තුමාණන්ගෙන්ය. සියලු ඉබාදා ක්‍රියාවක්ම ඉටු කරන්නේ කෙසේදැයි එතුමා අපහට උගන්වා හෝ ආදර්ශයක් වශයෙන් පෙන්වා හෝ ඇත. එනිසා ඒවාට නොගැළපෙන අයුරින් ඉටු කිරීමෙන් ඒවා උල්ලංඝනය කළ නොහැක.

උදාහරණ වශයෙන්, ජනාසා නැමදුමට රුකූඋ හෝ සජදා නැත. හජ් වන්දනා කරන විට, ගල් ගසන්නට උපයෝගි කරන කුඩා ගලේ තරම පවා එතුමා පෙන්වා දුන්නේය.

5. ඉබාදා සඳහා භාවිත කළ දේ. ආහාර සඳහා උද්හියියා කිරීමේ සැලකිය යුතු කරුණු මෙහි අඩංගුය. කුකුලෙක් මැරීමෙන් උද්හියියා ඉටු නොවන බව මතක තබා ගත යුතුයි. මෙහිදී වැදගත් කරුණක් නම්, මුස්ලිම්වරු ඕනෑම දෙයක් පටන් ගන්නාවිට බිස්මිල්ලාහ්, එනම් අල්ලාහ්ගේ නාමයෙන් යන වචනය පවසති. කුර්ආන් පාරායනය, ආහාර අනුභවය, ජලය පානය කිරීම, වැනි ක්‍රියා වලට පමණක් නොව නිවසින් බැහැර වීම, නිවසට යළි ඒම, රාජකාරිය පටන් ගැනීම, ගනුදෙනු කිරීම, වාහනය හෝ යන්ත්‍රය ක්‍රියා කිරීම, ආහාර සඳහා සතෙක් මැරීම වැනි සියලු අවස්ථාවන්හී බිස්මිල්ලාහ් යනුවෙන් කියති. වෙනත් ආගමික ජනතාව තම දේව පිළිමයට සත්තු මරා බිල්ලට දෙනවාක් මෙන්, මුස්ලිම්වරුද අල්ලාහ්ට සතෙක් බිල්ලට දෙන බව ඇතැම් අය සිතයි. පිළිමයට සතෙක් මරා පූජා කරන අය, එම සතාගේ මාංශය ආහාරයට නොගනිති. එහෙත් ඉස්ලාමයේ සතෙක් මැරීමේ ක්‍රියාව පිළමයකට කරන පූජාවක් නොවන හෙයින් මුස්ලිම්වරු එම සතාගේ මාංශය ආහාරයට ගනිති. ඇත්ත වශයෙන්, මරන විට බිස්මිල්ලාහ් යයි නොකිවහොත්, එම සතාගේ මාංශ ආහාරයට ගැනීම මුස්ලිම්වරුන්ට තහනම්ය. මෙම වෙනස මුස්ලිම්වරුද දැන ගත යුතුයි.

නබි (සල්) තුමාණෝ ඉබාදාවක් ඉටු කළේ නිතරමද, නැතහොත් විටින් විටද, යනුවෙන් දැන සිටිය යුතුයි. රසූල් (සල්) තුමාණෝ ඇතැම් සූරා, එනම් සජදා හෝ ආල ඉම්රාන් සූරාව සිකුරාදා ෆජ්ර් සලාවෙහි පාරායන කළේය. එහෙත් අද සමහර ඉමාම්වරු මෙම සූරා

දෙකෙන් එක සූරාවක් සෑම සිකුරාදා ෆජ්ර් සලාවෙහි පාරායන කරති. මෙම ක්‍රියාවෙන් එම සූරාව පාරායනය කිරීම අනිවාර්ය ක්‍රියාවක් බව මුස්ලිම්වරු සලකන්නට මාර්ගද විවෘත කරති.

නබි (සල්) තුමාණෝ ඉඳ හිට යම් ක්‍රියාවක් ඉටු කළේ නම් අපද ඒ ආකාරයෙන්ම සිදු කිරීම, විශේෂයන් සමූහයක් වශයෙන් කරන ඉමාම් ජමාඅත් නැමදීමකදී නුවණට හුරුය.

## 1. 2 ඉබාදා නොවන ක්‍රියාවන්

මේවා අහම්බෙන් හෝ ක්ෂණික ලෙස රසූල් (සල්) තුමාණෝ සිදු කළ ක්‍රියාවන්ය. ඒ සමඟ ඒ කාලයේ චාරිත්‍ර වශයෙන් සළකනු ලැබූ ඇතැම් ක්‍රියා නබි (සල්) තුමාණෝ විසින් සිදු කෙරුණු අතර, ඒවා ඉබාදා නම් වතාවත් බව නොසැලකුණි. මේ හේතුවෙන් අපද එවැනි ක්‍රියාවන්හී යෙදෙන විට ඒවා ඉබාදා ලෙස සැලකිය නොයුතුය.

- රසූල් (සල්) තුමාණෝ තම හිස කෙස් උරහිස දක්වා දිගට තියා ගත්තේ ඉබාදාවක් වශයෙන් නොව, එම යුගයේ පිරිමින්ගේ කෙස් එලෙස තිබුණු හෙයින්ය. එනිසා අද කිසිවෙක් දිග කෙස් තියාගන්නට කැමති නම්, එය ඉබාදාවක් යයි සිතිය නොයුතුය.

- අරාබි රටේ අධික උෂ්ණ නිසා රසූල් (සල්) තුමාණෝ තම කමිසයේ බොත්තම් එකක් හෝ දෙකක් විවෘතව තැබූහ.

- එම යුගයේ අරාබි සමාජයේ පිරිමි තලප්පාවක් බැඳ ගැනීම සිරිතක් හෙයින්, රසූල් (සල්) තුමාණෝද එවැනි තලප්පාවක් බැඳ සිටියහ.

- නබි (සල්) තුමාණෝ ඇතැම් අවස්ථාවන් හි බස්තමක් පාවිච්චි කළේ ආගමික වතාවත් වශයෙන් නොවේ.

මෙ වැනි ක්‍රියාවන් අප කරන්නට කැමති නම්, එය ආගමික වතාවත් වශයෙන් නොසලකා, නබි (සල්) තුමාණන්ට අප තුළ තිබෙන ආදරය නිසා, ඒ ආකාරයෙන් අනුගමනය කළ හැක. එසේ කරන විට එතුමා කෙරෙහි අපි දක්වන ආදරය සඳහා අපහට ත්‍යාග ලැබෙන බව සලකන්න.

## 2. ඉබාදා සහ ඉබාදා නොවන ක්‍රියා අතර වෙනස.

රසූල් (සල්) තුමාණෝ ඉටු කළ ක්‍රියාවන් අතර, ඉබාදා වශයෙන් ඉටු කළ ක්‍රියා කුමක්ද, ඉබාදා නොවූ ක්‍රියා කුමක්ද යන වෙනස අප දැන සිටිය යුතුයි. රසූල් (සල්) තුමාණෝ පහත සඳහන් අයුරින් ක්‍රියා කළේ නම්, ඒවා ඉබාදා බව ඇතැම් ආගමික විද්වතුන් අදහස් දක්වති.

- යම් ක්‍රියාවක් ඉටු කරන ලෙස රසූල් (සල්) තුමාණෝ අණ කළේ නම්;

- යම් ක්‍රියාවක් ඉටු නොකරන ලෙස රසූල් (සල්) තුමාණන් තහනම් කළේ නම්;

- යම් ක්‍රියාවක් ඉටු කිරීමෙන් ත්‍යාගයක් ලැබෙන බව පැවසුවේ නම්;

- යම් ක්‍රියාවක් ඉටු නොකළේ නම්, දඬුවම් ලැබෙන බව පැවසුවේ නම්;

## 3. ඉස්ලාමයේ සම්පූර්ණභාවය

ඉස්ලාමයට කිසිදු ඌනතාවයක් නොමැති හෙයින්, අලුතින් කිසිම දෙයක් ඉස්ලාමයට එකතු කිරීමට අවශ්‍ය නොමැති අතර, ඉස්ලාමය අංග සම්පූර්ණ ආගමක් බව අල් කුර්ආනය තහවුරු කරයි.

*"අද දින මම ඔබට ඔබගේ සන්මාර්ගය පරිපූර්ණ කෙළෙමි. මගේ ආශීර්වාදය ඔබ වෙත පූර්ණ කෙළෙමි. ඔබට මාර්ගයක් වශයෙන් ඉස්ලාම් සතුටින් තෝරා දුනුමි."* සූරා අල් මාඉදා වාක්‍ය 3

## 4. රසූල් (සල්) තුමාණන්ට අගෞරවය දැක්වීම

ඉස්ලාමය අංග සම්පූර්ණ ආගමක් යන යථාර්ථය මත, ඉස්ලාමයට කිසිවක් අලුතෙන් එකතු කිරීම, අල්ලාහ් සුබ්හානහු වතආලාට සහ ඔහුගේ රසූල් (සල්) තුමාණන්ට කරන අපහසක් සහ අගෞරවයක් බව සැලකේ.

## 5. බිද්ආ ක්‍රියාවෙන් වැළකී සිටීම

ඉබාදා යන ආගමික වතාවත් වලට අදාළ නොවන ක්‍රියාවන් ආගමික වතාවත් ලෙස සැලකීම බිද්ආ වන බව ඉමාම් අෂ් ෂාතිබි පවසයි. උදාහරණයක් වශයෙන්, යහ ක්‍රියා ඉටු කිරීමට තීරණය කළ තිදෙනෙකුගේ සිද්ධිය ගැන බලමු. පළමු වැන්නා කිසි දවසක විවාහ නොවන බවද, දෙවැන්නා සෑම රාත්‍රියකම නින්දට නොගොස් සලාහ් ඉටු කරන බවද, තුන්වැනි පුද්ගලයා සැමදාම උපවාසයේ යෙදෙන බවද තීරණ කළහ. මේ ගැන ආරංචි වූ රසූල් (සල්) තුමාණෝ, අන් සියලු දෙනාට වඩා තමා භක්තිමත් සහ ධර්මිෂ්ඨ කෙනෙක් නමුත් මේ තිදෙනා කරන්නට තෝරා ගත්  කිසිවක් තමා නොකරන බව පැවසුහ. මේ තිදෙනා ආගමික වතාවත් වලට අයත් නොවන නවීන යමක් එකතු කරන්නට ගත් තීරණය බිද්ආවක්  බව මෙම සිද්ධියෙන් පැහැදිලි වේ.

## 6. ඉබාදාවෙහි පහසු මාර්ගය තෝරා ගෙනීම

ඉබාදා යයි සලකා යම් ආහාර නොගැනීමෙන් වැළකී සිටිය නොයුතුයයි අෂ් ෂාතිබි තව දුරටත් පවසයි. සෞඛ්‍ය හෝ වෙනත් හේතුවක් මත මෙවැනි ආහාර ගැනීමෙන් වැළකී සිටිය හැකි නමුත් එයට ඉබාදා හේතුවක් බව පෙන්විය නොහැක.

අනිවාර්ය ක්‍රියාවක් ඉටු කිරීමේදී, විවිධ මාර්ග තිබේ නම්, ඒවායින් පහසු මාර්ගය තෝරා ගත යුතු බවද අෂ් ෂාතිබි තව දුරටත් පවසයි. උදාහරණයක් වශයෙන්, සීත කාලයේ උෂ්ණ ජලය උපයෝගී කිරීමේ පහසුකමක් තිබේ නම් අපි එම ජලය උපයෝගී කළ යුතුයි. එසේ නොකර, අපි සෞඛ්‍ය සම්පන්න යයි අන් අයට පෙන්වනු පිණිස, සීත ජලය උපයෝගී කර අපහසුතාවට පත්ව, එයින් අල්ලාහ්ගෙන් අමතර ත්‍යාග ලැබෙන බව නොසිතිය යුතුයි. එමෙන්ම, මස්ජිද් දෙකක් තිබේ නම්, සමීපව තිබෙන මස්ජිදයට යා යුතුයි.

දිනක් රසූල් (සල්) තුමාණෝ පාරේ ගමන් කරන විට, පාර මැද දහවල් අව්වේ සිට ගෙන ඉන්නා කෙනෙක් දුටුහ. ඔහු කරන්නේ කුමක්දැයි රසූල් (සල්) තුමාණෝ සහාබාවරයෙකුගෙන් විමසුහ. ඒ මිනිසා අව්වේ සිට ගෙන උපවාසයේ යෙදෙන්නට භාරයක් කර ගත් බවට තොරතුරු හෙළිවුණි. එවිට රසූල් (සල්) තුමාණෝ, අව්වෙන් ඉවත් වන ලෙසද, උපවාසය යහ ක්‍රියාවක් හෙයින් එය සම්පූර්ණ කරන ලෙසද ඒ මිනිසාට දන්වන ලෙස අණ කළහ. භාරය අවසන් කිරීම අනිවාර්ය ක්‍රියාවක් වන අතර, අව්වෙන් ඉවත යෑමෙන් හානිය වැළකී ඉබාදාව පහසුවෙන් ඉටු කළ හැකිය.

## 7. ෂරීආව පහසුතාව මුල් කර ගෙන ඇත.

වැඩි වැඩියෙන් කුසල් උපයන්නට හැකි වන්නේයයි සිතා ඉබාදාව අසීරු බවට පත් නොකරන ලෙස ආගමික විද්වතුන් අදහස් දක්වති. ෂරීආව පහසුතාව මුල්

කරගෙන තිබේ. එනිසා, ඉබාදාවක් ඉටු කරන විට, අප පහසු මාර්ගයක් තෝරා ගත යුතු අතර, එ මගින් හරියාකාරව ඉබාදාව ඉටු කළ හැකි වේ. අප අසීරු මාර්ගය තෝරා ගත්තේ නම්, කාලයකට පසුව නොයෙක් හේතුන් මත එය නොකඩවා නිසියාකාරව ඉටු කරන්නට අපට නොහැකිවනු ඇත. එනිසා ෂරීආව සඳහන් නොකළ අපහසු ක්‍රමයෙන් ඉබාදා ඉටු කිරීමෙන් වැළකී සිටිය යුතුයි.

## 8. ආගමෙහි බිද්ආ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉබාදාවට යම් නවීන දැයක් එකතු කිරීමෙන් ෂරීආව කෙලසන්නේ නම්, එම ඉබාදා නම් වතාවත් පවා ප්‍රතික්ෂේප කරනු ලබන බව විද්වතුන් පවසති. මෙය කෙනෙක් සිදු කරන කෙලසීම මත රැඳී පවති. උදාහරණයක් වශයෙන් නැමදුම් ක්‍රියාවට අදාළ කොන්දේසි කඩ කරන්නේ නම්, ඔහුගේ වතාවත් පිළි ගනු නොලැබේ. යම් ක්‍රියාවක් බිද්ආවක් වුයේ නම්, එය ප්‍රතික්ෂේප කරනු ලැබ, විනිශ්චය දිනයේ එය පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කරනු ලබන අතර, ඒ සඳහා ඔහු දඬුවමට ලක් විය හැක. එම බිද්ආ ක්‍රියාවට පිළිගත හැකි හේතුවක් තිබේ නම්, ඔහුගේ එම ක්‍රියාව සඳහා ත්‍යාග නොලැබෙන නමුත්, ඔහුට සමාව දෙනු ලැබ, අල්ලාහ්ගෙන් ඔහුට දඬුවම් ලැබෙන්නේ නැත.

## 9. ක්‍රියාවන් දෙකක් එක වර සිදු කිරීම

ලෞකික දෙයක හා ගනුදෙනුවක (මුආමලාත්) කෙනෙක් මූල ධර්මය වෙනස් කළේ නම් හෝ එම ගනුදෙනුවෙහි ෂරීආ නීතිය කඩකළේ නම් හෝ එම ගනුදෙනුව අවළංගු වන්නේය. උදාහරණය, තහනම් කළ දේ පදනම් කරගත් වෙළඳාම.

එක් මොහොතේ සිදු කරන එකිනෙකට සම්බන්ධ නොවන ක්‍රියා දෙකක් පිළිබඳව ඉබ්න් රජබ් මෙසේ

අදහස් දක්වයි. එක් ක්‍රියාවක් ෂරීආව උල්ළංඝනය කරන නමුත් අනිත් ක්‍රියා එසේ නොකරයි. පට ඇඳුමෙන් සැරසී කෙනෙක් කරන නැමදුම, හෝ අයිතිකරුගෙන් බලෙන් අත්පත් කර ගත් නිවසක නැමදුම් කිරීම මේවාට උදාහරණවේ. ඔහුගේ නැමදුම පිළිගනු ලබන නමුත්, වැරදි ක්‍රියාව සඳහා ඔහුගෙන් ප්‍රශ්න කරනු ලබයි.

## අවසාන නිගමනය

ඉමාම් නවවි රැස් කළ හදීස් වදන්, මුස්ලිම්වරයෙක් තම දෛනික ආගමික වතාවත් ඉටු කිරීමට සහාය වනු පිණිස ඉස්ලාමීය ප්‍රතිපත්ති සහ මිණුම් තලයක් වශයෙන් මඟ පෙන්වයි.

5 වන හදීසය, මුස්ලිම්වරයෙක් තම ක්‍රියාවන් නිවැරදි හා පිළි ගනු ලබන්නේදැයි තක්සේරු කිරීමට සහ අගයන්නට මාර්ග සලසයි.

# 6. හලාල් සහ හරාම් පැහැදිලි කිරීම

අබූ අබ්දුල්ලාහ් අන් නුඋමාන් බින් බෂීර් මෙසේ වාර්තා කරයි. "රසූල් (සල්) තුමාණෝ මෙසේ පවසනු මම ඇසුවෙමි. සැබැවින්ම, ඔබ සැමට අනුමත කරන ලද දේ කුමක්දැයි පැහැදිලිය, අනුමත නොකළ දේ කුමක්දැයි පැහැදිලිය. මේවා දෙක අතර, බොහෝ දෙනා නොදන්නා, සැක සහිත දේ තිබේ. සැක සහිත දේවලින් ආරක්ෂා

කරගන්නා ඔහුගේ දහම සහ ගෞරවය සුරක්ෂිතව රැක ගත්තේය. සැක සහිත දේවල යෙදෙන්නා, ඇත්තෙන්ම තහනම් කරන ලද දේවල යෙදෙන්නේය. රක්ෂිත භූමිය අසල තම බැටළු රංචුවට තණකොළ කවන්නා, අවසානයේ රක්ෂිත භූමිය තුළ තණ කවන්නට යෙදෙයි. පරෙස්සම්වනු මැනවි. සෑම පාලකයෙකුටම රක්ෂිත භූමියක් තිබේ. තහනම් බව අල්ලාහ් ප්‍රකාශ කළ දේ ඔහුගේ රක්ෂිත භූමිය වේ. ප්‍රවේශම් වනු මැනවි. සෑම කෙනෙකුගේම සිරුරෙහි මස් පිඩුවක් ඇත. එය යහපත් වුයේ නම්, මුළු සිරුරම යහපත් වන්නේය. එය අයහපත් වුයේ නම්, මුළු සිරුරම අයහපත් වන්නේය. එය හදවතයි.“ වාර්තා කළේ: ඉමාම් බුහාරි සහ ඉමාම් මුස්ලිම්.

## පසුබිම

මෙම හදීසය ඉමාම් බුහාරි, ඔහුගේ කිතාබුල් බුයූ නම් වෙළඳාම් කිරීම පිළිබඳ පොතෙහි පළමු වන හදීසයක් බවට සඳහන් කර ඇත. ඉමාම් බුහාරි, හදීස් වදන් වණපොත් කරන, රැස් කරන, ලේඛන ගත කරන ඒවා ග්‍රන්ථය බවට පත් කරන සහ එකතු කරන මුහද්දිත් වරයෙකු පමණක් නොව, එතුමා ඉස්ලාමීය නීතිවේදියෙකුද වන අතර, නීති සංග්‍රහ විද්‍යාව පිළිබඳව එතුමාගේ දැනුම විවිධ අංශයන්හී දැක ගත හැක. හදීස් වදන් වාර්තා කර ඇති ක්‍රම වේදය, හදීස් ග්‍රන්ථ කෙරෙහි එතුමා තුළ තිබෙන ෆික්හ් පිළිබඳ දැනුම සඳහා සාක්ෂි දරයි.

ඉමාම් බුහාරිගේ තිතාබුල් බුයූ නම් ග්‍රන්ථයෙහි මෙම හදීස් වදන මුලින්ම සඳහන් කිරීමට හේතු කිහිපයක් තිබේ. භාණ්ඩ වෙළඳාම් කිරීමේදී මෙවැනි සැක සහිත කරුණු පැන නගින්නට ඉඩ තිබේ. ඉමාම් වරයාගේ පියා වෙළඳෙක් වු අතර, වසර හතළිහක් මුළුල්ලේ සැක සහිත

කිසිවක් මිල දී නොගත් බව වරක් තම පියා පැවසුවා යයි ඉමාම් වරයා දැන්විය.

තම පියාගේ අදහස් වල බලපෑම් වලට ඉමාම් බුහාරි ලක් වූ බව පෙනේ. එතුමාගේ පියා නිත්‍යානුකූල (හලාල්) බව දන්නා දේ පමණක් නිවස තුළට ගත්තේය. එම පවුල කෑමට, බීමට, පාවිච්චියට ගත් සියල්ල හලාල් දේ පමණි. සැක සහිත කිසිවක් නිවස තුළට නොගත්තේය. ඉමාම් බුහාරි හැදී වැඩුණේ මෙවැනි පරිසරයක් තුළයි. එතුමාගේ පියා ඉදිරිපත් කළ සියලු දුආ (ප්‍රාර්ථනා) අල්ලාහ් විසින් ඉෂ්ට කරනු ලැබුවේ, සැක සහිත කිසි දෙයක් ඔහු පරිහරණය නොකළ හේතුවෙන් බව කවුරුත් කීහ. මෙවැනි පරිසරයක ජීවත්වූ හේතුවෙන් ඉමාම් බුහාරි මෙම හදීසයට මුල් තැන දුන්නේ මන්දැයි වටහා ගත හැක.

ඉමාම් බුහාරි, හදීස් පිළිබඳ උසස් දැනුම ලත් මුහද්දිත් වරයෙකු බව කොයිකවුරුත් දනිති. හදීසයක් වාර්තා කළ අයගේ සත්‍යභාවය මුහද්දිත්වරයෙක් දැන සිටිය යුතුයි. මෙම දැනුම ඉමාම් බුහාරිට තිබුණි.

## මෙයින් ඉගෙන ගන්නා පාඩම

### 1. ක්‍රියාවන්හි වර්ගඃ

සියලු ක්‍රියාවක්ම අනුමත කළ ක්‍රියා හෝ තහනම් කළ ක්‍රියා යන වර්ග දෙකකට අයත් වන බව විද්වතුන් පවසති. සැක සහිත ක්‍රියා යන වර්ගයට අයත් වන්නේ ඉතාමත් සුළු කොටසක් පමණි.

### 2. උපමිතිය උපයෝගි කිරීම

රසූල් (සල්) තුමාණෝ තම නිවේදනය පවසනවිට, එළුවන්ට තණකොළ කවන්නා, අවසානයේ රක්ෂිත භූමිය තුළ තණ කොළ කවන්නට යෙදෙයි. යන වාක්‍ය තුළින් උපමිතිය පෙන්නුම් කළේ, සැක සහිත ක්‍රියා, නීති විරෝධි ක්‍රියාව හා සම්බන්ධ වන බවයි.

## 3. අල්ලාහ් ව උත්කර්ෂයට පත් කිරීමේ වැදගත්කම

අල්ලාහ්ව උත්කර්ෂයට පත් කිරීමේ වැදගත්කම ගැන මෙම හදීසය පැහැදිලි කරයි. මෙහිදී අල්ලාහ්ගේ නියෝග සහ විධානය ගැන පැවසීමද අඩංගු වේ. ඒසමඟ අල්ලාහ් තහනම් කළ දේවලින් ඉවත් වීම සහ පොරොන්දුව ඉටු කිරීමද අයත් වේ. ඔබ කළ සුළු පාපය ගැන නොබලා, ඔබ අකීකරු වූ අල්ලාහ්ගේ මහිමය ගැන සිතා බලන්නයි ඉමාම්වරයෙක් පවසයි. පාපය කෙතරම් කුඩා වුවද, එය සිදු කිරීමෙන් කෙනෙක් අල්ලාහ්ගේ අණට අවනත නොවූ බව පැහැදිලි වේ. මෙම ක්‍රියාව අල්ලාහ්ගේ උත්කර්ෂයට පත් කිරීමේ ක්‍රියාවට අකීකරු වීමක් බව සැලකේ. අල්ලාහ්ව උත්කර්ෂයට පත් කිරීම තව්හීද් නම් ඒකදේව වාදයේ මූල ධර්මයක් වේ.

## 4. තව්හීද් නම් ඒකදේව වාදයේ ප්‍රතිපත්ති

පළමුවන හදීසයේ සඳහන් කළ ආකාරයට, උතුම් ක්‍රියා හෝ තව්හීදයේ ප්‍රතිපත්ති සිදු වන්නේ කෙනෙකුගේ සිතෙහිය. මෙම හදීසයේ අවසානයේ සිත ගැන සඳහන් කරන්නේ මේ හේතුවෙනි. සිත හා මෙම හදීසය අතර තිබෙන සම්බන්ධකම කුමක්ද? අල්ලාහ්ට පැසසුම් කරන්නේ සිතෙන් ය. එමෙන්ම, තහනම් දැයින් ඉවත් වන ලෙස පවසන්නේ සිතය. ශක්තිමත්, නිරෝගී, දුබලකමින් තොර වු හා ඊමාන් සහිත සිතක් හරාම් ක්‍රියාවකට, එනම් මුහර්රමාත් නම් පාප ක්‍රියා සහ මක්රූහාත් නම් අප්‍රසන්න ක්‍රියාවක් සිදු කිරීම වළක්වයි. සැක සහිත දේවලින් ඉවත් වන්නට හැකි වන්නේ අල්ලාහ් කෙරෙහි ආදරය හා බිය බැතිමත් කෙනෙකුගේ ශක්තිමත් හා නිරෝගී සිතකට පමණයි. එහෙත් රෝගාතුර වු හේතුවෙන් ඊමානය දුබල වු සිතක්, සැක සහිත දේ වටා ගොස් එය කෙසේ හෝ ඉටු කරන්නට යෙදෙයි. මෙවැනි සිතක් සහිත කෙනෙක් ක්‍රමක් ක්‍රමයෙන් මක්රූහ් ක්‍රියා වන්හි යෙදී

අවසානයේ හරාම් ක්‍රියාවන් හි පවා පා තබන්නට ඉඩ තිබේ.

මෙයට හොඳම නිදසුනක් වන්නේ, අනිවාර්යය සලාහ්ව නියමිත වෙලාවට ඉටු නොකිරීම මක්රූහ් වන අතර, එය අත හැර දැමීම හරාම් ක්‍රියාවකි. සිතෙ හි තත්ත්වය අනුව මෙම ක්‍රියාවන් සිදු වනු ඇත. මස්ජිදයේ සමූහයක් වශයෙන් මුස්ලිම්වරු නැමදුම ඉටු කරනු ඔබ දකින නමුත්, එක් එක්කෙනාගේ සිතෙහි තත්ත්වය වෙනස් බව අපි දනිමු. මෙහිදී අල්ලාහ්ගේ සිහියෙන් සිටින්නේද, නොසිටින්නේද යනු සිතෙහි පිරිසිදුභාවය නිර්ණය කරන බව දැන ගත යුතුයි. මෙම යථාර්ථය අපි අවබෝධ කර ගත යුතු අතර, අන් අය සමඟ තරඟ කර යුත්තේ යහ කියාවන් හි පමණී. අපේ සිත ශක්ති සම්පන්නව තබා ගැනීමට අපි වෙහෙස දැරිය යුතුයි.

මුහම්මද් රසූල් (සල්) තුමාණෝ වරක්, අබූ බක්කර් සිද්දීක් (රලි) තුමාගේ ඊමානය ඉතිරි සියලු දෙනාගේ ඊමානයේ එකතුව හා සමාන බව කීය. අබූ බක්කර් (රලි) තුමාගේ ඊමානය තරාදියේ එක තට්ටුවකද ඉතිරි සියලු දෙනාගේ ඊමානය තරාදියේ අනිත් තට්ටුවේද තැබුවේ නම්, අබූ බක්කර් (රලි) තුමාගේ ඊමානය බර වැඩිය. අබූ බක්කර් (රලි) තුමාගේ සිතෙහි තිබෙන යම් දෙයක් අන් අයට වඩා කැපී පෙනෙන හේතුවෙන් එතුමා අස් සිද්දීක් (සත්‍ය පවසන්නා) ලෙස හඳුන්වනු ලැබීය. “මම ඉස්ලාම් ගැන කෙනෙකුට පැවසුවහොත්, ඒ තැනැත්තා තුළ සුළු දෙගිඩියාවක් පැන නැගිය හැකි නමුත්, අබූ බක්කර් (රලි) එයට හාත්පසින් වෙනස් වූ කෙනෙකි. ඔහුට ඉස්ලාම් ගැන පැවසූ විගස අල්ලාහ් ගැනද මම රසූල්වරයෙකු බවද ඔහු විශ්වාස කළේය.“ යනුවෙන් රසූල් (සල්) තුමාණෝ පැවසුහ. මේ හේතුවෙන් ප්‍රථම ඛලීෆා බවට පත්වීමට ඔහු සුදුසුකම් ලැබීය.

ඉහත සඳහන් කරුණු මත, මුස්ලිම්වරයෙක් තම සිත පිළිබඳව ප්‍රවේශමෙන් කටයුතු කළ යුතුයි. ඒක දේවවාදයේ මූලික ප්‍රතිපත්තිය වන අල්ලාහ්ට ආදරය කිරීම, ඔහු ගැන බිය බැතිමත් වීම සහ ඔහු මත සම්පූර්ණයෙන් රැඳී සිටීම වැනි කරුණු සමඟ ඔහු වෙත පමණක් විශ්වාසය තැබීම යන කාර්යද ඉටු කළ යුතුයි. ඒ සමඟ තම සිත තණ්හාව හා උඩංගුව වැනි අයහපත් කරුණු වලින් නිදහස්ව තබා ගන්නට වග බලා ගත යුතුයි.

## 5. සිත

පාප ක්‍රියාවන් කරන ජනයා, පාප ක්‍රියා කරන්නට අන් අයවද පොලඹවති. මුස්ලිම්වරයෙක් තම සිත ගැන ආරක්ෂා නොවුයේ නම්, ඔහුද පාප ක්‍රියාවන් හී යෙදෙන්නට ඉඩ ඇත. එවැනි දෙයක් ගැන ඇතැම්විට ඔහු අවබෝධ කර ගන්නේද නැත.

රසූල් (සල්) තුමාණන්ගේ හදීස් වදන් හී ඇතැම් ක්‍රියාවන් කරන ලෙස පොළඹවන අතර, ඇතැම් ක්‍රියා නොකරන ලෙස අවවාද කරන බව දැක ගත හැක. මේවා හලාල් සහ හරාම් කරුණු බව අවබෝධ කර ගත යුතුයි. ඒවා සමඟ සැක සහිත ක්‍රියා ගැනද සඳහන් කර ඇත. මේ නිසා, සැක සහිත කරණු පිළිබඳව අපි විශේෂයෙන් ප්‍රවේසම් වී, ඒවායින් ඉවත් විය යුතුයි. මේ මගින් අපේ සිත් ශක්තිමත්ව තබා ගත හැකි වන බවද දැන සිටිය යුතුයි.

## 6. සැක සහිත දේවලින් වැළකී සිටීම

මෙම හදීසය තුළින් රසූල් (සල්) තුමාණෝගේ ඉගැන්වීම් කෙතරම් එලදායි දැයි දැන ගත හැක. මෙම හදීසය ආහාර භාණ්ඩ වෙළඳාමට බොහෝ අදාළය. බටහිර රටවලින් ආනයන කරන ආහාර වර්ගයේ ලෙසිතින් නම් ද්‍රව්‍ය භාවිත කරන බව එහි ආවරණයෙහි

සඳහන් කරයි. මෙය පිළිබඳ අප විශේෂ සැලකිලි දැක්විය යුතුයි. විස්කෝතු, ටින් ආහාර, ටින් පලතුරු. සෝයා වැනි හලාල් දේවලින් ලබා ගත් ලෙසිතින් භාවිතා කර ඇති බව සඳහන් නොවුයේ නම්, එම ලෙසිතීනය අධික වියදමක් නැති ඌරාගෙන් ලබා ගත් බවට අප දැන ගෙන, එවායින් වැළකී සිටිය යුතුයි. මෙවැනි තවත් ද්‍රව්‍ය එමල්සිෆයර් නම් එකකි. මේවායින් ද අපි වැළකී සිටිය යුතුයි.

අප කෑමට ගන්නා ආහාර හරාම් වුයේ නම්, අපේ සලාහ් අල්ලාහ් විසින් පිළිගනු ලබන්නේ නැති බව තවත් හදීසයක් පවසයි. අද වෙළඳ පොළේ අලෙවි කරන ආහාර වල රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වී ඇත. ඒවා කෑමට අනුමත තිබෙන නමුත්, අපේ සෞඛ්‍යට ඒවා අහිත කරන අවස්ථාවන්ද ඇත. එනිසා මුස්ලිම්වරයෙක් ආහාරයට ගන්නා එවැනි භාණ්ඩ සීමා කර තම සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගත යුතුයි.

## 7. සිතෙහි තත්ත්වය

අපගේ ඊමානය ගැන අපි සැලකිල්ලෙන් සිටින්නේ නම්, සැක සහිත දේවලින් ඉවත් වී අපේ සිත් යහපත් තත්ත්වයක තබා ගන්නට වග බලා ගත යුතුයි.

රාත්‍රියේ දීර්ඝ වේලාවක් අවශ්‍යතාවක් නොමැතිව අවදි වී සිටීම සුදුසු නැති (මක්රූහ්) බව ඇතැම් ආගමික විද්වතුන් අදහස් දක්වති. රාත්‍රියන් හි අවදි වී සිටීමේ කිසිදු වරදක් නොමැති නමුත්, අලුයම අනිවාර්යය ෆජ්ර් සලාතය මස්ජිදයේ සමූහයක් වශයෙන් ඉටු කිරීම පිණිස අවදි විය නොහැකි වන බව මෙම විද්වතුන් පවසති.

## 8. නබි (සල්) තුමාට සලවාත් කීම.

නිතරම සලවාත් කීමෙන් අපේ ඊමානය ශක්තිමත් කර ගත හැක. මුහම්මද් නබි (සල්) තුමාණෝ, “මසුරු මිනිසා

කවුරුන් දැයි ඔබ දන්නාවාද? ඔහු මගේ නම සඳහන් කරන විට සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් යනුවෙන් සලවාත් නො පවසන කෙනෙක්." යනුවෙන් පැවසුහ.

තවත් හදීසයක,"කෙනෙක් සලවාත් අන් නබි පවසන්නේ නම්, අල්ලාහ් ඒ මිනිසාට සලාවාත් දහයක් ආශීර්වාද කරන්නේය" යනුවෙන් රසූල් සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමා පැවසුහ. එනිසා එක කුසල් ක්‍රියාවක් ඉටු කිරීමෙන් ත්‍යාග දහයක් ලබා ගත හැකි පහසු මාර්ගයද මෙය වේ.

## අවසාන නිගමනය

අපගේ දෛනික ජීවිතයේ නොයෙකුත් සැක සහිත කරුණු වලට මුහුණ දෙන්නට සිදු වනු ඇත. එම අවස්ථාවන් හි ආරක්ෂා වීමට මෙම හදීසය මඟ පෙන්වයි. මෙම ප්‍රශ්න වලින් මිදී සිත ආරක්ෂා කර ගනු පිණිස, හයා නම් විලිබිය, මුරාකබාහ් නම් සිය ක්‍රියාවන් කෙරෙහි ගණන් ගැනීම, මුහාසබාහ් නම් වගකීම, දික්ර් නම් අල්ලාහ්ව සිහි කිරීම සහ රසූල් තුමාණන්ට සලවාත් කීම යන පියවර සහය වනු ඇත. ඒ තුළින් සැක සහිත දේ වලින් වැළකී සිටිය හැකි යැයි මෙම හදීසය පවසයි.

# 7. නසීහා

අබි රුකෙයියා තමීම් ඉබ්න් අව්ස් අද් දාරි (රලියල්ලාහු) මෙසේ දන්වා ඇත. “රසූල් (සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම්) ආගම යනු නසීහාවේ (අද් දීන් අන් නසීහතු) යනුවෙන් පැවසුවේය. එය කිනම් පුද්ගලයින් සම්බන්ධයෙන් දැයි අපි විමසුවෙමු. අල්ලාහ්ට සහ ඔහුගේ ග්‍රන්ථයට සහ ඔහුගේ රසූල්තුමාණන්ට සහ මුස්ලිම්වරුන්ගේ නායකයන්ට සහ ඔවුන්ගේ පොදු ජනතාවට යැයි නබි (සල්) තුමාණෝ පිළිතුරු දුන්හ.“ වාර්තා කළේ මුස්ලිම්.

**පසුබිම:-**

නසීහා යන අරාබි පදය තුළ නොයෙකුත් සංකල්ප අඩංගු වී තිබෙන හෙයින් එයට සමාන තවත් වචනයක් වෙනත් භාෂාවෙ හි නැත. අවංක පාක්ෂිකභාවය - එනම් මුලාව හෝ රැවටිලි වලින් තොරවු අවංකකම යනුවෙන් ඇතැම් අය අදහස් දක්වන අතර එම තේරුම එක් කොටසක් පමණි. නසීහා දීමට අදහස් කරන තැනැත්තා සඳහා, අරමුණින් හා ක්‍රියාවෙන් උතුම් දෙයක් පැතීම යනුවෙන් ඉමාම් ඉබ්න් අල් සාලහ් තුමා අදහස් දක්වයි.

මෙම හදීසය ඉතාමත් ගැඹුරු අදහස් ප්‍රකාශ කරයි. මෙම කෙටි වාක්‍ය මගින් නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ ඉස්ලාමයේ සාරය පෙන්වා දී ඇති බව ෂෙයික් ජමාල් අද්දීන් සරබෝසෝ පවසයි. මේ අනුව, ඉස්ලාම්, ඊමාන් සහ ඉහ්සාන් යන වැදගත් කරුණු සියල්ල නසීහා යන වචනයෙහි ඇතුළත් වී තිබේ.

## මෙයින් ඉගෙන ගන්නා පාඩම්

### i. අල්ලාහ් කෙරෙහි නසීහා

නසීහා ප්‍රථමයෙන් සර්ව බලධාරි වන අල්ලාහ් කෙරෙහි තිබිය යුතුයි. සෑම මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ ප්‍රධාන අරමුණ වන්නේ සිය ගැතිභාවය ඉහ්සාන් නම් උසස් අයුරින් ඉෂ්ට කිරීම වේ. අනිවාර්ය නැමදුම් තුළින් පමණක් නොව, තවත් අමතර නැමදුම් ක්‍රියා තුළින් සර්ව බලධාරි අල්ලාහ්ට සමීපවීමට උත්හාස දැරීම මෙහි අඩංගුය. හරාම් සහ මක්රූහ් ක්‍රියාවන් ගෙන් ඈත්ව ඉවත් වීමට කිසිවෙක් අමතක නොකළ යුතුයි.

අල්ලාහ්ට නසීහා කිරීමෙහි පහත සඳහන් කරුණුද අඩංගු වේ.

- අල්ලාහ් කෙරෙහි ස්ථිර විශ්වාස තැබීම සහ අන් කිසිවෙක් ආදේශ නොකිරීම.

- අල්ලාහ්ගේ ගුණාංගයන් සහ අළංකාරවත් නාමයන් හි විශ්වාසය තැබීම.

- අල්ලාහ්ගේ නියෝගයට කීකරු වීම.

- අල්ලාහ්ගේ නියෝගය පිළිපැදීම සහ තහනම් කළ දේ වලින් ඉවත් වීම

- සෑම තත්ත්වයකම සහ සෑම අවස්ථාවකම අල්ලාහ්ව සිහි කිරීම සඳහා ඉතාමත් සුදුසු ක්‍රියාවන් හි යෙදීම.

- ද්‍රව්‍ය, පුද්ගලයා, ක්‍රියා හෝ කථා යන කරුණුවල, අල්ලාහ් කැමති දේ වලට ප්‍රිය කිරීම සහ අල්ලාහ් අකැමැති දේ අප්‍රිය කිරීම.

- අල්ලාහ් අපහට ලබාදුන් ඔහුගේ ආශීර්වාද සියල්ල අවබෝධ කර ගෙන, ඒවා සඳහා අල්ලාහ්ට නිසියාකාරව කෘතඥතාව දැක්වීම.

අති උතුම් අල්ලාහ් කෙරෙහි නසීහා දක්වන්නට කැමති කෙනෙක් නිවැරදි දේවසංකල්පය මත රැඳී සිටීම අත්‍යවශ්‍යයි. එනම්, අල්ලාහ්ගේ අයිතිවාසිකම් නිසියාකාරව ඉටු කිරීමට අපොහොසත්ව හෝ ඒ සඳහා සමාව ලැබ තිබියදී පවා තම යුතුකම ඉටු කිරීමට වෙහෙස දැරීම. එවැනි කෙනෙක් තම යුතුකම ඉටු කිරීමට අපොහොසත් වුවත්, නිවැරදි නසීහාවෙහි (අරමුණෙහි) සිටින බව කිව හැක.

හදවතෙහි ක්‍රියාවන් වන අල්ලාහ්ගේ මෛත්‍රිය කෙරෙහි බලා පොරොත්තුව, බියබැතිමත්කම සහ ඔහුගේ රැකවරණය පැතීම සමඟ, ශරීරයෙන් සිදු කරන ක්‍රියාවන් වන නැමදුම, සකාත් යන සියල්ල අල්ලාහ් කෙරෙහි තබන නසීහා වෙහි අඩංගු වේ.

මෙම නසිහා නම් සංකල්පයේ අවංකකම ඉතා වැදගත් වන අතර, සියලු කටයුතු ඉඛ්ලාස් නම් පදනම මත සිදු කළ යුතුයි.

## ii. අල්ලාහ්ගේ ග්‍රන්ථයෙහි නසීහාවෙහි පහත සඳහන් කරුණු අඩංගු වේ.

- අල් කුර්ආනය අල්ලාහ්ගේ වචන යනුවෙන්ද, එය මිනිස් වචනයට සමාන නොවන බවද විශ්වාස කිරීම.

- තම හැකියාවට එකඟව කුර්ආන් වැකි කියවීම, සහ එයට එකඟව ක්‍රියාවේ යෙදීම.

- එහි තිබෙන පාඩම්, අවවාද සහ උපමාකථා යන දේ ඉගෙන ගැනීම.

- අල් කුර්ආනය වෙත විශ්වාසය තබන ලෙස ඇරයුම් කිරීම.

- වෙනස් කිරීම් හෝ විකෘති කිරීම් සිදුවීමෙන් කුර්ආනය රැකබලා ගැනීම.

- අල් කුර්ආනයට එරෙහිව ඇතැම් අය නගන බොරු චෝදනාවලට සුදුසු පිළිතුරු සපයා එය ආරක්ෂා කිරීම.

- අල් කුර්ආනයට දැක්විය යුතු ගෞරවය නිසි ලෙස දැක්වීම. එනම්, කුර්ආන් වැකි තිබෙන කඩදාසි කැබැලි මිනිසුන්ගේ පයට පෑගෙන අයුරින් විසි වී තිබෙනු දුටුවහොත්, ඒවා සුදුසු අයුරින් ඉවත් කිරීම.

## iii. රසූල් (සල්) තුමාණන් කෙරෙහි නසීහා

- නබි (සල්) තුමාණන්ට පහල කරන ලද නිවේදනය කෙරෙහි විශ්වාසය කිරීම.

- නබි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණන්ට අනාවරණාය කරන ලද සියල්ල අල්ලාහ් විසින් දෙන ලද බව විශ්වාස කිරීම.

- අප කෙරෙහි සහ අප පවුලේ අය කෙරෙහි තිබෙන ආදරයට වඩා අධිකව නබි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් කෙරෙහි ආදරය දැක්වීම. අල්ලාහ්ට පසුව අප ආදරය හිමිවන්නේ එතුමාටයි.

- මෙම ආදරය තුළින් එතුමා ගෙන ආ නියෝගයන්ට අවනත වීම.

- නබි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණන්ගේ සම කාලීන සහාබාවරු එතුමාට අවනත වී, ආරක්ෂා සැපයූ අතර එතුමාට ගෞරවයද දැක්වූ බව විශ්වාස කිරීම.

- එයට පසුව පැමිණි මුස්ලිම්වරු, සැබෑ සුන්නාහ් සියල්ල පිලිපැද, එතුමාගේ නියෝගයන්ට අවනත වූ ආකාරය අධ්‍යයන කිරීම.

- නබිතුමාගේ නාමය පවසන සෑම විටම, සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් යනුවෙන් සලවාත් පැවසීම.

- වචනයක්, ක්‍රියාවක් හෝ ඕනෑම දෙයක් පිළි ගැනීමට, එතුමාගේ සුන්නාහ්ව මිනුම් දණ්ඩක් වශයෙන් උපයෝගි කිරීම.

- ආගම (දීන්) සම්බන්ධව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් නායකයා බවද, එතුමාගේ වචන ආඥාවක් බවද, එයට එකඟවන්නේ නම් පමණක් අන් අයගේ වචන පිළිගත හැකි බවද විශ්වාස කිරීම.

- නබි සල්ලල්ලාහු අලෙහි ව සල්ලම් තුමාණන්ට ආදරය කරන අය කෙරෙහි ආදරය කිරීම සහ එතුමාට පිළිකුල් දක්වන අය අප්‍රිය කිරීම.

- නබි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණන්ගේ සුන්නාව අධ්‍යයනය කිරීම, පහදා ගැනීම, ඉගැන්වීම සහ ප්‍රචාර කිරීම වැනි ක්‍රියා තුළින් ඒවා යළි ප්‍රාණවත් කිරීම. එහෙත් මෙම ක්‍රියාවෙහි යෙදෙන පුද්ගලයා, අන් අයට කාරුණිකව සහ ගෞරවයෙන් ඇරයුම් කළ යුතු අතර අනවශ්‍ය ගැටුම් හෝ වාද විවාද වලට පැටලිය නොයුතු බව ඉමාම් අහ්මද් පවසයි. අද මුස්ලිම්වරු බොහෝ දෙනෙක් සුන්නාහ්ව යනු කුමක්ද, මුස්ලිම්රයෙකුගේ ජීවිතයේ එහි වැදගත්කම කුමක්ද යනුවෙන් මනා අවබෝධ නොමැතිව සිටින හෙයින්, මේවා ගැන කථා කරන විට අළංකාරවත් වචන භාවිතා කළ යුතුයි. අන් අය කිපෙන ආකාරයෙන් කථා කළ විට, ඔවුන් සුන්නාහ්ව පිළිකුල් කරන්නට ඉඩ තිබේ.

අද මුස්ලිම්වරු අතර බිද්ආ නම් වැරදි චතාවත් බොහෝමයක් තිබෙන අතර ඒවා ඉවත් කිරීමට ඉතාමත් සුදුසු මාර්ගය සුන්නාහ්ව යළි ප්‍රාණවත් කිරීමයි. සුන්නාහ් ගැන නොදන්නා විට සහ ඒවා තම ජීවිතයේ අනුගමනය නොකරන විට බිද්ආව හිස ඔසවන බව විද්වතුන් පවසති. බිද්ආ ක්‍රියාව හෙලා

දැකීමෙන් සිදු වන්නේ වෛරය හට ගැනීමයි. ඒ වෙනුවට අළංකාරවත් වචන යොදා සුන්නාහ්ව උගන් වන්නේ නම්, මේවා ගැන නොදන්නා අයගේ සිත් දිනා ගැනීමට හැකිවනු ඇත. සවන් දෙන්නා, සුන්නාහ්වේ අළංකාරය හා ප්‍රයෝගික භාවය දැක ගනී. තම ක්‍රියා සියල්ල සුන්නාහ් නම් මිනුම් දණ්ඩෙන් මැනීමට ඔවුන් පටන් ගන්නා විට, බිද්අා ක්‍රමයෙන් නැති වී යයි ඉන්ෂා අල්ලාහ්.

සුන්නාහ් ගැන උගන්වන විට, සුළු වැරදි ගැන වැදගත්කම නොදක්වන්නට වග බලා ගත යුතුයි. සුන්නාහ් විවිධ මට්ටමේ වර්ග කර ඇති හෙයින්, මූලික හා ආරම්භක මට්ටම ගැන මනා අවබෝධයක් අපහට තිබිය යුතුයි. සුන්නාහ්වෙහි මූලික මට්ටම ගැන අවබෝධය ලබා දිය යුතු අතර, ඒවා අගය කරන්නට හා එයින් සතුට ලබන්නටද මඟ පෙන්විය යුතුයි.

- නබි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණන්ගේ පවුලේ අය සහ සගයන් කෙරෙහි ආදරය දැක්වීම.

මුස්ලිම්වරුන්ගෙන් පිරිසක්, ඇතැම් සහාබා වරුන්ට පමණක් ප්‍රිය කරන අතර, තවත් පිරිසක් වෙනත් සහාභාවරුන් ප්‍රියකරති. ඉස්ලාමයෙන් බැහැර ගිය ඇතැම් පිරිස් ඇතැම් සහාබා වරුන්ට ප්‍රිය මනාපය නොදක්වන අතර, අනිකුත් මුස්ලිම් වරුන්ටද එසේ ප්‍රිය මනාපය නොකරන ලෙස පවසති. මෙමගින් සුන්නාහ්ව ප්‍රතික්ෂේප කරන්නට සිදු වන බව ඔවුන් නොදනිති. ඇතැම් මුස්ලිම්වරු, ඔවුන්ගේ ඉමාම්ගේ මාර්ගයෙන් ඉගෙන ගත් සුන්නාහ් පමණක් විශ්වාස කරති.

- සුන්නාහ්ව අනුගමනය කරන, රැක බලා ගෙන, ඒවාට යළි ප්‍රාණවත් කරන්නට මහන්සි ගන්නා පිරිසට සහාය දැක්වීම.

## 4. මුස්ලිම් නායකවරුන්හට නසීහා

මුස්ලිම් නායකයන් යන්න ආගමික විද්වතුන් සහ සියලු මට්ටමේ පාලකයන් ද ඇතුළත්ය. කෙනෙකුගේ පදවිය හෝ බලය මත වෙනස්කම් නොතකා, සියලු නායකයින්ට නසීහා දිය යුතුයි. ඉස්ලාමයේ නීතියට ඉහළින් කටයුතු කළ හැකි කිසිවෙක් නැත. එමෙන්ම උපදෙස් අවශ්‍ය නොමැති කිසිවෙක් නැත. රසූල් සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණෝ අවශ්‍යතාව හා අවස්ථාවට අනුව උපදෙස් පැතුහ. හෑන්දක් සටනේදී, නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ උපදෙස් ලබා ගත් අතර, බද්ර් සටනේදී සහාබාවරු ස්වේච්ඡාවෙන්ම උපදෙස් දුන්හ. නසීහා ලැබීම බලයේ සිටින නායකයන්ට ප්‍රයෝජනවත් එකකි. මේ හේතුවෙන් පාලකයෙක් හෝ නායකයෙක් හෝ විද්වතෙක් හෝ, අවංක උපදෙස් ලැබීමට සූදානම්ව සිටිය යුතුයි.

මුස්ලිම් නායකයෙකුට දෙන නසීහාවෙහි පහත සඳහන් කරුණු අඩංගුවේ.

- හොඳ දැයකට හා ප්‍රයෝජනවත් දැයකට සහය වීම.
- නිවැරදි දෑ හි නායකයින්ට අවනත වීම.
- නායකයෝ වැරදි කළහොත් හෝ අමතක කළහොත් ඔවුන්ට මතක් කිරීම.
- අපි අකැමැති දේ ඔවුන් සිදු කළේ නම්, ඉවසිලිමත් වීම. අපි නිතර ඉවසිලිවන්තව නසීහා දිය යුතු අතර,

එයට පටහැනිව අපි ක්‍රියා කළහොත්, මුස්ලිම් සමාජයේ අස්ථාවර භාවයක් පැන නගිනු ඇත.

- ඔවුන් බලය වැරදියාකාරව භාවිතා කළේ නම් එයට එරෙහිව රංචු ගැසී කැරලි කිරීම නොව අසාධාරණයට එරෙහිව ජිහාද් කිරීම.

- ඔවුන්ට යහමඟ හා බැතිමත්කම දෙන ලෙස අල්ලාහ් වෙත දුආ කිරීම.

- ඔවුන්ට උපදෙස් දීම සඳහා නිවැරදි ක්‍රමය, මාධ්‍ය හා පිළිවෙළ තෝරා ගැනීම.

  නායකයන්ට නසීහා දීමේදී එක්තරා ක්‍රමයක් අනුගමනය කළ යුතු බව විද්වතුන් පවසති.

- කෙනෙක් යහපත් චේතනාවකින් ඉදිරිපත් විය යුතුයි.

- නායකයන්ට සුදුසු අයුරින් ගෞරවය දක්වා එම කාර්ය ඉටු කළ යුතුයි.

- අමිහිරි වචන භාවිතා කිරීම සහ ඔවුන් අසීරු තත්ත්වයට පත් කිරීමෙන් වැළකිය යුතුයි. අපේ අරමුණ එම අවස්ථාවෙහි අපේ වැදගත්කම පෙන්වීම නොව නිවැරදි උපදෙස් දීම පමණකි.

- සමාජයට හෝ මාධ්‍යට පෙන්වීම සඳහා ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකර අප්‍රසිද්ධියේ නසීහා දීම.

නායකයෙකු විසින්, වැරදි ක්‍රියාවක් (මඃසිය්යා) හෝ ෂරීආවට පටහැණි කරුණක් සඳහා නියෝගයක් දෙනු ලැබුණේ නම්, එම නියෝගයට කිසි විටකත් කීකරු වියයුතු නැත. එහෙත් එම අකීකරු වීම කලහකාරී ලෙස

ප්‍රකාශ නොකළ යුතුයි. ඇත්ත වශයෙන් අපගේ අරමුණ නායකයාට ඔහුගේ ක්‍රියාව වැරදි එකක් බවද, එවැනි දැයකට අපේ සහයෝගය පැතිය නොයුතු බවද පෙන්වා දීමයි.

ආගමික විද්වතුන් ගෙන් දැනුම ලැබීම එවුන් කෙරෙහි අපේ නසීහාවේ.

- ඔවුන්ගේ අදහස් නිවැරදි සාක්ෂි හා සාධක මත පදනම් වන්නේ නම් පමණක් ඔවුන් අනුගමනය කිරීම.

- ඔවුන්ගේ වැරදි සෙවීමට හෝ එය ප්‍රසිද්ධ කිරීමට අපට අවශ්‍ය නැත. ආගමිත විද්වතුන්ගේ වැරදි සෙවීමට හා ඒවා ප්‍රසිද්ධ කිරීමට ඇතැම් අය වෑයම් කරති. ආගමික විද්වතුන් ද අල්ලාහ්ගේ බැතිමත් අය වන හෙයින් එවැනි ක්‍රියාවෙන් අපි වැළකී සිටිය යුතුයි. එපමණක් නොව මෙමගින් සමාජයේ ආරවුල් හට ගන්නටද ඉඩ ඇත.

- ආගමික විද්වතුන් පසු පස අන්ධ භක්තිකයන් ලෙස යෑමද වැරදි ක්‍රියාවකි.

  කෙසේ වෙතත්, ආගමික විද්වතුන්ට අගෞරවය නොකළ යුතුයි.

## 5. මුස්ලිම් සමාජයට නසීහා

පහත සඳහන් කරුණු එහි අඩංගුවේ.

- අන් මුස්ලිම් වරුන්ගේ අයිතීන්ට ගරු කිරීම සහ අප වගකීම ඉෂ්ට කිරීම. මෙම වගකීම විවිධාකාරයි. එනම්, දෙමාපියන්, දරුවන්, ඥාතීන්, අසල්වැසියන් යනාදී වශයෙනි. ඔවුන් දුටු විට ඔවුන්ට ආචාර කිරීම,

ඔවුන්ගේ ලෙඩ දුක් ගැන සෙවීම, ඔවුන් වෙනුවෙන් දුආ කිරීම, ඔවුන් උපදෙස් පැතූ විට අවංකව උපදෙස් දීම, කෙනෙක් මරණයට ලක් වුව හොත් සලාතුල් ජනාසා නැමදුම ඉටු කිරීම ඒවායින් සමහරක් වේ.

මේවාට අමතරව:

- සෑම මුස්ලිම්වරයෙකුටම ආදරය දැක්වීම.
- සියලු මුස්ලිම් වරුන් කෙරෙහි සැලකිලිමත් වීම.
- මුස්ලිම් වරුන්ට උදව් උපකාර කිරීම.
- මුස්ලිම් සමාජය රැක බලා ගැනීම.

## අල් වලා සහ අල් බරා

අල් වලා යන පදය, අල්ලාහ් වෙනුවෙන් එකිනෙකා කෙරෙහි දක්වන ආදරය, සැලකිලි හෝ සම්බන්ධකම යන අර්ථයට වඩා ගැඹුරුයි. එම ආදරය පදනම් කර ගෙන සිදු කරන ක්‍රියාවද එහි අඩංගුය. ආදරය නොකරන්නෙකුට කිසිවෙක් සැලකිලි දක්වන්නේ නැත. සැලකිලිමත් නොවන්නේ නම් උදවු කරන්නේද නැත. අද මුස්ලිම්වරු අන් මුස්ලිම් ජනතාව ගැන සැලකිලි නොදක්වන්නේ නම් එයට හේතුව, අල් වලා පිළිබඳව ඔවුන්ගේ විශ්වාස අසම්පූර්ණ බවයි. අපි අන් මුස්ලිම්වරුන්ට, විශේෂයෙන් අසරණ මුස්ලිම් ජනතාවට ආදරය දැක්විය යුතු අතර, ඒ තුළින් ඔවුන් ගැන සැලකිලිමත් වී, ඔවුන්ට උදව් කළ යුතුයි. ඔවුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කිරීමල ඔවුන් වෙනුවෙන් අපට කළ හැකි අවම උදව්ව බව විද්වතුන් අදහස් දක්වති.

අල් වලා යන වචනයේ විරුද්ධ වචනය අල් බරා වේ. එහි අර්ථය දේව විශ්වාස නොමැති හා අසත්‍ය පවසන අයගෙන් ඉවත් වී සිටීම යනු වේ. මෙය අනුගමනය කිරීමට ප්‍රධාන හේතුව වන්නේ, එවැනි අය පාප ක්‍රියා සිදු කිරීමෙන් වළක්වාලීමයි. කෙසේ වෙතත් පහත සඳහන් අවස්ථාවන්හි අල් බරා වෙන් අපි වැළකිය යුතුයි.

- අපගේ පෞද්ගලික අවශ්‍යතාව මත අපි අල් බරා සිදු කරන්නේ නම්.
- අනෙක් පුද්ගලයා තම වැරදි ක්‍රියා නිවැරදි නොකරන්නේ නම්, අපි ඔහුගෙන් වැළකී නොසිට, ඔහු සමඟ ආශ්‍රය කර යහ මාර්ගය කරා ආරාධනා කළ යුතුයි.

එවැනි අයට ආදරය හා කරුණාව දක්වමින් යහපත් නසීහා සපයා, ඔහු යහ මගට හරවා ගන්නට උත්සාය කළ යුතුයි. එම උත්සාහය අසාර්ථක වුවහොත් අවසානයේ දී ඔහුගේ ආශ්‍රයෙන් වැළකී සිටිය හැකි නමුත්, එසේ වැළකී සිටීම නිසා ඔහු තම ජීවිතය නිවැරදි කර ගන්නට අවස්ථාවක් බවට අල් බරා පත් විය යුතුයි.

''කෙනෙකුගේ අතින් හෝ වචනයෙන් අන් මුස්ලිම්වරු ආරක්ෂා කාරීව සිටින්නේ නම් ඔහු සැබෑ මුස්ලිම් වරයෙක්වේ.'' යනවෙන් රසූල් සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණෝ උපදෙස් දුන්හ.

වයසින් බාලයාට කරුණාව දැක්වීම සහ වැඩිමහල් අයට ගෞරවය දැක්වීම අල්ලාහ්ව උත්කර්ෂයට පමුණුවන ක්‍රියාවන් වේ. ''බාල අයට කරුණාවද වැඩිමහල් අයට ගෞරවයද නොදක්වන කෙනෙක් අපට අයත් කෙනෙක් නොවේ.'' යනුවෙන් හදීස් වදනක් තිබේ.

මුස්ලිම් සමාජය සඳහා කාලය, ශ්‍රමය හා මුදල් පරිත්‍යාග කිරීම.

අපි බලයේ සිටින්නේ නම්, සෙසු මුස්ලිම් වරුන්ගේ යහපත උදෙසා අවශ්‍ය සියලු දේ අවංකව ඉටු කළ යුතුයි. මහ ජනයාගේ යහපත සඳහා ක්‍රියා කරමින් ජනතාවට නසීහා දිය යුතුයි. මෙහිදී සමාජය රැක බලා ගැනීම, සුදුසු පුද්ගලයා සුදුසු රැකියාවට බඳවා ගැනීම ආදී කරුණු අඩංගු වේ. ඕනෑම මට්ටමක නායකත්වය හෝ බලධාරීන්, තම වග කීම ඉටු කළේ කෙසේදැයි අවසාන දිනයේ අල්ලාහ් ඉදිරියේ පිළිතුරු දීමෙන් කිසිවෙකුට මඟ හැරිය නොහැකි බව දැන ගත යුතුයි.

## අවසාන නිගමනය

ඉහත සඳහන් විස්තර අනුව නසීහා යන වචනය යටතේ ඉස්ලාම්, ඊමාන් සහ ඉහ්සාන් යන සියල්ල ඇතුළත් බව පෙනේ.

# 8. ජිහාද් හ සංකල්පය

අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණන් මෙසේ පැවසු බව අබ්දුල්ලාහ් ඉබ්න් උමර් (රලි) වාර්තා කරයි.

'නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැති බවද, මුහම්මද් අල්ලාහ්ගේ රසූල් තුමාණෝ බවද ජනතාව සාක්ෂි දරන තුරුද, නැමදුම් ඉටු කරන තුරුද, සකාත් නම් ධන බද්ද ගෙවන තුරුද, සටන් වදින ලෙස මාහට අණ කරන ලදී. මේම වගකීම සම්පූර්ණයෙන්ම ඉටු කර ඉස්ලාමයට අනුව නිති විරෝධි ක්‍රියාවන් වලින් වැළකී සිටින්නේ නම්, ඔවුන්ගේ ප්‍රාණය හා ඔවුන්ගේ දේපොළ සම්පත් සඳහා ආරක්ෂාව ලබා දෙමි. ඔවුන්ගේ ගණන් බැලීම සියලු කීර්ති හිමි අල්ලාහ් වෙතය.' (වාර්තා කළේ අල් බුහාරි, මුස්ලිම්)

## පසුබිම

මෙම හදීසයේ ජනතාව ලෙස හැඳින්වන්නේ අරාබි දේශයේ එවකට ජීවත් වු බහු දේව වන්දනා කරුවන් බව ආගමික විද්වතුන් බහුතරයක් පවසති. සූරා අන් නස්ර් හී මෙම අදහස දකින්නට තිබේ.

## මෙයින් ඉගෙන ගන්නා පාඩම්

සියලු කීර්ති හිමි අල්ලාහ් වෙතට මඟ පෙන්වන හෙයින් ඉස්ලාම් යනු සත්‍ය දහමකි. අල්ලාහ් මහ පොළොව මැවීමෙන් පසු, සත්‍යයට එරෙහිව නිතර මෙන් අසත්‍යය සටන් කරයි. සත්‍යය රැක ගත යුතු අතර, එසේ රැක ගැනීම සඳහා අවශ්‍ය බලයද තිබිය යුතුයි. ඉස්ලාමයේ ජිහාද් හී ප්‍රධාන සංකල්පය මෙයයි. එනම් සත්‍යය හා යුක්තිය ස්ථාපිත කර එය නඩත්තු කිරීම ජිහාද් යනුවෙන් හැඳින් වේ.

ජිහාද් යනු සටනට පමණක් සීමා නොවෙයි. ජිහාද් හි විවිධාකාර ක්‍රම තිබේ. ඒවා පොදුවේ මුස්ලිම්වරුන් විසින් අනුගමනය නොකරනු ලබනු හෝ ඉතා ස්වල්පයක් වශයෙන් සිදු කරනු ලැබේ. ඒවා නම් දඅවා යන අන් අයට දැනුම් ලබා දීම, යහ දේ වැඩියෙන් සිදුකිරීම සහ අයහපත් දේ අවම කිරීම, මුස්ලිම්වරු අතර ගැටුම් සහ කලහය නිරවුල් කිරීම සහ සමාජයේ වර්ධනය සඳහා වෙහෙසීම යන්නයි.

අප සමකාලීන ජීවිතයේ ජිහාද් යන සංකල්පය අදාළ වන්නේ කෙසේද?

සටන් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති පීඩිත සමාජයන් ඇත. විශේෂයෙන් ඇතැම් මුස්ලිම් රටවල් ආක්‍රමණයට ලක් ව ඇත. තම දේපළ හා නිවස රැකගනු පිණිස සටන් වැදීම ඔවුන් සතු අයිතිය වේ. මුස්ලිම්වරු මුහුණ දෙන භාහිර හා අභ්‍යන්තර අභියෝග තුළින් ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු දිය හැකි වේ.

## මුස්ලිම්වරු මුහුණ දෙන අභ්‍යන්තර ප්‍රශ්න

අද මුස්ලිම්වරු අතර සමගිය නොමැතිකම අවාසනාවකි. සමාජය භේද බින්න වී ආගමික හෝ දේශපාලනික කැබලි වලට පත්ව තිබේ. සෑම තැනම මුස්ලිම්වරුන් අතර ගැටුම් ඇත. මෙවැනි පරිසරයක, මුස්ලිම් සමාජ අතර සමගිය ඇති කිරීම සඳහා දරන

පරිශ්‍රමය ජිහාද් වේ. මෙහිදී ගැටුම් හා ආරවුල් අවම කිරීම අරමුණක් වේ.

මුස්ලිම් වරුන්ටම ඉස්ලාමය පිළිබඳ අනවබෝධය තවත් අභියෝග යකි. මුස්ලිම්වරු බහුතරයක් ඉස්ලාම් යන්නෙහි සැබෑ අර්ථය හෝ මූලික තේරුම නොදැන සිටිති. මෙවැනි අවස්ථාවක, ඉස්ලාම් පිළිබඳ නිවැරදි දැනුම ලබා දීමද ඒ තුළින් මුස්ලිම්වරු තම දහම ගැන මනා අවබෝධයක් ලැබීමට අවශ්‍ය පියවර ගැනීමද ජිහාද් වේ.

මුස්ලිම් බහුතරයට ඉස්ලාම් ගැන මනා අවබෝධයක් නොමැති වීම නිසා ඔවුන් තම දහම සම්පූර්ණව හා නිවැරදිව අනුගමනය නොකරති. මුස්ලිම්වරුන්ට තමා පැවසු ෂහාදා දෙක ගැන ඔවුන්ටම විශ්වාසයක් නැත. අන් ජාතීන්ට අපි ආදර්ශයක් වීමට සැරසෙන නමුත්, එම කටයුත්ත අපි හරියාකාරව ඉටු කර නැත. අන් අයට ආදර්ශයක් වශයෙන් ඉදිරිපත් වීමට පෙර අපි ඉස්ලාමයේ සංකල්ප, ප්‍රතිපත්ති සහ අගය අවබෝධ කරගෙන, එහි නිගමනය හා මාර්ගය අනුගමනය කළ යුතුයි. එමගින් ඉස්ලාමය නිරූපණය කරමින්, සමාජයට, ජනතාවට හා ජාතියට ශ්‍රේෂ්ඨ ආදර්ශයක් බව පත් විය හැක. මෙවැනි අවස්ථාවක ඉස්ලාම් පෙන්වන යුක්තිය, අගනා ජීවන මාර්ගය හා මිනිසාගේ සමෘධිය දකින සෙසු ජනතාව ඉස්ලාමය වෙතට ඇදී එති.

දීර්ඝ කාලයක්, ඇතැම් විට ශත වර්ෂ ගණනාවක්, විශාල පරිශ්‍රමයක් දරා මුස්ලිම්වරු පා තැබිය යුතු මහත් ජිහාදයක් තිබේ. නොයෙකුත් සමකාලීන වෙහෙස දරා අඩියක් අඩියක් පාසා පා තැබිය යුතු ජිහාදය මෙය වේ. නිදසුන් වශයෙන්, මුස්ලිම්වරුන්ට ඔවුන්ගේ උතුම් දහම ගැන ඉගැන්වීම, අන් අයට ආදර්ශයක් වශයෙන් ජීවත් වීමට මුස්ලිම්වරු මහන්සි දැරීම සහ මුස්ලිම්වරුන් උතුම්

සමූහයක් වශයෙන් හා එක්සත් සමාජයක් බවට පත් කිරීමට මහන්සි දැරීම එයින් කිහිපයකි.

මුස්ලිම්වරුන් දෙස සමූහයක් වශයෙන් අද බලන විට, සමගියට මඟ පෙන්වන අල් වලා නම් සංකල්පය එහි දක්නට නොමැත. අංක හත දරණ හදීසය බලන්න. අල් වලා යන සංකල්පයෙහි ආදරය, සැලකිල්ල, සහය සහ ආරක්ෂාව යන කරුණු හතරක් තිබේ. මෙම මූලික කරුණු මුස්ලිම් සමාජයේ දක්නට නොමැති හෙයින්, සමාජය සමඟි කිරීමට නම් මෙම මූලික ගුණාංග නැවත ප්‍රාණවත් කළ යුතුයි.

අද මුස්ලිම්වරුන්ගේ සැබෑ තත්ත්වය මෙයයි. මුස්ලිම්වරු අඩුපාඩු, පරස්පරවාදය, හා වැරදි සහිතව තවමත් සිටින විට, මුස්ලිම්වරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය හෝ ප්‍රමුඛතාව ගැන කථා කරන්නේ කෙසේද? විශාල පරිශ්‍රමයක් හා ජිහාදයක් අවශ්‍ය වන්නේ මෙම කරුණු වලටයි.

ශාරීරිකව සටන් කර ජිහාද් හි යෙදීමෙන් මෙහිදී කිසිදු ඵලක් නොමැති අතර එයින් අලුත් ප්‍රශ්නද මතු විය හැක. ජිහාද් යනු ශාරීරික සටනෙහි යෙදීම පමණක් බව සිතන ඇතැම් අය එමගින් ඉහත සඳහන් අරමුණු සියල්ල ලබා ගත හැකි වන බව විශ්වාස කරති. මෙම ක්‍රියා මාර්ගය ඉස්ලාමයේ ප්‍රතිරූපය විනාශ කරන අතර, මුස්ලිම්වරුන්ට එරෙහිව අයහපත් ප්‍රතිඵලයක් ගෙන දෙයි. සටන් කිරීම ගැන පමණක් මෙම හදීසය පවසන බව ඒ පිරිස විශ්වාස කරන නමුත්, එම වැරදි අවබෝධය මගින් මුස්ලිම්වරු අද සිටින තත්ත්වයට විශාල හානියක් ගෙන දෙන බව නිසැකයි.

## මුස්ලිම්වරුන් මුහුණ දෙන බාහිර අභියෝග කිහිපයක්

ඉස්ලාමයට එරෙහිව ක්‍රියා කරන පිරිස විසින් පටවන ලද බාහිර අභියෝගයන්ටද මුස්ලිම්වරුන් මුහුණ දෙන්නට සිදු වී ඇත. මේ සතුරන්, විවිධ මාර්ගයෙන් මුස්ලිම් වරුන්ට එරෙහිව කුමන්ත්‍රණ කරමින් මුස්ලිම් ලොව තම පාලනය යටතට ගන්නට කටයුතු කරති. ගෝලීකරණය, නවීනතාවය, ජීවන රටාව වෙනස් කිරීම, තාක්ෂණය වැරදි ආකාරයෙන් භාවිතා කිරීම, සාරධර්මය වෙනස් කිරීම වැනි දේ බාහිර අභියෝග බවට අපිට දැක ගත හැක.

ඉස්ලාමයට එරෙහි බලවේගය, අයහපත් හා අසභ්‍ය සංකල්ප කිහිපයක් නවීන මාර්ග වලින් ඉදිරිපත් කරති. සියලු කරුණු පිළිබඳව අපේ අවබෝධය විකෘති කිරීම එයින් එක් ක්‍රමයකි. වැරදි හා පාප ක්‍රියා පිළි ගත හැකි බවද වඩා උතුම් බවද පහදා කර දීම එක් උදාහරණයකි. නවීන මනෝශාස්ත්‍රය උපයෝගි කර මුස්ලිම් ඇතුළු ලෝක ජනතාවගේ අදහස් සහ හරය පමණක් නොව ආගමික විශ්වාසය පවා වෙනස් කිරීමට පර්යේෂණ පවත්වා ගෙන යති.

අද පවතින තත්ත්වය ඒ ආකාරයෙන්ම පිළිගෙන ඒ පිළිබඳව කිසිවක් නොකළේ නම්, අනාගතයේ සිදු විය හැකි අයහපත් ප්‍රතිවිපාක ඉමහත්ය. අද සියලු දේ- මුස්ලිම් වරුන්ගේ අනාගතය පවා ඔවුන් සැලසුම් කර අවසානයි. එහෙත් මුස්ලිම්වරු මේවා කිසිවක් නොදනිති. අපි අන් අයගේ උපක්‍රමයන්ට හසු වී අවසාන බව තවමත් අපි නොදනිමු. මුස්ලිම්වරුන්ගේ සිතුවිලි හා මනස අයහපත් දෙසට මෙහෙය වන්නට සහ ඔවුන් ගොදුරු කර ගන්නට කරන කුමන්ත්‍රණයට අපි භාජන වී සිටිනා බව අපි නොදනිමු. මෙවැනි බාහිර තර්ජනයට එරෙහිව අපි ක්‍රියා කළ යුතුයි. මෙම සතුරෝ අපගේ දේව විශ්වාසය සහ අනන්‍යතාවය විනාශ කරන්නට ක්‍රියා කරන හෙයින්, එයට එරෙහිව කටයුතු කිරීම විශාල ජිහාද් එකකි. මෙම

බලපෑම් ගැන අපි කල්පනා කළ යුතු පමණක් නොව, එයට එරෙහිව නිසි සැලැසුම් සහිත සුදුසු ක්‍රියා මාර්ගයක යෙදීම අත්‍යවශ්‍ය ජිහාද් එකක් බව සලකන්න.

ඉස්ලාමයට එරෙහිව ක්‍රියා කරන්නන් යොදන බලපෑම් සාතාන්ගේ සැලැස්ම හා සමානය. අපේ අවබෝධතාව විකෘති කිරීමට සාතාන් දරන වෑයම ගැන අල් කුර්ආන් පවසයි. අපේ අවබෝධය විකෘති කිරීමෙන් අයහපත් දේ අලංකාර දෙයක් බව පෙන්වීමට හෝ යහපත් දේ ඉටු කිරීමෙන් වලක්වන්නට සාතාන් උත්සාහ කරන බව සියලු කීර්ති හිමි අල්ලාහ් පවසා අත. උදාහරණයක් වශයෙන්, අපි සදකා ගෙවන්නට සූදානම් වන විට, මෙම ක්‍රියා මගින් අප ආර්ථිකයට අවාසියක් සිදු වන බවද එම මුදල ව්‍යාපාරයක යෙදීම වඩා උචිත බවද සාතාන් පෙන්වයි.

මුස්ලිම්වරුන්ගේ අවබෝධතාව විකෘති කිරීමෙන් ඔවුනතර ආරවුල් හා ගැටුම් හට ගන්නට සාතාන් ක්‍රියා කරන බව අල් කුර්ආන් පවසයි. වචනයක් හෝ වාක්‍යයක් විවිධ තේරුම් දිය හැකි අතර, මෙය හේතු කොට ගෙන, ආරවුල් හා ගැටුම් හට ගන්නට අවස්ථා ඇත. සැමියා හා බිරිය අතර, මිතුරන් අතර, සොයුරන් අතර, සමාජය තුළ නොයෙක් ගැටුම් හට ගන්නට සාතාන් සලසන ආකාරය අපි දනිමු.

තාක්ෂණ විද්‍යාව ඵලදායක ලෙස හෝ විනාශකාරී ලෙස හෝ භාවිතා කළ හැක. එය ඉගෙන ගෙන, අපගේ සම්පූර්ණ පාලනය යටතේ ගෙන, මුස්ලිම් සමාජයේ යහපත සඳහා භාවිතා කළ යුතුයි. උදාහරණයක් වශයෙන්, අන්තර් ජාලය, අප සමාජයේ දියුණුව සඳහා පමණක් භාවිත කළ යුතු අතර සතුරන්ගේ උවදුරට ලක් වීම සඳහා එයින් මාර්ගයක් නොතැබිය යුතුයි. එය ඉස්ලාම් පිළිබඳ නිසි අවබෝධයක් ලබා දීමට පමණක් නොව ඉස්ලාමය පිළිබඳ නිවැරදි මතයක් ගොඩ

නගන්නටද උපයෝගි කළ යුතුයි. ඒ සමඟ, මුස්ලිම් සමාජයට යහ මඟ පෙන්වීමද මෙයින් සිදු කළ යුතුය.

උපමා වාක්‍ය හා සමකාරකය යොදමින් අල් කුර්ආනය පෙන්වන දඅවා ක්‍රමයද භාවිත කළ හැක. අවාසනාවට මෙම ක්‍රම වේදය උපයෝගි කිරීමේ දී අපි බොහෝ දුබලව සිටිමු. උපමා සංකල්පය සහ විශ්ලේෂණ සංකල්පය යන දේ අපි ඉගෙන ගත යුතු ශක්තිමත් නිපුණතාවකි. සැබැවින්ම මේවා අල් කුර්ආනයේ ක්‍රමය වේ. මෙවැනි සංකල්ප බටහිර සමාජයට අයත් බව පෙන්වන නමුත්, ඒවා වසර 1,400 පෙර ස්ථාපිත කරන ලදී. වසර 50කට පමණ කාලය තුළ මෙවැනි සංකල්ප බටහිර විසින් සොයා ගන්නා ලද නමුත්, සැබැවින්ම වේවා ඉස්ලාමිය සංකල්පයන් වන අතර, මුස්ලිම්වරුන්ගේ නොසැලකිලිමත්කම නිසා මුස්ලිම් වරුන්ට අහිමි වූනි. මෙනිසා මෙම ක්‍රමය අපි ඉගෙන ගෙන, යළි ප්‍රයෝජනයට ගත යුතුයි. මෙම දඅවා ක්‍රමය භාවිත කර සංවාදයේ යෙදීමන් ඉස්ලාමයේ පහසු නිවේදනය අලංකාර ලෙස අන් අයට ඉදිරිපත් කළ හැක.

අවශ්‍ය දැනුම ලබා ගැනීම ඉස්ලාමිය ජිහාදයේ සහ වගකීමේ කොටසකි. කැමැත්ත සහ උද්යෝගීමත්කම පමණක් නොසෑහෙන බව දැන ගත යුතුයි. අයහපත් අය අප මත පටවන අසත්‍ය සිතුවිලි හා අදහස් වලට එරෙහිව ක්‍රියා කිරීමට අප අවශ්‍ය දැනුම ලැබීම පමණක් නොව ඒවා උපයෝගි කිරීමටද අප දැනුම ලැබිය යුතුයි.

## අවසාන නිගමනය:

අප සමාජයේ අභියෝග වලට නිසියාකාරව මුහුණ දීමට අවශ්‍ය දේ:

- අප ගැනම අවබෝධ කර ගැනීම.
- ඉස්ලාමය හරියාකාරව දැන ගැනීම.

- අන් අයට ඉස්ලාමය පිළිබඳ දැනුම ලබා දීම.
- වර්තමාන අභියෝග පිළිබඳ විභාග කර ඒවා අවබෝධ කර ගැනීම.
- අවශ්‍ය උපකරණ සූදානම් කර ගැනීම.

ජිහාද් නම් සංකල්පය පිළිබඳව කථා කරන විට, ජිහාද් ගැන මිනිසුන් අතර පොදුවේ පවතින විවිධ මත ගැන පමණක් කථා කළ නොහැක. අප ගැන, අප ජීවත්වන ලෝකය ගැන, අප සමාජයේ යථාර්ථය ගැන හෝ අප මුහුණ දෙන අභියෝගය ගැන අමතක කර, ක්ෂණික කෝපයට හෝ කලබලකාරී තත්ත්වයට පත් නොවිය යුතුයි.

ජිහාද් නම් සංකල්පය ගැන සාකච්ඡා කරන විට, පරමාදර්ශ හා යථාර්ථය අතර අප තුළ පවතින පරස්පර මත භේදය විසඳා ගත යුතුයි. අපි පතන පරමාදර්ශ ලෝකය සහ සැබෑ ලෝක තත්ත්වය අතර තිබෙන පරතරය අවම කිරීමට අපි කෙතරම් මහන්සියක් දරන්නට සිදුවේ දැයි තක්සේරු කිරීම ඉතා වැදගත්ය.

අප තුළ පවතින මෙම ගැටුම විසඳීමට නම්, මානසික හා සමාජීය සමාදානයක් සිදු විය යුතුයි. අප ජීවත්වන ලෝකය විශාල වශයෙන් දූෂණයට ලක් වී තිබෙන නමුත්, අපේ සාරධර්ම තවමත් පවත්වාගෙන යන අතර, ඒවා වර්ධනය කර ගන්නටද අප මහන්සි ගත යුතුයි. මෙවැනි සැකසුමක් නොමැති නම්, ගැටීම් වලට හා කලහකාරී වීමට සම්බන්ධ වීමේ අනතුරක් ඇත. එසේ නොමැති නම් අපේ සාරධර්ම හා දේව විශ්වාසය අත හැර දමා නවීන සමාජයේ කොටසක් බවට අපිත් පත් වන අනතුරක්ද ඇත.

මෙවැනි අන්තවාද දෙකම අයහපත්ය. මානසික හා සමාජීය ගැළපීම සඳහා තිරසාරව ප්‍රකාශ කිරීම අවශ්‍ය විය හැකිය. අපේ අනන්‍යතාව හා සාදාචාරය ආරක්ෂා කරමින්, යහපත් මුස්ලිම්වරු වශයෙන් නවීන යුගයේ ජීවත් වන්නේ කෙසේදැයි අප තීරණය කළ යුතුයි. මේවා අද අප මුහුණ දෙන බරපතළ අභියෝගයන්ය. මෙවැනි අභායෝග වලට මුහුණ දෙන විට, අප ප්‍රායෝගිකව පියවර ගත යුතුයි. ඉස්ලාමය පිළිබඳව කථා කරන විට, තක්වා නම් බිය බැතිකම, ඉහ්ඃලාස් නම් අවංකභාවය වැනි සිද්ධාන්ත ගැන අපි පොදුවේ කථා කරමු. මෙවැනි සංකල්ප අපගේ දෛනික ජීවිතයේ, විශේෂයෙන් අභියෝග වලට මුහුණ දෙන අවස්ථාවන් හි ක්‍රියාවේ යෙදිය යුතුයි. මේ නිසා, ඉස්ලාමිය සංකල්පය වර්තමාන සමාජයේ පවතින යථාර්ථ තත්ත්වය තුළ ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය කරුනක් වී ඇත.

# 9. සිය හැකියාවට එකඟව යහකම් කිරීම.

අල්ලාහ්ගේ රසූල් (සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම්) තුමාණෝ මෙසේ පවසනු තමා සවන් දුන් බව අබූ හුරෙයිරා අබ්දු අල් රහ්මාන් බින් සඃඛ්ර් (රලි) දන්වයි.

“මම ඔබට කුමක් තහනම් කරන්නේ ද ඒවායින් වැළකී සිටින්න. මම කුමක් කළ යුතු දැයි ඔබට අණ කරන්නේ ද, ඒවා ඔබලාගේ හැකියාවේ සීමාවට එකඟව ඉටු කරන්න. සැබැවින්ම ඔබට පෙර ජීවත් වූ සමාජය සීමාව ඉක්මවා දහම පිළිබඳව ප්‍රශ්න කිරීමෙන් සහ ඔවුන්ගේ නබි වරුන් සමඟ මත භේද ඇති කිරීමෙන් විනාශ කරනු ලැබුවෝය.“ අල් බුඛාරි සහ මුස්ලිම් වාර්තා කරයි.

පසුබිම:

හදීසයක සැබෑ අර්ථය අවබෝධ කර ගැනීමට, එම හදීසය පැවසීමට (සබබ් අල් වුරූද්) තුඩු දුන් හේතුව සහ පසුබිම පිළිබඳව දැන ගැනීම අවශ්‍යවේ. මන්ද, හදීසයේ පසුබිම ගැන දැන සිටීමෙන්, හදීසය අවබෝධ කර ගත හැකිවේ. දිනක් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ, ‘අල්ලාහ්ගේ සේවකයිනි! හජ් වන්දනාව ඉට කරන ලෙස ඔබට අල්ලාහ් අණ කරයි. ඒ නිසා හජ් වන්දනාව ඉටු කරනු මැනවි.‘ යැයි දැන්විය. එම සෙනඟ අතර කෙනෙක් නැගිට, “අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමනී, සෑම වසරම අපි එය ඉටු කළ යුතු ද?“ යනුවෙන් විමසුවේය. එයට නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ, “මම තහනම් කරන සියලු දේවලින් ඉවත් වනු මැනව. ඉටු කරන ලෙස මම නියෝග

කරන සෑම දෙයක් ම ඔබට හැකි පමණ අධික ලෙස ඉටු කරනු මැනව“ යැයි පිළිතුරු දුන්හ.

## ඉගෙන ගන්නා පාඩම්

මෙම සිද්ධිය අල් කුර්ආන් පහල වු කාලයට අදාළ එකකි. වගකීම පිළිබඳව අධික ලෙස ප්‍රශ්න කිරීමෙන් පැටලිලි සහ අවුල් පැන නැගිය හැක. මෙම ප්‍රශ්නයට ‘ඔව්‘ යනුවෙන් පිළිතුරු දුන්නේ නම්, ලොවේ ජීවත්වන සියලු මුස්ලිම්වරයෙකුටම සෑම වසරම හජ් වන්දනාව ඉටු කිරීම අනිවාර්ය බවට පත්වන හෙයින්, රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් එම ප්‍රශ්නයට කැමති වුයේ නැත.

නිසියාකාරව ඉදිරිපත් කරන ප්‍රශ්නවලට ඉස්ලාම් අනුබල දෙයි. මෙම පොතෙහි තිබෙන දෙවන හදීසය තුළින් මේ බව අවබෝධ කර ගත හැක. ඇත්තෙන්ම, රසූල් (සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම්) තුමාණෝ මෙවැනි ප්‍රශ්න හා පිළිතුරු ක්‍රම මගින් සහාබාවරුන්ට දැනුම ලබා දුන්හ. දැනුම හා යහපත්කම වර්ධනය කරනු පිණිස, ප්‍රශ්න ඇසීම උතුම් ක්‍රමයකි. සමාජයේ සැකය සහ ගැටළු හට ගන්නා ප්‍රශ්න වලට අනුබල දෙනු නොලැබේ. මෙයින් සිදුවන්නේ අනවශ්‍ය ප්‍රශ්න ඇසීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා විස්තර සෙවීමයි.

නම්‍ය භාවය සහ ප්‍රායෝගික භාවය ෂරීආ නීති මාලාවේ අත්‍යවශ්‍ය මූලික කොටසවේ. ඉස්ලාමයේ අත්‍යවශ්‍ය ක්‍රියාවක් ඉටු කිරීම කෙනෙකුගේ හැකියාව මත රැඳී පවතී. මුස්ලිම්වරයෙක් යහ ක්‍රියාවන් කිරීමට ඔහුගේ හැකියාවේ සීමාව තුළ පමණක් උනන්දු කරවනු ලබයි.

හජ් වන්දනාව ඉටු කිරීම මෙයට හොඳ නිදසුනකි. මුස්ලිම් කෙනෙකුට හැකියාව සහ ශාරීරික ශක්තිය තිබුනේ නම් පමණක් මක්කමට ගොස් හජ් වනදනාව ඉටු කිරීම අනිවායර්ය වේ. මෙම හැකියාව මුදලින් පමණක්

නොව, ශාරීරික ශක්තිය සහ අනිකුත් අවශ්‍යතාවන්ටද බල පානු ඇත. කාන්තාවක් හජ් වන්දනාවේ යෑමට සිතුවේ නම්, මහ්රම් කෙනෙක් සමඟ යා යුතුයි. එමෙන්ම කෙනෙක් ණය බර වී සිටියේ නම් ඔහු ණය සියල්ල ගෙවා අවසන් කර තිබිය යුතුයි. මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණෝ හජ් වන්දනාව ඉටු කළේ ජීවිතයේ එක් වරක් පමණි. එනිසා තරුණයෙකු හෝ මහළු කෙනෙකු හෝ වේවා, ඒක් වතාවකට වැඩියෙන් හජ් වන්දනාව ඉටු කිරීමට කිසිදු හේතුවක් නොමැත. මෙම වන්දනාව ගැන අල් කුර්ආනය පවසන්නේ මෙලෙසයි.

*"එහි පැහැදිලි ආයාවන් ඇත. මකාම් ඉබ්‍රාහීම් යමෙක් ඇතුළු වුවහොත් ඔහු අභය ලද්දෙකි. අල්ලාහු උදෙසා අල්ලාහ්ගේ නිවස හජ් කිරීම එහි යෑමට ශක්ති ඇති මිනිසුන් කෙරෙහි පැවැරී ඇත. යමෙක් ප්‍රතික්ෂේප කළහොත් සැබැවින්, අල්ලාහ් ලෝක වාසින්ගෙන් ස්වයං ප්‍රභූය."* සූරා 3: ආයත් 97

සලාහ් වැනි අනිකුත් ක්‍රියාවන්හීද රසූල් සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණෝ, 'හැකි පමණින් සලාහ් ඉටු කරනු මැනවි' යනුවෙන් පැවසීමේ අර්ථය වන්නේ නියමිත වෙලාවට, නියමිත අයුරින් - සමූහයක් වශයෙන්, ඉටු කරන ලෙසයි. එහෙත් වැළකිය නොහැකි අවස්ථාවන් හි නියමිත වෙලාව තුළ ඉටු කිරීමට අනුමත තිබේ. එමෙන්ම, සිටගෙන සලාහ් ඉටු කළ නොහැකි කෙනෙක් වාඩිවී සලාහ් කළ හැක. මෙවැනි ක්‍රමය තුළින් රමදාන් මස උපවාසය දෙස බලමු. ගමනක යෙදෙන කෙනෙක් හෝ අසනීප වු කෙනෙක් තම උපවාසය, පසු කලක පහසුවෙන් සිටින කාලයක සම්පූර්ණ කිරීමට අනුමත ඇත.

තහනම් කළදේ ඉටු කිරීමට කිසිවෙකුට අනුමත නැති හෙයින් මුස්ලිම්වරු ඒවායින් ඉවත් විය යුතුයි. හරාම් නම් තහනම් ක්‍රියාවට ළඟාවන මාර්ග පවා වසා දැමීමෙන්

මෙය කෙතරම් බරපතල දැයි දැක ගත හැක. එවැනි තහනම් ක්‍රියාවක් සිදු කරන්නට අදහසක් නැති වුවත්, ඒවා හා සම්බන්ධ කිසිදු දෙයක යෙදෙන්නට මුස්ලිම්වරයෙකුට අනුමත නැත. තහනම් ක්‍රියාවකට මඟ පාදන කිසි දෙයකට සම්බන්ධ වීම පවා තහනම් කිරීමෙන්, තහනම් දෙයක් සිදු නොවීමට ඉස්ලාම් වග බලා ගනී.

'ඔබට හැකි පමණින් අනුමත කළ දේ ඉටු කරනු මැනවි.' යන වදනින්, අනිවාර්ය ක්‍රියාවක් ඉටු කිරීමේදී පවා මුස්ලිම්වරයෙක් අමතර බර උසුලන්නට අවශ්‍ය නැත, යනුවෙන් ඉමාම් ෂාෆි අදහස් දක්වයි. යම් අවස්ථාවක විකල්පයක් තිබුනේ නම්, මුස්ලිම්වරයෙක් පහසු මාර්ගය නිතර තෝරා ගත යුතුයි. වුදු ක්‍රියාවට පහසු අයුරින් සීතල හෝ උෂ්ණ ජලය භාවිතා කළ හැකි අතර, මේවා භාවිතා කිරීමේදී අපහසු තාවයක් තිබුනේ නම්, එය ඉවසීමෙන් දරා ගත් හේතුවෙන් අල්ලාහ් ගෙන් ඔහුට වැඩියෙන් ත්‍යාග තිබෙන බව ඉස්ලාම් පවසයි.

මන්දූබ් ක්‍රියාවන්ටද (අනිවායර්‍ය නොවුවත්, අනුබල දෙන ලද ක්‍රියා) මෙම නියමය අදාළවේ. එවැනි ක්‍රියා අපගේ උපරිම හැකියාවෙන් ඉෂ්ට කළ යුතුයි. මෙවැනි මන්දූබ් ක්‍රියා ඉටු කරන කෙනෙක් ඒවා අනිවාර්ය ක්‍රියාවක් බවට පත් නොකළ යුතු බව සුප්‍රකට ඉස්ලාමිය විද්වතෙක් වන අල් ෂාතිබි (රහිමහුල්ලාහ්) අවවාද කරයි. එනම් එවැනි ක්‍රියාව අනිවාර්ය ක්‍රියාවක් වශයෙන් නොකඩවා, රූටීනයක් වශයෙන් නොකළ යුතුයි. ඒ වෙනුවට තම හැකියාව තුළ පහසුවෙන් සිදු කළ යුතුයි. නිදසුනක් වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා කරන උපවාසය, රමදාන් මස උපවාසයේ තත්ත්වයට පත් නොකර, විටින් විටින් කඩ කඩ සිදු කළ යුතුයි. මෙවැනි වතාවත් ඉටු කරන විට, ඒවා කෙනෙකුට දරා ගත නොහැකි බරක් බවට පත්විය නොයුතුයි. එසේ බරක්

බවට පත්වුවහොත්, කලකට පසු ඒවා සිදු නොකර අත හරින්නටද සිදුවෙයි.

මෙම මාතෘකාව යටතේ, 'මිනිසුනි! ඔබට ඉටු කළ හැකි ප්‍රමාණයට එවැනි ක්‍රියා ඉටු කරනු මැනවි. මන්ද අල්ලාහ් වෙහෙසට පත් නොවන නමුත්, ඔබ වෙහෙසට පත් වන්නේය.' යනුවෙන් රසූල් සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ පැවසීය.

තවත් අවස්ථාවක, "කුඩාවුවත් නොකඩවා දිගින් දිගට කෙනෙක් කරන ක්‍රියා පිළිබඳව අල්ලාහ් සතුටුවෙයි." යනුවෙන් රසූල් සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ පැවසීය. වාර්තා කළේ ඉමාම් මුස්ලිම්

බරපතල හානියක් සිදුවීම වලකනු පිණිස, තහනම් දෙයක් පවා කරන්නට සමහර අවස්ථාවන්හී අනුමත තිබේ. දිගු කාලයට ආහාරයට කිසිවක් නොමැති අවස්ථාවක හරාම් ආහාර පවා කෑමට ගන්නට අනුමත ඇත.

## අවසාන නිගමනය:

මෙම හදීස් වදන පෙන්වන ඉස්ලාමීය ප්‍රතිපත්තියේ අළංකාරය අවබෝධ කර ගැනීමෙන් ආගම නිසියාකාරව අනුගමනය කරන්නට පහසු වනු ඇත. එ සමඟ ආගමේ අන්තයට නොගොස් නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ පෙන්වූ මාර්ගයෙන් බැහැරව ගමන් කිරීමෙන් වැළකී සිටිය හැක.

# 10 පිරිසිදුව සිටීම (අත් තය්යිබ්)

අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණන් මෙසේ පැවසූ බව අබූ හුරෙයිරා (රලි) දන්වියි. සැබැවින්ම අති උතුම් අල්ලාහ් ඉතාමත් පිවිතුරුය.

පරිශුද්ධ දේ පමණක් ඔහු පිළිගනී. රසූල්වරුන්ට දුන් නියෝගය සියලු විශ්වාසීන්හටද ඔහු නියෝග කරයි. සියලු කීර්ති හිමි අල්ලාහ් මෙසේ නියෝග කරයි. *"රසූල්වරුණි පිරිසිදු දේ පමණක් අනුභව කරනු, යහකම්ද කරනු."* අල් කුර්ආනය. 23:51.

*'තවද අහෝ විශ්වාස වන්තයිණි! අප ඔබට ආහාර වශයෙන් දුන් හොඳ දෑයින් අනුභව කරනු.'* අල් කුර්ආනය 2:172.

ඉන් පසුව නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් මෙසේ සඳහන් කළහ. 'දීර්ඝ ගමනක යෙදුනු මිනිසෙක් අපිරිසිදු හා දූවිලි සහිත කෙස් හා ඇඳුමෙන් සැරසී, "මාගේ පරමාධියාණනී! මාගේ පරමාධියාණනි" යනු පවසා අහස දෙසට දෑත් ඔසවයි. ඔහුගේ ආහාර අසාධාරණයෙන් ලබා ගත් දෙයකි, ඔහුගේ ඇඳුම් අසාධාරණයෙන් ලබා ගත් දෙයකි, ඔහූගේ පානය අසාධාරණයෙන් ලබා ගත් දෙයකි, අසාධාරණව උපයා ගත් දේවලින් ඔහු සිරුර පෝෂ්‍ය කර ගනී. ඔහුට නිසි පිළිතුරු ලැබෙන්නේ කෙසේද?" වාර්තා කරන්නේ සහීහ් මුස්ලිම්.

## පසුබිම:

යහපත් ක්‍රියා, යහපත් මිනිස්සු, යහපත් දේ, යහපත් කථා වැනිදේ සඳහා තය්යිබ් යන පදය අල් කුර්ආන් සහ රසූල්වරුයාගේ සුන්නාහ් සඳහන් කරයි. මෙය නාම විශේෂණ පදයකි. ඕනෑම හොඳ දැයකට එම වචනය උපයෝගි කෙරේ.

හදීසයේ 'ඇත්තෙන්ම, අති උතුම් අල්ලාහ් ඉතාමත් පරිශුද්ධය.' යන වාක්‍ය, සියලු කීර්ති හිමි අල්ලාහ්ගේ ගුණාංගය සහ ලක්ෂණය කිසිදු අඩුපාඩුවක් හෝ දුබලකමක් හෝ නොමැති අංග සම්පූර්ණ බව පවසයි.

'පරිශුද්ධ දේ හැර අන් කිසිවක් ඔහු පිළිගන්නේ නැත.' යන වාක්‍ය, අල්ලාහ් වෙනුවෙන් පමණක් කෙරෙන බව බාහිරව පෙන්නුම් කළද, එහි අභ්‍යන්තරයේ වැරදි තිබේ නම් අල්ලාහ් එය පිළිගන්නේ නැති බව පවසයි. ලෝකයාට පෙන්වනු පිණිස කරන පිංකම් මෙයට එක් උදාහරණයකි. මෙවැනි පිං ක්‍රියා කිසිවක් අයහපත් මාර්ගයෙන් උපුටා ගත් මුදලින් සිදුකරන්නේ නම් අල්ලාහ් විසින් එය පිළිගනු නොලැබේ. ඉස්ලාම් අනුමත නොකළ මාර්ගයෙන් උපයා ගත් ධනයෙන් කෙතරම් පිං දහම් කළත්, එයින් පිනක් හෝ යහපතක් නොලැබේ.

සකල කීර්ති හිමි අල්ලාහ්, ඔහුගේ රසූල්වරුන්ට දුන් අයුරින් විශ්වාස කළවුන්ටද දුන් නියෝගය එකයි.

*'රසූල්වරුනී! පිරිසිදු දේ පමණක් අනුභව කරනු.'* අල් කුර්ආන් 23:51

*'විශ්වාස කළවුනි! අප ඔබට ආහාර වශයෙන් දුන් හොඳ දැයින් අනුභව කරනු.'* අල් කුර්ආන් 2:172

මෙයින් ඉගෙන ගන්නා පාඩම්

ඉහත සඳහන් අල් කුර්ආන් වැකි සහ හදීස් වදන් පහත සඳහන් වැදගත් නිගමනය පෙන්වයි.

සියලු කීර්ති හිමි අල්ලාහ් විසින් අපගේ පිං ක්‍රියා පිළිගනු ලැබීමට,

- අපි උපයන මුදල් නීති මාර්ගයෙන් හා පිරිසිදු ක්‍රියා මාර්ගයෙන් උපයාගත් එකක් විය යුතුයි.
- අපි ගන්නා ආහාර හලාල් මාර්ගයෙන් හා අනුමත කළ දේ විය යුතුයි.

- අපි ආහාර මිල දී ගන්නා මුදල් නීති මාර්ගයෙන් හා පිරිසිදු ක්‍රියාවෙන් උපයා ගත් එකක් විය යුතුයි.

- ඉස්ලාමයේ යමක් අනුමතද නොහොත් තහනම් දැයි ප්‍රශ්නයට පිළිතුරු, අල්ලාහ්ගේ කැමැත්තට එකඟව සිදුවෙයි. යම් දැයක් හලාල් ද හලාල් නොවේදැයි පැහැදිලි කර, යහ මඟ පෙන්වන්නේ අති කාරුණික අල්ලාහ් පමණි. මෙයට පෙර වු සමාජයන්හී අල්ලාහ් අනුමත කළ දේ තහනම් (හරාම්) බවට නිගමනය කළේ සමාජයේ ඇතැම් මිනිසුන්ය.

- යමක් හලාල්ද හරාම් දැයි නියෝග කරන අයිතිය අල්ලාහ්ට පමණක් හිමි වේ. අන් කිසිවෙකුට එම අයිතිය නැත.

- අපේ යාච්ඥා සහ ආයාචනා අල්ලාහ් විසින් පිළි ගනු ලැබීමට හලාල් මාර්ගයෙන් ඉපයීම සහ අනුභව කිරීම ප්‍රධාන අවශ්‍යතාවක්වේ.

## අල්ලාහ් ගෙන් දුආ ඉල්ලීමේ ක්‍රමය

- සියලු කීර්ති හිමි අල්ලාහ් විසින් පිළි ගනු ලැබිය හැකි කදිම අවස්ථාවක් වනුයේ, ගමනක යෙදුනු විට කෙනෙක් කරන දුආ ය. හදීස් වදන් පවසන මෙවැනි අනිකුත් අවස්ථා නම්, අල්ලාහ්ට සජදා කරන විට, වැස්ස වහිනවිට, සෑම රාත්‍රියෙහි අවසාන තුන්වන කොටස යනු මේවාය. මෙම අවස්ථාවන්හි අපි කරන දුආ අල්ලාහ් විසින් පිළිගනු ලබන හෙයින්, මේ ගැන නොසැලකිලිමත් නොවන්න.

- එවැනි අවස්ථාවන්හී දුආ ඉල්ලන විට අහංකාරයෙන් හෝ උඩංගුවෙන් නොව, නිහතමානිව හා බැගෑපත්ව දුආ ඉල්ලිය යුතුයි.

- දුආ ඉල්ලන අවස්ථාවන්හී අප දෑත් ඔසවා ඉල්ලිය යුතුයි.

- ඉතා ඕනෑකමින් දුආ ඉල්ලිය යුතුයි. යා රබ්බී යා රබ්බී (මාගේ පරමාධිපතියාණනි) යනුවෙන් අමතමින් මෙම දුආ ඉල්ලිය යුතුයි. දුආ යනු ඉබාදා නම් එක්තරා නැමදුම් ක්‍රමයක් වන හෙයින්, ඉතා ඕනෑකමින් හා අවංකව දුආ ඉල්ලිය යුතුයි.

  මෙවැනි ආකාරයෙන් ඉදිරි පත් නොකරන දුආ ඇතැම් විට අල්ලාහ් විසින් ඉටු නොකරනු ඇත. එනිසා, අපේ දුආ සඳහා අල්ලාහ්ගෙන් ප්‍රතිචාරයක් ලබා ගැනීමට අපි හලාල් දේ පමණක් අනුභව කළ යුතුයි.

- මෙම හදීසය පවසන තවත් වැදගත් කරුණක් නම්, නිත්‍යානුකූලව උපයන දැයින් අපි දෙන සදඛා පමණක් අල්ලාහ් විසින් පිළිගනු ලැබේ. මෙයට හේතුව, 'අල්ලාහ් ඉතාමත් පරිශුද්ධය. පරිශුද්ධ දේ හැර අන් කිසිවක් ඔහු පිලිගන්නේ නැත.' යන හදීසයයි. වැරදි මාර්ගයෙන් උපයා ගත් මුදලින් සදඛා දිය නොහැකි අතර එවැනි මුදලින් හජ් වන්දනාව පවා ඉටු කළ නොහැක. සොරකම් කළ මුදලින් හජ් වන්දනාව ඉටු කිරීම මෙයට නිදසුනකි. 'අශික්ෂිත දේ මගින් අශික්ෂිත පාපයන්හට සමාව ලබා ගත නොහැක.' යනුවෙන් ඉබ්න් අබ්බාස් (රලි) දන්වයි.

කෙනෙක් මුදල් සොරකම් කළේ නම්, එය හිමිකරුට ආපසු ගෙවිය යුතු අතර, පින් කටයුතු සඳහා එය වියදම් කළ නොහැකි බව ආගමික විද්වතුන් අදහස් දක්වති. මුදල් සොරකම් කර, පසුව ඒ ගැන පසුතැවිලි වීමට (තව්බා කරන්නට) බලාපොරොත්තු වන කෙනෙක්, සොරා ගත් මුදල් නිසි හිමිකරුට ආපසු ගෙවිය යුතු බව මතකයේ තබා ගත යුතුයි. අයිතිකරු කවරෙක්දැයි නොදන්නාවිට හෝ සොයා ගත නොහැකිවූ විට එම මුදල් මහජන සේවය සඳහා නිසි හිමිකරු වෙනුවෙන් වියදම් කළ හැක.

කෙනෙක් නිත්‍යානුකූලව ලබා ගත් ආදායමින් තම ජීවිතය සකස් කර ගැනීමේ වැදගත්කම මෙම හදීසය පෙන්වන බව ජමාල් අද් දීන් සැzරබෝzසෝ නම් විද්වතෙක් අදහස් දක්වයි. කෙනෙක් තම ආදායමට ගැලපෙන අයුරින් ජීවත් විය යුතුයි. ඉපැයුම නිත්‍යානුකූල මාර්ගයෙන් ලැබුවහොත්, එයට අල්ලාහ්ගේ ආශීර්වාදය ලැබෙන බව මෙයින් අදහස් වේ.

ආයතනයකට, සංවිධානයකට, සමාගමකට හෝ රජයට අයත් දේපළ පොදු දේපළ වන බව විද්වතුන් අදහස් දක්වති. මෙය ඉතා වැදගත් කරුණකි. පොදු දේපළින් අනුමැතිය නොමැතිව ගන්නා දේ ගුලූල් (නීති විරෝධී ලෙස ගන්නා සොරකමක්) යනුවෙන් හැඳින් වී තිබීම ඉතා වැදගත් එකකි. මෙම වැරැද්ද කළ කෙනෙක් ඒවා ආපසු ගෙවන තුරු, අල්ලාහ්හේ මාර්ගයේ ජිහාද් හී යෙදුනත් එම පාපයෙන් මිදිය නොහැක. යුද්ධයකින් ලැබූ භාණ්ඩයෙන් ඉතා සුළු ප්‍රමාණයක් අනුමැතිය නොමාතිව ගත් කෙනෙක් පිළිබඳ හදීසය මෙයට සාධකවේ.

බොහෝ මුස්ලිම්වරු මෙම ගුලූල් නම් පාපය සිදු කරති. කාර්යාලයෙන් කඩදාසි, පෑන්, වැනිදේ තම පුද්ගලික ප්‍රයෝජන සඳහා භාවිතා කරති. ආයතනයට අයත් ෆොටෝ කොපි යන්ත්‍රය, වාහනය, දුරකථනය, මුදල්,

සහ වෙනත් බොහෝ දේ අයිතිකරුගේ අනුමැතියෙන් තොරව භාවිතා කරති. මෙවැනි මහජන දේපළට හානියක් සිදු වුයේ නම් ඒවාට අපි වග කිව යුතුව තිබේ.

ඉස්ලාමිය සුභ සාධන කටයුතුවල නිරතවන මුස්ලිම්වරු මෙවැනි ගුලූල් නම් පාපයේ යෙදෙන්නේ නම් ඔවුන් එසේ යෙදෙන්නේ එය පිළිබඳ නිසි අවබෝධයකින් තොරවද? යන ප්‍රශ්න මෙහි අදාළවේ.

ඉස්ලාමයේ පස්වන කාලිෆා උමර් ඉබ්න් අබ්දුල් අසීස් (රලි) මෙහිදී අළංකාරවත් නිදසුනක් පෙන් විය. ඔහු තම නිවසේ ඉටිපන්දම් දෙකක් උපයෝගි කළේය. මහජන සේවයේ නිරතවන විට බයිතුල්මාල් මුදලින් මිළදී ගත් ඉටිපන්දම පාවිච්චි කරයි. තම පුද්ගලික කටයුතු සඳහා යෙදෙනවිට, තම මුදලින් මිළදී ගත් ඉටි පන්දම දල්වා ගනී. රාජකාරිය අවසන් වූ වහාම බයිතුල් මාල් මුදලින් ගත් ඉටිපන්දම නිවා දමයි.

අපේ වැඩපොළෙහි සහ කාර්යාලයෙහි, කඩදාසි වැනි දේ භාවිතා කරන විට මෙවැනි ක්‍රියා මාර්ගය අනුගමනය කළ යුතුයි. අපේ රාජකාරියට අදාළ කටයුතු වලට පමණක් කාර්යාලයේ පාරිභෝගික ද්‍රව්‍ය උපයෝගි කළ යුතුයි. කාර්යාලයේ විදුලිය සහ වෙනත් උපකරණ සඳහා විදුලිය අපතේ භාවිතා කිරීමෙන් වැළකිය යුතුයි. මෙවැනි ක්‍රියා මාර්ගයෙන් අපි හොඳ මුස්ලිම්වරුන් බවට පත්වන අතර, අපේ දුආ ප්‍රාර්ථනා අල්ලාහ් විසින් පිළිගනු ලබන්නේය.

මෙම හදීසයට අදාළ තවත් වැදගත් කරුණක් නම්, ආහාර පිළිබඳවද ප්‍රවේසම් වීම.

ආපන ශාලාවෙහි ආහාර සහ ටින් කෑම වර්ගයෙහි අඩංගු ආහාර පිළිබඳව අපි ප්‍රවේසම් විය යුතුයි. ආනයන කරන ලද ආහාර වර්ග ගැන වැඩි අවබෝධයෙන් සිටිය යුතුයි. ඒවා හලාල් ආහාරය දැයි සොයා බැලිය යුතුයි.

අපි ගන්නා ආහාර නිසා, සෞඛ්‍යට නොයෙක් හානි සිදුවිය හැක. ආහාරයට එකතු කරන නොයෙක් ද්‍රව්‍ය හලාල් ද හරාම් ද යන දැනුම මුස්ලිම්වරුන්ට අත්‍යවශ්‍යයි. අපේ ආහාර තයියිබාත් වීමට අප හැකි පමණ වග බලා ගත යුතුයි.

## අවසාන නිගමනය:

අපි කෑමට ගන්නා ආහාර නිසා අපේ සිතුවිලි සහ හැසිරීමෙහි බලපෑමක් තිබෙන බව විද්වතුන් පවසති. එනිසා, තය්යිබ් නම් පිරිසිදු ආහාර අපි කෑමට ගත යුතු අතර එවා ඉස්ලාම් පෙන්වන පරිදි සකස් කර තිබිය යුතුයි. මේ මගින්, ඊමානය තර කර ගනිමින් වඩා හොඳ මුස්ලිම් වරයෙකු බවට පත් වීමට අල්ලාහ් අපහට මාර්ගය පහසු කරයි. ආහාර පානාදිය පිරිසිදු මාර්ගයෙන් උපයා ගත්විට, එවා තය්යිබ් බවට පත්වන අතර, අපිද තය්යිබූන් නම් පිරිසිදු සහ ආශීර්වාද ලැබූ අය බවට පත්වන්නෙමු ඉන්ෂා අල්ලාහ්.

# ඉමාම් අල් නවවිගේ
# හදීස් වදන් 40 පිළිබඳ
# විවරණය

## 2 වන කොටස


කර්තෘ

මහාචාර්ය ජමාල් අහමද් බදී ඉ

පොදු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලය

මැලේෂියාව



සිංහල පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්

පටුන

11. සැක උපදවන ක්‍රියාවෙන් වැළකී සිටීම

12. ඵලදායී දේවල් ගැන සැලකිලිමත් වීම

13. සියලු මුස්ලිම්වරුන්ට ආදරය දැක් වීමට බැඳී සිටීම

14. මිනිස් ජීවිතයේ අගය

15. අසල් වැසියන් සහ අමුත්තන් සමඟ කථා කිරීම් හා හැසිරීම් හී ඉස්ලාමීය සාරධර්මය.

16. කෝපය මැඩ පවත්වා ගැනීම

17. ඉහ්සාන් (විශිෂ්ට භාවය) නම් සංකල්පය

18. තක්වා (ධර්ම ශීලතාවය) නම් සංකල්පය

19. අල්ලාහ්ගේ රැකවරණය

20. අල් හයා (විළිබිය) නම් සංකල්පය

# 11. සැක උපදවන ක්‍රියාවෙන් වැළකී සිටීම

මුහම්මද් රසූල් සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණෝ මෙසේ උපදෙස් දුන් බව එතුමාණන්ගේ මුනුබුරා වන අබි මුහම්මද් අල් හසන් බින් අලි බින් අබි තාලිබ් (රලි) වාර්තා කරයි.

"ඔබ සැක සහිත දැයින් ඉවත් වී, ඒ වෙනුවෙන් සැක රහිත පැහැදිලි දේ තෝරා ගනු මැනව." මූලාශ්‍ර අත් තිර්මිදි සහ අන් නසාඊ.

<u>මෙම හදීසයේ පසුබිම</u>

අංක 6 දරණ හදීසය හා මෙම හදීසය සැසඳේ. මෙහි දී අනුමත කළ දේ සහ තහනම් කළ දේ අතර තෝරා ගැනීම සඳහා නිර්ණය කිරීමට මාර්ගයක් පෙනේ. මෙම හදීසයේ තවත් වාර්තාවක, නබි සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණෝ තව දුරටත් මෙසේ කීහ. "ඇත්තෙන්ම සත්‍ය දේ සිත් සහනය ගෙන දෙයි, අසත්‍ය දේ සැක උපදවයි." එනම් ශාන්තිය හා සහනයට සත්‍යය මඟ පාදන අතර, අසත්‍යය දේ සිත් අවුල් කර සැක උපදවයි.

මෙලෙස පැහැදිලි කිරීමෙන් සැක උපදවන අසත්‍ය හෝ වැරදි කරුණු සහ ශාන්තිය සහ සතුට ගෙන දෙන සත්‍යය කරුණු යන දෙක පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණෝ ස්ථිර නිගමනයක්

පෙන් වූහ. අප ජීවිතයේ ඕනෑම අවස්ථාවක මෙම ප්‍රතිපත්තිය අදාළ වනු ඇත. සත්‍ය හා ධාර්මිකතාවට මඟ පෙන්වන මෙම හදීසය බොහෝ වැදගත් එකකි

## මෙයින් ඉගෙන ගන්නා පාඩම්

ඉස්ලාම් අනුමත කළ සහ යෝග්‍ය බව නිසැකව දන්නා ක්‍රියාවක් නම් පමණක් එය ඉටු කළ යුතුයි. එමගින් මෙලොව ජීවිතයේ සහ මතු ජීවිතයේ ශාන්තිය සහ සතුට ලබා ගත හැකි වේ. මෙය අප ජීවිතයේ අපට දෙන ලද සහනයකි.

අසත්‍ය දේ සැක උපදවන අතර, කිසි විටෙක සිත් සහනය ගෙන නොදෙයි. එනිසා, මූඃමින් වරයෙකුගේ සිත සැක සහිත දැයක් නිසා අසහනයෙන් කැලඹෙන්නේ නම්, ඔහු එම විෂයයෙන් ඉවත් විය යුතුයි. සැබෑ විශ්වාස වන්තයෙකු ගේ සිත සත්‍ය හා නිවැරදි දැයින් ශාන්ත බවට පත් වෙයි. අසත්‍ය හා වැරදි දෑ පිළිබඳ පුද්ගලයෙකුගේ සිත අසහනයට පත්වනු ඇත.

මෙම නිගමනය අල්ලාහ් විසින් අල් කුර්ආනය සහ සුන්නාහ් ලෙස පහළ කරන ලද වහී සියල්ලෙන්, යහ මඟට පිවිසුණු කෙනෙකුට පමණක් බලපාන නමුත්, මුස්ලිම් වුවත් තහනම් ක්‍රියාවන් හී යෙදෙන කෙනෙකුට මෙය අදාළ නැත.

හදීස් අනුගමනය කිරීමට කොන්දේසි කිහිපයක් ඇත.

- අල්ලාහ් කෙරෙහි විශ්වාසය.
- දැනුම නොහොත් අවබෝධය.
- වහී මාර්ගයෙන් ලැබෙන ඥානය අනුගමනය කිරීම.

වෙනත් වචන වලින් පවසන්නේ නම්, අල්ලාහ්ගේ නියෝග සහ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පෙන් වූ ජීවන මාර්ගය අනුගමනය කරන්නේ නම් පමණක් අපි යහ මඟට පිවිසෙන්නෙමු. තහනම් ක්‍රියාවන් හි යෙදී අනිවාර්යය ක්‍රියා වලින් ඉවත් වන කෙනෙකුට මෙම තත්ත්වය අදාළ නැත. එම තැනැත්තාගේ පාප ක්‍රියාවන් නිසා, ඔහු ජීවතුන් අතර සිටීමෙන්ද කිසිදු ඵලක් නැත.

ඇතැම් විට බරපතළ පාප ක්‍රියාවක යෙදුණු අය පවා සැක සහිත දේ වලින් ඉවත් වන්නට වෑයම් කරති. හුසෙයින් (රලි) තුමාව ඝාතන කළ මිනිසුන්, මදුරුවන් නැසීමට ඉස්ලාමයේ තිබෙන අනුමත ගැන සාකච්ඡා වෙහි යෙදීම මෙයට හොඳ නිදසුනකි.

සම්පූර්ණයෙන්ම යහපත් හෝ සම්පූර්ණයෙන්ම අයහපත් යැයි පැහැදිලිව වෙන් කළ නොහැකි කරුණු කිහිපයක් ඇත. යහපත් දේ සමඟ අයහපත් යැයි කිව

හැකි ඇතැම් කරුණු ඇත. මෙවැනි අවස්ථාවන් හි එයින් සිදු විය හැකි ප්‍රතිඵල ගැන සොයා බලා ප්‍රවේශමින් ක්‍රියා කළ යුතුයි. මෙහිදී අල් කුර්ආනය සහ සුන්නාහ්ව අපට මඟ පෙන්වන්නක් වශයෙන් පත් කර ගත යුතුයි. මේවාට එකඟව, ඇතැම් අවස්ථාවන් හි විශාල පාඩුවක් වළකාලීම පිණිස හෝ විශාල වාසියක් ලබා ගනු පිණිස, සුළු වාසියක් පරිත්‍යාග කිරීමට හෝ සුළු පාඩුවක් විඳින්නට සිදු වන බව පෙනේ.

මෙම විෂය පිළිබඳව විද්වතුන් අතර මත භේදයක් නොමැති බවද එක් එක් අවස්ථාවන් හි තිබෙන සාක්ෂි වලට එකඟ ව තීරණ ගත් බවද අපි අවබෝධ කර ගත යුතුයි.

මෙහි නිදසුනක් නම්, අපේ ඇඳුමෙ හි අපවිත්‍ර දෙයක් තැවරුනු බව දන්නා නමුත්, එය කොතැනක දැයි සැකයක් තිබේ නම් ඇඳුම සම්පූර්ණයෙන්ම සේදිය යුතුයි. එමෙන්ම, රකඅ ගණනෙහි අමතක වීමක් සිදුවුයේ නම්, මතක තිබෙන රකඅතය නිවැරදි බව පිළි ගෙන ඉතිරි රකඅ ගණන නිම කළ යුතුයි.

තවත් වැදගත් දෙයක් නම්, යම් කරුණක් පිළිබඳව අල් කුර්ආනය සහ සුන්නාව පැහැදිලිව නිගමනය කර තිබේ නම්, එහි දී ඉජ්තිහාද් කිරීමට අවශ්‍යතාවක් නැත.

ෂරීයාවෙ හි හලාල් යනුවෙන් පැහැදිලිව නිගමනය කරන ලද දැයක් ප්‍රතික්ෂේප කිරීම බැතිමත්කමේ

ලක්ෂණයක් නොවන්නේය. යම් ආහාරයක් අනුමත කර තිබියදී, එය අනුභව කිරීමෙන් වැළකී සිටීම කුසල් ක්‍රියාවක් ලෙස සැලකීම වරදකි. එසේ වැළකී සිටින කෙනෙක් අල්ලාහ්ගේ ආශීර්වාදය නොලබයි.

මිනිසුන් තිදෙනෙක් ගත් තීරණය පිළිබඳ කථාව දෙස බලමු. එක්කෙනෙකු රාත්‍රියේ නින්දට නොගොස් නොකඩවා සලාහ් කරන බව තීරණය කළේය. අනිත් මිනිසා දිනපතා නොකඩවා උපවාසයේ යෙදෙන බවද, තුන්වැන්නා විවාහ නොවී ජීවත් වන බවද තීරණ කළේය. ධාර්මිකතාව රකිනු පිණිස ඔවුන් මෙම තීරණය ගත්හ. ඔවුන් ගැන ආරංචි වූ රසූල් සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණෝ, අසතුටු වූහ. ඔවුන් තිදෙනා කැඳ වූ රසූල් සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණෝ, ඔවුන් සියලු දෙනාට වඩා තමා ධර්මිෂ්ඨ බැතිමතෙක් වන නමුත්, තමා නිදාගන්නා බවද, ආහාර ගන්නා බවද, විවාහ වන බවද පැවසූහ. අවසානයේදී, ”මෙය මගේ මාර්ගය වේ. මෙය අනුගමනය නොකරන කෙනෙක් මට අයත් නොවන්නේය.”යනුවෙන් පැවසූහ.

එහෙයින්, බැතිමත්කමක් යැයි පවසා ඉස්ලාමය අනුමත කළ දැයක් අනුගමනය නොකිරීමට අනුමත නැත. එහෙත්, වෙන යම් හේතුවක් නිසා එසේ කිරීමෙන් වැළකිය හැක. නිදසුනක් වශයෙන් මාංශ ආහාර අනුමත නමුත් සෞඛ්‍ය හේතු මත එය අනුභව කිරීමෙන් වැළකී සිටිය හැක.

තහනම් දැයක් අනුමත කළ බව පෙන්වීම සාතාන්ගේ ක්‍රියාවකි. සාතාන්ගේ මුළාවට හසු නොවීමට කවුරුත් පරික්ෂාකාරිව සිටිය යුතුයි. යමක් හරාම් බවට ඉස්ලාම් පවසන්නේ නම්, එය කවදත් හරාම්ය. සාතාන්ගේ මුළාවට හසු වී හරාම් දේ පිළිබඳව අප ලැබූ අවබෝධය වෙනස් කර, ඒවා අනුමත කළ දෙයක් බවට පත් කර ගැනීමට අපට අනුමත නැත.

මෙම නවීන යුගයේ, වෙළඳ ව්‍යාපාර ගනු දෙනු වල යම් ප්‍රමාණයක පොලිය ද මිශ්‍ර වී තිබිය හැකි බව ෂෙයික් ජමාල් උද් දීන් සZරබෝසාZ නම් විද්වතෙක් අදහස් දක්වයි. මෙවැනි අවස්ථා බොහෝමයක් තිබෙන අතර, මේවා හලාල්ද නැතහොත් හරාම්ද යන අවුලක්ද තිබේ. මෙවැනි අවස්ථාවන් හි සැක සහිත දේවලින් මිදීම නුවණට හුරු බව ඔහු තව දුරටත් අදහස් දක්වයි.

මෙවැනි ප්‍රශ්න පිළිබඳව විද්වතුන් නොයෙක් සාකච්ඡා පැවැත් වූ නමුත්, එහි යොදා ගන්නා ලද නිගමනයන් පිළිබඳව මුස්ලිම් සමාජයේ බහුතරයක් නොදනිති. විද්වතුන් සාකච්ඡා කරන කරුණු මුස්ලිම් සමාජයේ ජනතාව දැන සිටිය යුතුයි. මෙවැනි ප්‍රශ්න පිළිබඳව අපද දැනුම ලබා ගත යුතුයි.

<u>නිගමනය</u>

හලාල් සහ හරාම් ගැන මුස්ලිම්වරු නිසි අවබෝධය ලැබිය යුතු අතර මෙමගින් නිවැරදි නිගමනයට මුස්ලිම්වරුන්ට පැමිණිය හැක.

## හදීස් අංක 12: ඵලදායී දේවල් ගැන සැලකිලිමත් වීම

රසූල් සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් මෙසේ පැවසූ බව අබූ හුරෙයිරා (රළි) වාර්තා කරයි. " තමන්ට අදාළ නොමැති දැයින් වැළැකී සිටීම කෙනෙකුගේ ඉස්ලාමීය ලක්ෂණය වේ." මූලාශ්‍ර තිර්මිදි, මෙය හසන් හදීසයකි.

<u>මෙහි පසුබිම</u>

ඉමාම් අන් නවවි ගේ හදීස් වදන් හතළිහට විවරණය ලියූ ඉබ්න් රජබ්, ඉස්ලාමයේ හැසිරීම, චර්යාව සහ සුසිරිත් සියල්ලට මුල මෙම හදීස් වදන යැයි සඳහන් කරයි.

පහත සඳහන් හදීස් වදන් හතර ඉස්ලාමයේ උසස් චර්යාවන් සහ හැසිරීම් සඳහා ප්‍රධාන සංකල්පය සපයන බව මාලිකි මදහබ් හදාරන ඉබ්න් අබි සෙZයිද් අල් කයිරවානි ඉමාම් වරයා පවසන බව ඉමාම් රජබ් දන්වයි.

1. ඉහත සඳහන් මෙම හදීස් වදන.

2. “අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාසය තබන්නෙකු යහපත් වදන් පැවසිය යුතුයි, නැතිනම් නිහඬ විය යුතුයි“ යන හදීසය. (හදීස් අංක 15 බලන්න).

3. මිනිසෙක් නබි සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණන් වෙතට පැමිණ ”මට උපදෙස් දෙන්න” යැයි ඉල්ලීය. එවිට එතුමා, ”කෝප නොවී සිටින්න.” යනුවෙන් පිළිතුරු දුන්හ. ඒ මිනිසා තම ඉල්ලීම නැවත නැවත කිහිප වරක්ම ඉදිරිපත් කළ නමුත් නබි තුමාණෝ ඔහුට කෝප නොවී සිටින්න.” යනුවෙන් පිළිතුරු දුන්හ.
මෙම පොතෙහි 16 වන හදීසය බලන්න.

- ”තමා කැමති දේ තම සොයුරාටද ලැබේවා යැයි පතන තුරු, ඔබෙන් කිසිවෙක් සැබෑ ඊමානය ලැබුවේ නැත.” යන හදීසය, 13 වන හදීසය බලන්න.

## <u>මෙයින් ඉගෙන ගන්නා පාඩම්</u>

මූඃමින් වරයෙක් තමාට අදාළ නොවන සියලු දැයින් ඉවත් වී සිටිය යුත බව මෙම හදීසය පවසයි. දේව විශ්වාසයට අදාළ නොවන කිසිදු කථා හා ක්‍රියා ඔහුගේ මෙලොව ජීවිතයට හෝ මරණයෙන් පසු ජීවිතයට හෝ කිසිදු ඵලක් ගෙන නොදෙයි. තම සියලු

අවශ්‍යතා පවා ඉටු කර ගන්නට කාල වෙලාවක් නොමැතිව කාර්ය බහුලව සිටින කෙනෙකුට අනවශ්‍ය දේවලට සිත යොමු කරන්නට කිසිසේත්ම නොහැකි වන බව ඉමාම් ඉබ්න් අරබ් පවසයි. සමාජයට සිදු විය හැකි ඕනෑම අනතුරකින් මුදවා ගන්නට ඉස්ලාම් සමත් බව ෂෙයික් ජමාල් උද්දීන් සZරබෝ්සෝ්Z පවසයි. සමාජයට යම් අනතුරක් සිදු වීමට ප්‍රධාන හේතුව මිනිසුන් අනවශ්‍ය දේවලට සහ තමන්ට අදාළ නොවන විෂයයන්ට සම්බන්ධ වීම සහ තමන්ට කිසිසේත්ම අදාළ නොමැති අනුන්ගේ කටයුතු වලට මැදිහත් වීමයි. මේ නිසා සමාජය තුළ විශාල ආරවුල් සිදු විය හැක. අද සමාජයේ පවතින ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා රසූල් සල්ලල්ලාහු ව සල්ලම් තුමාණෝ එදා ක්‍රියා මාර්ග නිර්දේශ කළහ. අද සමාජයේ හට ගන්නා ප්‍රශ්න රාශියක් විසඳීමට සහ සෑම කෙනෙක්ම සහනයෙන් ජීවත් විය හැකි ස්ථානයක් බවට මෙලොව පත් කරගන්නට එදා රසූල් තුමාණන් පැවසු මෙම හදීස් වදන් බොහෝ වැදගත්ය.

මෙලොවට සහ මරණයෙන් පසු ජීවිතයට ඵලදායි දෑ ගැන පමණක් සිත යොමු කිරීමට මූඃමින්වරු පුරුදු විය යුතු අතර, මිනිසාගේ ස්වාභාවික ගුණාංගයක් බවට එය පත් විය යුතුයි. මෙලොව සහ මරණයෙන් පසු කිසිදු ඵලක් නොමැති දේවල් සඳහා කාලය සහ මුදල් වැය කිරීමෙන් වැළකිය යුතුයි.

මෙලොව සහ මරණයෙන් පසු ජීවිතයේ තමාට ඵලදායිතාව ගෙන දෙන දේවල් පිළිබඳව පමණක් උනන්දු වීම මුඃමින් වරයෙක් තම ඊමානයේ ශ්‍රේෂ්ඨත්වය ලබා ගැනීමේ මාර්ගයක් බව මෙම හදීසය පවසයි. ''ඔබට ඵලදායිතාව ගෙන දෙන දේවල් ගැන පමණක් උනන්දු වී, අති බල අල්ලාහ් ගෙන් උපකාරය පතනු. නොසැලකිලිමත් නොවනු'' යනු මෙයට අදාළ තවත් හදීසයකි.

මුස්ලිම්වරයෙකුට සිය අවධානය යොමු කරන්නට අවශ්‍ය තරම් කරුණු තිබෙන අතර, ඒවා සියල්ල ගැන සැලකිලි දක්වන්නට ඔහුට කාලය නැත. මෙහි දී කාලය කළමනා කරණය පිළිබඳ ප්‍රශ්න පැන නගින හෙයින්, අපහට අදාළ කරුණු ගැන පමණක් අප අවධානය යොමු කළ යුතුය.

මෙහි දී ඉතා වැදගත් ප්‍රශ්නයක් පැන නගී. එනම්, මුස්ලිම් වරයෙක් සැබැවින්ම අවධානය යොමු කළ යුතු වැදගත් කරුණු මොනවාද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමෙන්, මෙම හදීසය නිසියාකාරව අවබෝධ කරගෙන එය අනුගමනය කිරීමට හැකි වේ. මේ සඳහා මුස්ලිම් වරයෙක් පහත සඳහන් විෂයයන් කෙරෙහි සිත යොමු කළ යුතුයි.

- ඉස්ලාම් හි වාජිබාත් නම් අත්‍යවශ්‍ය කරුණු නිසියාකාරව ඉෂ්ට කිරීම. මුස්ලිම් වරයෙක් ආගමෙහි අත්‍යවශ්‍ය ක්‍රියා සියල්ල තමාට හැකි

අයුරින් ඉටු කිරීම, ඉන් පසුව දහමෙහි නිර්දේශ කරන ලද (මන්දූබාත්) ක්‍රියා සියල්ල හැකි පමණින් ඉටු කිරීම, ඉන් පසුව නබි තුමාණෝ දහමෙන් තහනම් කළ (හරාම්) කටයුතු සියල්ලෙන් ඉවත් වීම, සහ දහමෙහි ප්‍රිය නොකරන (මක්රූහ්) සියල්ල මගහැරීම යන කරුණු කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කිරීම වැදගත්ය.

- කෙනෙක් අත්‍යවශ්‍යයෙන් කළ යුතු කරුණු සියල්ල පෞද්ගලිකව ඉටු කිරීම. මේවායෙ හි අප සියලු දෙනාම අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු නැමදුම සහ ප්‍රාර්ථනා යන සියලු කරුණු අඩංගු වේ.

- ෆර්ද් කිෆායා යනුවෙන් හැඳින්වන සමාජය විසින් ඉටු කළ යුතු අනිවාර්යය කරුණු ඉටු කිරීම. මෙම ක්‍රියා කිසිවක් අත පසු නොකළ යුතු අතර, මෙය සෑම මුස්ලිම් කෙනෙකුගේ සැලකිල්ලට යොමු විය යුතුයි. නිදසුනක් වශයෙන් සමාජයේ වර්ධනය සඳහා කටයුතු කිරීම. සෑම කෙනෙක්ම තම හැකියාවෙන් සහ දැනුමෙන් සමාජ සංවර්ධනයට දායකත්වය ලබා දීම යන කරුණු මෙහි අඩංගු වේ.

- යහපත් දේ අණ කර අයහපත් දේ තහනම් කිරීම. පාපයන්ට සහ වැරදි මාර්ගයට යෑමෙන් සමාජය රැක ගැනීම සමඟ තම තමන්ගේ කටයුතු වලට වගකීම භාර ගැනීම තුළින් ඉහ්සාන් නම් අල්ලාහ් වෙනුවෙන් ක්‍රියා කිරීමේ මාර්ගයට පිවිසීම. මේ ගැන අල් කුර්ආනය මෙසේ පවසයි.

*"ඔබ අතරින් කවරෙකු ක්‍රියාවෙන් ඉතා ලක්ෂණ දැයි ඔබ පිරික්සනු පිණිස මරණයත් ජීවිතයත් නිර්මාණය කළ ඔහු බලසම්පන්නය.ක්ෂමාශීලිය."*
සූරා අල් මුල්ක් වාක්‍ය 2.

- තමන්ගේ, සමාජයේ සහ මුස්ලිම්වරුන්ගේ සුභ සාධනය ගැන සිත යොමු කිරීම. මේවා ගැන තවුරුත් අමතක කරන අතර, මුස්ලිම්වරුන්ද සැලකිලිමත් නොවෙති. මුස්ලිම් වරුන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳව සතුටු වීම වෙනුවට, එය තව තවත් වර්ධනය කිරීමට දායක වන්නේ කෙසේ දැයි කල්පනා කළ යුතුයි. නැමදුම් හී පමණක් නිරත වන්නෙක්, වෘත්තියක යෙදෙන්නෙක්, ගුරුවරයෙක් හෝ ධර්ම දේශනා කරන්නෙක් වශයෙන් අපි කුමන තත්ත්වයක සිටිය හැකි නමුත් මෙය අපි සියලු දෙනාට අදාළ එකකි. අල්ලාහ්ට පමණක් අපි වහල් විය යුතු

අතර, අන් කිසිවෙකුටත් එසේ නො විය යුතුයි. ඒ සමඟ වර්තමාන සමාජ ක්‍රමයට හෝ පිළිවෙතට අපි වහල් නොවී, ෂරීආවට එරෙහි නොවන ඕනෑම ක්‍රමයක් මේ සඳහා යෙදිය හැක. නවීන කළමණාකරන උපකරණය වන අදහස් රැස්කිරීම, ප්‍රශ්න විසඳීම වැනි මාර්ගයද උපයෝගී කළ යුතුයි.

නවීන තාක්ෂණ හා මාධ්‍ය විප්ලවය නිසා අපි බොහෝ දෙනෙක් ඒවාට බුද්ධි මට්ටමෙන් වහල් බවට පත් ව සිටිමු. මෙම මානසිකත්වය ඉවත් කර, අනාගත පරපුර සඳහා දැනුම් මධ්‍ය ස්ථානයක් වහාම සූථාපිත කළ යුතුයි. මෙම කටයුතු අපි ඉට කළ යුත්තේ අල්ලාහ්ගේ සේවයක් වශයෙනි. එසේ නොමැති නම්, අපේ අනාගත පරපුර වැරදි මාර්ගයේ ගමන් කරන්නට අපිද හේතුවක් බවට පත්වන්නේමු. අනාගත පරපුර සඳහා කිසිවක් නොකර අපේ එදිනෙදා ජීවිතය ගැන පමණක් අපි කල්පනා කරමින් සිටියහොත්, අන් අය ඔවුන්ගේ සිතුවිලි අප මත පට වන්නට සහ අපේ දෛනික ජීවිතය ඔවුන්ගේ වුවමනා පරිදි සැලැසුම් කරන්නට අපි ඉඩ දීමට සිදුවන බව වටහා ගත යුතුයි. මෙයින් ඉස්ලාමය අගය කරන ජීවන මාර්ගයෙන් ඉවත් වන්නට අපට සිදු වනු ඇත.

## නිගමනය.

මුස්ලිම්වරයෙකු වශයෙන්, පුද්ගලයෙකු වශයෙන්, සමූහයක් හා සමාජයක් වශයෙන් (උම්මාව) මුහුණ

දෙන ප්‍රශ්න රාශියක් ඇත. මෙම ප්‍රශ්නය, අභියෝගය සහ තර්ජනය ගැන අපි සමාජයට අවබෝධ කළ යුතුයි. මෙය ඉටු කිරීමට සුදුසු ක්‍රමය වන්නේ සාකච්ඡා හා සංවාදයයි. බලයේ සිටින නායක පිරිසට මෙය විශාල වගකීමකි. කාලය සහ වෑයම අපතේ විනාශ නොකිරීමට අපි පුහුණු විය යුතුයි. අපට සහ උම්මාවට යහපත් ගෙන දෙන ක්‍රියාවන්හී අපි කවුරුත් යෙදිය යුතුයි.

## 13 - සියලු මුස්ලිම්වරුන්ට ආදරය දැක්වීමට බැඳී සිටීම

අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණන්ගේ සේවකයෙක් වශයෙන් කටයුතු කළ අබූ හම්සා අනස් ඉබ්න් මාලික් (රළි) මෙසේ වාර්තා කරයි. 'තමන් කැමති දේ තම සහෝදරයාටද (ලැබිය යුතුයැයි) ප්‍රිය කරන තුරු ඔබලාගෙන් කිසිවෙක් සැබෑ විශ්වාස වන්තයෙක් වන්නේ නැත.' යැයි රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසුහ. මූලාශ්‍රිත අල් බුහාරි සහ මුස්ලිම්.

<u>මෙහි පසුබිම</u>

ඉමාම් අහමද්ගේ මුස්නද් ග්‍රන්ථයේ නබි සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමාණෝ මෙසේ පැවසූ බව සඳහන් වී ඇත. 'අල්ලාහ්ගේ සේවකයෙක්, ඔහු

කැමති දේ තම අන් අයටද ලැබිය යුතු යැයි පතන තුරු ඊමානයේ සැබෑ තත්ත්වය ලබන්නේ නැත.'

නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ මෙසේ පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්න් අම්ර් ඉබ්න් අල් ආස් (රලි) තුමා වාර්තා කරයි. 'අපාය ගින්නෙන් මිදී, ස්වර්ගයේ උයනට පිවිසීමට කැමති කෙනෙක් අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස සහිතවද තමාට අන් අය කෙසේ සැලකිය යුතුයයි බලා පොරොත්තුවන්නේ ද, ඒ ආකාර යෙන් ඔහුද අන් අයට සැලකලි දක්වා, මරණයට පත් විය යුතුයි.' මූලාශ්‍රිතය සහීහ් මුස්ලිම් පොත් අංක 20 හදීස් අංක 4546.

<u>මෙයින් ඉගෙන ගන්නා පාඩම්</u>

ඉහත සඳහන් හදීස් වදන් තුනම එක හා සමාන අදහස් දක්වයි. එනම්, තමන්ට පතන දේ, අන් මුස්ලිම්වරුන්ටද ලැබිය යුතු යැයි පැතිය යුතුයි. මුස්ලිම්වරු එකිනෙකා අතර හැසිරිය යුතු ආකාරයද මෙයින් පෙන්නුම් කරයි. සැබෑ ඉස්ලාමිය සමාජයක් ආදරය හා කරුණාව මත ගොඩ නැගිය යුතු වෙයි. එහි සාමාජිකයෝ එකිනෙකාට සැලකිලි දක්වා උපකාර කළ යුතුය. අන් අය තමන්ට සැලකිය යුතු යැයි බලාපොරොත්තු වන ආකාරයෙන් තමන්ද අන් අයට සැලකිලි දැක් විය යුතුය.

සහෝදරත්වය සහ ආදරය වැනි ඉස්ලාමීය සංකල්ප ක්‍රියාත්මක කරන සැබෑ ඉස්ලාමීය සමාජයක් ස්ථාපිත කරන්නට ජාතිය, වර්ණය, මද්හබය, කල්ලිය හෝ පංති භේදය වැනි බාධා පමණක් නොව ඊර්ෂියාව, ආත්මාර්ථකාමි භාවය සහ කුහකකම වැනි සියල්ල ඉවත් කළ යුතුයි.

අන් අයට යහ දේ ලැබිය යුතු යැයි පැතීම, ඔවුන්ට ආදරය කිරීම වේ. "අපට ලැබේවා" යයි පතන යහ දේ අන් අයටද ලැබිය යුතු යැයි පැතීම මගින් අපට ඔවුන් සැලකිය යුතු යැයි අප බලාපොරොත්තු වන අයුරින්ම අපද ඔවුන්ට සැලකිලි දැක් විය යුතුයි..

සමාජයේ මුස්ලිම්වරු සමඟ ආශ්‍රය කරන විට උසස් අයුරින් කටයුතු කළ යුතුයි. කථා කරන විට අලංකාරවත් විනීත වචන භාවිත කළ යුතුයි.

*"විශ්වාස කරන අයවලුනි! බිය බැතිමත් වවු. සත්‍ය වචන පවසවු."* යනුවෙන් සූරා අල් අහ්ඃසාබ් 33, වාක්‍ය 70 අපට අවවාද කරයි.

*"ඉතා යහපත් දැය කථා කරවු, යැයි මගේ වහලුන්ට කියව. සැබැවින්ම ෂෙයිතාන් ඔවුන් අතර (සතුරුකම්) ඇති කරන්නේය. සැබැවින්ම ෂෙයිතාන් මිනිසාට ප්‍රකට සතුරෙකි."* සූරා අල් ඉස්රා 17 වාක්‍ය.

මෙම වාක්‍යය පෙන්වන අයුරින් යහපත් වචන මගින් මුස්ලිම් සමාජය තුළ ආරවුල් සහ ගැටුම් අවම කළ හැකිය.

අන් අය සමඟ ආශ්‍රය කරන විට මෛත්‍රිය සහ කරුණාව දැක්විය යුතුයි. අල් වලා නම් වැදගත් ඉස්ලාමීය සංකල්පයට මෙය මඟ පාදයි. සමාජයේ මුස්ලිම්වරු අතර තිබිය යුතු සම්බන්ධතා අල් වලා මත පදනම් විය යුතුයි. එහි අර්ථය 'ආරක්ෂාව' බව ඇතැම් අය අදහස් දක්වන නමුත් ආදරය, සැලකිලි හා සහය දීම යන සියලු අර්ථය එහි ආවරණය වේ. මෙම අර්ථයන් හතරම මෙහි අන්තර්ගත වී තිබෙන බව විද්වතුන් අදහස් දක්වති. සැබැවින්ම මෙම ගුණාංග සියල්ල එකිනෙකට සම්බන්ධ බව පෙනේ. ආදරය නිසා කෙනෙකුට සැලකිලි දැක්වීම මෙයට අගනා නිදසුනකි. මුස්ලිම්වරුන් අන් මුස්ලිම් වරුන්ට ආදරය හා සැලකිලි දැක් විය යුතු බව මෙම හදීසය පෙන්වයි.

අපි ප්‍රවේශම් විය යුතු තවත් හැසිරීමක් නම්, උඩඟුකම වේ. උඩඟුව හෝ අහංකාරය විවිධ අයුරින් ඇති වේ. අන් අයට නින්දා කිරීම, ඔවුන්ව සුළු කොට තැකීම, අන් අයට වඩා තමා උසස් බව සිතීම මෙවායින් සමහරකි. නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ මෙසේ පැවසූහ.

'සිතෙ හි අබ ඇට ප්‍රමාණයක හෝ අහංකාරය තිබෙන කෙනෙකු ස්වර්ගයට පිවිසෙන්නේ නැත.' මෙයට සවන් දුන් කෙනෙක් ඇත්තෙන්ම තම ඇඳුම අලංකාර විය යුතුයි, තම පාවහන් ලස්සන විය යුතුයි යනුවෙන් කෙනෙක් සිතනු ඇත.' යැයි කීය. එවිට නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ, 'ඇත්ත

වශයෙන්ම අල්ලාහ් සුන්දරයි. ඔහු අලංකාරයට කැමතියි. සත්‍ය පිළිකුල් කිරීම සහ මිනිසුන් හැල්ලුවට ලක් කිරීම උඩංගුකම වේ' යැයි කීහ. මූලාශ්‍රිතය: සහීහ් මුස්ලිම්.

එහෙයින් අප නිතර නිහතමානි ලෙස, අන් අයට කරුණාව දැක්විය යුතුයි. උපදෙස් ලබා දීම, යහ දේ කරන ලෙස උනන්දු කිරීම සහ අයහපත් දේ කිරීමෙන් වැළැක්වීම යනු අන් අයටත් යහ දේ ලැබිය යුතු යැයි පැතීමේ කොටසකි. අන් අයට උපදෙස් දෙන විට කරුණාව පදනම් කර ගෙන "ඔවුන්ටද යහපතක් සිදු වේවා" යැයි පැතිය යුතු අතර, අන් අයගෙන් පැසසුම් නොපැතිය යුතුයි. නබි සල්ලල්ලාහු අලෛයිහි ව සල්ලම් තුමාණෝ උපදෙස් දෙන විට ඒ අයට මෛත්‍රිය දැක් වූහ. මෙවැනි අවස්ථාවන් හි, අන් අයට තිබෙන ආදරය නිසා අප මේ ආකාරයෙන් උපදෙස් දෙන බව ඔවුන්ට අවබෝධ කළ යුතුය. යම් කෙනෙකුට පමණක් අදාළ උපදෙස් දෙන්නේ නම්, එය පුද්ගලිකව, අන් අය ඉදිරියේ ප්‍රසිද්ධියේ සිදු නොකිරීමට වග බලා ගත යුතුය.

අප තුළ වැරදි හා අඩුපාඩු තිබිය දී ඒවා නිවැරදි කර ගන්නට වෑයම් නොකර, අන් අයට යහපතක් සිදු විය යුතු යැයි පැතීමෙන් ඵලක් නැත. අප තුළ යම් යහපතක් තිබේ නම් එය ඉස්ලාමයෙන් අප ලබා ගත් ආශීර්වාදයකි. මේ හේතුවෙන් අන් අයටත් ඒවා ලැබිය යුතු බව සලකන්න. එහෙත් අප තුළ තිබෙන වැරදි හා

අඩුපාඩු ඔවුන්ටත් තිබිය යුතු යැයි පැතීම වරදකි. මේ නිසා මෙලෙස යහදේ පැතීම අප නොකඩවා වර්ධනය කළ යුතු යහ ගුණයට මග සලසයි.

ඉස්ලාමයේ සහෝදරත්වය පිළිබඳ ප්‍රශ්නයක් මෙහි අදාළ වේ. ලොවේ මුස්ලිම්වරු බොහෝ දෙනෙක් සිටින නමුත් අල්ලාහ්ගේ කරුණාවට ලක් වූ අය හැර බොහෝ අයගේ ඊමානය ඉතා දුර්වලය. ඇතැම් මුස්ලිම්වරු ඉස්ලාමයේ මූලධර්මයට පටහැණිව ජීවත් වෙති. පසු ගිය කාලයේ මෙවැනි අයගෙන් යහපත් මුස්ලිම්වරු ඇත් වී ජීවත් වූහ. නමුත් අද එවැන්නක් කිරීම සුදුසු නැත. ඉස්ලාමයේ අවම විශ්වාසය සහිතව සිටින අය පවා මුස්ලිම් සහෝදරවරු බව පිළි ගත යුතුය. මෙවැනි අයටද අප ආදරය දක්වමින්, 'ඔවුන්ටද යහපත් දේ සිදු වේවා' යැයි පැතිය යුතුය. ඔවුන් පාපයක් සිදු කළ හොත් ඔවුන්ට කරුණාව දක්වමින්, එම පාපයෙන් ඔවුන් මුදවා ගන්නට වෑයම් කළ යුතුය. ඔවුන් කෙරෙහි තිබෙන ආදරය සාධක කරමින් ඔවුන්ට උපදෙස් දිය යුතුයි.

## <u>නිගමනය</u>

මෙම හදීසය ඕනෑම අවස්ථාවක, ඕනෑම තරාතිරමක අයත් ඕනෑම මුස්ලිම් වරයෙකුට අදාළ වෙයි. උපදෙස් දීම, ආධාර දීම, යහ දේ කරන ලෙස හා අයහපත් දැයින් වැළකෙන ලෙස උපදෙස් දීම මෙහි අඩංගු වෙයි. මෙම හදීසය අනුගමනය කිරීමේදී එයට අදාළ

අනිකුත් හදීස් ගැනද සොයා බලා ඒවාද අනුගමනය කළ යුතුයි.

## 14. මිනිස් ජීවිතයේ අගය

ඉබ්න් මස්ඌද් (රළි) මෙසේ වාර්තා කරයි. ”විවාහකයෙකු දුරාචාරයේ හැසිරීම, අසාධාරණ ලෙස මුස්ලිම් වරයෙක් ඝාතනය කිරීම සහ ආගම අත හැර දමා ඉස්ලාම් ජන සමාජයෙන් පලා යෑම (එරෙහිව ක්‍රියා කිරීම) යන හේතුන් තුන හැර වෙනත් කිසිදු හේතුවක් නිසා මුස්ලිම් වරයෙකුගේ රුධිරය සෙලීම අනුමත කළ නොහැක.” යැයි මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම් තුමාණෝ පැවසූහ. මුලාශ්‍රිත සහීහ් බුහාරි සහ මුස්ලිම්.

<u>මෙහි පසුබිම</u>

ඉස්ලාමයට පෙර වූ යුගයේ මිනිස් ජීවිතයට කිසිදු වටිනා කමක් නොතිබුණි. පළි ගැනීම හෝ තම ගෝත්‍රයේ කීර්තිය ප්‍රකාශ කිරීම වැනි නොයෙක් හේතූන් සඳහා මිනිස් ඝාතනය කරනු ලැබීය. පවුලේ අයට අපකීර්තිය ගෙන දෙයි යන සැකය මත ඉපදුණු විගස ගැහැණු දරුවෝ පහසුවෙන් මරණයට පත්කරනු ලැබූහ. මෙවැනි වාතාවරණයක සෑම ප්‍රාණයක්ම වැදගත් බව අවබෝධ කර දුන්නේ ඉස්ලාම් ය. සෑම ප්‍රාණයක්ම ඉතාමත් පවිත්‍රය. ෂරීආ නීතියට එරෙහි ව කටයුතු කළ බවට සුදුසු නීතිමය හේතුවක් නොමැතිව

ජීවිතයක් විනාශ කළ නොහැක. මේ අනුව, ප්‍රාණයක් නැති කිරීමේ අයිතිය අධිකරණයට පමණක් අයත් ක්‍රියාවකි. පෞද්ගලික හේතුවක් මත ප්‍රාණයක් විනාශ කිරීම වලක්වනු පිණිස මෙම නීතිය අවශ්‍ය වේ.

පිරිමියෙකුගේ හෝ කාන්තාවගේ ප්‍රාණය නැති කිරීමේ අවස්ථාව අවම කරනු පිණිස, ඉස්ලාම් නොයෙකුත් නීති රීති පනවා ඇති බව මෙම හදීසය පෙන්වයි. (z)සිනා නම් කාම මිත්‍යාචාරි ක්‍රියා නිසා සමාජයකට පැන නගින තර්ජනයට ඉස්ලාම් දඬුවම් පනවා ඇත.

'ඉස්ලාම් හි බල කිරීමක් නැත.' යනුවෙන් අල් කුර්ආන් වාක්‍ය 2:256 තහවුරු කරයි.

*'යම් කෙනෙක් විශ්වාස කොට, පසුව ප්‍රතික්ෂේප කොට, යළි විශ්වාස කොට, යළි ප්‍රතික්ෂේප කොට, යළි ප්‍රතික්ෂේප යෙහිම මුහුකුරා ගියේද, අල්ලාහ් ඔවුන්ට සමාව නොදෙන්නේමය. තවද ඔවුන් යහමගෙහි නොයවන්නේ මය.'* යන අල් කුර්ආන් වාක්‍ය 4:137 අල්ලාහ්ගෙන් ලැබෙන දඬුවම ගැන අවවාද කරයි. එපමණක් නොව, ආගම අත හැර දමා ගිය අයට (මෙලොව මරණයෙන් පසුව) ආඛිඃරාවෙ හී දඬුවම් තිබෙන බව පවසන තවත් අල් කුර්ආන් වාක්‍ය කිහිපයක් තිබිය දී කෙනෙක් ඉස්ලාමය හැර දමා ගිය එකම හේතුවකට ඔහුට හෝ ඇයට මරණ දඬුවම පණවයිද?

ආගමෙන් බැහැර ගොස් සමාජ විරෝධි ක්‍රියාවන් හි යෙදෙන කෙනෙකුට ඉස්ලාම් දඬුවම් පනවයි. මෙහි දී ඔහුට දෙන ලද දඬුවම ආගම හැර ගියාට නොව, සමාජයට එරෙහිව ඔහු විසින් සිදු කරන ලද වරදටය. මෙවැනි කෙනෙකුට මුස්ලිම් නොවන සමාජයන් හි පවා කුමන්ත්‍රණය කිරීමේ වරදට දඬුවම් පනවනු අපි දකිමු. දැනුම සහ යහ මාර්ගයට ඇරයුම් දීම ඉස්ලාමීය සමාජයේ නිතර සිදු කෙරෙන කාර්යයකි. සමාජයට ඉටු කළ යුතු ආගමික වගකීම මුස්ලිම්වරු දනිති. මෙවැනි සියලු නීති රීති ඉස්ලාම් පනවා තිබෙන්නේ මිනිස් ජීවිතය ආරක්ෂා කරනු පිණිසය.

මෙමගින් ඉස්ලාමයේ ආරම්භක යුගයේ මුස්ලිම් සමාජයේ ජීවිත හානි සිදු වීම අවම කෙරුණි. මෙම හදීසය පැහැදිලි කිරීම අත්‍යවශ්‍යවේ. මුස්ලිම් සමාජයේ සෑම ජීවිතයක්ම ඉතා අගනා එකක් ලෙස සලකනු ලබයි. එයට හානියක් සිදු කිරීමට කිසිවෙකුට අනුමත නැත. සමාජයට එරෙහිව සිදු කරන ඉහත සඳහන් වරදට දඬුවම් කිරීමේ පූර්ණ අයිතිය පවතින්නේ රජයට පමණක් යැයි මෙ මගින් සනාථ කෙරේ.

<u>මෙයින් ඉගෙන ගන්නා පාඩම</u>

බරපතළ දඬුවමක් බව ඇතැම් අය විසින් සලකනු ලබන මෙම නීතිය තුළින්, සැබැවින්ම එම සමාජයේ සෑම කෙනෙකුගේම ජීවිත ආරක්ෂාව තහවුරු කරයි.

සමාජයේ අකුසල් ක්‍රියා අවම කිරීමට ඉස්ලාම් පියවර ගනී. සමාජ සදාචාරය සහ පිරිසිදුභාවය රැක ගැනීමට මෙවැනි නීති අවශ්‍යයය. නිත්‍යානුකූලව ගොඩ නැගූ පවුල් ජීවිතයට මෙයින් ගෞරවය හිමිවේ. නීති විරෝධීව සිදු කෙරෙන ලිංගික අපචාර සඳහා අනුබල දෙනු නොලැබේ.

අන් අයට ගරු කිරීමට සහ ඔවුන් සමඟ යහපත් ලෙස හැසිරීමට පෞද්ගලිකව හා සමාජයක් වශයෙන් අපේ වගකීම කුමක් දැයි ඉස්ලාම් පැහැදිලිව පවසයි. දුප්පත් හෝ පොහොසත් හෝ එවැනි වෙනසක් අමතක කර සමාජයේ සෑම කෙනෙකුටම සැලකිලි දැක්වීමේ වැදගත්කම ඉස්ලාම් පෙන්වයි. මේ මගින් වෛරය හා ද්වේෂය අත හැර, ගැටුම් හා ඝාතන සිදු වීම අවම කෙරේ.

දහමට ආදරය දැක්වීම තුළින් ඉහත සඳහන් හදීසය පවසන වරද සිදු කිරීමෙන් වැළකී සිටිය හැක. මුස්ලිම්වරු තම ආගම ගැන දනිති. ආගම විසින් තහනම් කරනු ලබන දේ සිදු කරන්නට ඔවුන් පසුබට වෙති.

එහෙත් අද තිබෙන නවීන තාක්ෂණය වන ජනමාධ්‍ය, අන්තර් ජාලය සහ විනෝද වීම සඳහා රූපවාහිනී නාලිකා මගින් පෙන්වනු ලබන නොයෙක් දේ තුළින් ඉහත සඳහන් වරද සිදු කිරීමට මඟ පෑදෙයි. මෙම වරද ඉතා සරල දෙයක් බවට අද පෙන්නුම් කරනු ලබයි. ඒ

සමගම ආගම් අනුමත කරන යහපත් හැසිරීම විහිළුවට ලක් කරනු ලබයි.

මුස්ලිම් සමාජයට මෙය බරපතළ අභියෝගයකි. මෙවැනි අභියෝගයන්ට මුස්ලිම් සමාජය, ඉහත හදීසය පෙන්වන ප්‍රතිපත්තිය ඉවත නොදමා ඉතාමත් ප්‍රවේශමෙන් ක්‍රියා කළ යුතුයි, ඉස්ලාමයේ මූලධර්ම විකෘති නොවන සේ ආරක්ෂා කරගන්නේ කෙසේද යනුවෙන් මුස්ලිම්වරු සියලු දෙනාම කල්පනාකාරීව කටයුතු කළ යුතුයි.

නවීන මාධ්‍යයන් මගින් දිනපතා ඉස්ලාමීය ප්‍රතිපත්තියට එරෙහිව එල්ල කරන පහර වලින් තරුණ සමාජය ආරක්ෂා කරන්නේ හෝ හානිය අවම කරන්නේ කෙසේදැයි ආගමික නායකයින් මං සෙවිය යුතුය. මුස්ලිම්වරුන් අතර දික්කසාදය, අනියම් සම්බන්ධතා, ආගම අනුමත කළ ජීවිතයෙන් බැහැරව යෑම යන අවාසනවන්ත සිදුවීම් අධික වීමට හේතුවූ කරුණු කුමක්දැයි සොයා බලා, එවාට පිළියම් යෙදිය යුතුය. දෙමාපියන්, ගුරුවරු, ආගමික මඟ පෙන්වන්නන්, සමාජ නායකයන් වැනි වැදගත් කණ්ඩායම්වල කාර්ය භාරය කුමක්ද, ඒවා තවත් පුළුල් කරන්නේ කෙසේද යනුවෙන් සොයා බැලිය යුතුයි. විශේෂයෙන් තරුණයින්ගේ සිතුවිලි සහ හැසිරීම් පිළිබඳ අප අවධානය යොමු කළ යුතුය.

ජනමාධ්‍යයෙහි, විශේෂයෙන් රූපවාහිනියේ තරුණ අයට සිදු වන අයහපත් බලපෑම් පිළිබඳව සිදු කළ නොයෙක් සමීක්ෂණයන් හී වාර්තා ප්‍රකාශ කර ඇත. කුඩා ළමයින් රූපවාහිනිය නිසා කායිකව හා මානසිකව කම්මැලි වී සිටින බව අද තහවුරු වී ඇත. එම ළමයින්ගේ අධ්‍යාපනික වර්ධනය සහ හැසිරීම් පවා පහත් මට්ටමට බැස ඇති බව අවබෝධ කර ගත හැකිය. මෙවැනි සමීක්ෂණ වාර්තා වලින් අපද පාඩමක් ඉගෙන ගෙන, අපගේ දරුවන් එවැනි උගුලට හසු නොවන සේ ආරක්ෂා කර ගත යුතුය.

අධ්‍යාපන, සෞඛ්‍ය, ධාර්මික මඟ පෙන්වීම, සහ මුදල් වැනි අංශයන් හී ඇති අනුග්‍රහය සහ සැලකිලි වැනි දෑ හි මුස්ලිම් සමාජය තුළ අඩුපාඩු තිබීම තවත් ගැටලුවකි. මේ හේතුවෙන්, මුස්ලිම් සමාජයට ආධාර අවශ්‍ය වන අවස්ථාවක, ඔවුන් සඳහා සහය දීමට ඉදිරිපත් වන්නේ ඉතා සුළු පිරිසක් වන නමුත් මෙවැනි මොහොතක, ක්‍රිස්තියානු මිෂනරිවරු ක්ෂණිකව පැමිණ මෙම අවස්ථාවෙන් අයුතු ප්‍රයෝජන ගනිති. ඇතැම් රටවල මුස්ලිම් උදවිය තම දරුවන්ව ක්‍රිස්තියානි පාසැලට අධ්‍යාපනය සඳහා යවති. මෙවැනි පැසැල් තම දරුවන්ගේ යහපත සඳහා ක්‍රියා කරන බව දෙමාපියන්ගේ මතයයි. මෙම පාසැල් දරුවන්ගේ අනාගතය සඳහා බොහෝ සේ සහය වන බව සැබෑවකි. එහෙත් මෙයින් මුස්ලිම්වරු ඉස්ලාමය අත හැර යෑමටද අවස්ථා තිබේ. අනාගත මුස්ලිම් තරුණ

පිරිස ඉස්ලාමය පිළිබඳ කිසිදු උවමනාවක් නොදක්වන්නේ නම්, එයට චෝදනා එල්ල වන්නේ මුස්ලිම් සමාජයටය.

මුස්ලිම්වරු බොහෝ දෙනෙක් බටහිර සහ මුස්ලිම් නොවන අය විසින් බුද්ධි සේදීමට ලක් කරනු ලැබ ඇත. මේ හේතුවෙන් මුස්ලිම්වරු ආගමික වතාවත් නිසියාකාරව සිදු කරන්නේ නැත. මෙවැනි අය නමින් හා උපතින් මුස්ලිම් වුවත්, ඔවුන්ගේ කල් ක්‍රියාව සහ සිතුවිලි වැනි දේ හි, ඉස්ලාම් දක්නට නැත.

මෙයින් තවත් ප්‍රශ්නයක් පැන නගී. එනම්, පුද්ගලිකව සහ මුස්ලිම් සමාජය තුළ තමන් කවුරුන් දැයි මුස්ලිම්වරු නොදැන සිටීමය. අද සමාජයෙහි, මුස්ලිම් නොවන අයගේ සංස්කෘතිය ගැන ප්‍රශංසා කරමින්, ඔවුන්හට අනුග්‍රහය දක්වන මුස්ලිම්වරු ඕනෑ තරම් අප අතර සිටිති. මේ හේතුවෙන් මුස්ලිම්වරු, අයහපත් බලපෑම් වලට භාජන වී, තම ආගම පහත් ලෙස සලකන්නටද ඉස්ලාම් ගැන ලැජ්ජා වන්නටද ඉඩ ඇත. මුස්ලිම් නොවන සමාජයේ නවීන කාර්මික වර්ධනය සහ නව තාක්ෂණය මගින් අප බොහෝ සේ ප්‍රයෝජන ලබන නමුත්, ඒ හේතුව පමණක් පදනම් කොට ඉස්ලාම් පෙන්වන අගනා මාර්ගයෙන් අපි ඉවතට නොයා යුතුය.

මෙවැනි කරුණු මගින් ඉස්ලාමයට නැගෙන අභියෝග පිළිබඳව අප සාකච්ඡා කළ යුතුය. මෙවැනි කරුණු

පිළිබඳව සාකච්ඡා කරන විට සැබෑ යථාර්ථයද අවබෝධ කර ගත යුතුය. මුස්ලිම් සමාජයට යහපතක් සිදු කරන මූලික කරුණු, පැන නගින තර්ජනය සහ ඒවාට අවශ්‍ය පිළියම් ගැන පමණක් නොව, ආත්ම ශක්තිය සහිතව ඉස්ලාමිය අනන්‍යතාවය පැහැදිලිව රැක ගන්නේ කෙසේදැයි පිළිතුරු සෙවිය යුතුය.

මුස්ලිම්වරු අතර අවබෝධතාව වර්ධනය කළ යුතු අතර, එමගින් තම කාර්යය සහ වගකීම කුමක්දැයි ඔවුන්ට වටහා දිය යුතුය.

ආරම්භක යුගයේ පැවැති ඉස්ලාමිය සමාජයේ හැසිරීම සහ යහගුණය අද පවතින සමාජයට ගැළපෙන පරිදි ප්‍රායෝගිකව යළි පිබිදීමක් සිදු කරන්නේ කෙසේදැයි අපි සොයා බැලිය යුතුය.

<u>නිගමනය</u>

මෙම හදීසයේ සැබෑ අර්ථය අපි සොයා බැලිය යුතුය. එනම් ඉහත සඳහන් වරද තුනකට නියමිත දඬුවමට වඩා මිනිස් ජීවිතයට ඉස්ලාම් දක්වන විශේෂ සැලකිලි. මේ මගින්, මෙවැනි වැරදි සිදු වීමට තිබෙන අවස්ථාව ඉස්ලාම් අවම කර ඇත.

ඉස්ලාමයේ ප්‍රතිවාදීන්, ඉස්ලාමය ගැන වැරදි අදහස් පළ කරමින්, ඉස්ලාමය ම්ලේච්ඡ හා මිනී මරු ආගමක් බව චෝදනා නගති. ඇත්ත වශයෙන්ම, මිනිස් ජීවිතය අගය කරනවාක් මෙන් සමාජයේ පිරිසිදු බවටද, එහි පවිත්‍රතාවටද ඉස්ලාම් විශේෂ සැලකිලි දක්වයි. එහෙත්

මෙම යුගයේ මෙවැනි ගුණාංගයන්ට එරෙහිව ඉස්ලාම් විරෝධි, මාධ්‍යය හා තාක්ෂණය මගින් සමාජයේ අයහපත් දේ පතුරන බව අපි දනිමු, මෙවැනි අයහපත් බලපෑම් නිසා, ඇතැම් මුස්ලිම්වරු පවා මෙම හදීසය වැරදි ආකාරයෙන් අවබෝධ කර ගන්නට හැකිය.

ඉස්ලාම් පෙන් වූ යහ ගුණයන්ට අද නැගෙන බලවත් අභියෝග නිසා, වර්තමාන සමාජය මුහුණ දෙන ප්‍රශ්න සියල්ල විසඳන්නට මෙම හදීසය කෙතරම් අවශ්‍ය දැයි කවුරුත් කල්පනා කළ යුතුය.

## 15. අසල් වැසියන් සහ අමුත්තන් සමඟ කථා කිරීම් හා හැසිරීම් හි ඉස්ලාමීය සාරධර්මය.

රසූල් (සල්ලල්ලාහු අලෛහි ව සල්ලම්) තුමාණෝ මෙසේ පැවසූ බව අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරයි. 'අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස සහිත කෙනෙක්, යහපත් දේ පමණක් කථා කළ යුතු අතර, එසේ කළ නොහැකි වුවහොත්, නිශ්ශබ්දව සිටිය යුතුය. අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස සහිත කෙනෙක්, අසල් වැසියන්ට ගෞරවය දැක් විය යුතුයි. අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස සහිත කෙනෙක්, අමුත්තන්ට ගෞරවය දැක් විය යුතුයි.' මූලාශ්‍රිතය අල් බුහාරි සහ මුස්ලිම්.

## <u>මෙහි පසුබිම</u>

අන් අය කෙරෙහි මුස්ලිම් වරයෙකුගේ දිව (කථා) සහ හැසිරීම පිළිබඳව මෙම හදීසය සඳහන් කරයි. අප පවසන සෑම දැයකටම අප වගකීම දරන බවද මෙය පෙන්වයි.

ඉමාම් හයිතමි මෙසේ දන්වයි. ''මෙම හදීසය පහත සඳහන් 13වන හදීසය හා සමාන වේ. තමා කැමති දේ තම සහෝදරයාටද ලැබිය යුතු යැයි පතන තෙක් ඔබ අතරින් කිසිවෙක් සැබෑ ඊමානය ලැබුවේ නැත.'' සෑම කෙනෙකුම තවත් කෙනෙකුගේ අසල් වැසියෙකි. ඒ හේතුවෙන්, සෑම කෙනෙක්ම මෙම හදීස් වදන අනුගමනය කරන්නේ නම්, අසල් වැසියන් අතර ශක්තිමත් බැඳීමක් ගොඩ නඟන අතර, සමාජය තුළ ආදරය හා සමගිය පැතිරෙන්නේයැ.' යි ඉමාම් තුමාණෝ දන්වයි.

## <u>මෙයින් ඉගෙන ගන්නා පාඩම</u>

මුස්ලිම්වරයෙක් පවසන සෑම වචනයකටම ඔහු වග කිව යුතු බව අල් කුර්ආනය මෙසේ පවසයි.

“ඔහු වචනයක්වත් උච්චාරණය නොකරන්නේය. ලේඛකයින් ඔහු ළඟ හිඳ (එය සටහන් කර) මිස.” සූරා අල් කාෆ් 50 වාක්‍ය 18

මුස්ලිම්වරයෙක් තමා පවසන සෑම දැයක් ගැනම ප්‍රවේශම් විය යුතු බව දන්වන හදීසයක් ඇති බව

ඉමාම් බුහාරි පවසයි. ඔහු පවසන වචන අල්ලාහ්ට සතුට ගෙන දෙන එකක් නම්, එම වචන ඔහුව උසස් තත්ත්වයට නංවයි. එහෙත් ඔහු පවසන වචන ගැන අල්ලාහ් අසතුටු වන්නේ නම්, එම වචන නිසා ඔහු නිරයට ඇතුළු කරනු ලබයි. එනිසා අප පවසන වචන නිසා, ඒවායින් අපහට සිදු විය හැකි වන්නේ යහපතක්ද නැතහොත් අයහපතක් දැ යි මෙයින් පෙන්නුම් කරයි.

කෙනෙක් පවසන අයහපත් වදනින් අල්ලාහ් අසතුටු වන බව පෙන්වන තවත් හදීසයක් ඉමාම් අබූ දාවූද් වාර්තා කර ඇත. රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණෝ පැවසූ හදීසයක, “ඉස්රායීල් ජනයාට අයත් දේව බැති මතෙක්, නිතර පාප ක්‍රියාවන් හි යෙදෙන තම මිත්‍රයාට දිනක්, ‘අල්ලාහ්ගේ නාමයෙන් පවසමි, අල්ලාහ් නුඹට කිසි විටෙක සමාව නොදෙන්නේය.’ යනුවෙන් ශාප කළේය. මෙම කථාව ප්‍රිය නොකළ අල්ලාහ් බැතිමතාට දඬුවම් දුන්නේය. මන්ද, අපේ ඉරණම සහ කෙනෙක් ස්වර්ගයට අයත් කෙනෙක්ද, නැතහොත් අපායට අයත් කෙනෙක්ද යන දැනුම අල්ලාහ් පමණක් සතු දෙයකි.”

යහපත් සහ ගුණවත් දේ පමණක් අපි පැවසිය යුතු අතර එසේ කළ නොහැකි නම්, නිහඬව සිටිය යුතුයැයි මෙම හදීසයෙන් අපි ඉගෙන ගනිමු.

යහපත් දේ පැවසීම සහ අල්ලාහ් අකැමති දේ නොපැවසීම පිළිබඳව බොහෝ හදීස් වදන් තිබේ. යහපත් දේ පැවසීම සහ අල්ලාහ් අකැමැති අයහපත් දේ නොපැවසීම පිළිබඳව ඉස්ලාමය මඟ පෙන්වීම් බොහෝමයක් ඇත. අන් අය සමඟ කථා කරන විට, ඔවුන් නාඳුනන කෙනෙක් හෝ මිත්‍රයෙක් හෝ ඥාතියෙක් හෝ අසල් වැසියෙක් හෝ වේවා, අපි අලංකාරවත් වදන් පැවසිය යුතුය. මෙයද අලංකාර විලාසයෙන් සිදු විය යුතුය. කවරෙකුට වුවත් පහසුවෙන් අවබෝධ කර ගත හැකි අයුරින් පැහැදිලිව කථා කළ යුතුය. මෙලෙස කථා නොකළහොත්, වැරදි අර්ථ කථනයට සහ අවසානයේ අනවශ්‍ය ගැටුම් සඳහා මඟ විවෘත විය හැක.

පවසන දේට අපිද ඕනෑ කමින් සවන් දී, එහි කරුණු යහපත් අයුරින් අවබෝධ කර ගත යුතුය. එහි සැඟ වී තිබෙන අර්ථය නොසොයා, සත්‍ය වටහා ගත යුතුයි. එමගින්, කථා කරන්නෙක් වශයෙන් අපි පැහැදිලිව කථා කළ යුතු අතර, සවන් දෙන්නෙක් වශයෙන් එහි අර්ථය පැහැදිලිව අවබෝධ කර ගත යුතුය. මේ මාර්ගයෙන් ආරවුල් සහ ගැටුම් සිදුවීමේ අවස්ථා අවම කිරීමට ඉස්ලාම් මග පෙන්වයි.

දෙපිරිසක් අතර ආරවුලක් තිබෙන අවස්ථාවක අප සම්බන්ධ වුයේ නම්, එහිදී මධ්‍යස්ථව සිටිය යුතුය. දෙපිරිස සමගි කිරීමට සහය විය යුතුය. ඔවුනතර තිබෙන ආරවුල සමතයකට පත්කිරීම සඳහා මඟ

පෙන් විය යුතුය. කෙනෙක් අපෙන් උපදෙස් පැතුවහොත්, හොඳ උපදෙස් දීමට වෑයම් කළ යුතුය. අපි දෙන උපදෙස් ඔවුන්ගේ ප්‍රශ්නයට විසඳුම් සඳහා විය යුතු අතර, පවතින ප්‍රශ්නය තවත් අවුල් කිරීම සඳහා නොවිය යුතුය. ප්‍රශ්නයක් විසඳීමට අවශ්‍ය දැනුම අපහට නොමැති නම් හෝ සුදුසු උපදෙස් දිය නොහැකි නම් හෝ නිශ්ශබ්දව සිටීම වඩාත් සුදුසුය.

ඇතැම් අවස්ථාවන්හී, ප්‍රශ්නයට අදාළ බව අපි දන්නා තොරතුරු ප්‍රකාශ කළහොත්, අළුත් ගැටලු මතු විය හැකි බව හෝ තිබෙන ප්‍රශ්නය තවත් උග්‍ර විය හැකි බව හෝ පෙනුනේ නම් අපි නිහඬව සිටීම ඉතා අවශ්‍යවේ.

යහපත් හා ඵලදායි නොවන කථා සියල්ල හැකි තරම් අත හැරිය යුතුය. ඇතැම් අය පැය ගණනාවක් සාකච්ඡා කරන නමුත්" එයින් අසන්නන්ට කිසිදු ප්‍රයෝජනයක් නොමැති අවස්ථාවන් බොහෝමය. මෙවැනි කථාවන්හී අල්ලාහ් අකැමැති කථාවන්ද ඇතැම් විට තිබිය හැකි බව මතකයේ තබා ගත යුතුය.

යහපත් දේ පවසන්නට විවිධ මාර්ග තිබේ. දික්රුල්ලා - අල්ලාහ් ගැන මතක් කිරීම, අල් කුර්ආනය පාරායනය කිරීම, නසීහා නම් අවංක උපදෙස් දීම යනු ඒවායින් කිහිපයකි. මෙවැනි සියලු ක්‍රියා ගැන අල්ලාහ් සතුටු වෙයි.

රෝගාතුර වී හෝ සිත් කලකිරීමට ලක් වී හෝ කම්පනයට පත් වී හෝ දැඩි අසහනයෙන් සිටින කෙනෙක් මුණ ගැසුනු විට, ඔවුන් සහනයට ලක් වන අයුරින් ඉවසීමෙන් ප්‍රශ්න වලට මුහුණ දෙන ලෙසද යහ ප්‍රතිඵලයක් බලා පොරොත්තු වන ලෙසද ධෛර්යයෙන් සිටින ලෙසද කාරුණික වචන යොදා කථා කළ යුතුය. මෙය අල් 'මුආසා' යනුවෙන් හැඳින් වේ. ප්‍රශ්න වලට මුහුණ දුන් අයගේ සිත් සැනසීම, කලබලයට පත් නොවන අයුරින් කථා කිරීම සහ අල්ලාහ්ගේ සහය ලැබෙන බව ධෛර්ය්‍ය දීමෙන් ඔවුන්ගේ සිතට සහන දීම යන කරුණු මෙහි අඩංගු වේ.

සබ්ර් නම් ඉවසීමට ආගමික විද්වතුන් මෙසේ විවරණ කර ඇත. ඒවා නම්, භීතියට හෝ තමන් පාලනය කර ගත නොහැකි තත්ත්වයට පත් නොවීම සහ කිසිවෙකුට අවලාද නොකර තම වචන ආරක්ෂා කර ගැනීම.

සුළු වැරදි වලට පවා පැමිණිලි කිරීම නිසා, ඉවසීමේ හැකියාව තුරන් වීම සිදු වේ. මේ නිසා අපේ ඉරියව්වට සහ අවසානයේ අපේ රාජකාරියටද බලපෑමක් සිදු විය හැක. මේ හේතුවෙන් අප දුක පවසන්නේ නම් එය අල්ලාහ් වෙත පමණක් කළ යුතුය. මෙම ක්‍රියාව 'මුනාජා' නම් එක්තරා නැමදුමකි. අල්ලාහ් හැර අන් අය වෙත පැමිණිලි කිරීම 'තෂක්කි' යනුවෙන් හැඳින් වන අතර, මෙම ක්‍රියාවෙන් සබර් නම් ඉවසීමේ

ඉබාදාව කඩ කෙරේ. මේ නිසා නිතර කරන පැමිණිලි අවම කිරීමෙන්, අවසානව එම අයහපත් පුරුද්ද සම්පූර්ණයෙන්ම අපෙන් ඉවත් කළ යුතුය.

අයහපත් දේ සහ අසත්‍ය දේ පැවසීමෙන් වැළකිය යුතුය. අපට යම් ආරංචියක් ලැබුණහොත් එය අන් අයට දන්වන්නට පෙර එහි සත්‍යතාව සොයා බැලිය යුතුය. මේ මගින් බොරු හා දූෂ්‍යමාන ආරංචි පැතිරීම වැළකේ. අපද පහත සඳහන් ක්‍රියා සිදු කිරීමෙන් වැළකී සිටිය යුතුය.

- කට කථා පැතිරීම, විශේෂයෙන් සමාජයට හානි සිදු විය හැකි අයහපත් ප්‍රවෘත්ති.
- කේලාම් කීම සහ අවලාද කථා පැතිරීම.
- ඇනුම් පද සහ අන් අයට සමච්චල් කිරීම - අද මෙය ඉතා බහුලව සිදු වනු අපි දකිමු. අන් අයට සමච්චල් කිරීම මහා පාපයකි.

ඇතැම් අවස්ථාවන් හි සමාජයක් පරීක්ෂණයට ලක් වන සිද්ධියකට මුහුණ දෙන්නට සිදු වූයේ නම් අප පවසන දේ ගැන ප්‍රවේශම් විය යුතුය. ඇතැම් අය මෙවැනි අවස්ථාවන්හි අනවශ්‍ය කථා පවසා එමගින් තවත් කරදර වලට ලක් වෙති. පරීක්ෂණයකට මුහුණ දෙන්නට සිදු වන අවස්ථාවෙහි ඇතැම් අය මහත් කලබලයට පත් වෙති. මෙසේ කථා කිරීමෙන් සමාජය තුළ බිය සහ අසහනය පැතිරිය හැකි නිසා, අප පවසන

දේ ගැන ප්‍රවේශම්  විය යුතුය. එ වෙනුවට, සිත් ධෛර්‍යමත් කරන වදන් උපයෝගි කර, සමාජය තුළ කනස්සලට පත් වූ අයගේ සිත් දිරි ගන්වන්නට ක්‍රියා කළ යුතුය.

මෙම හදීසියේ දෙවන කොටස, අසල් වැසියන්ට සහ අමුත්තන්ට කාරුණිකව සහ ත්‍යාගශීලිව සැලකිය යුතු බව දන්වයි. අල් කුර්ආන් මෙසේ පවසයි.

*"අල්ලාහු නමදිවු. ඔහුට කිසිවකින් සමානයක් නොතබවු. දෙමාපියන්ටද දිළිඳුන්ටද, අසල්වැසි නෑයන්ටද,  අසල් වැසි නොවන නෑයන්ටද, සහකාරයාටද, මගීන්ටද, ඔබගේ දකුණු අත් හිමි කර ගත් අයටද (සංග්‍රහ කරවු) සැබැවින්ම අල්ලාහු අහංකාර අයටද, පුහුමාන්නක් කාරයාටද ප්‍රිය නොකරන් නේය."* 4 සූරා අන් නිසා වාක්‍ය 36.

තවත් හදීස් වදනක, "අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස තබන කෙනෙක්, අසල්වැසියාට හානියක් සිදු නොකළ යුතුයි." යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසුහ. මූලාශ්‍ර සහීහ් අල් බුහාරි සහ මුස්ලිම්.

තවත් හදිස් වදනක, 'කවරෙකුගේ ක්‍රියාවෙන් අසල් වැසියන් ආරක්ෂා නොලබන්නේද, ඔහු සම්පූර්ණ ඊමානය සහිත කෙනෙක් නොවන්නේයැ.'  යි නබි (සල්) තුමාණෝ පැවසුහ. (මූලාශ්‍ර සහීහ් අල් බුහාරි සහ මුස්ලිම්.) ව්‍යංජනය පිසින කෙනෙක් එයට

තවත් ජලය ස්වල්පයක් එකතු කර, එහි හොද්ද වුවත් අසල් වැසියන්ට දිය යුතු බව රසූල් (සල්) තුමා පවසුහ. (මූලාශ්‍ර සහීහ් බුහාරි සහ මුස්ලිම්.) මේ ආකාරයෙන් ආහාර පානාදිය අසල් වැසියන් සමඟ බෙදා ගැනීමෙන්, ඔවුනතර සාමය හා සමගිය වර්ධනය වෙයි. අසල් වැසියෝ මුස්ලිම් නොවූවත්, ඔවුන් සමඟ සාමයෙන් හා සමගියෙන් අප ජීවත් විය යුතුය.

අසල්වැසියන් සමඟ ඉවසීමෙන් කටයුතු කළ යුතු බව තවත් හදීස් වදනක් අපට දන්වයි. තමාට හිරිහැර කරන අසල්වැසියා සමඟ ඉවසීමෙන් කටයුතු කරන කෙනෙක් අල්ලාහ්ගේ ආදරයට හිමිකම් ලබන බව රසූල් (සල්) තුමාණෝ දැන්වූහ.

'අල්ලාහ් සහ අවසාන දිනය කෙරෙහි විශ්වාස කරන කෙනෙක් නිවසට පැමිණෙන අමුත්තාට නිර්ලෝභීව සංග්‍රහ කළ යුතුය. අමුත්තෙකුට විශේෂ වරප්‍රසාද එක් රාත්‍රිය සහ එක් දහවල් කාලයයි. දින තුනක් දක්වා අමුත්තාට සැලකීම් දැක්විය හැක. එහෙත් අමුත්තා නිවසේ පාලකයාට අයුතු බරක් පමුණු වීමෙන් වැළකිය යුතුය.' යනුවෙන් රසූල් (සල්) තුමාණෝ දන්වා ඇත.

ආගන්තුක සත්කාරය කළ තැනැත්තාගේ කරුණාවෙන් අයුතු ප්‍රයෝජනය ලබන්නට අමුත්තෙක් බලා පොරොත්තු නො විය යුතුය. මෙම

විෂය ගැන අදහස් දක්වන ආගමික විද්වතුන්, කෙනෙකුට සත්කාර කිරීම උතුම් ක්‍රියාවක් වන නමුත්, එය අනිවාර්යය ක්‍රියාවක් (වාජිබ්) නොව, නිර්දේශ කළ (මුස්තහබ්) ක්‍රියාවක් බවට නිගමනය කරති. වැරදි හා පාප ක්‍රියාවන් හි යෙදෙන කෙනෙකුට මෙම සැලකිලි අදාළ නොවන බව ඔවුන් පවසති. ඒ අතර අයහපත් අයට පවා සත්කාර කළ යුතු බව තවත් සමහර විද්වතුන් අදහස් දක්වති. එමගින්, ඔවුන් තම වැරදි මාර්ගය අත හැර දමා, යහ මාර්ගයට පිවිසීමට අවස්ථාවක් ලැබිය හැකි බව ඔවුන් පවසති. කෙසේ වුවත්, මෙවැනි අයහපත් පුද්ගලයින්ට සත්කාර කරන විට, අපහට හානියක් සිදු නොවන අයුරින් ප්‍රවේශමින් ක්‍රියා කළ යුතුය.

අයහපත් පුද්ගලයින්ට සත්කාර කිරීම තුළින් ඇති විය හැකි සුළු හානියක් දරා ගැනීමෙන් ඔවුන් යහපත් මුස්ලිම්වරු බවට පත් වීමට මඟ පෙන් වීමේ වාසිය ලැබිය හැකි බව මෙම විද්වතුන්ගේ මතය වේ.

## නිගමනය

අමුත්තන්ට සැලකිලි දැක්වීම සහ ඔවුන් සමඟ කථා කරන විලාසය මෙම හදීස් වදන පෙන්වයි. මෙයින් ඉස්ලාමීය සමාජයෙ හි සාමය සහ සමගිය පවතින්නට සහ ඒ තුළින් අල්ලාහ්ගේ ආශීර්වාදය ලැබීමට මග විවෘත වන බව පෙනේ.

# 16. කෝපය මැඩ පවත්වා ගැනීම

නබි (සල්) තුමාණන් වෙත පුද්ගලයෙක් පැමිණ, 'මට අවවාදනුශාසනා කරනු මැනව!' යැයි ඉල්ලීමක් කළේය. එයට නබි (සල්) තුමාණන් 'ඔබ (කිසිවිටෙක) කෝපයට පත් නොවනු' යනුවෙන් අවවාද කළහ. ඒ මිනිසා නැවත නැවත ඔහුට අවවාද කරන ලෙස ඉල්ලුම් කළ නමුත්, නබි (සල්) තුමාණන් ඔහුට 'ඔබ (කිසිවිටෙක) කෝපයට පත් නොවනු' යනුවෙන් අවවාද කළ බව, අබූ හුරෙයිරා (රලි) වාර්තා කරයි. මූලාශ්‍ර සහීහ් අල් බුහාරි වෙළුම 8 හදීස් අංක 137)

<u>පසුබිම</u>

මෙයට අදාළ තවත් හදීස් වදනක් මෙසේ ඇත. "මිනිසෙක් අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණන් වෙත පැමිණ 'අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනී! මගේ ජීවිතයෙ හි අනුගමනය කළ හැකි වචන කිහිපයක් කියා දෙන්න. එහෙත් මට අමතක විය හැකි ආකාරයේ දිගු වචන විය නොයුතුයැ.'යි පැවසුවේය. එවිට රසූල් (සල්) තුමාණෝ "කෝප නොවනු" යනුවෙන් ඔහුට කීහ.

එම පුද්ගලයා ක්ෂණික කෝපයට පත් වන කෙනෙකු නිසා රසූල් (සල්) තුමාණෝ ඔහුට එම උපදෙස් දුන් බව ඇතැම් විද්වතුන් අදහස් දක්වන නමුත්, එම මතය මෙම හදීස් වදනේ වැදගත්කම සීමා කිරීමක් බව පෙනේ. එහෙත්, මෙම හදීස් වදන ඉතා පුළුල් එකක්

වන අතර ඕනෑම කෙනෙක් කෝපයට ලක් වීම බහුලව සිදු වන නිසා, සියලු දෙනාටම අදාළ වන බව පැහැදිලිය.

කෝපයට පත් වීමෙන් වළකින ලෙස උපදෙස් දෙන අල් කුර්ආන් වැකි හා තවත් හදීස් වදන් තිබේ. ධර්මිෂ්ඨ පුද්ගලයෙකු පිළිබඳව අල්ලාහ් මෙසේ පවසයි.

*"ඔබගේ ස්වාමිහුගෙන් වූ ක්ෂමාව වෙතද ජන්නාව වෙතද යුහුසුලු වවු. එහි පුළුල් අහස් ද පොළොවද වෙයි. අණ පනත් රකින වුන්ට සකස් කරන ලදී."* 3: 133

*"(අණ පනත් රකින) ඔවුහු යසසෙහිද අයසසෙහිද අගිදම් කරති. කෝපය මැඩ පවත්වති. මිනිසුන්ට ක්ෂමාව දෙති. අල්ලාහු යහකම් කරන්නවුන් ප්‍රිය කරන්නේය."* 3:134.

අබු හුරෙයිරා වාර්තා කළ හදීස් වදනක, "ශක්තිමත් පුරුෂයා යනු තම සතුරාව පරාජයට පත් කරන පුද්ගලයා නොවේ. කෝපයට පත් වූ විට එය පාලනය කර ගන්නා කෙනෙකි." යයි රසූල් (සල්) තුමාණෝ පැවසුහ. මූලාශ්‍ර අල් බුහාරි

රසූල් (සල්) තුමාණෝ මෙසේ දුආ කළහ. "යා අල්ලාහ්! සතුටට හා කෝපයට පත් වූ අවස්ථාවෙ හි සත්‍ය පවසන්නට ප්‍රාර්ථනා කරමි." මූලාශ්‍ර අහමද්.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්

'කෝපාවිෂ්ට නොවනු.' යන මුහම්මද් (සල්) තුමාණන්ගේ මෙම වදන් පිළිබඳ අදහස් හතරක් ඇත. එවායින් අදහස් දෙකක් පැරණි විද්වතුන්ගෙන්ද තවත් අදහස් දෙකක් සමකාලීන විද්වතුන්ගෙන්ද වේ.

1. කෙනෙක් තම ස්වභාවය වෙනස් කොට, උදාරත්වය, කරුණාව, සන්සුන්භාවය, විනීතභාවය, ඉවසිලිමත්කම, සමාව දීම වැනි ගති පැවතුම් පුරුදු විය යුතුය. මේවා තුළින් කෝපයට පත් වන අවස්ථාවක එය මැඩ පවත්වා ගැනීමට කෙනෙකුට හැකි වනු ඇත.

2. කෝපය පදනම් කර ගෙන හෝ කෝපාවේෂයට පත් වූ අවස්ථාවක එය මත කිසිවෙක් ක්‍රියා කළ නොයුතුය.

3. කෝපයට පත්වීමට පෙර, ඔහු තම සිත පාලනය කර ගෙන, කෝපය මැඩ පවත්වා ගත යුතුය. මෙම අදහස සම කාලීන විද්වතෙකු වන ෂෙයික් බිතාර්ගෙන්ය.

4. උස්තාද් ජමාලුද්දීන් සzරබෝසෝz මේ ආකාරයෙන් අදහස් දක්වයි. කථා හෝ ක්‍රියා කරන්නට පෙර මුස්ලිම් වරයෙක් කල්පනා කළ යුතුය. කෝපයට පත් වූ විගස, තමා කෝපයට පත් වූයේ ඇයි ද, කෝපයට පත් වීම අවශ්‍ය ද යනුවෙන් කල්පනා කළ යුතුය. මෙම අවස්ථාවෙ හි අල්ලාහ් සුබ්හානහූ ව තආලා ගැන සහ අවසාන දිනය ගැන සිහි කළ යුතුය.

මෙමගින් කෙනෙක් කෝපයෙන් මිදී සන්සුන් බවට පත් වන්නේය.

නොයෙක් අවස්ථාවන් හි මෙම අදහස් සියල්ල කෝපය පාලනය කිරීමට හා මැඩ පවත්වා ගැනීමට කෙනෙකුට උපකාර වනු ඇත.

කෙනෙක් කෝපයට පත් වුවහොත්, ඔහු තම ක්‍රියාව පිළිබඳව මුසාබහා නම් ගණන් බැලිය යුතුය. තම වැරදි ක්‍රියා, ඒවාට තුඩු දුන් හේතු, අනාගතයේ එවා මඟ හරින්නේ කෙසේද යන කරුණු මෙහි අඩංගුය. අපේ හැසිරීම් සහ ගති පැවැතුම් වර්ධනය කර ගැනීමට මෙය සුදුසු මාර්ගයකි.

කෝපය පාලනය කර ගනු පිණිස, නබි (සල්) තුමාණෝ නොයෙකුත් මඟ පෙන්වා දී ඇත.

'(කෝපයට පත් වූ) ඔහුට සන්සුන් කර වීමට පවසන වචනයක් මම දනිමි. එනම්, අඋඥු බිල්ලාහි මිනෂ් ෂෙයිතා නිර් රජීම්'. (ෂෛතාන්ගේ උවදුරෙන් අල්ලාහ් වෙත ආරක්ෂාව පතමි) එවිට ඔහුගේ සියලු කෝපය නිවී යන්නේය.' යනුවෙන් රසූල් (සල්) තුමාණෝ පැවසුහ. මූලාශ්‍ර අල් බුහාරි, වෙළුම 4 හදීස් අංක 502.

එනිසා, කෝපය පාලනය කර ගැනීමට හැකි වන එක් මාර්ගයක්, සාතාන්ගේ උවදුරෙන් මිදෙන්නට අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කිරීම වේ. අපේ සිතුවිලි වෙනස් කරනු

පිණිස ෂෙයිතාන් අප සිත් තුළ නිතර කොඳුරන බව අපි දැන ගත යුතුය.
මිනිසාගේ අවබෝධය විකෘති කිරීම තුළින්, මිනිසුන් අතර අයහපත් හා ආරවුල් ඇති කිරීම ෂෙයිතාන්ගේ එක් ක්‍රමයක් බව අල් කුර්ආන් නොයෙක් තැන් හී සඳහන් කරයි.

*"ඉතා යහපත් දැය කථා කරවු 'යැයි මගේ වහලුන්ට කියව. සැබැවින්ම ෂයිතාන් ඔවුන් අතර (සතුරුකම්) ඇති කරන්නේය. සැබැවින්ම ෂයිතාන් මිනිසාට ප්‍රකට සතුරෙකි."* (සූරා ඉස්රා 17 වාක්‍ය අංක 53.)

කෙනෙක් නොපැහැදිලි දැයක් පැවසුවහොත්, ෂෛතාන් එයට වැරදි තේරුමක් හෝ අවබෝධයක් දන්වන අතර, මෙයින් සමාජය තුළ තිබෙන සමගිය සහ සාමය නැති වී යාමට ඉඩ අත. මේ හේතුවෙන් පවුල් අතර, සැමියා හා බිරිය අතර, සොයුරු සොයුරියන් අතර හොඳම මිතුරන් අතර තිබෙන සම්බන්ධකම බිඳී යන්නට ඉඩ ඇත.

'කෝපය ෂෛතාන්ගෙන්ය. ෂෛතාන් ගින්නෙන් මවනු ලැබුවේය. ජලය ගින්න නිවන මාර්ගයකි. ඒ නිසා කෙනෙක් කෝපයට පත් වුවහොත්, ඔහු වුදූ කළ යුතුය.' යි නබි (සල්) තුමාණෝ උපදෙස් දුන්හ. මූලාශ්‍ර අබූ දාවුද් අංක 4766.

'කෙනෙක් සිට ගත් මොහොතේ කෝපට ලක් වුයේ නම්, ඔහු වාඩි විය යුතුය. එවිට ඔහුගේ කෝපය

අවසන් වුයේ නැතිනම්, ඔහු බිම වැතිරිය යුතුය.' යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූ බව අබූ දර් (රලි) දන්වයි. මූලාශ්‍ර අබූ දාවුද් අංක 4674

"කෙනෙක් කෝපයට පත් වුවහොත්, ඔහු නිහඬ විය යුතුය." යි නබි (සල්) තුමාණෝ පැවසූ තවත් හදීසයක් තිබේ. මෙය ඉතා වැදගත් වේ. මන්ද, කෙනෙක් කෝපයට පත් වූ විට ඔහු පවසන වචන හෝ ඔහුගේ ක්‍රියාව නිසා, අවසානයේ පසුතැවිලි වන්නට සිදු විය හැක.

සිජිස්තාන් හී සිටිනා තම පුත්‍රයාට අබ්දුල් රහ්මාන් බින් අබි බක්රා අබූ බකර් (රලි) මෙසේ උපදෙස් දුන්නේය. 'ඔබ කෝපාවිෂ්ටව සිටින අවස්ථාවක දෙදෙනෙකු අතර ප්‍රශ්නයක විනිශ්චය නොකරනු. මන්ද, කෝපාවිෂ්ටයව පත්ව සිටින විනිශ්ච කරුවෙක් දෙදෙනෙකු අතර තිබෙන නඩුවක විනිශ්චය නොකරනු' යනුවෙන් නබි (සල්) තුමාණෝ පවසනු මම සවන් දුන්නෙමි.' යනුවෙන් ලිපියක් යැවීය. මූලාශ්‍ර අල් බුහාරි වෙළුම 9 අංක 272.

මෙම හදීසය ඉහත අංක 15 යටතේ සඳහන් කෙරේ.

කෙසේ වෙතත්, කෝප විය යුතු ඇතැම් කරුණුද තිබෙන බව නබි (සල්) තුමාණන්ගේ ආදර්ශයන් පෙන්වන අවස්ථාවන්ද ඇත. අල්ලාහ්ගේ අණට එරෙහිව කරුණු ඕනෑකමින් සිදු වන විට පමණක් රසූල් (සල්) තුමාණෝ කෝපයට පත් වූහ. අපද

අල්ලාහු තආලා වෙනුවෙන් කෝපයට පත් වීමට නම් පහත සඳහන් හේතුන් ගැන අවධානම යොමු කළ යුතුය.

- අපේ පෞද්ගලික හේතුවක් මත කෝපයට පත් විය නොහැක.
- කෝපයට පත් වූ විට අසභ්‍ය වචන උපයෝගි කිරීම සහ තහනම් ක්‍රියාවක යෙදීම වැනි දැයින් වැළකී ඉතිරි වැඩ සටහන නිසියාකාරව කර ගෙන යා යුතුය.
- ෂරීආ අනුමත ක්‍රියාවන් හී නිරත වීමෙන් යහපත් ප්‍රතිඵල ලැබේ. අපගේ ක්‍රියාවලිය නිසා හානි සිදු වීමට ඉඩ තිබේ නම්, එම ක්‍රියාව වහාම නැවැත්විය යුතුය.

නිදසුනක් වශයෙන්, උපදෙස් දීම සිදු වන විට යහපත් වදන යොදා අවංකව සිදු කළ යුතු අතර, සට්ටනය තවත් උග්‍ර නොවීමට වග බලා ගත යුතුය.

අධික කෝපය නිසා රුධිර පීඩනය, හෘද රෝග වැනි දැයින් කෙනෙකුගේ සෞඛ්‍යයට පමණක් නොව ජීවිතයට පවා හානි සිදු විය හැකි බව වෛද්‍ය විද්‍යාව පෙන්නුම් කරයි. එනිසා ෂරීආ පවසන ආකාරයට හැසිරීමෙන් විශාල ප්‍රඥාවක් තිබෙන බව පෙනේ. එනිසා අධික කෝපය පාලනය කර ගැනීමේ හැකියාව

තුළින් තමන්ගේ සෞඛ්‍ය සහ ප්‍රාණය විනාශ කිරීමෙන් වැළකී සිටිය හැක.

<u>නිගමනය</u>

සමාජීය සම්මත මෙම හදීසයට රුතුලක් දෙයි. අධික ලෙස කෝපාවිෂ්ට වීමෙන් වැළකී සිට, ඉවසීමෙන් කටයුතු කළ යුතුය. මෙම ජීවිතයේ ඇතැම් දේ අපි අප්‍රිය කරන නමුත්, ඒවා තුළින් අපි නොදන්නා යහපත අපට ලැබිය හැක.

අපහට අනවශ්‍යව හිරිහැර කරන අය කෙරෙහි අප ඉවසීමෙන් කටයුතු කරන විට, ඒ අය තම කටුක හැසිරීම ගැන අවබෝධ කර ගෙන යහපත් මඟට පිවිසීමට ඉඩ ඇත. මුස්ලිම්වරු අන් අයට ආදර්ශයක් වශයෙන් ජීවත් විය යුතුයි.

## 17. ඉහ්සාන් (විශිෂ්ට භාවය) නම් සංකල්පය

අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ මෙසේ පැවසූ බව අබූ යඅලා ෂද්දාද් ඉබ්න් අවුස් (රලි) තුමාණෝ වාර්තා කරයි. “සැබැවින්ම සෑම දැයහිම අල්ලාහ් විශිෂ්ට භාවය පනවා ඇත. එනිසා, ඔබ ඝාතනය කරන්නේ නම් නිසි ලෙස ඝාතනය කරන්න. ඔබ (ආහාර සඳහා) සතෙකු ඝාතනය කරන්නේ නම් හොඳාකාරව එය ඉටු කරන්න. ඒ සඳහා, ඔබ සතු පිහිය හොඳින් මුවහත් කර

ගන්න. අනුකම්පා සහගතව කපා සතුන්ගේ වේදනාව අවම කරන්න.” (මූලාශ්‍ර සහිහ් මුස්ලිම්)

<u>පසුබිම</u>

ඉහ්සාන් යනු අංග සම්පූර්ණ සංකල්පයකි. එහි කරුණු හතරක් අඩංගු වේ.

1. අවංක භාවය (ඉහ්ඃලාස්)
2. පරිපූර්ණ භාවය
3. අලංකාරය
4. විධිමත් භාවය (කරන දේ නිවැරදි ලෙස කිරීම)

එනම්, කරන සියලු දේ අවංක ව, සම්පූර්ණ ව, අලංකාර ව සහ නිවැරදි මාර්ගයෙන් ඉටු කිරීම. මෙය විශිෂ්ට භාවයේ සංකල්පය යනුවෙන් ආගමික විද්වතුන් පහදා දෙති. මෙම වචනයේ අර්ථය තවත් භාෂාවකින් එක් වචනයකට සීමා කළ නොහැකි හේතුවෙන්, ඉහ්සාන් යන වචනය මෙහි උපයෝගි කර ඇත.

මුස්ලිම් වරුන්ට සියලු ක්‍රියාවන් හි ඉහ්සානය අනුගමනය කරන ලෙස ඉස්ලාම් අණ කරයි. එනිසා එය අනිවාර්යය ක්‍රියාවකි.

*“ඇත්තෙන්ම අල්ලාහ් සාධාරණකමද, යහකමද ඥාති සංග්‍රහයද අණකරයි.”* අල් කුර්ආන් 16:90 වාක්‍ය.

මිනිසාගේ මැවීමට ඉහ්සාන් එක් හේතුවක් බව අල් මුල්ක් නම් 67වන සූරාවෙහි 2වන වාක්‍යයෙහි අල්ලාහ් සඳහන් කරයි. *"ඔබගෙන් කවරෙකු ක්‍රියාවෙන් ඉතා ලක්ෂණදැයි ඔබ පිරික්සනු පිණිස මරණයත් ජීවිතයත් නිර්මාණය කළ ඔහු - ඔහු බලසම්පන්නය, ක්ෂමාන්විතය."*

<u>මෙයින් ඉගෙන ගන්නා පාඩම්</u>

මෙම හදීසයෙ හි වැදගත් ප්‍රතිපත්තියක් අඩංගු වී තිබෙන අතර, එයට උදාහරණයක්ද පෙන්වයි. මෙය රසූල් (සල්) තුමාණන්ගේ ක්‍රමයකි. මේ මගින් මුස්ලිම්වරු මෙම ප්‍රතිපත්තිය මෙය හා සමාන තවත් අවස්ථාවක අනුගමනය කළ හැක. ආදර්ශයක් පෙන්වීමෙන් ප්‍රතිපත්තියක් තවත් පහසුවෙන් පහදා දිය හැකි වේ. ඉමාම් අල් නවවි තුමා තෝරා ගත් හදීස් වදන 40 මෙය තවත් පැහැදිලි කරයි.

තම සියලු ක්‍රියාවන් වගකීමෙන් හා උසස් අන්දමින් මුස්ලිම් වරයෙක් ඉටු කළ යුතු ආකාරය ඉහ්සාන් හි සංකල්පයයි. ඔහු හෝ ඇය තම ක්‍රියාව නිවැරදි ව, අංග සම්පූර්ණ ව සහ අලංකාර ව ඉටු කරන බව මෙය පෙන්වයි. උසස් අන්දමින් ඉටු නොකරන දේ ගැන ඔහු හෝ ඇය සෑහීමට පත්නොවන අතර, සෑම ක්‍රියාවකම ඉහ්සාන් නම් තත්ත්වය අල්ලාහ් පනවා ඇති බව ඔහු හෝ ඇය දනී.

සූරා අල් මුල්ක් හි දෙවන වාක්‍යය සඳහන් කරන අයුරින්, ඉහ්සාන් යනු ඕනෑම ක්‍රියාවක් ගැන පවසයි. එය ආගමික වතාවත් ගැන පමණක් සීමා නොවී නිත්‍යානුකූල සියලු ක්‍රියා ගැනම සඳහන් කරයි. අපි කරන සියලු දෑ හි ඉහ්සාන් නම් තත්ත්වය තිබිය යුතුය. අපේ පෙනුම, ඇඳුම්, ආහාර ගැනීම, නිදා ගැනීම සහ ක්‍රියා, ඉස්ලාම් දහම අන් අයට පහදා දීම, ඉගැන් වීම හෝ ඉගෙන ගැනීම, පවුලේ අය, නෑයන් සහ අසල් වැසියන් සමඟ පවත් වන සම්බන්ධතාව යන සියල්ල මෙහි ඇතුළත්ය. මේවා සහ සියලු හොඳ ක්‍රියාවන් අවංකව සහ ඉහ්සාන් සහිත ව ඉටු කරන විට, එය ඉබාදාත් හෙවත් නැමදුම ලෙස හැඳින් වේ.

මේවා ඉටු කරන විට, අල්ලාහ්ගේ සතුට ලබා ගැනීමේ අරමුණින්, ඉටු කළ යුතුය. ඉස්ලාම් හී තරඟය අනුමත කරන නමුත් ඒවා ලෞකික දේ ලබා ගැනීම සඳහා නොව අල්ලාහ්ගේ සතුට හා පිළිගැනීම සඳහා පමණක් වන බව දැන ගත යුතුය.

ආහාර සඳහා සතෙක් මරණ විටද උන්ට කරුණාව දැක් විය යුතු යැයි මෙම හදීස් මගින් රසූල් (සල්) තුමා උගන්වා ඇත. “පක්ෂියෙක් පවා ආහාර සඳහා මරන්නේ නම්, ඌට කරුණාව දක්වනු මැනව. අල්ලාහ් ඔබට විනිශ්චය දිනයේ කරුණාව දක්වන්නේය.” මූලාශ්‍රය අල් බුහාරි.

තවත් හදීස් වදනක් මෙසේ පවසයි. "දිනක් මිනිසෙක් ගමනක යෙදුනු විට ගමනේ මහන්සිය හා අධික හිරු රශ්මිය නිසා පිපාසයට ලක් විය. ඔහු ළිඳක් දුටු නමුත්, එහි ලණුවක් හෝ භාජනයක් නොතිබුණු හෙයින්, ළිඳට බැස ජලය බී තම පිපාසය නිවා ගෙන, ළිඳෙන් උඩට පැමිණි විට පිපාසයෙන් සිටි සුනඛයෙකු දැක, "ඔහුද මා මෙන් පිපාසයෙන් සිටිනවා ඇති," යයි සිතා යළි ළිඳට බැස තම සපත්තුවේ ජලය ස්වල්පයක් පුරවාගෙනවිත් සුනඛයාට දුන්නේය. ඔහුගේ මෙම ක්‍රියාව නිසා අල්ලාහ් සුබ්හානහු ව තආලා සතුටු වී එම මිනිසාගේ පාපයන්ට සමාව දුන්නේය." යනුවෙන් රසූල් (සල්) තුමා පැවසුහ. මූලාශ්‍ර අල් බුහාරි.

තවත් හදීසයක සතුන්ව බිය නොගන්වන්නැයි රසූල් (සල්) තුමාණෝ අපට උපදෙස් දුන්හ. දිනක් නබි (සල්) තුමාණෝ තම සගයින් සමඟ සිටින විට පක්ෂියෙක් ශෝක හඬ නගනු අසා, "ඌගේ කුඩා පැටව් අරගෙන ඌ බියට පත් කළේ කවුද?" යැයි විමසා, "ඔහුගේ පැටවා ඔහු වෙතට ආපසු දෙන්න." යයි අණ කළහ.

තවත් දිනක්, "කාන්තාවක් බළලෙක් නිසා අපායට යවනු ලැබුවාය. ඇය බළලාව බැඳ දමා, ඌට ආහාර නොදුන් පමණක් නොව, ආහාර සොයා යන්නට අවස්ථාවක් පවා නොදුන්නාය." යනුවෙන් රසූල් (සල්) තුමාණෝ දැන් වූහ.

සතුන්ට කරුණාව දැක්වීම ගැන පවසන විට, සතුන්ගෙන් අධික ලෙස වැඩ ගැනීමෙන් වළකින ලෙස රසූල් (සල්) තුමාණෝ උපදෙස් දුන්හ. එනම්, සතුන්ට ප්‍රමාණය ඉක්මවා බර පැටවීම ගැන අවවාද කළහ. සතුන් සම්බන්ධයෙන් තවත් හාස්කමක් දෙස බලමු. මදීනා නුවර ගොවි පොළකට දිනක් රසූල් (සල්) තුමා ගිය අවස්ථාවක, ඔටුවෙක් එතුමා වෙතට පැමිණියහ. රසූල් (සල්) තුමාණෝ ඔටුවාගේ හිමිකරුව අඬ ගසා, “ඔබ මේ ඔටුවාගෙන් අධික ලෙස වැඩ ගන්නා බවද, උඟට හරියාකාරව ආහාර නොදෙන්නා බවද ඔටුවා මට පැමිණිලි කරයි.” යනුවෙන් පැවසුහ. මූලාශ්‍ර අබූ දාවූද්, අල් හාකිම්, ඉමාම් අහමද් යන අය.

සතුන්ට හානි සිදුවීම තහනම් බව පවසන මෙම හදීසයට එකඟව පර්යේෂණාගාරයේ සතුන්ට හිංසා සිදුවන අයුරින් පරීක්ෂණ වලට ලක් කිරීම නුසුදුසු බව ෂෙය්ක් ජිබ්රීන් නම් විද්වතෙක් අදහස් දක්වයි. සතාට හිංසාවක් සිදු නොවන බව සහතික කළහොත් එම සතා පරීක්ෂණ වලට සම්බන්ධ කිරීමට අනුමතය. මේ සියලු කරුණු මත, ඉස්ලාම් යනු ඉහ්සාන් සහ මෛත්‍රිය පදනම් කර ගත් ආගමක් වන අතර, බටහිර මාධ්‍යය සම්පූර්ණ වැරදි ආකාරයෙන් පෙන්වන බව සනාථවේ. එ පමණක් නොව සතුන්ට හිංසා සහ හානි කරන්නේ බටහිර රටවල් බවද මෙයින් පහදා ගත හැක.

සමාජය රැක ගනු පිණිස සතුරන්ට එරෙහිව කරන යුද්ධයක දී පවා මුස්ලිම්වරු ඉහ්සාන් භාවය අනුගමනය කළ යුතුය. යුද්ධයකදී මහලු අය, කුඩා ළමුන්, කාන්තාවන් සහ යුද්ධයට සම්බන්ධ නොවූ කිසිවෙකුට හානි සිදු කළ නොහැක. උග්‍රව සටන් කරන සතුරාට වුවත් ප්‍රමාණය ඉක්මවා හානි සිදු නොවන බවට, වද හිංසා නොකරන බවට ඉහ්සාන් භාවය අනුගමනය කළ යුතුයි. යුද්ධය අවසානයේදී හිර භාරයට ගත් සතුරු සෙබළුන්ට නව ක්‍රමයකින් සැලකිලි දක්වන මාර්ගයක් හඳුන්වා දුන්නේ ඉස්ලාම් ක්‍රමයයි. බද්ර් සටනේදී අත් අඩංගුවට ගත් සතුරු සෙබළු තමන් දන්නා අයුරින් මුස්ලිම් ජනතාවට අකුරු උගන්වා තම නිදහස ලබා ගන්නට අවස්ථාවක් දෙනු ලැබුහ.

නවීන යුද්ධයකදී මහත් විනාශයක් සිදු කළ හැකි අවි ආයුධ භාවිත කෙරේ. මෙය ඉහ්සාන් සංකල්පයට පටහැණි එකකි. සතුරු සේනාව මුස්ලිම් වරුන්ට එරෙහිව මෙවැනි අවි ආයුධ උපයෝගී කළහොත් කුමක් කළ යුතුද? මෙවැනි අවස්ථාවකදී, ස්වයං ඇරක්ෂාව සඳහා එවැනි අවි ආයුධ උපයෝගී කිරීමට මුස්ලිම් සේනාවට අනුමත තිබෙන බව ඇතැම් ආගමික විද්වතුන් අදහස් දක්වති.

<u>නිගමනය</u>

ඉහ්සාන් සංකල්පයට එකඟ ව ජීවත් වීම සහ තම සියලු කාර්යන් හි එය අනුගමය කිරීම තුළින්, මුස්ලිම් වරයෙක් අල්ලාහ්ගේ ආශිර්වාදයට ලක් වන අවස්ථාවන් ලබා ගනී. එපමණක් නොව, තම පරීක්ෂණයෙහි සමත් වී, යහපත් ජීවිතයක් හිමි කර ගත් අයගේ කොටසට ඔහු හෝ ඇය ඇතළත් කරනු ලබන්නෝය.

## 18. තක්වා (ධර්ම ශීලතාවය) නම් සංකල්පය

මුහම්මද් (සල්) තුමාණෝ පැවසූ බව අබූ දර් ජුන්දුබ් (රලි) සහ අබූ අබ්දුල් රහ්මාන් (රලි) මෙසේ වාර්තා කළෝය. "ඔබ සෑම කොතැනක සිටියත් අල්ලාහ්ට බියබැතියෙන් කටයුතු කරනු. ඔබගෙන් අකුසල් ක්‍රියාවක් සිදු වූ විට, පෙරළා පසුව කුසල් ක්‍රියාවක් කරන්න. මෙම කුසල් ක්‍රියාව ඔබෙන් සිදු වූ අකුසල් ක්‍රියාව මකා දමන්නේය. තවද අන් අය සමඟ විනීත ලෙස හැසිරෙන්න." මූලාශ්‍ර අත් තිර්මිදි.

<u>මෙහි පසුබිම</u>

තක්වා යනු ඉතාමත් වැදගත් සහ පුළුල් අර්ථයක් සහිත ඉස්ලාමීය සංකල්පය වේ. එහි මුල් පදය "වකායා" එනම් ආරක්ෂා කිරීම යන්නයි. මේ අනුව තක්වා යනු අල්ලාහ්ගේ බරපතල දඬුවමින් තමන් ආරක්ෂා කර ගැනීම යන්නයි.

තක්වා යනු අල්ලාහ්ට බිය බැතිමත් වීම යනුවෙන් ඇතැම් විද්වතුන් පරිවර්තනය කරන නමුත්, එය පුළුල් අර්ථයේ එක් කොටසක් පමණි. "අල්ලාහ්ට බිය වීම, ඔහුගේ අණ පනත් අනුගමනය කිරීම, ඔහුගෙන් ලැබෙන දැයින් සෑහීමට පත් වීම, සහ විනිශ්චය දිනය සඳහා සූදානම් වීම." යන සියල්ල එහි අඩංගු බව අලි ඉබ්න් අබි තාලිබ් (රලි) තුමා පහදා දෙයි.

"අල්ලාහ් ගැන සිහිසන් ඇතිව සිටීම" යනුවෙන් මුහම්මද් අසාද් පරිවර්තනය කරයි. අල් කුර්ආනය පෙන්වන අයුරින් එහි අර්ථය වටහා ගැනීම වඩා සුදුසු යැයි තවත් මුස්ලිම් විද්වතුන් පිරිසක් අදහස් දක්වති.

මෙම වචනය අල් කුර්ආනයේ බොහෝ ස්ථානයන් හී සඳහන් වී තිබේ. *"විශ්වාස කරන අයවලුනි, ඔබ අල්ලාහ්ට බිය විය යුතු අයුරින් බියවනු. ඒකාන්තයෙන්ම ඔබ (අල්ලාහ්ගේ අණට පමණක් යටහත් වන) මුස්ලිම්වරු නොවී මිස මිය නොයනු."* සූරා ආල ඉම්රාන් 3:102

තක්වා භාවය ලබා ගැනීමෙන් මුස්ලිම් වරයෙක් බොහෝ තිළිණ සහ දේවාශීර්වාද ලබා ගනියි. අල්ලාහ්ගේ ආදරය, යහපත් සහ අයහපත් කරුණු අතර විනිශ්චය කිරීමේ හැකියාව, දුෂ්කර ප්‍රශ්න පහසුවෙන් විසඳීමේ හැකියාව, පාපයන්ට සමාව දීම, අල්ලාහ් ගෙන් මඟ පෙන්වීම සහ සහය ලැබීම,

යහපත් දැනුම ලැබීම, සමෘද්ධිය සහ ජය ලැබීම මේවායින් කිහිපයකි.

<u>මෙයින් ඉගෙන ගන්නා පාඩම්</u>

තක්වා යනු "මුස්ලිම්වරයෙකු අවශ්‍යයෙන් කළ යුතු දේ ඉටු කිරීම, තහනම් දේ සහ සැක සහිත දේවලින් ඉවත් ව සිටීම" යයි ඉමාම් ඉබ්න් රජබ් ඇතුළු තවත් ආගමික විද්වතුන් අදහස් දක්වති. සියලු නබි වරුන්හට සහ මානව වර්ගයාට අල්ලාහ් විසින් දෙන ලද උපදෙස් මෙයයි. මුහම්මද් (සල්) තුමාණෝ තම අනුගාමිකයන්ට විවිධ අවස්ථාවන් හී කළ සියලු දේශනයන්හී ම තක්වා පිළිබඳව මතක් කරමින් උපදෙස් දෙයි. මෙය කෙටියෙන් පහදා දීම සඳහා තක්වා යනු අල්ලාහ්ට බියබැතිමත් වීම යනුවෙන් ආරම්භක යුගයේ ජීවත් වූ විද්වතුන් අදහස් දඅක්වුහ.

තක්වා යනු පරිපූර්ණතාව නොවේ. තක්වා සහිත අය පවා පාපයන් සිදු කිරීමට අවස්ථා තිබේ. එහෙත්, ඔවුන් පාපයක් සිදු කළහොත්, වහාම පසුතැවිලි වී, මෙම හදීසිය සඳහන් කරන ආකාරයෙන් එම පාප ක්‍රියාව මකා දමනු පිණිස යහ ක්‍රියාවක් ඉටු කරති. තක්වා යන සංකල්පයෙහි මෙයද කොටසක් බව පෙනේ.

මිනිසා දඬුවම් ලැබීමෙන් ආරක්ෂා ලබනු පිණිස, අති කාරුණික අල්ලාහ් සමාව දීමේ දොරටුව නොයෙක් අයුරින් විවෘත ව තබා ඇත. පාප ක්‍රියාවකට පසු කුසල්

ක්‍රියාවක් ඉටු කිරීම තුළින් පාපයට සමාව ලැබීමේ මාර්ගයක් තිබෙන බව අල්ලාහ් පවසන්නේ මෙසේය. *"ඇත්තෙන්ම, යහකම් අයහකම් පහ කරන්නේය."* සූරා හූද් 11: 114

පාපයන්ට සමාව ලබන්නට විවිධ මාර්ග තිබෙන බව අල් කුර්ආනය සහ සුන්නාහ්ව අපට පෙන්වයි. ඒවා නම්:

- ඉස්තිඃෆාර් නම් අල්ලාහ්ගේ සමාව ඉල්ලීම.
- තව්බාහ් නම් පසුතැවිලි වීම.
- දුආ නම් මුස්ලිම්වරු එකිනෙකා වෙනුවෙන් කරන ප්‍රාර්ථනා.
- ෂෆා නම් නබි (සල්) තුමාණන්ගේ මැදිහත් වීම.
- ෂෆා නම් යහපත් මුස්ලිම් වරුන්ගෙන් ලැබෙන දුආ.
- පස්වේල සලාහ් නොකඩවා නියමිත වේලාවට ඉටු කිරීම.
- පීඩාවට ලක් වීම.
- සොහොනෙ හි සිදු වන වද වේනාව.
- අවසාන දිනයෙහි භයංකර දර්ශනය සහ සිදු වීම්.

➢ අල්ලාහ්ගේ මෛත්‍රිය සහ සමාව.

අපි යහකමක් කරන විට අල්ලාහ්ගෙන් ත්‍යාග ලැබෙන අතර, තවත් යහකමක් කරන්නට මඟ පෙන්වනු ලබමු. එහෙයින් යහකමක් කරන සෑම විටම එයින් තවත් යහකමක් කිරීමට මඟ විවෘතවෙයි. එමෙන්ම අයහකමක් කර, ඒ සඳහා පසුතැවිලි නොවුයේ නම්, සමාව අයැද නොසිටියේ හෝ යහකමක් නොකළේ නම්, එම අයහකමට සමාන හෝ වෙනත් අයහකමක් හෝ කිරීමට පමණක් නොව එවැනි අයහකම් දිගින් දිගට කරන්නටද ඒවා සඳහා පසුතැවිලි නොවන්නටද ඉඩ තිබේ. මෙවැනි කෙනෙකුට අයහකම් කිරීම ඉතා පහසු බවට පත් වී ඔහුගේ හදවතට මුද්‍රා තබන ලදුව, ඔහු පාපතරයෙක් යන අභාග්‍ය තත්ත්වයට පත් වේ.

සෙසු මුස්ලිම්වරු සමඟ සුහඳව හා අන්‍යෝන්‍යව ගරු කිරීමට සෑම මුස්ලිම්වරයෙකුම බැඳී සිටී. “තක්වා භාවයේ සලකුණු යහපත් ගුණාංගය වේ.” යයි ඉබ්න් රජබ් නම් විද්වතෙක් පවසයි. මෙම යහ ගුණය නොමැතිව තක්වා භාවය පරිපූර්ණ නොවේ. මෙම කරුණු සියලු මුස්ලිම්වරු වටහා ගත යුතුයි. තක්වා යනු “මිනිසාගේ අයිතීන් ඉවත දමා අල්ලාහ් ගේ අයිතීන් පමණක් ඉටු කිරීම” යැයි බොහෝ දෙනෙක් සිතති. “මුස්ලිම්වරු මිනිසා සමඟ කරුණාවෙන් ක්‍රියා කළ යුතුය” යි නබි (සල්) තුමාණෝ තරයේ පැවසුහ.

මෙම නිගමනය තහවුරු කරන තවත් හදීස් වදන් කිහිපයක් මෙසේය.

'සියලු ධර්මිෂ්ඨභාවය සහ යහපත්භාවය අලංකාරවත් ගුණාංගයන්වේ.' මූලාශ්‍ර මුස්ලිම්

'අංග සම්පූර්ණ ඊමානය (දේව විශ්වාසය) සහිත මූඃමින් වරයෙක් උසස් හැසිරීම සහිත කෙනෙක් වේ.' මූලාශ්‍ර ඉමාම් අහ්මද් සහ අබූ දාවූද්.

'තුලාවෙහි, යහපත් ගුණාංගය මෙන් බර සහිත අන් කිසිවක් නොමැත.' මූලාශ්‍ර ඉමාම් අහ්මද් සහ අබූ දාවූද්.

දේව විශ්වාසය සහ යහපත් ගුණාංගය යන පදනම මත සැමියෙක් තෝරා ගන්නා ලෙස නබි (සල්) තුමාණෝ කාන්තාවනට උපදෙස් දුන්හ.

<u>නිගමනය</u>

අල්ලාහ්ට බියබැතිමත් වීම, අල්ලාහ්ගේ අණට කීකරු වීම, අයහකමක් කළේ නම් එයින් පසුව යහකමක් කරමින් එය මකා දැමීම, සෙසු අය සමඟ අන්‍යෝන්‍යව හා ගෞරවයෙන් හැසිරීම, යහපත් ගුණාංග වර්ධනය කර ජීවත් වීම යන සියලු දේ තක්වා යන වචනයේ අඩංගුවේ.

## 19. අල්ලාහ්ගේ රැකවරණය

අබු අල් අබ්බාස් අබ්දුල්ලා බින් අබ්බාස් (රලි) මෙසේ වාර්තා කළේය. 'දිනක් රසූල් (සල්) තුමාණන් පිටු පසින් වාඩි වී සිටියෙමි. එවිට එතුමාණන් මා අමතා මෙසේ පැවසුහ.

"දරුවා! ඔබට (උපදෙස්) වචන සමහරක් උගන්වන්නෙමි. අල්ලාහ් පිළිබඳ සිහි කල්පනාව ඔබ තුළ ආරක්ෂා කර ගන්න. එවිට අල්ලාහ් ඔබ ආරක්ෂා කරනු ඇත. අල්ලාහ් පිළිබඳ සිහි කල්පනාව ඔබ තුළ ආරක්ෂා කරගන්න, එවිට ඔබ ඉදිරියෙහි අල්ලාහ්ව දකිනු ඇත. ඔබ අයැද සිටිනා විට, අල්ලාහ්ගෙන් පමණක් අයදිනු. ඔබ පිහිට පතා ප්‍රාර්ථනා කරන විට අල්ලාහ්ගෙන් පමණක් පිහිට පතා ප්‍රාර්ථනා කරනු. දැන ගන්න. මුළු සමාජයම එක්වී ඔබට යහපතක් කිරීමට උත්සාහ කළද, අල්ලාහ් විසින් (ඔබට අදාළ ලේඛනයෙහි) යහපත් දේ පිළිබඳ ලියා ඇත්තේ කුමක්ද එම යහපත් දෑ හැර වෙනත් යහපතක් කිරීමට ඔවුන්හට නොහැක. ඔවුහු එක්රැස් වී ඔබට අයහපතක් කිරීමට උත්සාහ කළද, අල්ලාහ් විසින් (ඔබට අදාළ ලේඛනයෙහි) අයහපත පිළිබඳ ලියා ඇත්තේ කුමක්ද ඒ අයහපත් දෑ හැර වෙනත් යමක් කිරීමට ඔවුන්ට නොහැක. (ඔබට අදාළ ලේඛනය ක්‍රියාවට නැංවීම පිණිස) පන්හිඳ ඔසවා ඇත. ලේඛන ගත වී ඇති පිටු සියල්ලක්ම වියළී ගොස් ඇත. (එනම් ඔබේ ඉරණම තීරණය කර අවසානයි.)" මූලාශ්‍ර අත් තිර්මිදි.

මෙම හදීසය අත් තිර්මිදි මෙසේ වාර්තා කරයි. "අල්ලාහ් පිළිබඳව සිහි කල්පනාව ඔබ තුළ ආරක්ෂා කරගන්න. එවිට ඔබ ඉදිරියෙහි අල්ලාහ්ව දකිනු ඇත. සැපෙහි දී අල්ලාහ්ව සිහිපත් කරන්න, දුකෙහි දී ඔහු ඔබට පිහිට වනු ඇත. ඔබව පසු කොට ගිය දෙයක්, ඔබට යළි සිදු නොවන බවද, ඔබට සිදුවීමට තිබෙන දේ, ඔබව පසුකර නොයන බවද දැන ගනු මැනවි. ඉවසීම සමඟ ජය ලැබෙන බවද, විපත්තියෙන් පසුව සම්පත්තිය ලැබෙන බවද, කරදරයකින් පසුව සහන ලැබෙන බවද දැන ගනු මැනවි."

## මෙහි පසුබිම

අල්ලාහ් වෙත ආරක්ෂා පැතීම සම්බන්ධව ඉස්ලාමයේ ඉතා වැදගත් උපදේශයක් මෙම හදීසය සඳහන් කරයි. 'මෙම හදීසය නොදන්නා එහි අර්ථය ගැන අවබෝධ නොමැති කෙනෙක් අනුකම්පාවට ලක් විය යුතුයි' යනුවෙන් ඉස්ලාමීය විද්වතෙක් පැවසූ බව ඉබ්න් රජබ් දන්වයි.

## ඉගෙන ගන්නා පාඩම්

මුහම්මද් (සල්) තුමාණෝ, ඉබ්නු අබ්බාස් (රලි) තුමාට අමතා කථා කළ හෙයින් රසූල් තුමාණෝ පවසන සෑම වචනයකටම ඉතා ඕනෑ කමින් ඉබ්නු අබ්බාස් (රලි) සවන් දුන්නේය. කෙනෙක් යම් කරුණක් ගැන කථාවක් පවත් වන්නට පටන් ගන්නා විට සවන් දෙන

අයගේ සම්පූර්ණ අවධානය තමා වෙතට යොමු කර ගන්නට වග බලා ගත යුතුයි.

“අල්ලාහ් ගැන සිහි කල්පනා සහිතව සිටින්න.” යන පදයෙහි අර්ථය මෙසේය.

- අල්ලාහ් වෙතට අනිවාර්යයෙන්ම සිදු කළ යුතු සියල්ල ඉටු කිරීම.
- ඔහුගේ අණපනත් පිළිපැදීම.
- ඔහු තහනම් කළ සියල්ලෙන් ඉවත් වීම

අල්ලාහ්ගේ රැකවරණය ලබනු පිණිස අප ඉටු කළ යුතු ඇතැම් කටයුතු පහත දැක්වේ.

- පස්වේල නැමදුම නියමිත වෙලාවට අපට හැකි අයුරින් හොඳාකාරව ඉටු කිරිම.
- පිරිසිදු භාව හා පවිත්‍රතාව රැක ගැනීම.
- පොරොන්දුවක් දුන්නේ නම් එය ඉටු කිරීම.
- අපේ ඉන්ද්‍රියන් රැක ගැනීම. එනම්, අප දකින, සවන් දෙන සහ පවසන දේ අල්ලාහ්ට කැමති දේ බවට වග බලා ගැනීම. මෙම ඉන්ද්‍රියන් වැරදි දැයකට උපයෝගී නොකිරීම.
- හලාල් නොවන ආහාර හා පානය ගැනීමෙන් වැළකී සිටීම.

➢ අපේ ගණුදෙනු හලාල්ද යනුවෙන් ප්‍රවේසම් වීම.

➢ මසීය්යාගෙන් අපේ සිත ආරක්ෂා කර ගැනීම. එනම් පාප සිතුවිලි සහ පාප ක්‍රියාවන් ගෙන් සිත ආරක්ෂා කර ගැනීම. දුබල තත්ත්වයකට පත් වූ කෙනෙක් පාපයක් කළා නම්, ඔහු වහාම පසුතැවිලි වීම සහ කුසල් ක්‍රියාවක් ඉටු කිරීම.

අප අල්ලාහ් ගැන සිහි කල්පනාවෙන් සිට, අපේ යුතුකම් සියල්ල ඉටු කර, තහනම් දැයින් ඉවත් වූයේ නම්, අල්ලාහ් අපට රැකවරණය දෙයි. අල්ලාහ් ගෙන් ලැබෙන රැකවරණයෙහි වර්ග දෙකක් ඇත.

1. ගැත්තාගේ ලෞකික කටයුතු සම්බන්ධව අල්ලාහ් රැකවරණය සපයයි. නිදසුනක් වශයෙන්, අපගේ සෞඛ්‍යය සහ අවබෝධය - පෙනීම, සවන් දීම සහ කථා කිරීම වැනි ඉන්ද්‍රියන් ගෙන් අපි ඉමහත් ප්‍රයෝජන ලබන්නේ අල්ලාහ්ගේ කරුණාව සහ ඔහුගේ ත්‍යාග යෙන්ය. අපි මහළු වියට පත් වුවාට පසුවත්, මෙවැනි ඉන්ද්‍රියන් ගෙන් පමණක් නොව අපේ දැනුම සහ බුද්ධියද ප්‍රයෝජනයට ගෙනීමේ භාග්‍යයද අල්ලාහ් අනුමත කර ඇත. අපේ ඥාතීන්, දේපොළ, බඩුබාහිරාදිය සහ ධනය යන සියල්ල අල්ලාහ් ආරක්ෂා කරයි. තරුණ වියෙහි කෙනෙක් අල්ලාහ් ගැන සැලකිලි සහිතව සිටියේ නම්, ඔහුගේ මහලු වියෙහි අල්ලාහ් ඔහුට ආරක්ෂා දෙයි.

2. අල්ලාහ් ඔහුගේ ගැත්තාගේ ආගම සහ ඊමාන් නම් ආගමික විශ්වාසය ආරක්ෂා කරයි.

වැරදි ලෙස වටහා ගැනීම, නොමඟ යෑම, වැරදි මත සහ තමා කැමැති ආකාරයට ආගම වටහා ගැනීම වැනි උවදුරෙන් අල්ලාහ් අපව ආරක්ෂා කරයි. අල්ලාහ් අපට යහමග සහ උපකාර සැපයීමෙන් අයහපත් ආභාසයට ලක් වීමේ අනතුරෙන් අපි ආරක්ෂාව ලබන්නෙමු.

අප ජීවිතයේ අවසාන කාලයේ සාතාන්ගේ මුළාවට ලක් වීමේ අනතුරෙන් අල්ලාහ් අපට ආරක්ෂා සපයයි. මෙමගින් මෙලොව හැර දමා යන විට සම්පූර්ණ ඊමානය සහිතව මූඃමින් කෙනෙක් වශයෙන් මිය යන්නට අවස්ථාවක් අපට ලැබේ.

අල්ලාහ් අපගේ ආගමික විශ්වාසය ආරක්ෂා කරන බව අපි බොහෝ විට නොදනිමු. ඇතැම් සිදුවීම් පිළිබඳව අප අසතුටු වන්නට ඉඩ ඇත. අපි යමක් කරන්නට කැමති නමුත්, අල්ලාහ් එය සිදු වීමට අවස්ථාවක් නොදෙයි. නමුත් මෙමගින් අපට හානියක් හෝ අපගෙන් පාපයක් සිදු විය හැකි යමකින් අල්ලාහ් අප ආරක්ෂා කරයි.

අල්ලාහ් ගැන අවබෝධයෙන් සිටින්නේ නම්, ඔහු අපට ඉතා සමීප ව සිටියි. මූඃමින් නම් දේව විශ්වාසය සහිත කෙනෙකුට යහ මඟ පෙන්වා, ඔහුට සහයෝගය

දෙමින්, උදව් කර, ආරක්ෂා සපයා ජයද ලබා දීමෙන් අල්ලාහ් අප සමීප ව සිටියි.

හදීසයේ දෙවන කොටස, පහසු කාලයේ දී අල්ලාහ් ගැන අප සිහියෙන් සිටින්නේ නම්, අපගේ අයහපත් කාලයේ දී අල්ලාහ් අපට උදව් කරයි. එනම්, අල්ලාහ්ගේ ආශීර්වාද යෙන් අපි සෞභාග්‍යයෙන් සහ සැනසිල්ලෙන් සිටින විට එම ආශීර්වාදය අල්ලාහ්ගේ සතුට ලබා ගනු පිණිස වැය කළ යුතුයි. එවිට, අයහපත්, අසීරු, දුබල හා අසනීපයට ලක් වන විට, අල්ලාහ් අප ගැන සැලකිලිමත්ව බලා ගනියි. මනා ශක්තියෙන් සිටින කාලයේ අප කළ යහපත් දේ, එසේ කිරීමට තව දුරටත් අපට නොහැකි වන අවස්ථාවක අල්ලාහ් ඒවා සඳහාද ත්‍යාග ලබා දෙයි.

අබ්දුල්ලාහ් බින් අබ්බාස් (රලි) තුමාට මුහම්මද් (සල්) තුමාණෝ ''අයැදින විට අල්ලාහ් ගෙන් ඉල්ලනු මැනවි'' සහ ''අල්ලාහ්ගෙන් සහය ඉල්ලනු මැනවි'' යනුවෙන් පැවසූ උපදෙස් තව්හීද් නම් ඒක දේව වාදයේ මූලික පදනම වේ. සෑම සලාහ්වෙ හීම සූරා අල් ෆාතිහාවෙහි අප ''ඉය්යාක නඋබුදු ව ඉය්යාක නස්තර්න්'' යැයි කියවන විට අදහස් කරන්නේ එයයි. නොකඩවා අල්ලාහ් ගෙන් දුආ ඉල්ලීම සහ අල්ලාහ්ගේ සහය සහ ඔහුගේ යහ මඟ අයැදීම කෙතරම් වැදගත් ද යැයි මෙම වාක්‍යය අපට පෙන්නුම් කරයි. අල්ලාහ්ගේ සහය සහ ඔහු වෙත අපි මුළුමනින්ම යැපීම අවශ්‍ය බව නිතර මතකයේ තබා

ගැනීම සඳහා මෙවැනි වතාවත් ඉටු කිරීමෙන් අපට නිසි මඟ ලැබේ.

සිදු වීමට ඇති සියලු දේ ලව්හ් අල් මහ්ෆූස් යන ග්‍රන්ථයෙහි අල්ලාහ් ලියා අවසානයි. අපට පාලනය කළ නොහැකි රෝගාතුරු වීම, ආදරය අහිමි වීම වැනි බොහෝ කරුණු අප ජීවිතයේ සිදු වනු ඇත. මෙවැනි ප්‍රශ්නවලට නිසි අයුරින් මුහුණු දීම සඳහා තෘප්තිය ලත් හදවතක් සහ එඩිතර භාවය අවශ්‍යවෙයි. මෙම තෘප්තිය අප පුහුණු විය යුතු එකකි. යහපත් හෝ අයහපත් හෝ වේවා, අති අතුම් අල්ලාහ් අපහට තෝරා ගත් ඕනෑම දැයින් තෘප්තියට සහ සතුටට පත්වීම ''රිධා'' නම් උසස් මට්ටමට ළඟා වන මාර්ගය වේ. එහි දෙවන කොටස සබ්ර් නම් ඉවසීම වන අතර, එහි ඉවසීම සහ සන්සුන්භාවයද ඇතුළත් වෙයි. අල්ලාහ් අකැමැති කිසියම් දැයක් සිදු කිරීමෙන් සහ පැවසීමෙන් වැළකී සිටීම එහි කොටසකි.

මෙම හදීසයේ අඩංගු කරුණු ගැන අවධාරණය කරන අල් කුර්ආන් වැකි කිහිපයක් තිබේ. ඒවායින් කිහිපයක් පහත සඳහන් වේ.

*"අල්ලාහ් ඔබ විපතකට හසුකරන්නේද, එය පහසු කරන්නට ඔහු හැර (වෙන කිසිවෙක්) නැත. නුඹට යහක් සිතුවේ නම් ඔහුගේ වරප්‍රසාදය වළක්වන්නට කෙනෙක් නැත. ඔහුගේ වහලූන්ගෙන් ඔහු සිතු*

*කෙනෙකුට එය ලැබෙන්නට සලස්වන්නේය. ඔහු සමාන්විතය, දයාලුය.*" අල් කුර්ආන් *10:107*

*"අල්ලාහ් කෙනෙකුට (මිනිසෙකුට) දයාලු භාවයක් විවෘත කරන්නේද, එය නවත්වන්නෙක් නැත. ඔහු යමක් නවත්වන්නේද පසුව එය දෙන්නෙක් නැත. ඔහු බල සම්පන්නය. නුවණැත්තේය.*" අල් කුර්ආන් 35: 2

*"භූමියෙහි හෝ ඔබ තමන් කෙරෙහි හෝ ඇබැද්දක් නොවන්නේය. එය අප සිදුකරන්නට පෙර පුස්තකයෙහි ලියා මිස. සැබැවින්ම එය අල්ලාහුට පහසුය.*" අල් කුර්ආන් 57:22

පොළොව සහ අහස මැවීමට වසර 50,000ට පෙර අල්ලාහ් සියලු දේ මවා ඒවායේ ඉරණම ලියා අවසානය. අප කරන සියලු දැයක්ම මෙයට පෙර සටහන් පොතේ සඳහන් වී අවසානද? නැතහොත් දැන් සිදුවනවාද? යනුවෙන් රසල් (සල්) තුමාණන් ගෙන් කෙනෙක් විමසීය. එවිට එතුමා, "සටහන් පොතේ සඳහන් වූ ආකාරයෙන් ඒවා සියල්ල සිදු වනු ඇත" යැයි පිළිතුරු දුන්හ. එවිට ඒ මිනිසා, "එසේ නම් මම කිසිවක් කරන්නට තිබෙන අවශ්‍යතාව කුමක්ද?" යැයි විමසීය. එයට රසූල් (සල්) තුමාණෝ, "යහ දේ පමණක් කරන්න. සෑම කෙනෙක්ම තමා මවනු ලැබූ දැය කෙරෙහි ගෙන යනු ලබන්නේය". යනුවෙන් ඔහුට (සහ සියලු මිනිස් සමාජයට) අණ කළේය.

අල් කද්ර් (යන ඉරණම) කොටස් දෙකට බෙදිය හැක.

අපේ පාලනයෙන් තොරව බොහෝ කරුණු සිදු වන බව අපි දකිමු. ඒවා පිළිබඳව අපි අල්ලාහ්ගේ අණට සම්පූර්ණව යටපත් වී ඉවසීමෙන් සිටිය යුතුයි.

එමෙන්ම තවත් කරුණු කිහිපයක් අපේ පාලනයට යටත්ව සිදු වනු ඇත. අපි ප්‍රවේශම් නොවීම, කම්මැළිකම සහ නොසැලකිලිමත් වීම වැනි හේතුන් නිසා මේවා සිදු වනු ඇත. මේවා සිදු වූ විගස ඒවා කද්ර් නම් ඉරණම බවට පත් වීමෙන්, ඒවාට භාරව සිටින අය එම සිද්ධීන්ට වගකිව යුතු වේ. ගොඩනැගිලි කර්මාන්තයේ නිරත වන කෙනෙක්, රෝගීන්ට සත්කාරකම් කරන වෛද්‍යවරයෙක් සහ වාහනයක් පදවන රියදුරෙක් මෙයට හොඳ නිදසුන් වේ. මේවා පමණක් නොව ඕනෑම ක්‍රියාවක් කරන විට ප්‍රවේශමෙන් සහ අංග සම්පූර්ණව උපරිම හැකියාව යෙදිය යුතුය.

ලෞකික කටයුතු හෝ නැමදුම් හෝ වේවා, අපිට හැකි අයුරින් අංග සම්පූර්ණව ඒවා ඉටු කළ යුතුය.

ඒ සමඟ, වැළකිය යුතු කරුණු වලින් ඉවත් වීම තවත් වැදගත් දෙයකි. අපේ සෞඛ්‍යයට අහිත කරන ආහාරයෙන් වැළකීම තවත් වැදගත් කරුණකි. මෙවැනි අහිත කර ආහාරය ඕනෑකමින් අනුභව කිරීමෙන් පසු කද්ර් (ඉරණම)ට දොස් කීම නුවණට හුරු ක්‍රියාවක් නොවේ.

රෝගයට ප්‍රතිකාර ගැනීම කද්ර් (ඉරණම)ට එරෙහි වන ක්‍රියාවක් නොවන බව සලකන්න. එයින් සුවයක් ලැබුනේ නම්, එය අපගේ කද්ර් (ඉරණම) බව පිළි ගත යුතුයි. එමෙන්ම ප්‍රශ්නයක් පැන නැගුණේ නම්, එය විසඳන්නට හෝ අවම කරන්නට වෑයම් තළ යුතුය.

අල් කද්ර් පිළබඳ මෙම හදීසය මුස්ලිම්වරු පවා බොහෝ දෙනෙක් වැරදි ලෙස අවබෝධ කර ගන්නා අතර, අප එය යහපතක් ලෙස බැලිය යුතුයි. අපට පාලන කළ හැකි දේ සහ නොකළ හැකි දේ අතර වෙන් කර බැලිය යුතුයි. සිදු වන සියල්ල කද්ර් යනුවෙන් වර්ග නොකර, එම සිද්ධියට හේතුව කුමක්දැයි සොයා  බලා, එවැනි දැයක් නැවත සිදු නොවීමට වග බලා ගත යුතුය. අපෙන් සිදු වූ සියලු දේට සහ අප තෝරා ගත් ක්‍රියා මාර්ගයන්ට වග කීම අප භාර ගත යුතුය.

<u>නිගමනය</u>

සාමයෙන් හා සතුටින් පිරුණු ජීවිතයට මෙම හදීසය මඟ පෙන්වයි. සිදු වන සියලු දේවල යහපත් අංගය අවබෝධ කර ගැනීමෙන්, ආයාසයෙන් තොර වූ ජීවිතයෙහි සෑහීමට පත් වූ කෙනෙක් බවට සිටිය හැක. අනාගතය ගැන කනස්සල්ලට පත් නොවී, පහසුවෙන් ජීවත් විය හැක. අල්ලාහ් වෙතට ඉටු කළ යුතු යුතුකම අපට හැකි අයුරින් ඉටු කර, අපට අල්ලාහ් ගෙන්

ලැබෙන ඕනෑම දැයින් සෑහීමට පත්වන්නට සිත ධෛර්යාය කරගන්න හැකි වනු ඇත.

## 20. අල් හයා (විළිබිය) නම් සංකල්පය

රසූල් (සල්) තුමාණෝ මෙසේ පැවසූ බව අබූ මස්ඌද් උක්බා බින් අම්ර් අල් අන්සාරි අල් බද්රි (රලි) වාර්තා කරයි.

'පෙර විසූ නබි වරුන්ගෙන් ජන සමාජයට ලැබුණු එක් ආචාර ධර්මයක් නම්, ඔබ සතුව ලැජ්ජාව (සහ බිය) නොපවතී නම්, ඔබ සිතූ පැතූ දේ කර (ඒ තුළින් පාපතර ක්‍රියා කර) නූ ඇත.' යන්නයි'' මූලාශ්‍රිත අල් බුහාරි

පසුබිම:

හයා යන වචනයට විනීත භාවය, ලැජ්ජාව, කුළෑටිකම හෝ බයාදුකම වැනි නොයෙක් අර්ථ තිබෙන බව උස්තාද් ජමාල් අල් දීන් සzර්බෝසෝz පහදා දෙයි. හයා යන වචනයේ මූලික අර්ථය ප්‍රාණය වන අතර, විනීතභාවය නොමැති කෙනෙක් මෘත ශරීරයක් හා සමාන වනු ඇත.

හයා නම් විනීතභාවය ඉස්ලාම් අගය කර එය සඳහා අනුබල දෙයි. සෑම මුස්ලිම් කෙනෙකු වෙත තිබිය යුතු ඉතා වැදගත් ගුණාංගයක් හයා වේ. පහත සඳහන් හදීස් වදන් මෙය සනාථ කරයි.

- භයා සහ ඊමානය එකිනෙකට සම්බන්ධ වී ඇත. එයින් එකක් ඉවත් වුවහොත් අනිත් එකද ඉවත් ව යන්නේය.'' මූලාශ්‍ර හාකිම්.
- අල් හයා ඊමානයේ කොටසකි. මූලාශ්‍ර අල් බුහාරි සහ මුස්ලිම්.
- "හයා (නම් ගුණාංගය) මගින් යහ දෙයක් හැර අන් කිසිවක් සිදු නොවේ." මූලාශ්‍ර අල් බුහාරි සහ මුස්ලිම්.

මෙම හදීස් හී වචන යොදා තිබෙන ආකාරයට අනුව නොයෙක් අර්ථ පැවසිය හැකිය. මෙම හදීසයේ අර්ථ දෙකක් කිව හැකි බව විද්වතුන් පවසන බව ඉමාම් ඉබ්නු රජබ් දන්වයි.

<u>පළමුවන ව්‍යාඛ්‍යානය</u>

ඔබට විළි ලැජ්ජාවක් නොමැති නම් ඕනෑම ආකාරයෙන් හැසිරෙනු. එවිට අල්ලාහ්ගේ දඬුවම ඔබ වෙත පහළ වනු ඇත. මෙම භාෂා ශෛලිය අරාබි සමාජයේ පොදුවේ භාවිත කෙරේ. මෙය අවවාදයක් වන අතර, අල් කුර්ආන්ද සඳහන් කරන්නේ මේ අයුරින්ය.

*"අපගේ සංඥාවන් විකෘති කරන්නවුන් අපගෙන් නොසැඟ වෙති. ශ්‍රේෂ්ඨවන්නේ නිරයට හෙළනු ලබන්නා ද, එසේ නොමැතිනම් මළවුන් කෙරෙන්*

*නැගිටුවනු ලබන දින අභයදායීව පැමිණෙන්නාද? නුඹලා අභිමත කළ දෑ කරවු. සැබැවින්ම, ඔහු නුඹලා කරන දෑ පිළිබඳව බලන්නාය.*” අල් කුර්ආන් 41: වාක්‍ය 40

<u>දෙවැනි ව්‍යාඛ්‍යානය</u>

අල්ලාහ් හෝ වෙනත් කෙනෙකු ඉදිරියේ කරන්නට ලැජ්ජා වීමට හේතුවක් නොමැති යමක් සිදු කිරීමට ඔබ අදහස් කරන්නේ නම්, එය ඉටු කරනු.

මෙම ව්‍යාඛ්‍යානයෙහි යම් ක්‍රියාවක් ඉටු කිරීමේදී විළි ලැජ්ජාව මිනුම් දණ්ඩක් වශයෙන් භාවිත වන අතර, එයින් යමක් කරන්නට අනුමැතියද දෙන ලදී.

<u>තුන්වැනි ව්‍යාඛ්‍යානය</u>

අට වන ශත වර්ෂයේ ජීවත් වූ ප්‍රකට ආගමික විද්වතෙක් වන ඉබ්නු අල් කයියූම් අල් ජව්සිය්යා (රහ්) තුමා මෙම ව්‍යාඛ්‍යානය ඉදිරිපත් කළේය. මෙම හදීසය අනුමත කළ දේ පිළිබඳ නියෝගයක් නොව සත්‍ය ප්‍රකාශයක් වන බව ඔහුගේ මතය වේ. කෙනෙකුට විළි ලැජ්ජාවක් නොතිබුනේ නම්, ඔහුගේ ක්‍රියාව වැළැක්වීමට කිසිවක් නැත. කෙනෙක් පාප ක්‍රියාවන් හී යෙදීමෙන් වැළකීමට තිබෙන වැදගත් බාධකය හයා යන ගුණාංගය වේ. හයා නොමැති පිරිමියෙකු හෝ ස්ත්‍රියක් හෝ වේවා, ඔහු/ඇය ඕනෑම දෙයක් කරන්නට ඉදිරිපත් වෙයි.

## ඉගෙන ගන්නා පාඩම්

හයා නම් ලැජ්ජා ගුණාංගය දෙවර්ගයට අයත් වේ. ඒවා නම් ස්වාභාවික හයා සහ ආශ්‍රයෙන් ලබා ගත් හයා යන්නයි. දෙවන වර්ගයේ හයා සිදු වන්නේ අල්ලාහ්ගේ කීර්තිය සහ ඔහුගේ ගුණාංග පිළිබඳ දැනුමෙන් ලැබු අවබෝධය සහ පැහැදීමෙන්ය .

හයා නම් ගුණාංගය විවිධ මාධ්‍යයෙන් ප්‍රකාශ වන බව ජමාල් උද් දීන් සරබෝසෝ නම් ආගමික විද්වතෙක් හදීස් වදන් හතළිහක් පිළිබඳ විවරණයෙ හි සඳහන් කරයි.

- අල්ලාහ් කෙරෙහි තිබෙන හයා නම් විළි ලැජ්ජාව:

  මුස්ලිම්වරයෙක් අන් අයට නොපෙනෙන ස්ථානයක තනිව සිටින විට, අල්ලාහ්ගේ අසතුටට හේතු වන යමක් දෙස බැලීම, සවන් දීම, යමක් කිරීම, හෝ යමක් පැවසීම වැනි අවස්ථාවන් හි ලැජ්ජා වීමට ලක් විය යුතුය.

- මලාඉකාවරු කෙරෙහි හයා:

  මිනිසාගේ සියලු ක්‍රියා සටහන් කරන මලාඉකාවරු ඉදිරියේ අසභ්‍ය දෙයක් සිදු කර, ඔවුන් එය සටහන් කර ගන්නට සිදු වීම ගැන මුස්ලිම් කෙනෙක් ලැජ්ජාවට පත් විය යුතුය.

- සෙසු මිනිසුන් කෙරෙහි හයා නම් විළිලැජ්ජාව:

මිනිසුන් එකිනෙකා අතර අසභ්‍ය දෙයක් හෝ හිංසාවක් සිදු කිරීමෙන් වැළකී සිටීම, ඉතා වැදගත් හයා නම් විළි ලැජ්ජාව වේ. අන් අයට පෙනෙන්නට අසභ්‍ය දෙයක් සිදු කිරීමට මුස්ලිම්වරයෙක් ලැජ්ජා විය යුතුය.

➢ තමන් කෙරෙහි හයා නම් විළිලැජ්ජාව:

ලැජ්ජා සහගත දැයක් සිදු කිරීමට කෙනෙක් ලැජ්ජා විය යුතුය. තම හයා මට්ටම පහතට වැටී තිබෙන බව මුස්ලිම් වරයෙක් අවබෝධ කර ගත්තේ නම්, ඔහු එය යථා තත්ත්වයට පත් කර ගෙන අල්ලාහ්ට සමීප වීම සඳහා යහ ක්‍රියාවන් හී යෙදීමෙන් තම ඊමානය තර කර ගත යුතුය.

හයා නම් ඉතා අලංකාරවත් ගුණාංගය වර්ධනය කිරීමට, ගුරු වෘත්තියේ යෙදෙන අය, දෙමාපියන්, සහ දඃවා ක්‍රියාවෙ හි යෙදෙන පිරිස් යන සියලු තරාතිරමේ ජනයා වෙහෙසිය යුතුය. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සහ වගකීමෙන් තොරව එවායින් ලබන ප්‍රයෝජන නිසා ජනතාවට මෙම වටිනා ගුණාංගය අමතක වී ඇත. අයහපත් ජනතාව හයා නම් ගුණාංගය විකෘති කරන මෙම යුගයේ වග කිව යුතු මුස්ලිම්වරු ජනතාවගේ සිත් තුළට විළි ලැජ්ජාව නම් අගනා ගුණාංගය ගැන පහදා දිය යුතුය.

නවීන බටහිර මාධ්‍ය හයා නම් ගුණාංගය විකෘති කොට එයට අභියෝගයක් දක්වයි. මේ නිසා ඊමානය

පවා විකෘති වීමට අවස්ථා ඇත. එවිට අනිවාර්ය කුළුනු පවා නිසියාකාරව ඉටු නොකිරීමට සහ ප්‍රමාද වී ඉටු කරන අවස්ථාවන් ද ඇත. ඒ සමඟ මිණිස් ඝාතන, මත් ද්‍රව්‍ය භාවිත කිරීම, විශ්වාසය කඩ කිරීම සහ කාම මිථ්‍යාචාරය වැනි පාප ක්‍රියාවන් තුළින් විනෝද වීමට පෙලඹෙන්නට ඉඩ ඇත. අඩ නිර්වස්ත්‍ර සහ අශීලාචාර ගීත පවා විනෝද වීමේ මාර්ගයක් ලෙස සැලකේ. මුස්ලිම් සමාජය මෙවැනි අසභ්‍ය දේ කිසිදු සමීක්ෂණයකින් හෝ ඇගයීමකින් තොරව උපුටා ගැනීම ඉතාමත් කනගාටු දායක කරුණකි. මෙවැනි භයානක අනතුරෙන් මුස්ලිම් ප්‍රජාවට ආරක්ෂා දීම සෑම මාධ්‍ය ආයතනයකම වගකීමක් බව සලකන්න.

භයා නම් ගුණාංගය ඇතැම් අවස්ථාවන් හි අත්‍යවශ්‍ය කුළුනක් අතපසු කිරීමට හෝ ඒගැන නොසැලකිලිමත් වීම සාමාන්‍ය දෙයක් බව පෙන්වීමට සාධකයක් ලෙස උපයෝගි කර ගනු ලැබේ. නිදසුනක් වශයෙන් බොරුවක් හෝ දුෂ්ට පාලනයක් දකින විට හෝ නිහඬ ව සිටීමට භයා හේතුවක් වූ බව පෙන්වන්නට ඇතැම් අය සූදානම් වෙති. හඬ නැඟීමෙන් අනර්ථය අධික විය හැකි අවස්ථාවක පමණක් මෙම නිහඬ වීමේ පියවර අනුමත කරනු ලබන බව සලකන්න.

දැනුම නොසොයන්නට භයා නම් ගුණාංගය හේතුවක් වූ බව පෙන්වීම තවත් වැරදි ක්‍රියාවකි. බොහෝ මුස්ලිම් සමාජයන් හී ''දැනුම සෙවීමට භයා

(ලැජ්ජා විය) නො විය යුතුය''යන වාක්‍ය බොහෝ අයගේ සිත් තුළ අවුලක් සිදු කරයි. මෙම මතය ඇතැම් සීමිත අවස්ථාවන් හී පමණක් උපයෝගී කරනු ලබන බව පෙනේ. කෙසේ වෙතත්, පාසැලක දැනුම සෙවීමේදී, බොහෝ මුස්ලිම්වරු භයා නිසා නිහඬ ව සිටින බව පවසති. ළමයින් ප්‍රශ්න ඇසීම යහපත් හැසිරීමක් නොවන බව සලකා ඒ ගැන අසතුටට පත් වන දෙමාපියන්, පාසැල් ගුරුවරු සහ විශ්ව විද්‍යාලයන්හි කථිකාචාරවරුන් තවමත් සිටිති. මෙය වැරදි ආකල්පයක් වන අතර, එය වෙනස් කළ යුතුයි.

යහපත් ක්‍රියාවක් ඉටු නොකිරීමට හයා හේතුවක් බව පෙන්වන අයද අප අතර සිටිති. යම් ක්‍රියාවක් ඉටු කළ යුතු බවද, එය අනිවාර්යය දැයක් හෝ එයින් යහපත් ප්‍රතිඵලයක් ලැබෙන බවද කෙනෙක් දන්නා නමුත්, හයා (ලැජ්ජාව) නිසා කිසිවක් නොකරන අවස්ථාවන් බොහෝමය. නිදසුනක් වශයෙන්, අන් අය ඉදිරියේ සකාත් ගෙවීමෙන් වැළකීම, මිනිසුන්ගේ ගමනට බාධා කරමින් මාර්ගයේ තිබෙන උවදුරක් ඉවත් නොකිරීම, මහළු අයෙකුට හෝ ආබාධිතයෙකුට පාර හරස් කර යෑමට උදව් නොකිරීම මේවායින් කිහිපයකි.

## නිගමනය

හයා නම් උතුම් ගුණාංගය ඉස්ලාමයේ වැදගත් සංකල්පයක් වන අතර, එය උපරිම අයුරින්

අනුගමනය කරන මුස්ලිම්වරයෙක් යහපත් ක්‍රියාවක් ඉටු කිරීම පමණක් නොව, නින්දා සහගත හා අසභ්‍ය කාර්යයන් හි නිරත වීමෙන් වැළකී සිටියි. අල්ලාහ් සහ සමාජය ඉදිරියේ ලැජ්ජාවට ලක් නොවන ක්‍රියාවන් හී ඔහු නොයෙදෙයි. හයා සහ ඊමානය එකිනෙකට සම්බන්ධය. එහෙත් මෙම ගුණාංගය නවීන තාක්ෂණය සහ පරිසරය නිසා විනාශයට ලක් වෙමින් පවතී. මෙවැනි අභියෝගයන්ට මුහුණ දීමට මුස්ලිම්වරු පුහුණු වීමෙන් තම ඊමානයද ශක්තිමත් කර ගත යුතුය. යහපත් ක්‍රියාවක් ඉටු කිරීමෙන් වැළකී සිටීමට හයා හේතුවක් නොවිය යුතුයි.

# ඉමාම් අල් නවවිගේ හදීස් වදන් 40 පිළිබඳ විවරණය

## 4 වන කොටස

කර්තෘ


මහාචාර්ය ජමාල් අහමද් බදී ඉ

පොදු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලය

මැලේෂියාව


සිංහල පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්

## විෂය සටහන

29. ස්වර්ගයට ඇතුළත් කර වන සත් ක්‍රියා - 2

30. අල්ලාහ් විසින් පනවන ලද සීමාවන් ඉක්ම වීම

31. ඉස්ලාමයේ අල් (z)සුහ්ද් නම් තපස් භාවය

32. කිසිවෙකුට හිංසා නොකිරීම

33. අයිතිවාසිකම් සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය, විරුද්ධ වන පක්ෂය දිවුරුම් දිය යුතුය.

34. අම්ර් බිල් මහ්රූෆි වන් නහිඋ අනිල් මුන්කර් සංකලපය - යහපත් දෑ අණ කර අයහපත් දැයින් වළක්වාලීම විශ්වාසයේ අංගයකි

35. ඉස්ලාමීය සහෝදරත්වය විනාශ කරන පාපයන්

36. මුස්ලිම්වරයෙකුගේ අවශ්‍යතා පියවීමේ සහ අල් කුර්ආනය කියවීමට හා අල්ලාහ් සිහි කිරීමට එක්රැස් වීමේ වැදගත් කම

## 29. ස්වර්ගයට ඇතුළත් කර වන සත් ක්‍රියා 2

මුආද් ඉබ්නු ජබල් (රලි) මෙසේ වාර්තා කරයි.

"අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනි! ස්වර්ගය කරා මා රැගෙන යන සහ නිරයේ ගින්නෙන් මා ආරක්ෂා කරන යහපත් ක්‍රියාවක් ගැන මට කියා දෙනු මැනවි." යයි දිනක් කීවෙමි. එවිට නබි තුමාණන් "ඔබ වැදගත් කරුණක් ගැන මගෙන් ප්‍රශ්න කර ඇත. එහෙත් සැබැවින්ම අති උතුම් අල්ලාහ් කවරෙකුට එය පහසු කර ඇත්තේද, ඔහුට එය ඉතා පහසු කරුණකි. (එ නම්) අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකර ඔහුට පමණක් නැමදුම් කරනු, ඔබ සලාහ්තය ඉටු කරනු, ඔබ Zසකාත් ගෙවනු, රමදාන් මාසයේ උපවාස ශීලයෙහි නිරතවනු, සහ හජ් වන්දනාව ඉටු කරනු." යනුවෙන් පැවසූහ.

ඉක්බිති "කුසල් ධර්මයේ දොරටු කුමක්දැයි නුඹට මඟ පෙන්වන්නදැ?" යි විමසා මෙසේ අනුශාසනා කළහ. "උපවාස ශිලය ඔබ නපුරෙන් ආරක්‍ෂා කරන පලිහකි; ජලය විසින් ගින්න නිවා දමන්නාක් සේ සදකා නොහොත් දන් දීම නුඹේ පාපයන් නිවා දමනු ලබයි. තවද රාත්‍රි මැද කොටසේ මිනිසෙක් නැගිට සලාහ්තයේ නිරත වීමෙන්, ඔහුගේ වැරදි ක්‍රියා විසිරී යයි." යනුවෙන් පැවසූ රසූල් තුමාණන් අල්

කුර්ආනයේ 32-වාක්‍ය 16 සහ 17 පාරායනය කළේය. *"තවද, ඔවුන් බියෙන් හා අපේක්ෂාවෙන් තමන්ගේ පරමාධිපතිට අයැදීම පිණිස ඔවුන්ගේ ඉල ඇට නිදි යහනින් ඉවත් වෙති. තවද අපි ඔවුන් වෙත ලබා දුන් දැයින් වියදම් කරති. නෙතට දැකුම්කළු දැයින් ඔවුන් සඳහා (ස්වර්ගයේ) සඟවා ඇති දෑ කිසිම ආත්මයක් නොදන්නේය. (එය) ඔවුන් කරමින් සිටි දෑ සඳහා වූ ප්‍රතිඵලයන් වශයෙනි."*

පසුව නබි තුමාණන් මා අමතා "මෙම විෂයයෙ හි මුදුන් පැත්ත, එහි කුලුන සහ එහි අග්‍රස්ථානය ගැන කියා දෙන්නදැ?" යි විමසුහ. "ඔව් රසූල් තුමාණනි" යනු මම පිළිතුරු දුනිමි. එවිට රසූල් තුමාණන් "මෙම විෂයයක මුදුන් පැත්ත ඉස්ලාමිය දහමය. (අල්ලාහ් ට අවනත වීම), එහි කුලුන සලාතයයි, මේවායේ (ඉතා ඉහළින් පිහිටි දේ) අග්‍රස්ථානය ජිහාදය වේ." යයි අනුශාසනා කළහ.

පසුව "සෑම කරුණකදීම පාලනය කළ යුතු විෂයයන් සම්බන්ධ ව අනුශාසනා කරන්න දැ?" යි විමසුහ. "ඔව් (පවසනු) නබි (සල්) තුමාණනි!"යයි කීවෙමි. එවිට නබිතුමාණන් සිය දිව අතින් අල්ලා "මෙය පාලනය කර ගන්න." යනුවෙන් පැවසුහ. "අල්ලාහ්ගේ නබි තුමාණනි! අපගේ මුවින් පිට වන වචන සඳහා අපි වගකිව යුතුම දැ?" යි විමසූ විට එතුමාණෝ "ඔබේ මවට ඔබ තුරන් වේවා. මිනිසුන් දිව නිසා ඇති කර

ගත් ප්‍රතිඵලය හැර ඔවුහු නිරයේ වේදනාවට ලක් වීමට වෙනත් හේතු කාරණාවක් තිබේ දැ?'' යි පැවසුහ. (මූලාශ්‍ර සහ අත් තිර්මිදි)

පසුබිම:

මෙම හදීසයේ සඳහන් අයුරින් සහාබාවරු බොහෝ දෙනෙක් ප්‍රශ්න කළහ. නබි තුමාණන්, ඔවුන්ටද මේ අයුරින්ම පිළිතුරු දී ඇත. ඉමාම් අහමද් මූලාශ්‍රිතයේ සඳහන් කළ තවත් හදීසයක "රසූල් තුමාණන් වෙත මුආද් (රලි) පැමිණ "නබි තුමාණනි! මාගේ (සිත්) තුළ ඇවිළෙමින් මාව රෝගියෙක් බවට පත් කරන ප්‍රශ්නයක් පිළිබඳව ඔබ තුමාගෙන් විමසන්නට පැමිණියෙමි'' යයි කීවේය.

නබි තුමාණන්ද, "කැමති දෙයක් විමසන්න." ඔහුට කීහ. එවිට මුආද් "ස්වර්ගය තුළට පිවිසීමට මා හට ඉඩ සලසන ක්‍රියාවක් ගැන මට දන්වන්න." යනුවෙන් කීවේය. කුසල් ක්‍රියා ගැන දැනුම සෙවීමට මුආද් (රලි) තුළ තිබුණු ආශාව මෙම ප්‍රශ්නය පෙන්නුම් කරන බව ඉබ්නු රජබ් සඳහන් කරයි.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්:

කුර්ආනය පවසන ආකාරයෙන් කුසල් ක්‍රියා ඉටු කිරීම තුළින් ස්වර්ගයට යෑමට මඟ පාදන අතර එහි පිවිසීමද පහසු කරයි.

*“නුඹලා කරමින් සිටි දෑ හේතුවෙන් නුඹලාට උරුම කරන දෙනු ලැබුවා වූ ස්වර්ගය මෙයයි.”* සූරා සුඛ්රුෆ් 43: 72

කෙසේ වෙතත් කෙනෙකුගේ කුසල් ක්‍රියා යනු අති උතුම් අල්ලාහ්ගේ කරුණාව හා අනුග්‍රහයෙන් කොටසකි.

*“අල්ලාහ් විශ්වාසය නුඹලා වෙත ප්‍රිය කරවන අතර නුඹලා ගේ හදවත් හි එය අලංකාර කර පෙන්වන්නේය. තවද, ඔහු ප්‍රතික්ෂේපය, පාපය හා පිටුපෑම නුඹලාට පිළිකුල් කර පෙන් වන්නේය. යහමඟ ගියවුන් ඔවුහුමය.”* සූරා හුජරාත් 49: 7

එනිසා, මෙම වාක්‍යයෙ හි අර්ථය හදීසය මගින් සනාථ කර ඇත. කුසල් ක්‍රියා ඉටු කිරීමෙන් ස්වර්ගයට ඇතුළු විය හැකි නමුත් එවැනි කුසල් ක්‍රියාව ඉටු කිරීමට ලැබෙන සියලු අවස්ථාවන් අල්ලාහ්ගේ අනුග්‍රහයෙන්ය.

අප ස්වර්ගයට පිවිසීම සිදු වන්නේ, අප කළ කුසල් ක්‍රියාවෙන් පමණක්ද? නැතහොත් අල්ලාහ්ගේ කරුණාවේ හේතුවෙන්ද? යනුවෙන් ඇතැම් විද්වතුන් තර්ක කරති. ඇතැමුන් පවසන ආකාරයට මෙම පිවිසීම ගිවිසුමක් හෝ ගනුදෙනු වක් හා සමානද? නැතහොත් එසේ පිවිසීම සඳහා අල්ලාහ් කුසල් ක්‍රියාවන් හේතුවක් බවට පත් කර තිබේද? ඇත්ත

වශයෙන්ම, අල්ලාහ් අපහට දායාද කර ඇති ඔහුගේ එකම එක් දායාදයට වුවද අපට වන්දි ගෙවිය නොහැකි වන බව අපි තරයේ සිහියේ තබා ගත යුත්තෝ වෙමු.

මෙම හදීසයේ පවසන කුසල්, ඉහත හදීසයන් හි ඉමාම් නවවි සඳහන් කර ඇත. විශේෂයෙන් අංක 2, 3, 15 සහ 23 දරණ හදීස් දෙස බලන්න. කෙසේ වෙතත් මෙහිදී තවත් කුසල් ක්‍රියා දෙකක් ගැන සඳහන් කර ඇත.

1. මධ්‍යම රාත්‍රියෙ හි නැගිට සලාහ්තය ඉටු කිරීම - මෙහිදී මිනිසුන් තුන් කොටසක් පිළිබඳව සඳහන් කර තිබෙන බව ඉබ්නු රජබ් පවසයි. ඔවුන් නම්

- අල්ලාහ්ව දික්ර් (සිහි කිරීම) දුආ (යාච්ඤා කිරීම) සහ තහජ්ජද් සලාහ්තය ඉටු කිරීම පිණිස නැගිටින පිරිස.

- ඉෂා සලාහ් වේලාව දක්වා අවදි වී සිට, ඉෂා සලාහ්තය ඉටු කරන තුරු නින්දට නොයන පිරිස.

- ෆජර් සලාහ්තය සඳහා අලුයම අවදි වන පිරිස.

මෙම තුන් පිරිස පිළිබඳ ව කුර්ආනයේ සඳහන් වී ඇත. රාත්‍රි කාලයේ අවදියෙන් සිට නොයෙක් විනෝදයන්

හි නිරත වන ජනතාව ඉහත සඳහන් ආශීර්වාද කිසිවක් නොලබති. එම භාග්‍යවන්ත පිරිසට අති උතුම් අල්ලාහ්ගේ ආශීර්වාදය මරණයෙන් මතු ලැබෙන බව ඔහු පොරොන්දු දී ඇත.

**ජිහාද්:** තම මව්බිම ආරක්ෂා කිරීම සඳහා ජිහාදය අනිවාර්යය බවට පත්වන්නේ කොතැනකද, කුමන අවස්ථාවක ද? මෙම ක්‍රියාව පිළිබඳ ව වෙනත් හදීසයන් හි පැහැදිලි ව පවසා නැත. ජිහාදයට සහභාගි වීම අල්ලාහ්ට කෙනෙක් සමීප කිරීමේ උතුම් ක්‍රියාවකි. අනිවාර්යය ඉබාදාවන්හට පසුව ඉතා වැදගත් නැමදුමක් බව ජිහාදය ගැන බොහෝ ආගමික විද්වතුන් අදහස් දක්වති. ජිහාදය තුළින් අල්ලාහ්ගේ ධර්මය ආරක්ෂාව ලබන අතර සාමය පවතින සමාජයේ ජීවත් වන සියලු ජනතාවගේ අයිතීන් රැක ගනු ලැබේ.

හදීස් අංක 15 හි යහ දැයක් පැවසීමේ හෝ නිහඬ ව සිටීමේ වැදගත්කම පිළිබඳව නබි (සල්) තුමාණන් පෙන්වා දුන්හ. තම දිව (කතාව) හේතුවෙන් මිනිස්සු අපායට ඇද දමනු ලබන බව මෙම හදීසයේ නබි (සල්) තුමාණන් පෙන්වා දුන්හ. මේ හේතුවෙන් සෑම අවස්ථාවකම අපගේ කතාව අවම කිරීම හා පාලනය කිරීම ඉතා වැදගත් බව ඉබ්නු රජබ් සඳහන් කරයි. සිය දිව (කථා) පාලනය කරගන්නා තම සියලු කටයුතු පාලනය කර ගත් කෙනෙක් බවට පත් වෙයි.

මීට පෙර සඳහන් කළ හදීසට අනුව, කතාවේ යහපත් කොටස සඳහන් කරනු ලබන අතර මෙම හදීසය කතාවේ අයහපත් කොටස පෙන්නුම් කරයි. මේ අනුව අපගේ දිව (කතාව) යහපත් හා අයහපත් කරුණක් සඳහා උපයෝගි කළ හැකිය. බොහෝ දෙනෙක් මේ ගැන වැඩි සැලකිල්ලක් නොදක්වති. අල්ලාහ් ප්‍රිය නොකරන මුසාව, අපහාස කිරීම, අපවාද නැගීම වැනි අයහපත් කථාවන් හි යෙදීම තහනම් බව මුස්ලිම්වරු දන්නා නමුත්, ඔවුන් ද එවැනි පාපයන් හි නිරත වෙති. අපි කරන යහ කථාවට ත්‍යාග ලැබෙන අයුරින්ම අයහපත් කථාවට දඬුවම් ලැබෙනු ඇත. විහිළුවට වුවත් කෙනෙකුට අපහාස කිරීම වෙනුවෙන් අපි වගකිව යුතුමය. කෙනෙකුට "යා අල්ලාහ්! ඔහුට යහ මග පෙන්වනු මැනව." යැයි නින්දා ශීලිව කරන දුආවක් පවා පාපයක් ලෙස සලකනු ලබයි.

මුස්ලිම්වරයෙක් තම දිව ආරක්ෂා කර නොගත හොත් සමාජයට එයින් විශාල හානියක් සිදු විය හැක. උත්මාන් (රලි) තුමාගේ පාලන කාලයේ එතුමාට එරෙහි ව ඇතැම් සහාබාවරු කළ විවේචනාත්මක කථා එතුමාව ඝාතන කළවුන්ට සාධක වූ බව ඇතැම් විද්වතුන් අදහස් දක්වති. එහි ප්‍රතිඵල වශයෙන් මුස්ලිම්වරයෙක් යනු නිතරම සමාජයට ශුභ සිද්ධියක් කරනු පිණිස යහ දේ පමණක් පවසන යහපත් කෙනෙකු බව අර්ථ කථනය කරනු ලබයි. සමාජයේ

මුස්ලිම්වරු අතර ආරවුලක් සිදු කළ හැකි කිසිවක් ඔහු පැවසිය නොයුතුය.

මේ පිළිබඳව ඉස්රායීල් ගෝත්‍රිකයට අයත් කෙනෙකුගේ කථාවක් නබි (සල්) තුමාණන් පැවසුහ. "එක් කලක ඥාතීන් හෝ සොයුරන් දෙදෙනක් සිටියහ. එයින් කෙනෙක් ශ්‍රද්ධාවන්ත යහපත් කෙනෙකු වූ අතර අනෙකා පාපයන් කිරීමට පුරුදු වී සිටියේය. මේ ගැන යහපත් පුද්ගලයා නිතර විවේචනය කළ නමුත් එය මග පෙන්වීමේ අයුරින් සිදු කළේ නැත. දිනක් පාපය කරන්නා පසු කර ගෙන ගිය ශ්‍රද්ධාවන්තයා "අල්ලාහ් මත දිවුරා කියමි. ඔහු කිසි දවසක නුඹට සමාව නොදෙන්නේය." යනුවෙන් කෝපයෙන් පැවසීය. එවිට අල්ලාහ්, "මාගේ බලතලට ඉහළින් බලධාරියා වන්නට ඉදිරිපත් වන්නේ කවරෙක්ද?" යනුවෙන් යහපත් මිනිසා කළ ප්‍රකාශය සඳහා ඔහු ව වරද කරුවෙක් බවට පත් කළේය."

අප පවසන වචන, විශේෂයෙන් කෝපයට පත් වූ මොහොතේ පවසන වචන පිළිබඳව ඉතාමත් ප්‍රවේශම් විය යුතුයි යන පාඩම මෙයින් ඉගෙන ගත යුතුයි. "මම කෝපයෙන් හෝ අධික සතුටින් හෝ සිටින මොහොතෙ හි සත්‍ය පැවසීමට උපකාර කරන ලෙස අල්ලාහ්ගෙන් අයැදිමි." යනුවෙන් රසූල් තුමාණන් පැවසුවේ මේ හේතුවෙනි. අපහට තර්බියයාත් සහ

තස්කියයාත් අවශ්‍ය වන්නේ මේ නිසාය. ආරම්භයේ මෙය අපහසු දෙයක් වන බව සලකන්න. එහෙත් අපි අවංකවම මෙම මාර්ගයේ වෑයම් කරන බව අල්ලාහ් දුටුවේ නම් ඔහුගේ අසීමිත කරුණාවෙන් උදව් හා තව්ෆීක් නම් යහ මග අපහට ලබා දෙයි. උසස් මට්ටමේ තර්බියයාත් සහ තස්කියයාත් ලබා ගනු පිණිස මුස්ලිම්වරු අවංකව වෑයම් කළ යුතුය. මෙය ඔවුන්ගේ අඃහ්ලාක් හි කොටසක් වෙයි. යම් දෙයක් පිළිබඳව නිසි දැනුමක් නොමැති හේතුවෙන් මුස්ලිම්වරු වැරදි අවබෝධය මත පාප ක්‍රියාවන් හි පවා යෙදෙන්නට ඉඩ තිබෙන නිසා දැනුම (ඉල්ම්) අවශ්‍ය වේ. මුස්ලිම් වරයෙක් තම දිව පාලනය කර ගත්තේ නම් ඔහු තම අනිකුත් සියලු කටයුතු පාලනය කර ගන්නා බව ඉබ්නු රජබ් පවසයි. මෙම හදීසය මගින් මුස්ලිම්වරු ලබා ගන්නා ප්‍රඥාව මෙය වේ.

මුස්ලිම්වරු ඉගැන්වීමේ හා ඉගෙන ගැනීමේ ක්‍රමවේදය කුමක් දැයි මෙම හදීසය පෙන්වා දෙන කදිම ආදර්ශය දෙස බලන්න. තම හදවතෙ හි දැවෙන ප්‍රශ්නයක් අසන්න දැයි මුආද් (රලි) විමසීය. එයට පිළිතුරු දුන් රසූල් තුමාණන්, "ඕනෑම ප්‍රශ්නයක් අසන්න" යැයි පැවසුවේ තමා ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දීමට සූදානම් බව පෙන්වනු පිණිසයි. යමෙක් විමසීමක් කළහොත් පිළිතුරු දෙන්නා එයට මුහුණ දීමට විවෘත හදවතකින් සිටිය යුතුය. ඉන් අනතුරුව රසූල් තුමාණන් නොයෙක් ප්‍රශ්න මාලාවකින් මුආද්

(රලි) ගේ දැනුම වර්ධනය කළේය. පිළිතුරු දෙන තැනැත්තාද නොයෙක් ප්‍රශ්න අසන විට සාකච්ඡා කරන කරුණු ගැන සවන් දෙන්නාගේ සිත යොමු වන අතර ඒ පිළිබඳව කල්පනා කිරීමටත් පොළොඹවයි.

නිගමනය:

ඉස්ලාමයේ ප්‍රධාන තේමාව තව්හීද් සහ තක්වා ය. එනම් සියලු කීර්ති හිමි අල්ලාහ් ට අවනත වීමයි. අන් සියලු ක්‍රියාවන් තව්හීද් සහ තක්වා වෙහි ශාඛා යැයි සැලකිය හැක. නිවැරදි තක්වා නොමැතිව, සර්ව බලධාරි අල්ලාහ් කෙරෙහි බිය බැතිමත්කම හට නොගනී. අප අල්ලාහ් ට බියබැතිමත් වන්නේ නම් ඔහු කෙරෙහි ආදරය ගොඩ නැගීම තුළින් ඔහුට ළඟා විය හැකි වෙයි. ඔහු තම රසූල් තුමාණන් ව යවා නිවේදනය සහ අනුගමනය කළ යුතු මාර්ගය අපහට පෙන්වා දුන්නේය. මේ හේතුවෙන් රසූල් තුමාණන්ගේ මාර්ගය අනුගමනය කිරීම තුළින් පමණක් අල්ලාහ්ට අවනත වීම සිදු විය යුතුය.

## 30. අල්ලාහ් විසින් පනවන ලද සීමාවන් ඉක්ම වීම

රසූල් (සල්) තුමාණන් මෙසේ පැවසූ බව අබූ තඅලබා අල් හුෂාමී ජුර්තූම් බින් නාසිර් (රලි) වාර්තා කරයි.

“අති උතුම් අල්ලාහ් අනිවාර්ය ක්‍රියාවන් ප්‍රකාශට පත් කර ඇත. එබැවින් ඒවා පැහැර හැරීමෙන් වැළකී සිටින්න. ඔහු විසින් විවිධ කරුණු සම්බන්ධ ව සීමාවන් පනවා ඇත. එම සීමාවන් ඉක්මවා නොයන්න. ඔහු විසින් ඇතැම් දේ තහනම් කර ඇත, ඒවා උල්ලංඝනය නොකරන්න. ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඔහු නිහඬ ව සිටියි. එසේ ඔහු නිහඬ ව සිටින්නේ අමතක වීමක් නිසා නොව නුඹලා කෙරෙහි දක්වන කරුණාව නිසාය. එබැවින් ඔහු නිහඬ ව සිටින කරුණු ගැන අනවශ්‍යව විමසා බැලීමෙන් වැළකී සිටින්න.” මූලාශ්‍ර දාර කුත්නි.

පසුබිම:

මෙම හදීසය දාවූද් ඉබ්නු අබී හින්ද් සහ මහූෘල් සහ අබී ත’අලබා අල් කුෂර්ශානි යන අයගේ මාර්ගයෙන් විද්වතුන් කිහිප දෙනෙකු විසින් වාර්තා කරන ලදී. ඉමාම් බුහාරි, අහමද් සහ හාතිම් මෙය දුර්වල හදීසයක් බව පවසන නමුත් මෙය හසන් හදීසයක් බව තවත් අය සනාථ කරති.

පහත සඳහන් හේතුන් මත මෙය දුබල හදීසයක් බව සඳහන් කරනු ලබයි.

1. අබී තඅලබා (රළි) ගෙන් මෙම හදීසයට මහූෘල් සවන් දුන්නේ නැත.

2. මහූෘල් තම ගුරු තුමාණන්ගෙන් මෙම හදීසයට සවන් දී නැති බව පෙනේ.

3. මේ හේතුවෙන් මෙය නබි තුමාණන්ගේ හදීස් වදනක් ද නැතහොත් සහාබාවරයෙක් පැවසූ කරුණක් ද යනු විවාදයට තුඩු දෙන ප්‍රශ්නයකි.

ඉහත සඳහන් අඩු පාඩු තිබුණ ද, මෙම හදීසය නිවැරදි බව බොහෝ අය පිළිගනිති.

තවද මෙම හදීසයේ සඳහන් කරුණු බොහෝ විද්වතුන් මගින් නොයෙක් අවස්ථාවන් හි ෂරීආ නීති රීති වර්ග කරනු පිණිස උපයෝගී කර ඇත. ඉස්ලාමීය වර්ගී කිරීම් පහක් උපුටා ගනු ලැබුණේ මෙම හදීසයෙනි. ඒවා නම් අත්‍යවශ්‍ය යන වාජිබ්, වඩා හොඳ යන මන්දූබ්, තහනම් යන හරාම්, පිළිකුල් සහිත යන මක්රූහ් සහ අවසර දිය හැකි යන මුබාහ් යනු වර්ග පහකි. මෙම හදීසයේ සඳහන් වචන ෂරීආවෙ හි අහ්කාම් නම් නිගමනය සඳහා උපයෝගී කර ගනු ලැබේ.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්:

'අල්ලාහ් ඇතැම් සීමාවන් පනවා ඇත. ඒවා ඉක්මවා නොයන්න.' යන ප්‍රකාශය අල් කුර්ආන් වාක්‍යයන් මගින් සනාථ කර ඇත.

*“මේවා අල්ලාහ්ගේ සීමාවන්ය. එම (සීමා) නොඉක්ම වවු. යම් කෙනෙක් අල්ලාහ්ගේ සීමාවන් ඉක්මවත්ද ඒ අය ඔවුහුමය වරද කරුවෝය.”* සූරා අල් බකරා 2:229

*“මෙය අල්ලාහ්ගේ සිමාවන්ය. කවරෙකු අල්ලාහ්ගේ සීමාවන් ඉක්ම වන්නේ ද ඔහු තමාටම අපරාධ කර ගත්තේය. එය (දික්කසාදය)ට පසුව අලුත් තත්ත්වයක් අල්ලාහ් ඇති කළ හැකි බව නුඹ නොදන්නෙහිය.”* සූරා අත් තලාක් 65:1

මෙම වාක්‍ය ගැන පරීක්ෂා කළේ නම් “පවුල් ජීවිතයේ ” විශේෂයෙන් අඹු සැමි අතර තිබෙන සම්බන්ධතාවේ සීමාව ගැන පවසන බව දැක ගත හැක. උරුමක්කාරයන් අතර කෙනෙකුගේ උරුමය වැඩි කිරීම හෝ අඩු කිරීම ඉස්ලාමිය නීතිය උල්ලංඝනය කිරීමකි. අයිති වාසිකම් සහ උරුමය සම්බන්ධ ව අල්ලාහ්ගේ නීතිය උල්ලංඝනය කිරීමට කිසිවෙකුට අයිතියක් නැත.

පවුලේ නෑයන් අතර ඉස්ලාම් විසින් පනවන ලද සීමාව ඉක්ම වීම නිසා නොයෙක් අයහපත් විපාකයන්ට දොර විවෘත වේ. ලොවේ මුස්ලිම් වරුන්ගේ සැබෑ ජීවිතයේ මෙය දැක ගත හැක. පවුල් අයිතිවාසිකම් උල්ලංඝනය කළ නඩු, උසාවි වල බොහෝමයක් ඇත. පවුල් ජීවිතය ෂරීආවට එකඟ ව නොපැවැත්වීම සමාජයේ බොහෝ ගැටුම් වලට මූලික

හේතු වනු ඇත. උදාහරණයට වචන හුවමාරුව සීමාව ඉක්ම වන විට දික්කසාදයට තුඩු දෙයි. මේ යුවළ අන් අයගෙන් උපදෙස් පතන්නේ, තත්ත්වය උග්‍ර වූ පසුවයි. ආරම්භයේ දීම ඔවුන් තම කෝපය හා වචනය සීමාව තුළ තබා ගත්තේ නම් මෙවැනි අවුලට මුහුණු පාන්නට සිදුවන්නේ නැත.

දික්කසාදයට අදාළ කොන්දේසි හා නීති රීතිද අල්ලාහ් පැහැදිලි කර ඇත. එහි දෙපාර්ශවයම විශේෂයෙන් සැමියා අනුගමනය කළ යුතු කරුණු ඇත. දික්කසාද කිරීමේ අවස්ථාවන් අවම කිරීමේ මාර්ගය ද තිබේ. එමෙන්ම සීමාව ඉක්ම වුයේ නම් දෙපාර්ශවය යළි එක්වන්නට සුදුසු වාතාවරණයක් සැපයිය හැකිය. දික්කසාදය හැර වෙනත් මාර්ගයක් නොමැති නම් එයද ලහි ලහියේ අධික කෝපයට පත් ව සිටිය දී සිදු කළ නොයුතුය.

දික්කසාදයට ලක් වූ බිරිය හා දරුවන් අසාධාරණ තාඩන පීඩන වලින් ආරක්ෂාව ලැබිය යුතුය. මේ බව වග බලා ගනු පිණිස අල්ලාහ් නියම කළ සීමාවන් තුළ අප කටයුතු කළ යුතුය. ජනතාව පවුල් නෑකම අගය කළ යුතුය. එම නෑකම් තුළින් කෙනෙකුට වගකීම් තිබෙන අතර ඒවා දිගින් දිගට රැක ගැනීමද සිදු විය යුතුය.

ඉස්ලාම් යනු පහසුවෙන් අනුගමනය කළ හැකි ප්‍රායෝගික දහමකි. අප යම් දැයකට අකැමැති වුවද

ඉස්ලාම් එය අනුමැතිය කරයි. අඹු සැමියා අතර පවතින නෑකමෙ හි මෙය ඉතා වැදගත්ය. විශ්වාස වන්තයෙක් (සැමියා) තවත් විශ්වාසවන්තියක් (බිරිය) පිළිකුල් නොකළ යුතුයි. ඇයගේ යම් ගුණාංගයකට ඔහු අකැමැති වුවත් ඇගේ තවත් ගුණාංකයට ඔහු කැමති විය හැක. අංග සම්පූර්ණ වූ කිසිදු කෙනෙක් නැත. එහෙයින් අන් අයගේ ගුණාංගයන් අගේ කොට සලකන ලෙස ඉස්ලාම් උපදෙස් දෙයි.

ජනතාව අතර මධ්‍යස්ථ ව කටයුතු කරන ලෙස ඉස්ලාම් පවසයි. කෙනෙකුට ප්‍රිය කරන විට සීමාව තුළ මධ්‍යස්ථ ව ප්‍රිය කරන්න. ඇතැම් විට ඔබ අප්‍රිය කෙනෙකු බවට ඔහුට පත් විය හැක.

කෙනෙකුට අප්‍රිය කරන විට මධ්‍යස්ථ ව අප්‍රිය කරන්න. ඇතැම් විට ඔබ ප්‍රිය කෙනෙකු බවට ඔහු පත් විය හැකි බව ඉස්ලාම් උගන්වයි.

කථාවෙන් හා ක්‍රියාවෙන් මධ්‍යස්ථ ව හැසිරෙන ලෙස මෙම හදීසය උගන්වයි. එහෙත් ආදරය ප්‍රධාන තේමාව කර ගත් ගීත, චිත්‍රපටි, ටෙලි නාට්‍ය වැනි මාධ්‍ය මගින් මධ්‍යස්ථභාවය දැනටමත් විනාශ කර අවසානය. මේ හේතුවෙන් ආදරය ඉස්ලාම් නිර්දේශ කරන අයුරින් මධ්‍යස්ථ ව ප්‍රකාශ කරන කිසිදු අවස්ථාවක් දැන් දක්නට නැත. සුව කළ නොහැකි, අභාග්‍ය හා අර්ථයක් නොමැති එකක් බවට ජීවිතය පත් කර ගත් පිරිසක් අද අප සමාජය තුළ දකින්නේ

අල්ලාහ්ගේ සීමාව ඉක්ම වීමේ හේතුව නිසාය. සංස්කෘතිය හා පරිසරය ඔවුන්ගේ ජීවිතය විනාශ කර ඇත. අල්ලාහ්ගේ සීමාව ඉක්ම වූ කෙනෙක් ප්‍රශ්න වලට හා විනාශයට ලක් වෙයි.

ජනතාව සීමාව ඉක්මවන තවත් කරුණක් නම් (ෆරාඉද්) දේපළ උරුමයයි. මේ පිළිබඳ සීමාව කුමක්දැයි අල් කුර්ආනය හා හදීස් වදන් සඳහන් කර ඇත. සම්පත් උරුමය සම්බන්ධ ව ඒවායේ හිමි කරුවන් කවුරුන් ද, ඔවුන් ට හිමි වන කොටස කොපමණ ද යන සියලු විස්තර ඉස්ලාමිය ෂරීආ නීතියෙහි දන්වා ඇත.

සීමාව ඉක්ම වා වංක ලෙස ලබා ගන්නා දේපළ හා සම්පත් උරුමය නිසා අල්ලාහ් ගේ කෝපයට භාජන වන බව මුස්ලිම්වරු දැන ගත යුතුය. වංක ලෙස කෙනෙක් ලබා ගත් උරුමයෙන් සුළු කාලයකට කෙනෙකුට සතුටු විය හැකි නමුත් අවසාන යේ මෙලොව සහ මතු ලොවේ ඒවා සඳහා වන්දි ගෙවන්නට හා දුක් වන්නට සිදු වේ. තම නෑයන්ට හිරිහැර කරන සහ ඔවුන්ගේ අයිතිවාසිකම් පැහැර හරින මිනිසුන් පිළිබඳ තොරතුරු අපි දනිමු. මෙවැනි ක්‍රියා අධර්මිෂ්ඨ හා අසාධාරණ බව අල්ලාහ් කුර්ආනයේ සඳහන් කරයි. මෙවැනි ජනතාව තම අසාධාරණ ක්‍රියාවන් සඳහා සම්පූර්ණ වගකීම භාර ගෙන ඒ සඳහා දඬුවම් උසුලන්නට සිදු වෙයි.

අවසාන නිගමනය:

මෙම හදීසයේ සඳහන් සියලු අර්ථ හා කරුණු ඉතා වැදගත් හා පිළි ගත හැකි අදහස් ප්‍රකාශ කරන හෙයින් මූලාශ්‍රයෙහි ඇතැම් අඩු පාඩු තිබුණ ද මෙය ඉතා වැදගත් හදීසයක් බවට බොහෝ විද්වතුන් පවසති. සෑම මුස්ලිම්වරයෙක්ම මෙම හදීසය උගන්වන වැදගත් පාඩම අවබෝධ කර ගත යුතුය.

# 31. ඉස්ලාමයේ අල් (z)සුහ්ද් නම් තපස් භාවය

රසූල් (සල්) වරයා මෙසේ පැවසූ බව අබූ අල් අබ්බාස් සහ්ල් බින් සඅද් අල් සාඅද් (රලි) වාර්තා කරයි.

මිනිසෙක් රසූල් තුමාණන් වෙතට පැමිණ ‘අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනි! මට (කුසල්) ක්‍රියාවක් කිරීම කෙරෙහි මග පෙන්වනු මැනව. එම යහකම් කිරීමෙන් අල්ලාහ් සහ ජනතාව මට ආදරය දැක්විය යුතුයි’ යනු පැවසුවේය. රසූල් (සල්) තුමාණන් ඔහුට ‘ලොවට ආශා නොදක්වනු. එවිට අල්ලාහ් ඔබ කෙරෙහි ආදරය දක්වයි. මිනිසුන් දැඩි ලෙස අයිතිවාසිකම් දක්වන දෙයින් වැළකී සිටින්න. එවිට මිනිසුන් ඔබට ආදරය දක්වයි.’ යනුවෙන් අනුශාසනා කළහ. මූලාශ්‍ර ඉබ්නු මාජා සහ තවත් කිහිප දෙනෙක්.

මෙහි පසුබිම

මෙය දුබල පදනම් සහිත හදීසයක් බව විද්වතුන් කිහිප දෙනෙක් පෙන්නුම් කර ඇත. එහෙත් පසු කාලීන විද්වතුන් විවිධ හේතුන් මත හදීසයේ පාඨය ගැන ඔවුන්ගේ අර්ථ කථනයන්හි, සඳහන් කර ඇත. එවායේ ප්‍රධාන හේතුන් පහත සඳහන් වේ.

හදීසය දැනුම් දුන් මූලාශ්‍ර පිරිසගේ විස්තර නිවැරදි ව සනාථ කළ නොහැකි හේතුවෙන් මෙය සහීහ් (සත්‍යවත්) බව කිව නොහැකි නමුත් මෙහි අඩංගු අර්ථය නිවැරදි හා පිළිගත හැකි බව කවුරුත් පවසති.

මෙම හදීසය ඉස්ලාමයේ අති වැදගත් විෂයයක් වන අල් (z)සුහ්ද් නම් තපස්භාවයේ සංකල්පය පිළිබඳ ව සඳහන් කරයි. විවිධ ඉස්ලාමීය පිරිස අතර මෙම විෂය පිළිබඳව පවතින නොයෙකුත් අදහස් කුර්ආනය සහ හදීස් වදන් පදනම නොකොට ඔවුනො වුන්ගේ සංස්කෘතිය, දෙමාපියන්, ඥාතීන් හෝ සමාජය මගින් දෙන ලද ඉගැන්වීම් පදනම් කර ගත් ඒවාය.

මෙම හදීසයේ ඉතා වැදගත් උපදෙස් මාලාවක් අඩංගු වී තිබෙන බව ඉමාම් රජබ් පවසයි.

‘මෙලොවට ආශාව නොදැක්වීම තුළින් අල්ලාහ්ගේ ආදරයට මඟ පෑදෙන්නේය.’යනුවෙන් රසූල් (සල්) තුමාණන් පැවසූහ. එනම් ලොවට වැදගත්කම නොදක්වන කෙනෙකුට අල්ලාහ් ආදරය කරන්නේය.

එනම් (z)සුහ්ද් නම් සන්‍යාසි භාවය රකින කෙනෙකුට අල්ලාහ්ගේ ආදරය හිමි වෙයි.

(z)සුහ්ද් අනුගමනය කරන්නෙකුට පොදුවේ ලෝ වැසියන් ආදරය කරනු ඇත. මෙලොවෙ හි (z)සුහ්ද් භාවය රකින කෙනෙක් පිළිබඳ ව අල් කුර්ආනය සහ හදීස් වදන් තරයේ මෙසේ පවසයි.

"මෙලොව සැප සම්පත්ය. (අල්ලාහුට) බිය බැතිමත් වූවන්ට එලොව වඩා හොඳය. අනු ප්‍රමාණයකටවත් නුඹලා අපරාධ කරනු නොලබන්නෙහිය. යි කියව."සූරා අන් නිසා වාක්‍ය 77

"පරලොව විෂයෙහි මෙලොව ජීවිතය අල්ප භුක්ති විඳීමක් මිස නැත." සූරා අර් රඅද් (අකුණු) වාක්‍ය 26

"නුඹ මෙලොව ජීවිතය වඩා (හොඳයැයි) කැමති වන්නහිය. එහෙත් පරලොව ජීවිතය වඩා හොඳය. කල් පවත්නේය." සූරා අල් අ'අලා වාක්‍ය 16 සහ 17

දිනක් රසූල් වරයා (සල්) වෙළඳ පොළ පසු කර ගෙන යන විට එළුවෙකුගේ මළ සිරුරක් දුටුහ. ඌගේ කන කපා තිබුණි. එළුවාගේ කනන් අල්ලා ගත් රසූල් වරයා (සල්) 'එක දිර්හමක් ගෙවා මෙය මිල දී ගන්නට කවරෙකු හෝ සිටිනවා'දැයි විමසුවේය. එහි හුන් පිරිස එය නොමිලේ ලැබුණත් නොගනිමු, එයින් කුමක් කරන්න දැ යි පැවසුවෝය. මෙය ඔබ අතර කාහටවත්

අයත් සතෙක් දැ යි රසූල් වරයා (සල්) විමසුවේය. එවිට පිරිස එය ජීවතුන් අතර සිටියත් කන කැපු එළුවෙක් අපි මිල දී නොගනිමු දැන් ඔහු මළායින් පසු අපි මිල දී ගන්නේ කුමටදැයි පැවසූහ. රසූල් වරයා (සල්) "කිසිදු වටිනා කමක් නොමැති මේ එළුවාගේ මළ සිරුර මෙන් අල්ලාහ් ඉදිරියේ මෙලොව ජීවිතය ඉතා අල්ප දෙයක් වේ." යනුවෙන් පහදා දුන්හ. මූලාශ්‍ර සහීහ් මුස්ලිම්.

අන් අයගෙන් කිසිවක් නොඉල්ලන ලෙස විශේෂයෙන් අනුන්ට අත පා කිසිවක්, විශේෂයෙන් මුදල් නො ඉල්ලන ලෙස තරයේ අණ දුන් හදීස් වදන් බොහෝමයක් ඇත.

මෙයින් ඉගෙන ගන්නා පාඩම

(z)සුහ්ද් යනු මෙම ජීවිතයේ ආගම විසින් අනුමැතිය කරන ලද දේ තහනම් කර ගැනීම හෝ නාස්ති කිරීම හෝ නොවන බව අබූ මුස්ලිම් අල් හව්ලානි නම් ආගමික විද්වතා පැහැදිලි කරයි. කෙනෙක් තමන්ගේ හැකියාව කෙරෙහි පමණක් නොව අති උතුම් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබීම (z)සුහ්ද් යනු එහි අර්ථය වේ. කෙනෙක් මෙලොවෙ හි ආපදාවක යම් දෙයක් අහිමි කර ගත්තේ නම් හෝ අලාභයක් සිදු වුයේ නම් හෝ මතු ලොවේ ඒ සඳහා ත්‍යාගය ලබා ගන්නා බව ඔහු තරයේ විශ්වාස තබා ගනියි.

මෙම අර්ථ කථනය පදනම් කර ගෙන ඉබ්නු රජබ් (z)සුහ්ද් පිළිබඳ මෙසේ දන්වයි.

1. සියලු සම්පත් (රිස්ක්) කෙනෙකුගේ පරිශ්‍රමයෙන් නොව අල්ලාහ්ගේ ආශීර්වාදයෙන් ලැබෙන බව කෙනෙක් අවබෝධ කර ගත යුතුය.

2. මෙලොව යමක් ඔහු අහිමි කර ගත්තේ නම් එය පිළිබඳ ව ඔහු දැඩි සේ කනස්සලට ලක් නොවී මතු ලොවේ දී එහි ත්‍යාගය බලාපොරොත්තු විය යුතුය.

3. තමා ප්‍රශංසාවට හෝ දොස් පැවරීමට ලක් වන්නේ දැයි මුස්ලිම්වරයෙක් පසුතැවිලි නොවිය යුතුය. ඔහු අන් අයගේ ප්‍රශංසා සෙවිය නො යුතු අතර ඒවායින් ඔහු අතිශයින් ප්‍රීතියට පත් විය නොවිය යුතුය. ඔහුට දොස් පැවරනු ලැබුවේ නම් එයින් ඔහු කෝපයට පත් නොවිය යුතුය. ඔහුට එල්ල වන බොරු හෝ සැබෑ චෝදනා වලට ඔහු බිය නොවිය යුතුය. ඒ වෙනුවට යහපත් මුස්ලිම්වරයෙකු වීමට ඔහු උත්සාහ කළ යුතුය.

කෙනෙක් ඉමාම් ඉබ්නු හම්බල් ගෙන් ‘දීනාර් දහසක් තිබෙන පොහොසත් කෙනෙක් (z)සාහිද් ලෙස සැලකිය හැකිදැ?’ යි විමසීය.‘එම මිනිසා මුදල් වැඩි වන විට සතුටට හෝ  මුදල් අඩු වන විට ශෝකයට හෝ පත් නොවන්නේ නම් ඔහු (z)සාහිද් කෙනෙකි’ යයි ඉමාම් වරයා පිළිතුරු දුනි. කෙනෙක් ලෞකික

සම්පත් හෝ මුදලට හෝ වහල් නොවිය යුතුය. ධනවත් කෙනෙකු පවා තම ධනය සඳහා අල්ලාහ්ට කෘතඥ වී තම ධනය යහපත් මාර්ගයේ වියදම් කරන්නේ නම් ඔහු (z)සාහිද් කෙනෙක් වශයෙන් පත් වේ. තමා සතු සම්පත් සඳහා අල්ලාහ් ට කෘතඥ වන හා බලවත් පරීක්ෂණයට ලක් වන විට ඉවසීමෙන් සිටින කෙනෙක් (z)සාහිද් ලෙස පත් වූ බව සුෆියාන් ඉබ්නු උයෙයිනා නම් ආගමික විද්වතා පහදා දෙයි.

තම හදවත තුළ ආඃහිරා (මතු ලොව) සඳහා සූදානම් ව සිටින්නෙක් මෙලොවෙ හි (z)සාහිද් බව සුෆියාන් අල් තව්රි සඳහන් කරයි. මෙවැනි මානසික ව සූදානම් තත්ත්වය සහිත කෙනෙකුගෙන් සමාජයට සිදු වන්නේ යහපතක්ය. අල්ලාහ්ට අධික ව සමීප වීමට ඔහු තම අවනතභාවය ඉටු කිරීමටද අකීකරු වීමෙන් ඉවත් වීමටද නිතර වෙහෙසෙයි.

මෙවැනි හේතුන් මත නොයෙක් (z)සුහ්ද් තත්ත්වයන් තිබෙන බව සඳහන් වේ.

1. පාප හා අකීකරු ක්‍රියාවන්ගෙන් වැළකීම.

2. අප තුළ නැගෙන ආශාවන් ගෙන් වැළකීම.

3. මුබාහ් නම් ඉස්ලාම් අනුමැතිය කළ ක්‍රියාවන් පවා සීමාව ඉක්ම වීමෙන් වැළකීම. නිදසුනක් වශයෙන්

අනුමැතිය කළ නින්ද හෝ ආහාර ගැනීම වැනි ක්‍රියාවන් හි පවා සීමාව නොඉක්ම වීම.

දීර්ඝ කාලීන ජීවිතයට බලා පොරොත්තු නොකරන, මතු ලොවට ආෂා කරන, අල්ලාහ් මුණ ගැසීමට අපේක්ෂා කරන කෙනෙක් (Z)සුහ්ද් හී මුදුන් තත්ත්වය ලබා ගත් බව ඉබ්නු රජබ් පවසයි. මෙලොව තිබෙන සියලු සම්පත් අල්ලාහ්ගේ ආශීර්වාද වේ. අල්ලාහ් අනුමැතිය කළ මාර්ගයෙන් බැහැර ව ක්‍රියා කරන විට වරද සිදු වනු ඇත. අල්ලාහ් අනුමැතිය කළ මාර්ගයේ ක්‍රියා කරන විට එහි ප්‍රතිඵල කුමක් වුවත් එයින් වරදක් සිදු නොවේ.

මේ නිසා තම ශාරීරික ආශාවන්හට ගොදුරු නොවී ජීවත් වන කෙනෙක් අල්ලාහ්ගේ ආදරයට ලක් වන්නේය.

ප්‍රමාණවත් ආහාර සහ විවේකය තුළින් අපේ යුතුකම ඉටු කළ හැකි වනු ඇත. මෙවැනි අත්‍යවශ්‍ය දේ ලබා ගැනීම, ලොවට ආශා කිරීමක් ලෙස කිසිසේත්ම නොසැලකේ. මේ නිසා රැකියාවක හෝ ව්‍යාපාරයක නිරත වීම ලොවට ආශා කිරීමක් නොව ලෞකික ජීවිතයට අදාළ වන කොටසක් ලෙස සලකනු ලැබේ.

එහෙත් ඇතැම් මුස්ලිම්වරු ලෝකය ගැන සැලකිලි අතහැර දමා සමාජයෙන් ඈත් වී හුදකලාවේ අල්ලාහ්ට නැමදුම් කරමින් කාලය ගෙවීම පමණක්

යයි වැරදි අවබෝධයකින් (z)සුහ්ද් තත්ත්වයට පටු අර්ථයක් සඳහන් කිරීම ඉතා අවාසනාවකි. (z)සුහ්ද් හී සැබෑ අර්ථය මෙය නොවේ. නැමදුම් ක්‍රියාවෙ හි අර්ථය බොහෝ පුළුල් වන අතර සමාජයේ වර්ධනය හා සමාජයට යහපතක් සිදු කිරීමේ සියලු කටයුතු එහි අඩංගුය. මේ නිසා විවිධ රැකියා හා වෘත්තිය මගින් සමාජයට යහපත් සේවයක් ඉටු කරන පිරිසක් අවශ්‍යවෙයි. රට හා සමාජ සංවර්ධනය සඳහා දීර්ඝ කාලීන හා අධික වෙහෙසක් දැරීමට සිදු වනු ඇත. මෙම ක්‍රියාවන් හි අල්ලාහ් වෙනුවෙන් පිරිසිදු චේතනාව සහිත ව නිරත වන්නේ නම් එයද (z)සුහ්ද් හි තත්ත්වයක් බව සැලකේ. එනිසා (z)සුහ්ද් යනු අති උතුම් අල්ලාහ් වෙනුවෙන් නිවැරදි මාර්ගයෙන් උතුම් චේතනාවෙන් සිදු කරන ක්‍රියාවන්ය.

ලෞකික ජීවිතයේ අධික ලෙස නිරත විම නිසා අල්ලාහ්ව නැමදුම් කිරීමෙන් ඈත් වන මිනිසාට මෙලොව ජීවිතය පරීක්ෂණයකි යැයි සූරා කහ්ෆ් වාක්‍ය අංක 7 පවසයි. ජීවිතය නිවැරිදි මාර්ගයේ ගෙවන්නේ නම් පරීක්ෂණය ජය ගත හැකි අතර වැරදි මාර්ගයේ ගෙවන්නේ නම් නොමග යෑමට අපට සිදු වෙයි.

## නිගමනය

අල්ලාහ් ට සමීප වීමට සහ ඔහුගේ ආදරය ලබා ගන්නට අපට තිබෙන එකම මාර්ගය (z)සුහ්ද්ය.

මෙයට අමතර ව අල්ලාහ්ගේ ආදරය දිනාගන්නට තවත් මාර්ග කිහිපයක් තිබේ. ඒවා නම්

- අල්ලාහ්ව සැබැවින්ම ආදරය කිරීම
- අල්ලාහ්ව මුණ ගැසීමට දැඩි ආශාවෙන් සිටීම
- අපගේ පවුලේ අය සහ අප කෙරෙහි දක්වන ආදරයට වඩා රසූල්වරයා (සල්) කෙරෙහි අධික ආදරය දැක්වීම
- අපේ ශෛලයෙන් නොව රසූල් (සල්) වරයාගේ සුන්නාහ් ව පෙන් වූ මාර්ගයේ අල්ලාහ්ට අධික ලෙස දික්ර් කිරීම
- වෛකල්පිත සුන්නාහ්වන් හි යෙදීම.

ඉහත සඳහන් කරුණු අනුව ක්‍රියා කිරීමෙන් අල්ලාහ් කෙරෙහි අප දක්වන ආදරය මැන ගත හැකි වනු ඇත. මෙලොව හා මරණයෙන් පසුව ජය ගත හැකි එකම මාර්ගය අල්ලාහ්ට ආදරය කිරීම තුළින් පමණක් බව නිතර මතකයේ තබා ගත යුතුය.

## 32. කිසිවෙකුට හිංසා නොකිරීම

රසූල් (සල්) වරයා මෙසේ පැවසූ බව අබූ සර්ද් සඅද් බින් මාලික් බින් සිනාන් අල් කුද්රි (රලි) මෙසේ වාර්තා කරයි.

"කිසිවෙකුට හිංසා නොකරන්න. (අනුන් කළ) හිංසාකාරි ක්‍රියාවට එරෙහි ව (එකටෙක වශයෙන් කර) පළිනොගන්න."

මූලාශ්‍ර ඉබ්නු මාජා, දරා කුත්නි සහ තවත් කිහිප දෙනෙක්. අබූ සර්ද් (රලි) ගේ නම සඳහන් නොකර ඉමාම් මාලික් මෙම හදීසය වාර්තා කරයි.

මෙහි පසුබිම

මෙම හදීසයට තවත් අර්ථ කිහිපයක් ඇත. "හිංසාවට ලක් නොවිය යුතුයි, හිංසා නොකළ යුතුයි" යනු එවායින් එකකි. "හිංසා නොකළ යුතුය. එමෙන්ම හිංසාවට ප්‍රති ප්‍රහාරය සිදු නොවිය යුතුය." යනු මෙම හදිසයේ තවත් අර්ථයක් බව උස්තාද් ජමාලුද් දීන් (z)සර්බෝ(z)සෝ දන්වයි. රසූල්වරයා (සල්) තුමාණන් තවත් අවස්ථාවක "ඉස්ලාමයේ හිංසාව හෝ හිංසා කිරීම හෝ නොමැත" යනුවෙන් පැවසූහ. තවත් අර්ථයක "මූඃමින් වරයෙකුට හිංසා කරන්නෙක් ශාපයට ලක් විය" යැයි දන්වා ඇත.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්:

ෆික්හ් සම්බන්ධ සියලු කරුණු මෙම හදීසය කේන්ද්‍ර කර ගත් බව ඉමාම් අබූ දාවූද් දන්වයි. තවද මෙම හදිසයෙන් ෆික්හ් සිද්ධාන්තය යන නව අතුරු ශාඛාවක් ආරම්භ විය. මෙම හදීසයේ වාක්‍යය ෆික්හ් සිද්ධාන්තයේ ඉතා වැදගත් එකකි. මෙම හදීසයෙන් උපුටා ගත් අනිකුත් සිද්ධාන්තයන් ගැන පහත සඳහන් වේ.

1. හානිය හෝ හිංසාව හැකි පමණින් වැළැක් විය යුතුය.

2. හානිය හෝ හිංසාව මුලින් උපුටා දැමිය යුතුය.

3. හානිය තවත් හානියකින් ඉවත් නොකළ යුතුය.

4. විශාල හානියක් සුළු හානියකින් ඉවත් කළ හැක.

5. ඉහත සඳහන් 4වන සිද්ධාන්තය යටතේ වෙනත් විකල්පයක් නොමැති විටක සුළු හානියකින් විශාල හානියක් සිදු වීම නවතා දැමිය හැක. ඇතැම් විට හානි දෙකක් අතර ගැටුමක් පැන නැගිය හැක. එවැනි අවස්ථාවක හානියට මග පාදන ක්‍රියාව ඉටු කිරීම වැළකීමට ප්‍රධාන තැන දිය යුතුයි.

6. වාසියක් ලැබීමට වඩා හානිය වැළකීම ප්‍රධාන අරමුණ විය යුතුයි.

7. යමක් ඉටු කිරීම හා වැළැකීම අතර ගැටුමක් තිබේ නම් එය ඉටු නොකර එය වැළැකීමට ප්‍රමුඛත්වය දිය යුතුය.

8. දැනට ක්‍රියාවෙහි පවතින එකම හේතුවක් නිසා හානි සහිත දෙයක් දිගින් දිගට සිදු කිරීමට අනුමැතිය නොදිය යුතුය. දැනට පවතින යමක් හානි සහිත දෙයක් වේ නම් එය තව දුරටත් පවතින්නට තිබෙන අවස්ථාව ඉවත් කළ යුතුයි.

ඉහත 7වන නිගමනයට අදාළ නිදසුනක් දෙස බලමු.

(පෘතුගීසි හා ස්පාඤ්ඤ ඇතුළු) අන්දලූස් හි මුස්ලිම්වරු මස්ජිදයක් සහ අදාන් කීමට උස මිනාරාවක් (කුලුනක්) තැනූහ. මුඅද්දින් වරයා මිනාරාව උඩට ගොස් අදාන් කියයි. වසර ගණනාවකට පසු නගරය වර්ධනය වීමත් සමග නගර වැසියන් මස්ජිදය අවට බොහෝ නිවෙස් ඉදි කර ජීවත් වූහ. එවකට සිටි ආගමික විද්වතුන් මුඅද්දින් වරයා මිනාරාව උඩට නැග අදාන් කීම තහනම් කළහ. එයට හේතුව මිනාරාව උඩ සිට ගත් විට අවට තිබෙන නිවෙස් හි ජීවත් වන ජනතාව දෙස බැලීමට හැකි වීමෙන් ජනතාවගේ පෞද්ගලික නිදහසට බාධාවක් සිදු වීම වළකිනු පිණිසය.

එක් පුද්ගලයෙකුට සිදු විය හැකි හානිය සහ ජනතාවට සිදු විය හැකි හානි අතර පරස්පර ගැටුමක් සිදු වූයේ

නම්, ජනතාවට සිදු විය හැකි හානිය වැළැක් විය යුතු යැයි ඉස්ලාමයේ තවත් මූල ධර්මයක් පවසයි. මෙවැනි අවස්ථාවන් හි සිදු විය හැකි හානිය පිළිබඳ ව තමන්ගේ අත්දැකීම් තුළින් විද්වතුන් සලකා බලා එවැනි හානිය සිදු නොවීමට ජනතාවට අවවාද කළ යුතුය.

හානියක් සිදු වීමට පෙර එය වළකාලීමට කටයුතු කළ යුතුය. කෙසේ හෝ හානියක් සිදු වුයේ නම් එය හැකි ඉක්මණින් අවසන් කරන ලෙස ඉස්ලාම් තරයේ පවසයි. එසේ ඉක්මණින් අවසන් කළ නොහැකි වුයේ නම් එහි ප්‍රතිවිපාකය අවම කිරීමට ක්‍රියා කළ යුතු යැයි තවත් මූල ධර්මයක් පෙන්වයි.

විශාල හානියක් හෝ සුළු හානියක් හෝ සිදු විය හැකි අවස්ථාවක විශාල හානිය වළකාලීමට වෑයම් කළ යුතුය. මෙමගින් විශාල හානිය වළකනු පිණිස සුළු හානියට ඉවසීමෙන් මුහුණු දීමට මුස්ලිම්වරු පුහුණු විය යුතය. යම් හානියක් ඉවත් කිරීමෙන් එය හා සමාන තවත් හානියක් සිදු විය හැකි නම්, එම හානිය ඉවත් කිරීම පිළිබඳව කිසිවක් නොකළ යුතුය. මෙහිදී මඅරූෆ් (යහපත් දේ කිරීමට පොලඹවීම) සහ මුන්කර් (අයහපත් දේ කිරීමෙන් වළකාලීම) සම්බන්ධ වන නිසා මේ ගැන ප්රවේශමින් ක්‍රියා කළ යුතුය.

ඉමාම් ඉබ්නු රජබ් තුමා හානිය සහ හානි කිරීම යන වචනයන්ට අර්ථ කථන දෙකක් තිබෙන බව පවසයි.

හානිය යනු තමන්ට වාසියක් තිබෙන හේතුවෙන් කෙනෙකුට හානියක් සිදු කිරීම. කෙනෙක් තම නිවස අලුත් වැඩියා කරන විට එය උසට තැනීමෙන් තම අසල් වැසියාට ඔහුගේ නිවසේ නිදහස් ව ජීවත් වීමට බාධාවක් සිදු විය හැක. සුදුසු හේතුවකින් තොරව මෙලෙස හානි සිදු කිරීම නබි (සල්) තුමාණන් ප්‍රතික්ෂේප කළ බව ඉබ්නු රජබ් දන්වයි.

දෙවන අර්ථය තමන්ට වාසියක් නොතිබුණත් කෙනෙකුට හානියක් සිදුකිරීම. එනම් අන් අයට සාපරාධයක් සිදු කිරීම. මෙයට ඉස්ලාමීය ෂරීආවට එකඟව දඬුවම් දෙනු ලැබේ.

## සුදුසු හේතුවක් නොමැතිව හානියක් සිදු කිරීම.

කෙනෙකුට හානියක් කිරීමේ එකම අරමුණකින් යමෙක් හානියක් සිදු කළේ නම්, එවැනි ක්‍රියාව රසූල් (සල්) තුමාණන් සම්පූර්ණ යෙන් තහනම් කළ බව ඉමාම් ඉබ්නු රජබ් දන්වයි. අල් කුර්ආනයේ තහනම් ක්‍රියාවන් කිහිපයක් සඳහන් වේ.

වසීයියා - කැමති පත්‍රය: කෙනෙක් තමා සතු මුදල උරුමක්කාරයන් නොවන පිට අයෙකුට බෙදා දීමේ දී තුනෙන් කොටසක ට ඉක්ම නොවිය යුතු බව අල් කුර්ආන් හි සූරා අන් නිසා වාක්‍ය 12 පවසයි. එමෙන්ම කෙනෙක් උරුමක්කාරයන් අතර ද තම හිතවත් නැයෙකුට මෙලෙස සීමාව ඉක්මවා ත්‍යාග දීමෙන්

අනෙකුත් උරුමක්කාරයන්ට හානි සිදු වන නිසා මෙය මහා පාපයක් බව ඉබ්නු අබ්බාස් (රලි) අදහස් දක්වයි. නොදැනුවත්කම නිසා ඇතැම් මුස්ලිම් වරු මෙවැනි වරද සිදු කරති.

අර් රජා අ - ආපසු හැරී ඒම: කෙනෙක් දික්කසාද වූ තම බිරියට හිරිහැර කිරීමේ අරමුණින් ඇය සමඟ යළි එක් වීමට අනුමැතිය නැත. කුර්ආනයේ සූරා බකරා වාක්‍ය අංක 231 බලන්න.

දීර්ඝ ගමන: සුදුසු හේතුවක් නොමැතිව තම බිරියගෙන් දීර්ඝ කාලයට ඈත් වී ගමනක නොයා යුතුයි. මෙයින් බිරියට හා පවුලේ සාමාජිකයන්ට හානි සිදු වනු ඇත.

මව් කිරි පෙවීම: දික්කසාද පිළිබඳ විෂයයෙ හි දික්කසාද වූ කාන්තාවගෙන් දරුවා උදුරා ගෙනීම හෝ කිරි පෙවීමේ උරුමය අහිමි කිරීමට සැමියෙකුට අනුමැතිය නැත. සූරා බකරා වාක්‍ය 233 මෙය සඳහන් කරයි.

වෙළෙඳ ගනුදෙනු: කෙනෙකුට යම් භාණ්ඩයක් අවශ්‍ය බව දැන ගෙන එහි මිල අසාධාරණ ලෙස වැඩි කිරීම හරාම් - තහනම් වේ. මෙය එක්තරා පොලි ගනුදෙනු ක්‍රමයක් බව ඇතැම් ආගමික විද්වතුන් සලකති.

භාණ්ඩයක් මිලදී ගන්නා, කේවල් කිරීමට අපොහොසත් කෙනක් නම් විකුණන වෙළෙඳා අධික මිලට හෝ භාණ්ඩයේ වටිනාකම අසාධාරණ ලෙස ඉක්මවා විකිණීමට අනුමැතිය නැත. භාණ්ඩයක් මිල දී ගත් මුදලට වඩා තුනෙන් කොටසක් ලාභයක් තබා විකිණීම තහනම් බව ඉමාම් මාලික් පවසයි.

2. යහපත් චේතනාවකින් කෙනෙක් කරන ක්‍රියාවක් සීමාව ඉක්මවා අයහපත් ප්‍රතිඵලයක් ගෙන දෙන ඇතැම් අවස්ථාවන්.

- කුණු කසළ තම ඉඩමේ අධික සුලං තිබෙන දිනයක පිලිස්සීම නිසා දුම, දුර්ගඳ මගින් පරිසරයට හානිය ද අන් අයට කරදරයක් ද සිදු වීම මෙයට නිදසුනකි. මෙය වහාම නවතා දැමිය යුතුය.

- කෙනෙකුගේ ළිඳ අසල නියමිත දුර ප්‍රමාණය නොතකා අසූචි වළක් හෝ කසළ වලක් හෝ කැපීමෙන් ළිඳේ ජලය භාවිතයට නුසුදුසු බවට පත් වන නිසා එසේ කිරීමෙන් වැළකීම.

- තමාට අයත් ඉඩමේ කරනු ලබන ඇතැම් ක්‍රියාවන්ගෙන් අවට සිටින අයට සෘජුව හෝ වක්‍රව හිරිහැරයක් සිදු වීම. නිදසුනක් වශයෙන්

කෙනෙකුගේ ඉඩමෙන් විහිදෙන දුර් ගඳ, ලංකාවේ පැතිර පවතින ඩෙංගු උවදුරු යනාදිය.

- කෙනෙකුගේ ළිඳට සමීප ව තවත් ළිඳක් කැපීමෙන් දැන් පවතින ළිඳේ ජල මට්ටම අඩු වන හෝ ළිඳට හානියක් සිදුවිය හැකි අවස්ථාවන් ද තිබේ. මෙයද වැළකිය යුතුය.

කෙනෙක් තමන්ටම හානි සිදුකරන කාර්යයන් හි යෙදීම අල්ලාහ් තහනම් කර ඇත. මේවා ගැන පැහැදිලි කරන විට මෙලොවට හා මතු ලොවට යහපතක් ගෙන දෙන ක්‍රියාවන් ඉටු කරන ලෙස ද මෙලොවට හා මතු ලොවට අයහපතක් ගෙන දෙන කිසිදු ක්‍රියාවන් හි නොයෙදෙන ලෙස ඉස්ලාම් පවසයි.

- තයම්මම් කිරීම: අසනීපෙන් සිටින විට හෝ ජලය නොමැති අවස්ථාවක තයම්මම් කිරීමට අනුමැතිය ඇත.

- උපවාසය: ගමනක නිරත වන කාලයේ උපවාසයේ යෙදීමෙන් ඉවත් වීමට හා එලෙස අතපසු වූ දින වෙනත් දිනයන් හි නිරත වීමට අල්ලාහ් අනුමැතිය දී ඇත.

- යම් ක්‍රියාවක් කිරීමට පහසු මාර්ගයක් තිබිය දී එය ඉවත දමා අපහසු හා අසීරු මාර්ගයක් තෝරා නොගන්නා ලෙස රසූල් (සල්) වරයා උපදෙස් දුන්හ. මක්කාවට පයින් ඇවිද ගොස් හජ් වන්දනාව ඉටු කරන බව බාරයක් කළ කෙනෙකුට, මිනිසා තමන්ටම හිංසා කර ගැනීම අල්ලාහ්ට කිසිදු අවශ්‍යතාවක් නොමැති නිසා ප්‍රවාහන සතෙකු පිටේ වාඩි වී ගමන් කරන ලෙස රසූල් (සල්) වරයා උපදෙස් දුන්හ.

- ණය බරට පත් වූ කෙනෙක්: ණයට මුදල් ගත් කෙනෙක් එම ණය මුදල ආපසු ගෙවීමට නොහැකි අසරණ තත්ත්වයට පත් ව සිටුන බව දුටුවේ නම් එම ණය කරුට මුදල් ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කර සහන සැලසිය යුතුය.

ඉහත සඳහන් අයහපතක් හෝ හානියක් හෝ සිදුවිය හැකි අවස්ථාවන් සහ ඒවා ඉවත් කර සහන සලසන ඇතැම් මාර්ග ගැන ඉමාම් ඉබ්නු රජබ් පැහැදිලි කළේය.

අවසාන නිගමනය:

කෙනෙකුට වාසියක් හෝ ලාභයක් ලැබෙන නමුත් පුද්ගලයෙකුට හෝ සමාජයට හානියක් සිදු කළ හැකි

ඕනෑම ක්‍රියාවක් ඉස්ලාම් තහනම් කර ඇත. බලයේ සිටින නිලධාරීන් හෝ සමාජයේ නායකයා මෙවැනි ක්‍රියාවන් තහනම් කළ යුතු බව ආගමික විද්වතුන් සඳහන් කරති. මෙවැනි හානි සහිත ක්‍රියා කිසිවක් ආරම්භ වීමට පවා ඉඩ නොදිය යුතුය. එවැනි ක්‍රියාවක් කෙසේ හෝ ආරම්භ වුයේ නම් එය නවත්වා දැමීමට සහ එහි විපාකය අවම කිරීමට පියවර ගත යුතුය.

## 33. අයිතිවාසිකම් සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය, විරුද්ධ වන පක්ෂය දිවුරුම් දිය යුතුය.

රසූල් (සල්) තුමාණන් මෙසේ පැවසූ බව ඉබ්නු අබ්බාස් (රළි) මෙසේ වාර්තා කරයි’

“මිනිසුන්ගේ ඉල්ලීම් පරිදි සියලු දේ දෙන්නේ නම් ඇතැම්හු අනුන්ගේ සියලු සම්පත් සහ රුධිරය පවා උදුරා ගනිති. තම අයිතිය ඔප්පු කිරීමේ වගකීම ඉල්ලීම් කරන්නා සතුය. එය (මුසාවක් බව) ප්‍රතික්ෂේප කර දිවුරීම වගඋත්තරකරු සතුය.”

මෙය ඉතා යහපත් හදීසයක් බව අල් බයිහකී පවසන අතර බුහාරි සහ මුස්ලිම් මෙම හදීසයේ කොටසක් සඳහන් කරති.

මෙහි පසුබිම:

ඕනෑම ආරවුලක පැමිණිලිකරු හා වග උත්තරකරු යන දෙපාර්ශවයක් සිටිති. පෙනෙන්නට තිබෙන සාධකයන්ට එරෙහිව පැමිණිලි කරු අයිතිවාසිකම් ඉල්ලන අතර, පෙනෙන්නට තිබෙන සාධකයන්ට එකඟ ව වග උත්තරකරු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි.

මෙම හදීසය ඉතා වැදගත් ප්‍රතිපත්තියක් පිළිබඳව සඳහන් කරයි. එනම් "පැමිණිලිකරු සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර වග උත්තරකරු දිවුරුම් කළ යුතුයි"

<u>මෙයින් ඉගෙන ගන්නා පාඩම</u>

ඒ නිසා යුක්තිය ඉටු කිරීම සඳහා ඔප්පු කිරීමේ වගකීම පැවරී තිබෙන්නේ කාහටද යන වැදගත් ප්‍රතිපත්තිය මෙම හදීසය පැහැදිලි කරයි. ව්‍යාජ හා සනාථ කළ නොහැකි අයිති වාසිකම් ඉදිරිපත් කිරීමේ දී සත්‍යය ස්ථාපනය කිරීම සඳහා මෙහි භූමිකාව පෙන්වයි.

මෙයට එකඟව ඔප්පු කිරීමේ වගකීම පැවරී තිබෙන්නේ කාහට ද යනුවෙන් දැනගැනීම වැදගත්ය.

මෙය පැමිණිලිකරුවා සතු වගකීම බව කිසිදු සැකයක් නැත. පෙනෙන්නට තිබෙන සාධක මූලික පසුබිම බව පෙනුණද එය ප්‍රතික්ෂේප කරන්නා එයට අදාළ සාධක ඔප්පු කළ යුතුය.

මෙහි දී අවසාන නිගමනය සඳහා අවශ්‍ය සාධක ඉදිරිපත් කිරීම බොහෝ වැදගත් වේ. පැමිණිලිකරු ඔප්පු කරන තුරු විත්තිකරු වගකීමෙන් නිදහස් ව සිටින හෙයින් පැමිණිලිකරු කවුරුන්දැයි ද විත්තිකරු කවුරුන්දැයි ද පැහැදිලි අදහසක් තිබිය යුතුය. මෙයින් ඔප්පු කිරීමේ වගකීම පැවරී තිබෙන්නේ කාහටද සහ සාක්ෂි පිළිගත යුත්තේ කාගෙන්ද යන කරුණු පැහැදිලි වෙයි.

## බය්යිනා 'සාධක' යනු කුමක්ද?

සාධක යනු සාක්ෂිකරුවන් බව බොහෝ විද්වතුන් අදහස් දක්වති. එහෙත් සාධක යනු මෙයට වඩා සංකීර්ණ හා විස්තරාත්මක වන බව ද සාක්ෂීන් ඉදිරිපත් කිරීමට පමණක් සීමා නොවන බවද සලකන්න.

අල් බය්යිනා යනු සත්‍යයතාවය තහවුරු කිරීමෙහි උපයෝගි කරන සියලු කරුණු අඩංගු වන බව සමකාලීන විද්වතුන් අදහස් දක්වති. පරිවේෂණීය සාක්ෂිය, පූර්ව නිගමනය, නිශ්චිත තීරණය කෙරෙහි මාර්ගය පෙන්වන පැහැදිලි සංඥා යන දේ මගින් අවසාන නිගමනයට එළඹීම පිණිස සැලැකිල්ලට ගත හැකිය.

නවීන අපරාධ පරීක්ෂණ ක්‍රමය ද භාවිත කර අධිකරණ නිගමනයට එළඹිය හැක. එසේ නොමැති

විට ඇතැම් පාක්ෂිකයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සිදුවනු ඇත.

## සාක්ෂිකරුවෙකු ලෙස පිළිගැනීමට අදාළ කරුණු

සාක්ෂිකරුවෙකු වශයෙන් පිළිගනු ලබන පිණිස පහත සඳහන් අවශ්‍යතාවන් තිබිය යුතුය.

1. සාක්ෂිකරුවා හොඳ සිහිය ඇති සුදුසු කෙනෙක් විය යුතුයි.

2. සාමාන්‍යයෙන් සාක්ෂිකරුවා වැඩි මහල් කෙනෙකු විය යුතුයි.

3. මුස්ලිම් නොවන කෙනෙකු සම්බන්ධ විභාගය හැර, අනෙක් සැම අවස්ථාවකම සාක්ෂිකරු මුස්ලිම් කෙනෙකු විය යුතුයි.

4. සාක්ෂිකරු හොඳ මතක ශක්තිය තිබෙන කෙනෙක් විය යුතුයි.

5. සාක්ෂිකරු අවංකභාවයෙන් යුත් කෙනෙක් විය යුතුයි.

## කෙනෙකු සාක්ෂි දීමේ වැදගත්කම

සාක්ෂි දීම සඳහා ඇරයුම් ලැබූ විට ඒ සඳහා අවංකව හා සත්‍ය ලෙස සාක්ෂි දීම පිණිස ඉදිරිපත් වීම කාගෙත් වගකීමකි.

*"ඔවුන් කැඳවනු ලැබුව හොත් සාක්ෂිකරුවන් මග නොහැරිය යුතුය."* සූරා බකරා වාක්‍ය අංක 282

සාක්ෂි කරුවෙක් සත්‍යය සැඟවීම පාප ක්‍රියාවක් බව අල් කුර්ආනය පවසයි. *"සාක්ෂිය නොසඟ වවු. යමෙක් එය සැඟ වුවහොත් ඇත්තෙන්ම ඔහුගේ සිත පව්වුය."* සූරා බකරා වාක්‍ය 283.

## සාර්ථක ලෙස බොරු සාක්ෂි පවසන්නන්ට අවවාද

අති උතුම් අල්ලාහ් ට බිය බැතිමත් වීමේ අවශ්‍යතාව ගැන ඉස්ලාම් තරයේ පවසයි. දෛනික වැඩ කටයුතු වන වෙළෙඳාම, පවුල් ජීවිතයේ පැන නගින විවිධ ආරාවුල් හෝ උරුමය ඉල්ලා පවරන නඩු වැනි අවස්ථාවන් හි බලතල වලින් අයුතු ලෙස වාසි ලබන විට මෙම බිය බැතිමත්කම් තවත් වැදගත් වනු ඇත.

නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ.

"මම සාමාන්‍ය මිනිසෙකි, ඔබ ආරවුලක් රැගෙන මා වෙත පැමිණෙනු ඇත. ඔබ අතර කෙනෙක් අනෙකාට වඩා තර්ක කිරීමේ දක්ෂ කෙනෙක් විය හැක. මට

සපයන ලද තොරතුරු වලට එකඟ ව මම ආරවුල විසඳා දෙමි. කෙනෙකුට ඔහුගේ සොයුරා ගෙන් යමක් අයහපත් ලෙස මම පවරා තිබුණේ නම් ඔහු එය භාර නොගත්වා. මන්ද මම ඔහුට දුන්නේ අපාය ගින්නෙන් කොටසකි.”

ව්‍යාජ නඩු පවරා ව්‍යාජ ඉල්ලීම් මගින් ලබන අයුතු ලාභයේ අයහපත් විපාක ගැන ඉහත සඳහන් හදීසය සඳහන් කරයි. මෙලොව ජීවිතයේ වාසියක් ලැබෙන නමුත් මරණයෙන් පසුව භයානක විපතක් සහ දඬුවම් නියතයි.

වෙනත් කෙනෙකුට අයත් ඉඳි ගසේ කෙඳි වැනි අල්ප දෙයක් පවා අසාධාරණ ව ගන්නා කෙනෙක් පරමාන්ත දිනයේ දී මහත් දඬුවමට ලක් වන බව තවත් හදීසයක නබි (සල්) තුමාණන් සඳහන් කළහ.

සුදුසු හේතුවක් නොමැතිව ඉඩමක මායිම් වෙනස් කරන කෙනෙකුට ද නබි (සල්) තුමානන් ශාප කළහ

අවසාන නිගමනය:

මිනිසා අතර පැන නගින ස්වභාවික මත භේද, ආරවුල්, සමාජීය හා පුද්ගල ගැටුම් වැනි සියලු අවස්ථාවන්හට පිළිතුරු සපයන ඉස්ලාම් ඉතාමත් ප්‍රායෝගික ආගමකි. මෙවැනි අවස්ථාවන් හි මිනිසුන් තම අයිතිවාසිකම් අන් අයගෙන් ඉල්ලා සිටිති.

මෙවැනි ආරවුල් සාධාරණ ව සමථයට පත් කර අවසන් කරනු පිණිස අවශ්‍ය පියවර ඉස්ලාම් සපයා ඇත. තව ද සැකයෙන් තොරව ඔප්පු කරන තුරු පුද්ගලයෙක් නිර්දෝෂී බව ඉස්ලාම් පවසයි.

## 34. අම්ර් බිල් මඃරූෆ් වන් නහිඋ අනිල් මුන්කර් සංකල්පය යහපත් දෑ අණ කර අයහපත් දැයින් වළක්වාලීම විශ්වාසයේ අංගයකි

රසූල් (සල්) වරයා මෙසේ පැවසනු ඇසූ බව අබූ සඊද් අල් කුද්රි මෙසේ වාර්තා කරයිග'

"(අල්ලාහ් විසින්) තහනම් කළ යමක් සිදු වනු ඔබ අතරින් කෙනෙක් දුටුවහොත් ඔහු එය තම අතින් වෙනස් කළ යුතුයි' එසේ කළ නොහැකි නම් තම දිවෙ (වදනි)න් වෙනස් කළ යුතුයි, එසේත් කළ නොහැකි නම් තම සිතෙන් පිළිකුල් කළ යුතුයි. මෙය ඊමානයේ ඉතාමත් දුබලතම අදියර වේ." මූලාශ්‍රිත සහීහ් මුස්ලිම්

මෙහි පසුබිම:

ඉස්ලාමීය දඅවාවෙහි (යහමගට ආරාධනාවෙහි) මූලික අංගයක් වන්නේ යහපත් දේ අණ කර අයහපත් දැයින් වළක්වාලීමයි. ඉස්ලාමයේ නිවේදනය පවසන කෙනෙක් සැබැවින්ම ඉටු කරන්නේ යහපත් දේ අණ කර අයහපත් දැයින් වළක්වාලීමයි. එහෙයින් මෙම

විෂය පවසන්නේ එකිනෙකට සම්බන්ධ කරුණු හෙයින් මෙය විෂයන් දෙකක් ලෙස සැලකීම වරදකි.

**යහපත් දෑ අණ කර අයහපත් දැයින් වළක්වාලීමට අවශ්‍ය වැදගත් ගුණාංග පහත සඳහන් වේ.**

1. ඉඛ්ලාස් නම් අවංක භාවය - යහපත් දෑ අණ කර අයහපත් දැයින් වලක්වාලීමේ ක්‍රියාව අල්ලාහ්ගේ සතුට ලබා ගන්නා ක්‍රියාවක් වන හෙයින්, එය අවංකකමින් ඉටු කළේ නම් පමණක් අල්ලාහ් විසින් පිළි ගනු ලබයි.

2. ඉල්ම් නම් දැනුම. *"මෙයයි මගේ මාර්ගය. මම ද මා අනුගමනය කළවුන් ද පැහැදිලි සාධක මත සිටිමින් (නුඹලාව) අල්ලාහ් වෙත ඇරයුම් කරන්නෙමි."* සූරා යූසුෆ් 12 වාක්‍ය 108.

මෙය ඉතා වැදගත් අවශ්‍යතාවකි. කුමන දේ යහපත් ද කුමන දේ අයහපත් ද යනුවෙන් දඅවා කරන්නා දැන සිටිය යුතුය. තවද මේවා දෙක අතර ඇති වෙනස පිළිබඳ පැහැදිලි දැනුම ද අවශ්‍යය වේ. ඒ සමඟ මෙවැනි කරුණු සිදු කරන අවස්ථාවන් ද, ඒවා සිදු වන සමාජයේ තත්ත්වය ගැන ද අවබෝධය තිබිය යුතුයි

3. හික්මා - බුද්ධිය. අති උතුම් අල්ලාහ් නියම කළ ආකාරයෙන් නැවැරදි දේ, නිවැරදි ක්‍රමයෙන්, නිවැරදි අවස්ථාවක, නිවැරදි තැනැත්තාට දඅවා කරු පැවසිය

යුතුය. *“ප්‍රඥාවෙන් යුතුව ද යහපත් උපදෙස් මඟින් ද නුඹගේ පරමාධිපතිකේ මාර්ගය වෙත ඇරයුම් කරවු.”* සූරා අල් නහ්ල් 16 වාක්‍ය 125

යහපත් දෑ යහපත් අයුරුන් අණ කිරීම ද අයහපත් දෑ අයහපත් අයුරුන් නොවැළකීම ද අවා ක්‍රියාවෙ හි වැදගත් බව ඉස්ලාමීය ෆික්හි සිද්ධාන්තයකි.

4. හිල්ම් - සහන සහ රිෆ්ක් - මෘදුබව. දඅවා කිරීම අපගේ වගකීමක් වන හෙයින්, විශේෂයෙන් දඅවා නිවේදනයට එරෙහි වන අය සමඟ කටයුතු කිරීමේ දී මෙම ක්‍රමය බොහෝ වැදගත්ය. අති උතුම් අල්ලාහ් මෙසේ පවසයි. *“අල්ලාහුගෙන් පහළ වූ දයාලු භාවය නිසා ඔබ ඔවුනට මොලොකෙහිය, ඔබ තද පරුෂ සිත් ඇත්තෙහි නම් ඔබගෙන් ඔවුහු ඉවත්ව යන්නෝය.”* සූරා ආල ඉම්රාන් 3 වාක්‍ය 159.

‘යමක් අලංකාර කිරීමට හැර කිසි දෙයකට මෘදු භාවය ඇතුළු වන්නේ නැත. යමක් අවලක්ෂණ කිරීමට හැර කිසි දෙයකින් එය ඉවත් කරනු ලබන්නේ නැත.’ යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසුහ. මූලාශ්‍රය ඉමාම් මුස්ලිම්.

5. සබ්ර් - ඉවසීම. විරෝධයක් දකින කළ දඅවා ක්‍රියාවෙ හි යෙදෙන පිරිස ඉවසීමෙන් කටයුතු කළ යුතුය.

‘අල් ඉස්තිකාමා’ නම් ග්‍රන්ථයෙහි ඉබ්නු තයිමිය්යා මෙම මාතෘකාව පිළිබඳව මෙසේ විග්‍රහ කර ඇත. “(දඅවා ක්‍රියා) එයට පෙර දැනුම පැමිණිය යුතුය. මෘදු භාවය එය සමඟ පැමිණිය යුතුය, ඉවසීම එය පසු පස පැමිණිය යුතුය.”

සූරා අල් අස්ර් හි පහත සඳහන් ගුණාංගයන් සහිත මිනිසා හැර අන් සියලු දෙනාම ඌනතාව තත්ත්වයක සිටින බව අල්ලාහ් පවසයි. එම ගුණාංගයන් නම්

- ඊමානය - දේව විශ්වාසය
- කුසල් ක්‍රියාවන්
- සත්‍ය සඳහා, එනම් යහකම් කිරීමට සහ අයහකම් නොකිරීමට එකිනෙකාට පොලොඹ වීම.
- ඉහත සඳහන් ක්‍රියාවෙ හි නිරත වන විට ඉවසීමෙන් කටයුතු කිරීමට එකිනෙකාට පොලොඹ වීම වේ.

එ බැවින් ඉහත සඳහන් ගුණාංගයන්ගෙන් යමක් නොමැති කෙනෙකුගේ චරිතයේ කිසියම් ඌනතාවක් තිබෙන බව සැලකේ. මෙලෙස අඩු ලුහුඬුකම් අධික

ලෙස තිබෙන කෙනෙකු අල්ලාහ් ඉදිරියේ අධික ඌනතාව සහිත කෙනෙක් වෙයි.

6. තවද්දු - නිහතමානභාවය - උද්ධච්ච කම සහිත හෝ අන් අයට වඩා ඉහළින් හැසිරීමට වග බලන කෙනෙකුගේ වදනට කිසිවෙක් ගරු කරන්නේ නැත.

7. කුද්වා - ආදර්ශමත්කම: ආරාධනා කරන කෙනෙකු යහපත් දේ අණ කර අයහපත් දේ වළක්වාලීමේ කර්තව්‍යයෙහි ආදර්ශමත් පුද්ගලයෙක් ලෙස පෙනී සිටිය යුතුය. අති උතුම් අල්ලාහ් මෙසේ පවසයි.

*"විශ්වාස කළවුනි! නුඹලා නොකරන දැයක් පවසන්නේ මන් ද? නුඹලා නොකරන දැයක් පැවසීම අල්ලාහ් අභියස ඉමහත් පිළිකුලක් විය."* සූරා අස් සෆ් 61: 2හා 3

8. හුස්නුල් ඉස්තිමා: සවන් දීමේ හැකියාව - ආරාධනා කරන්නා අන් අයගේ අවශ්‍යතා හා දුක්ගැනවිල්ලට සවන් දීමේ හැකියාවක් සහිත කෙනෙක් විය යුතුය.

9. සජාඅ - එඩිතර භාවය: කෙනෙකුගේ ශාරීරක ශක්තියට නොව හදවතේ ශක්තියට සහ දැනුමට මෙය අදාළ වේ. සැබෑ ධෛර්යය හා වගකීමෙන් තොරව ක්‍රියා කිරීම අතර වෙනස මෙය පෙන්නුම් කරයි.

10. කරම් - නොමසුරුකම: ඇරයුම් කරන්නා, තමා ඇරයුම් කරන අය කෙරෙහි නොමසුරුකම් දැක්විය හැකි කෙනෙක් විය යුතුය.

**මෙයින් ඉගෙන ගන්නා පාඩම්:**

අයහපත් දැයක් නැවැත්වීම සඳහා දෑත උපයෝගී කිරීමට පෙර එවැන්නන්ට උපදෙස් දීමට ද, පාපයන් සිදු කිරීමේ ප්‍රතිවිපාක ගැන පහදා දීමට ද වෑයම් කළ යුතු බව ද,  යහපත් ක්‍රියා සිදු කිරීමේ අලංකාරය ඔවුන්ට පෙන්වා දිය යුතු බව ද ආගමික විද්වතුන් අදහස් දක්වති. තවද සමාජයේ පාපයක් සිදු වීම වළක්වාලීමට රජය, පොලීසිය, අධිකරණය වැනි පාලන බලය තිබිය යුතුය.  කෙසේ වෙතත් බලය උපයෝගී කිරීම අවසාන විකල්පයක් විය යුතු බව ද විද්වතුන් අදහස් දක්වති.

එ සමඟ ආරාධනා කරන්නා, වාචික ව හෝ දෑතින් ලැබෙන ප්‍රතිචාර වලට සූදානම් ව සිටිය යුතු බව ඉමාම් ෂාතබි පවසයි.

අයහපත වෙනස් කිරීමට යෑමේ දී වාචික ව පමණක් නොව කායික හෝ ජීවිත හානියට මුහුණු දීමට සිදු විය හැකි බව ද, එලෙස සිදුවිය හැකි නම් එම පරිසරය වෙනස් කිරීම ඇරයුම් කරන්නාට අනිවාර්යය  නැත. ඇරයුම් කරන්නාට එරෙහි ව මුසා පැතිරීමෙන් චරිත ඝාතනය  සිදු කිරීමට ඇතැමුන් වෑයම් කළ හැක.

ක්ෂණික හෝ දීර්ඝ කාලීන ආර්ථික හානි පවා දාඉ වරයාට සිදු විය හැකි බව ඉමාම් කුදාමා සඳහන් කරයි.

පවතින පාපකාරී පරිසරය වෙනස් කිරීමට තිබෙන හැකියාව ඇරයුම් කරන පුද්ගලයින් අතර විවිධ වේ. කෙනෙකුගේ තනතුර හා නිලයට එකඟ ව වෙනස් වී, ඒ සමඟ වගකීම ද වෙනස් වේ. නිලය හා තනතුර උසස් වන ප්‍රමාණයට වගකීම ද අධික වනු ඇත.

ඉන්කාරුල් මුන්කර් - අයහපත් දේ වැළකීම:

අයහපත් දේ වැළකිමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති බොහෝමයක් පිළිබඳ ව විද්වතුන් සඳහන් කර ඇත. යහ ක්‍රියාවෙ හි යෙදෙන කෙනෙක් ඒවා පිළිබඳ ව සැලකිලි දැක්වීම අවශ්‍යය.

1. පාපයන් හී ප්‍රමුඛතාව ගැන තීරණය කර ගන්න. ප්‍රමාද වී වැළකිය හැකි පාපයන්ට පෙර හදිසියෙන් ක්‍රියා කළ යුතු පාපයන් පිළිබඳව වහාම තීරණයක් ගන්න.

2. තදර්රුජ් - ක්‍රමානුකූලව ප්‍රශ්නයට ළඟාවීම. මෙය ඉතා වැදගත් ප්‍රතිපත්තියකි. මත්පැන් පිළිබඳ ව අල්ලාහ් යොදා ගත් ක්‍රමානුකූල පියවර ගැන සිහි කරන්න. ප්‍රථමයෙන් එහි හොඳ හා නරක තිබෙන බව දැනුම් දෙන ලදී, දෙවනුව මත් වී සිටිය දී සලාහ් වෙත නොයන ලෙස තහනම් පනවන ලදී, තෙවන පියවර

වශයෙන් මත්පැන් සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබීය. මෙහි අපි දකින්නේ ඉස්ලාම් හි ආරම්භක යුගයේ මත්පැන් අනුමැතිය ද යන්න නොව ක්‍රමානුකූලව මත්පැන් පිළිබඳ ව මිනිසාගේ සිත සූදානම් කළේ කෙසේද යන්නයි.

3. මිනිසුන්ගේ වැරදි ගැන නොසොයනු - මෙම ප්‍රතිපත්තියට නොගැළපෙන ඇතැම් අවස්ථාවන් තිබෙන බව අල් කාදි අබූ යඅලා අදහස් දක්වයි. එනම්, අයහපතක් හෝ පාපයක් සිදු වන බව හෝ සිදු වීමට යන බව පැහැදිලි සාධක දුටු වේ නම් වහාම ක්‍රියා කළ යුතුය. නිදසුනක් වශයෙන් මිනිස් ඝාතනයක් හෝ ස්ත්‍රී දූෂණයක් සිදු වන බව හෝ සිදු විමට යන බව පැහැදිලි සාධක දුටුවේ නම්, එම පාපය වලක්වාලීමට වහාම ක්‍රියා කළ යුතුය.

4. වරදක් හෝ පාපයක් සැබැවින්ම සිදු වන බව තහවුරු කර ගන්න.

5. ආරාධනා කරන්නා, ආරාධනා නිකුත් කිරීමට මිනිසුන් යහ ප්‍රතිචාරයක් දැක්විය හැකි සුදුසු අවස්ථාව තෝරා ගත යුතුය. යූසුෆ් (අලෛ) තුමා අයහපත් සිහින දැක අවුලට පත් වූ සිර ගෙදර සගයින්ට ඒක දේව වාදය ගැන කථා කිරීමට පියවර ගත්තේය.

6. ඇරයුම් කිරීමේ දී අප්‍රසිද්ධ ව කතා කරන ලෙස ඉමාම් ෂාෆි (රහ්) උපදෙස් දෙන්නේ මෙසේය.

*මම තනිවම සිටිය දී උපදෙස් දෙනු පිණිස මා වෙත පැමිණෙන්න. ජනයා මැද මට අනුශාසනා නොකරන්න. එවැනි අනුශාසනා මට බැණ වැදීමේ ක්‍රියාවයි. එනිසා ජනතාව ඉදිරියේ සවන් දෙන්නට මම අකැමතිය.*

*මගේ වදනට ඔබ සවන් නොදී අකීකරු වුයේ නම්, ඔබේ වදනට කිසිවෙක් අවනත නොවීම ගැන ශෝක නොවන්න.*

7. ඔබේ කතාවෙන් මිනිසුන් කුපිත කිරීමට හෝ අවුස්සන්නට ක්‍රියා නොකරන්න. එ වෙනුවට අලංකාර ලෙස සංවාදයේ යෙදෙන ලෙස අල්ලාහ් අණ කරයි.

*"ප්‍රඥාවෙන් යුතුව ද යහපත් උපදෙස් මඟින් ද නුඹගේ පරමාධිපතිගේ මාර්ගය වෙත ඇරයුම් කරවු. තවද, කවර දෙයක් යහපත් වන්නේ ද එමගින් ඔවුන් සමඟ වාද කරවු."* සූරා අන් නහ්ල් 16: 125.

"අභියෝගාත්මක ලෙස සත්‍ය ඉදිරිපත් නොකරන්න." යනු ඉමාම් ගස්සාලි සඳහන් කළේය.

8. මිනිසුන්හට කරුණාව හා සුහදශීලී දක්වන අයුරින් කථා කරන්න. කිසි විටෙක ඔබේ කෝපය හා නොඉවසීම ප්‍රදර්ශනය නොකරන්න. මෙයින් ඔවුන් ඔබේ උපදෙස් ප්‍රතික්ෂේප කරනු ඇත.

9. ඉජ්තිහාද් පිළිබඳ ව මත භේද හට ගත්තේ නම්, යම් මතයක් දරණ දා'ඉ වරයා, අන් අයගේ මතය ප්‍රකාශ කිරීම තහනම් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

10. ඉබ්නු තයිමිය්යා (රහි) රචනා කළ ග්‍රන්ථයේ සඳහන් කළ පරිදි, සාකච්ඡාවකින් ලැබිය හැකි වාසිය හා අවාසිය පිළිබඳ ව සලකා බලන්න. යහපත් දේ අණ කර අයහපත් දැයින් වළක්වාලීමේ ක්‍රියාවෙන් යම් අවස්ථාවක එයට වඩා බරපතළ පාපයක් සිදු වන බවට පෙණුනේ නම්, එම ක්‍රියාව දිගින් දිගට කිරීම හරාම් වේ. එනම් යහ දේ අණ කිරීමෙන් එයට වඩා වැඩි කුසල් ඉටු වන ක්‍රියාවකට හානියක් සිදු විය නොයුතුය, අයහපත් දැයින් වැළකීමෙන් එයට වඩා බරපතළ පාපයක් සිදු නොවිය යුතුය.

යහපත් දේ අණ කර අයහපත් දැයින් වළක්වාලීමේ ක්‍රියාව විවිධ හේතූන් මත සිදු වනු ඇත.

- උත්තරීතර අල්ලාහ්ගෙන් ත්‍යාග ලබන අරමුණ.
- අයහපත් දේ නොවැළකීම නිසා අල්ලාහ්ගෙන් ලැබෙන දඬුවම පිළිබඳ බිය.
- අල්ලාහ් විසින් පණවන ලද සීමාව උල්ලංඝනය වීම දැක සිත් තැවිල්ලට පත් වීම.

- මුස්ලිම් සමාජයේ පාප ක්‍රියාවන් හි යෙදෙන අය කෙරෙහි ආදරය හා විශ්වාසය දැක්වීමෙන් ඔවුන් මෙලොව හා මරණයෙන් පසු අල්ලාහ්ගේ කෝපයට හා දඬුවමට ලක් නොවීම පිණිස ඔවුන්ට යහ මඟ පෙන්වා ආරක්ෂාව ලබන මාර්ගයට කැඳවීම.

- සියලු ප්‍රශංසාවට හා සිහි කිරීමට හිමි උත්තරීතර අල්ලාහ් කෙරෙහි ආදරය දැක්වීම හා ඔහු උත්කර්ෂයට පමුණුවීම. එපමණක් නොව ඔහුගේ අනෙකුත් මැවීම් වලට වඩා ඔහුගේ අණට අවනත වීම ප්‍රධාන ස්ථානය දැරිය යුතුය.

ඉස්ලාමීය දා'ඉ වරයා, මුහුණ දීමට සිදු වන ඕනෑම ප්‍රශ්නය හා හිරිහැර මැඩ පවත්වා ගෙන ඉදිරියට යෑමට මෙහි සඳහන් අවසාන කරුණු දෙක අනුබල දෙයි.

### අවසාන නිගමනය

ඉහත හදීසයේ අවසාන කොටස, පාප ක්‍රියාවක් දකින මුස්ලිම් වරයෙක් කළ හැකි අවම ක්‍රියාව සිත් තුළින් එය පිළිකුල් කිරීම බව සඳහන් කරයි. එනම් එම පාපය ඉවත් කිරීමට සිත් තුළ තීරණ කිරීමය. මෙය සිත සම්බන්ධ ක්‍රියාවක් වන අතර, එම මිනිසා " යා අල්ලාහ්! ඔබ අනුමැතිය නොකරන මෙම පාප ක්‍රියාව

නවත්වාලිමට මට හැකියාවක් නොමැත. එම පාපය සමඟ මම එකඟ නොවෙමි. යා අල්ලාහ්! මට සමාව දෙනු මැනව. මට යහ මඟ පෙන්වනු මැනව. එම පාපයේ ආභාසයට පත්වීමෙන් මගේ සිත ආරක්ෂා කරනු මැන.” යනුවෙන් තම සිත් තුළින් ප්‍රාර්ථනා කරයි.

මුස්ලිම් වරයෙකුගේ සිත මෙලෙස ප්‍රාර්ථනා නොකළේ නම්, එම පාපයේ ආභාසයට ඔහුගේ සිත ද ලක් විය හැකි අතර, එම අවස්ථාවේ ඔහුගේ සිතෙහි කළු තිතක් තබනු ලැබේ. ඉමාම් බුහාරි මෙසේ වාර්තා කර ඇත.

මෙවැනි පාපයන් දිගින් දිගට සමාජයේ සිදු වනු දැක නිහඬ ව සිටින මුස්ලිම් වරයෙක් කලකට පසුව ඒවාට පුරුදු වීමෙන්, හොඳ හා නරක අතර වෙන් කර පෙන් වීමට ඔහු අපොහොසත් වන හේතුවෙන් යහපත් දේ අණ කර අයහපත් දැයින් වළක්වාලීමේ ක්‍රියාව ඉටු කිරීම සඳහා ඇරයුම් කළ යුතු ඔහු, පාප ක්‍රියාවන් හි නිරත වීමට පටන් ගන්නා බව මතකයේ තබා ගත් යුතුය.

## 35. ඉස්ලාමීය සහෝදරත්වය විනාශ කරන පාපයන්

මුහම්මද් (සල්) තුමාණන් පැවසූ බව අබූ හුරෙයිරා (රලි) මෙසේ වාර්තා කරයි.

“කිසිවෙකු කිසිවෙකුට ඊර්ෂ්‍යා නොකරන්න. ව්‍යාපාරික කටයුතු වලදී එකිනෙකා අතර තරඟකාරිත්වයක් ඇති කරමින් මිල ගණන් වැඩි නොකරන්න. කිසිවෙකු කිසිවෙකුව පිළිකුල් නොකරන්න. කිසිවෙකු කිසිවෙකුට විරුද්ධ නොවන්න. කෙනෙකුගේ වෙළඳ ව්‍යාපාරය ට විරුද්ධ ව තවත් කෙනෙකු සිය වෙළෙඳ ව්‍යාපාරයේ බඩු මිල පහත නොදමන්න. අල්ලාහ්ගේ ගැත්තනි! ඔබ සැම සහෝදර ලීලාවෙන් සිටිනු මැනව! මුස්ලිම් වරයෙක් තවත් මුස්ලිමෙකුගේ සහෝදරයෙකි. එ බැවින් මුස්ලිම් කෙනෙකු සිය සහෝදර මුස්ලිම් කෙනෙකුට හිංසා නොකරයි. අපහාසට ලක් නොකරයි. ඔහුට අසත්‍ය ප්‍රකාශ නොකරයි. නින්දා පරිභව නොකරයි. මුහම්මද් (සල්) නබි තුමාණන් සිය දැත තුන් වතාවක් පපුව දෙසට හරවා සංඥා කරමින් ‘බිය බැතිකම ඇත්තේ මෙහේ ය‘ යනුවෙන් පැවසූහ.” (මූලාශ්‍ර සහීහ් මුස්ලිම්)

**මෙහි පසුබිම**

එක්සත් භාවය ඉස්ලාමයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා මුස්ලිම්වරු දිරි ගන්වන වාක්‍යයන් බොහෝමයක් අල් කුර්ආනයේ දක්නට තිබේ.

*“ඔබ සියල්ල (එකතු ව) අල්ලාහුගේ (මාර්ගය නමැති) රැහැන ස්ථිර ව අල්ලා ගනිවු. ඔබ අතර අසමගිය නොවවු.”* සූරා ආල ඉම්රාන් 3:103

*“විශ්වාස කරන පුරුෂයෝ ද, විශ්වාස කරන ස්ත්‍රීහු ද ඇතැමෙක් ඇතැමෙකුට ආරක්ෂකයෝය.”* සූරා අත් තව්බා 3:71. මෙය මුස්ලිම්වරු හොඳාකාරව දන්නා වාක්‍යයකි.

මුස්ලිම්වරු අසමගි වීම තහනම් කරන තවත් වාක්‍ය කිහිපයක් පහත් දැක් වේ.

- සූරා ආල ඉම්රාන්: වාක්‍ය 105 සිට 110 දක්වා
- සූරා අල් හුජුරාත් වාක්‍ය 10
- සූරා අල් අනාම් වාක්‍ය 153 සහ 159
- සූරා අර් රූම් වාක්‍ය 31 සහ 32

මේ සියලු වාක්‍යයන් හා මේවා හා සමාන තවත් වාක්‍යයන් බොහෝමයක් මුස්ලිවරුන් භේද බින්න වීම සහ විවිධ කණ්ඩායම් වශයෙන් වෙන් වීම තහනම් කරයි.

මෙම අල් කුර්ආන් වැකියන්ට අමතරව, රසූල් (සල්) තුමාණන්ගේ මෙම හදීස් වදන මුස්ලිම්වරු සමගි වීමේ වැදගත් කම පිළිබඳ ව සඳහන් කරයි.

'සැබැවින්ම, අල්ලාහ් ඔබගේ කරුණු තුනකට කැමති වන අතර, කරුණු තුනක් අනුමත නොකරයි. ඔබ අල්ලාහ්ට කිසිවක් ආදේශ නොතබා අල්ලාහ්ට පමණක් නැමදීම, ඔබ අල්ලාහ්ගේ රැහැන තදින් අල්ලා ගැනීම සහ ඔබ භේද බින්න වී විසිරී නොයෑමට ඔහු කැමති වන අතර, ඔබ අතර අනවශ්‍ය කතා, දිගින් දිගට අනවශ්‍ය ප්‍රශ්න කිරීම් සහ ධනය නාස්ති කිරීම ඔහු අනුමැතිය නොකරයි.' මූලාශ්‍ර ඉමාම් මුස්ලිම්.

සමගිය සඳහා ක්‍රියා කළ යුතු බව ඉහත සඳහන් හදිසය මුස්ලිම් වරුන්ට අණ කරන බව අපි දකිමු. ඒ සමග සමාජයේ සමගිය බිඳ දමන්නට තුඩු දෙන විවිධ ක්‍රියාවන් ඉස්ලාම් හි තහනම් බව අපට පෙනේ. හදීස් අංක 35 මෙයින් එකකි.

**මෙයින් ඉගෙන ගන්නා පාඩම**

මෙම හදීසය තහනම් කරන ප්‍රථම ලක්ෂණය ඊර්ෂ්‍යාව යි. කෙනෙක් විශාල සම්පතක් ලබනු දකින්නට අකැමැති වීම සහ එසේ ලබන්නා එය අහිමි කර ගත යුතු බව පැතීම ඊර්ෂ්‍යාව බව ඉමාම් ගස්සාලි ඇතුළු තවත් මුස්ලිම් විද්වතුන් අර්ථ දක්වයි.

ඉමාම් ඉබ්නු රජබ් වෙනත් ආකාරයකින් ඊර්ෂ්‍යාව විග්‍රහ කරයි. එනම් තමාට වඩා සත්ගුණයෙන් උසස් කෙනෙක් දැක මිනිසා තුළ නැගෙන ස්වභාවික හැඟීම යනුවෙන් එතුමා පවසයි. මිනිසා තුළ විවිධ ආකල්ප තිබෙන බවද ඊර්ෂ්‍යාව වර්ග පහකට අයත් බව එතුමා පවසයි.

1. තමා ඊර්ෂ්‍යා කරන අය සතු සම්පත දැක ඒවා විනාශ කිරීමට ක්‍රියාවෙන් හා කතාවෙන් වෑයම් කරන පිරිසක්;

2. තමා ඊර්ෂ්‍යා කරන අය සතු සම්පත තමන්ට පවරා ගන්නට වෑයම් කරන පිරිස. එනම් තමා ඊර්ෂ්‍යා කරන තැනැත්තා සතු සම්පත ඔහුට අහිමි කිරීමට කටයුතු කර, පසුව එම සම්පත තමන් අයිති කරගැනීමට ක්‍රියා කරන්නන්. නිදසුනක් වශයෙන්, පුද්ගලයෙකුට එක්තරා තනතුරක් හෝ නිලයක් ලබනු දකින ඊර්ෂ්‍යාකාරයා. ඔහු එම නිලය කායිකව හෝ කථාවෙන් හෝ ඉවත් කරන්නට වෑයම් කරයි. පසුව, එම තනතුර තමා සතු කරගන්නට ක්‍රියා කරයි.

3. පුද්ගලයෙක් ලබන තනතුර හෝ නිලයට එරෙහි ව කථාවෙන් හෝ ක්‍රියාවෙන් ඊර්ෂ්‍යාවක් තිබුන ද ඒ

සඳහා කිසිදු වෑයමක් නොකරන පිරිසක්. ඉබ්නු රජබ් මේ දෙපිරිස තවත් වර්ග දෙකකට වෙන් කර පෙන්වයි.

අ. තම සිත් තුළ නැගෙන ඊර්ෂ්‍යාව වනසා දැමීම පිණිස තමන්ට හැකි අයුරින් වෑයම් දරන නමුත් එයින් පරාජයට පත්වුවත්, තම වෑයම දිගින් දිගට පවත්වාගෙන යන පුද්ගලයෙක්, අල්ලාහ්ගේ දඬුවම් ලැබීමෙන් ආරක්ෂා වන බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි.

ආ. තමා ඊර්ෂ්‍යා කරන කරුණු ගැන නිතර සිහි කරන කෙනෙක් දෙස බලමු. ඔහු තම ඊර්ෂ්‍යාවට ලක් වූ තැනැත්තාට එරෙහි ව කිසිවක් නොකරන නමුත්, තම හැඟීම් ඉවත් කිරීමට කිසිවක් නොකරයි. සැබැවින්ම ඔහු ඊර්ෂ්‍යා හැඟීමෙන් මානසික තෘප්තියක් ලබන අතර, අනිත් පාර්ශවයට අයත් සම්පත් විනාශ වන අවස්ථාවක මහත් ප්‍රීතියට පත්වෙයි. මෙවන් තැනැත්තා දඬුවම් ලැබිය යුතු කෙනෙකි.

4. කෙනෙකුගේ සම්පත් ගැන ඊර්ෂ්‍යා කරන තවත් තැනැත්තෙක්, අනිත් පාර්ශවයේ සම්පත් විනාශ කිරීමට හෝ හානියක් සිදු කිරීමට අපේක්ෂා නොකරයි. ඒ වෙනුවට එම පාර්ශවයේ සම්පත් හෝ සත්ගුණය තමන් ද ලැබිය යුතු යැයි මේ තැනැත්තා

උත්සාහ කරයි. මෙහි දී ඔහුගේ අරමුණ සුඛෝපභෝගී වාහනයක් වැනි ලෞකික සම්පත් ලබා ගැනීම නම් එයින් ඔහුට කිසිදු වැදගැම්මක් නැත. එහෙත් එහි අරමුණ ධාර්මික සත්ගුණය නම්, එයින් විශාල ජයක් ඇති බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි.

5. තවත් පිරිසක් තමන් තුළ පැන නගින ඊර්ෂ්‍යාව වැනි පහත් හැඟීම වනසා දමන්නට උත්සාහ දරන අතර, එම සම්පත හිමි තැනැත්තාට ආදරය කරන්නට ද ඔහු වෙනුවෙන් දුආ කරන්නට ද යෙදෙති. ඊර්ෂ්‍යාව යනු වෛරය හා සම්බන්ධ හැඟීමක් වන හෙයින් අන් අය සතු කිසි දෙයක් ගැන ඔවුන් කිසිවක් නොසිතයි. සෑම කෙනෙක්ම ඊර්ෂ්‍යාව කිරීමට හෝ ඊර්ෂ්‍යාවට ලක් වීමට සිදු වන හෙයින් මෙවැනි පිරිස ඉතා උතුම් බව ඉමාම් ඉබ්නු රජබ් නිගමනය කරයි.

## ඊර්ෂ්‍යාව තහනම් කරනු ලැබුවේ ඇයි?

ඊර්ෂ්‍යාව නිසා අනිත් පාර්ශවයට හානියක් සිදු විය හැකි වන්නේ අල්ලාහ්ගේ අනුමැතියෙන් ය. අනතුරුව ඊර්ෂ්‍යාව අකුසල් ක්‍රියාවක් ලෙස හැඳින් වේ. තමා ඊර්ෂ්‍යා කරන තැනැත්තාට හානියක් සිදු විය යුතු යැයි පැතීමෙන් පවා එම තැනැත්තාට හානියක් සිදු විය හැක. අන් අය ගැන ඊර්ෂ්‍යා කිරීම සාතාන් සහ යුදෙව් වරුන්ගේ ස්වභාවය වේ. මේ බව අල් කුර්ආන් පවසන්නේ මෙසේය.

*“පුස්තකයට අයත් මිනිසුන්ගෙන් බොහෝ දෙනෙක්, ඔවුන් වෙත සත්‍ය එළිදරව් වුවායින් පසු, ඔවුන් තුළ හටගත් ඊර්ෂ්‍යාවෙන් නඹලා විශ්වාස නොකරන්නවුන් කිරීමට කැමති වෙති.”* සූරා බකරා 2:109

*“අල්ලාහ් ඔහුගේ වරප්‍රසාදයෙන් මිනිසුන්ට දුන් දැයෙහි ඔවුහු ඊර්ෂ්‍යා කරන්නෝද?”* සූරා අන් නිසා 4:54

මුහම්මද් (සල්) තුමාණන් ඊර්ෂ්‍යාවට එරෙහිව මෙසේ අවවාද කළහ. “ඔබට පෙර විසූ ජනයාට හටගත් රෝගය ඔබ වෙතද ළඟා වනු ඇත. ඊර්ෂ්‍යාව සහ වෛරය. ඊර්ෂ්‍යාව යනු හූ ගාන එකකි. එය හිස් හූ ගාන බව මම නොකියමි. එහෙත් එය ඔබේ දහම හූ ගානවා ඇත. මාගේ ප්‍රාණය කා අතේ තිබේද, ඔහු මත දිවුරා කියමි. ඔබ විශ්වාසය කරන තුරු ස්වර්ගයට ඇතුළු නොවන්නේය. ඔබ එකිනෙකාට ආදරය දක්වන තුරු ඔබ විශ්වාසය නොකරන්නේය. එවැනි දේ ස්ථාපනය කරන දැයක් ගැන මම ඔබට පවසමි. ඔබ අතර සාමයේ (සලාම්) නිවේදනය පතුරුවන්න.” (මුලාශ්‍රය ඉමාම් අහමද් සහ තිර්මිදි).

ඊර්ෂ්‍යාව යනු අනර්ථකාරි ක්‍රියාවක් වන හෙයින්, සූරා අල් ෆලක්, සූරා අන් නාස් සහ සූරා අල් ඉඛ්ලාස් පාරායනය කර, ඊර්ෂ්‍යා කරුවන්ගෙන් සිට අල්ලාහ් වෙත ආරක්ෂා පතන ලෙස

මුස්ලිම්වරුන්ට උපදෙස් දෙනු ලැබේ. දෛනික පස් වේල් සලාතයෙන් පසුව ආයතුල් කුර්සි සමඟ පාරායනා කිරීම සුදුසු බව මුස්ලිම් විද්වතුන් අදහස් දක්වති.

මෙම හදීසයේ සඳහන් තනාජුෂ් යන පදය එකිනෙකා අතර තරඟකාරිත්වයක් ඇති කරමින් මිල ගණන් වැඩි නොකරන්න, යනුවෙන් පරිවර්තනය කෙරේ. හදිස් හි සඳහන් නජෂ් යන පදය දෙවර්ගයට අයත් බව අර්ථ කථන දිය හැකි බව ඉබ්නු රජබ් (රහි) පවසයි.

අ. බයි අල් නජෂ් - යම් භාණ්ඩයක් අධික මිලකට ගන්නා බව කෙනෙක් පැවසීම. සැබැවින්ම ඔහුට එම භාණ්ඩය මිල දී ගැනීමට කිසිදු අවශ්‍යතාවක් නොමැති නමුත්, භාණ්ඩයේ මිල නැංවීමේ අරමුණින් ඔහු එසේ කරයි. මේ නිසා භාණ්ඩය එහි වටිනාකට වඩා අධික මිලට ගන්නට අන් අයට සිදු වේ. මෙවැනි අසාධාරණ ගනු දෙනු මුස්ලිම් සමාජයන් හි පවා දක්නට ඇත. තොග වෙළෙඳාම සහ වෙන්දේසියක මෙලෙස මිල නංවන උපක්‍රමයක් විකුණුම් කරුවා සූදානම් කර ගන්නේ ඔහුගේ මිත්‍රයෙක් හෝ ඥාතියෙක් සමඟය. මිල දී ගත් තැනැත්තා මෙම වංචනික ක්‍රියාව ගැන දැනගත්තේ නම් ඔහු කැමති නම් තම ගනු දෙනුව අවලංගු කළ හැක.

ආ. නජාෂා යන පදයෙහි දෙවැනි අර්ථ කථනය මීට වඩා පුළුල් එකකි. මෙය වෙළෙඳ ගනු දෙනුවක පමණක් සීමා නොකර, වංචා කිරීමෙන් කෙනෙකුට හානියක් සිදු කිරීමට මග පාදන ඕනෑම ක්‍රියාවක් මෙහි අඩංගු බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි. වංචා සහිත ඕනෑම ගනු දෙනුවක් මෙහි අඩංගු බව ඔහු පවසයි. එයට සාධක ලෙස අංක 35 සූරා ෆාතිර් වාක්‍ය 43 ඔහු පෙන්වා දෙයි. *"තවද, කුමන්ත්‍රණය ඒ(ම නරක කුමන්ත්‍රණ)ය ඇත්තවුන් මිස (වෙන කිසිවෙකු) ග්‍රහණය කර නොගනී."*

පෞද්ගලික හේතූන් මත මුස්ලිම්වරු එකිනෙකාට වෛර නොකරන ලෙස මෙම හදීසය අවවාද කරන බව ඉබ්නු රජබ් පවසයි. මුස්ලිම්වරු එකිනෙකාගේ සහෝදරයෝ වෙති. මේ හේතුවෙන් මුස්ලිම් සමාජය තුළ පිළිකුල් සහ ද්වේෂය හට ගන්වන අල් නමීමා (මුසා සහ චරිත ඝාතන) ඔවුන්ට තහනම් ය. මුස්ලිම්වරු ආගමේ ඇතැම් විෂයයන් පිළිබඳ ව පරස්පර අදහස් දරණ නිසා නොයෙක් නිකාය සහ කණ්ඩායම් වශයෙන් බෙදීමෙන්, ඔවුනතර ද්වේෂය හා වෛරයට මාර්ග විවෘත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජයේ අසමගිය හිස ඔසවන බව ඉබ්නු රජබ් ප්‍රකාශ කරයි.

අප අතර එකිනෙකාට පිටුපෑම නොකළ යුතුය. සෑම ආකාරයේම සම්බන්ධකම් බිඳ දැමීම මෙහි අඩංගුය.

මුස්ලිම්වරයෙක් තවත් මුස්ලිම් වරයෙක් හා දින තුනකට වඩා සම්බන්ධකම බිඳ දැමිය නොහැකි බව නබි (සල්) තුමාණන් වදාළහ. මෙම උපදෙස් ලෞකික දේ පිළිබඳ බව ඉබ්නු රජබ් අදහස් දක්වයි. දහම පිළිබඳ විෂයයෙ හි මෙලෙස දින තුනකට අධික ව සම්බන්ධකම බිඳ දැමිය හැක. එනම් කෙනෙක් කළ පාප ක්‍රියාවන් සඳහා දඬුවම් වශයෙන් මෙලෙස සමාජයෙන් පිටුවහල් කළ හැක. පාපයක් කළ කෙනෙක් සෘජු මාර්ගයට යළි පිවිසිය නොහැකි නිසා, එම පියවරින් කිසිදු ඵලක් නොමැති බව තවත් විද්වතුන් අදහස් දක්වති. ෂරීආවේ අරමුණ ඉටු නොවුයේ නම්, සමාජ සම්බන්ධකම බිඳ දැමීමෙන් තේරුමක් නොමැති බව ඔවුන් පවසති.

වෙළෙඳ ගනු දෙනුවක අපි එකිනෙකාට වංචා නොකළ යුතුය. උදාහරණයට, ගැනුම්කරුවෙක් භාණ්ඩක් මිල දී ගන්නට සූදානම් වන අවස්ථාවක, තුන් වැනි පාර්ශවකරුවෙක් මැදිහත් වී තම භාණ්ඩ තොග ගැනුම් කරුවාට විකිණීමට වෑයම් කරයි. මෙලෙස මැදිහත් වීම හරාම් (තහනම්) වන්නේ ගැනුම්කරු තවමත් තීරණයකට එළඹී නොමැති අතර මේ හේතුවෙන් මුස්ලිම් සමාජය තුළ ඇති විය හැකි අසමගිය හේතුවෙනි.

මුස්ලිම්වරු එකිනෙකාට සහෝදරයන් වන බව නබි (සල්) තුමාණන් උපදෙස් දුන්හ. නබි (සල්) තුමාණන්

තහනම් කළ ගනු දෙනුවක නිරත වීමෙන් එම සහෝදරත්වයට හානියක් සිදු වන බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි. මුස්ලිම්වරු මෙවැනි ගනු දෙනු වලින් ඉවත් වූයේ නම්, ඔවුන් ඉස්ලාමයේ සහෝදරයන් බවට පත් වනු ඇත. එනම් මුස්ලිම්වරු සහෝදරත්වය තර කර ගනු පිණිස දැනුවත් ව වෑයම් කළ යුතු බව මෙයින් අදහස් කෙරේ. සලාම් කිවහොත් පිළිතුරු දීම, අසනිප වුවහොත් ඔහුගේ සොවදුක් බැලීමට යෑම, අසරණයන්ට උපකාර කිරීම, ආරාධනාව පිළි ගැනීම, ත්‍යාග හුවමාරු කර ගැනීම, ප්‍රසන්න මුහුණින් පිළිගැනීම මුස්ලිම් වරුන්ගේ අයිති වාසිකම් යන සියල්ල ඉෂ්ට කළ යුතුය.

ඉස්ලාමිය සහෝදරත්වය යන ප්‍රතිපත්තිය යටතේ, "මුස්ලිම් වරයෙක් තම සහෝදරයාට යහපතක් සිදු කිරීම සහ ඔහුට හානියක් සිදු කිරීමෙන් වැළකීම අනිවාර්‍යය කරුණක්" බව ඉමාම් රජබ් මෙම වදන අර්ථ කථන සපයයි. හිංසාව සහ අසාධාරණය කිරීම මුස්ලිම් වරයෙකුට කළ හැකි බලවත් හානිය වේ. සහය හා පිහිට පතන මුස්ලිම් වරයෙකුට ඒවා නොසැපයීම අසාධාරණය වේ. මුස්ලිම්වරු බොහෝ තැන් වල හිංසාවට ලක්ව සිටින අතර, ඔවුන්ට කිසිවෙක් පිහිට නොවෙති. ඔවුන්ට පිහිට නොවූයේ නම්, මුස්ලිම්වරු වශයෙන් ඔවුන් ව අතරමං කළ වරදට අපි පත් වෙමු. අපි මුහුණ දෙන ප්‍රශ්න වලට විසඳුමක් ලබන්නට, අපි ප්‍රථමයෙන් සමගි ව සිටිය යුතුය. සෑම විටම අපගේ

අරමුණ මෙයයි. අපගේ උතුම් ජිහාදය මුස්ලිම් සමාජය සමගි කිරීම වන අතර, මෙම අරමුණ කෙරෙහි මුස්ලිම් වරුන්ගේ සහයෝගය අනිවාර්යය බව සුප්‍රසිද්ධ විද්වතෙක් වන අබ්දුල් රහ්මාන් අල් සාදි ප්‍රකාශ කරයි.

අපි මුස්ලිම් සහෝදරයෙකුට අසත්‍ය පැවසිය නොයුතුය. අනෙකුත් මුස්ලිම් වරුන් ව පහත් කොට කතා කිරීම, ඔවුන් අපහාස කිරීම යන දේ නොකළ යුතුය. මුස්ලිම් සහෝදරයෙකුගේ ගෞරවයට තර්ජන කරන අයුරින් සංඥා හෝ ඉඟියක් හෝ නොකළ යුතුය. මුස්ලිම් සහෝදරයෙකුට නින්දාශීලිව කතා කිරීම හෝ රහසින් අනතුරක් සිදු කිරීම හෝ නොකළ යුතුය.

තක්වා නම් දේව බිය බැතිමත්කම සිතෙහි තිබෙන බව නබි (සල්) තුමාණන් පැවසුහ. මෙම වදන පිළිබඳ ව විග්‍රහ කරන ඉමාම් ඉබ්නු රජබ් පවසන්නේ මෙසේය. සමාජයේ වංශවත් බව හෝ වාසනා වන්ත ලෙස හෝ නොපෙනෙන නමුත් ධර්මිෂ්ඨකම සහිත පිරිස ඉතාමත් උදාරය. ධාර්මික අය අල්ලාහ් ඉදිරියේ වංශවත් අය ලෙස සලකනු ලබති.

ඉහත සඳහන් සියලු කරුණු හදවත හා සම්බන්ධ වන අතර, අපගේ මුස්ලිම් සහෝදරයන්ට ආදරය දක්වන ලෙසද ඔවුන්ට වෛරය නොකරන ලෙසද අපහට අවවාද කරයි. අප සිත් තුළ තක්වා නම් දේව බිය බැතිමත්කම තිබේ නම්, ඉහත සඳහන් තහනම් ක්‍රියා

කිසිවක් අපි ඉටු කරන්නේ නැත. අප අතර ආදරය පතුරුවීමට හැකිවන්නේ අපගේ සිත් පිරිසිදු වූයේ නම් පමණි.

අවසාන නිගමනය

මුස්ලිම්වරයෙකුගේ රුධිරය, ඔහුගේ දේපොළ, ඔහුගේ ගෞරවය යන සියලු දේ තවත් මුස්ලිම් වරයෙක් නොකෙලෙසිය යුතුය, යනුවෙන් නබි (සල්) තුමාණන් තම සමුගැනීමේ හජ් වන්දනාවේ දී කළ දේශනයෙහ සඳහන් කළහ. මෙම දේශනාවේ සාරාංශය ඉහත සඳහන් හදීස් වදන පවසයි. තවත් කෙනෙකුට වචනයෙන් හෝ ක්‍රියාවෙන් හානි සිදු කිරීම පාපයක් බව මෙම හදිස් වදනේ තේමාව වේ.

මෙම විෂය අල්ලාහ් ඔහුගේ අල් කුර්ආනයේ සඳහන් කරන්නේ මෙසේය. *"විශ්වාසවන්ත පුරුෂයින්ටත්, විශ්වාස වන්ත ස්ත්‍රීන්ටත් නුසුදුසු පරිද්දෙන් පීඩාවට පත් කළවුන්, සැබැවින්ම ඔවුන් පැහැදිලි පාපයක් හා අවලාදයක් උසුලා ගත්තෝය."* සූරා අල් අහ්සාබ් 33:58.

මුස්ලිම් වරු එකිනෙකාට මෛත්‍රිය දක්වනු පිණිස, එකිනෙකාට උපකාර කරනු පිණිස, එකිනෙකාට සහය වනු පිණිස අති උතුම් අල්ලාහ් ඔවුන් එකිකෙනාගේ සහෝදරයන් බවට පත් කළේය. මුස්ලිම්වරු ජීවත් විය යුත්තේ එලෙසය.

## 36. මුස්ලිම්වරයෙකුගේ අවශ්‍යතා පියවීමේ සහ අල් කුර්ආනය කියවීමට හා අල්ලාහ් සිහි කිරීමට එක්රැස් වීමේ වැදගත් කම

මුහම්මද් (සල්) තුමාණන් පැවැසු බව අබු හුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි. “මෙලොවෙ හි මූඃමින් වරයෙකුගේ දුක් වේදනාව ඉවත් කරන්නේ කවරෙක්ද, එලොවෙහි ඔහුගේ දුක් වේදනාව අල්ලාහ් ඉවත් කරයි. ණය පියවීමට නොහැකි අසීරු තත්ත්වයක සිටින දුප්පත් කෙනෙකුගේ අමාරුකම සැහැල්ලු කරන්නේ කවරෙක්ද අල්ලාහ් ඔහුගේ එලොව හා මෙලොව කටයුතු සැහැල්ලු කරයි. මුස්ලිම් කෙනෙකුගේ අඩුපාඩුකම් (ප්‍රසිද්ධ නොකර) ආරක්‍ෂා කරන්නේ කවරෙක්ද ඔහුගේ අඩුපාඩු එලොව හා මෙලොවෙ හි අල්ලාහ් ආරක්‍ෂා කරයි. අල්ලාහ්ගේ ගැත්තෙකුට උදව් කරන තාක්කල් ඔහුට අල්ලාහ් උදව් කරමින් සිටියි. කවරෙකු අධ්‍යාපනය හැදෑරීමේ මාර්ගයෙ හි යෙදී සිටින්නේද අල්ලාහ් ඔහුට ස්වර්ගයට ඇතුළු වීමේ මග පහසු කරයි.

අල්ලාහ්ගේ මස්ජිදය තුළ ජනයා එක රැස් වී අල්ලාහ්ගේ අල් කුර්ආනය කියවීමට හා එය එකිනෙකා අතර ඉගැන්වීමට කටයුතු කරන්නේ නම් ඔවුන් අතරට අල්ලාහ්ගේ ශාන්තිය පහළ නොවු

කිසිවෙත් නැත. අල්ලාහ්ගේ ආශීර්වාදය ඔවුන් වටා වෙළා ගනී. මලක්වරුන් ඔවුන් පිරිවරා ගෙන සිටිති. අල්ලාහ්, ඔහු අබියස සිටින මලාඉකා වරුන් ඉදිරියේ මෙම පිරිස ගැන විශේෂයෙන් සඳහන් කරයි. යහකම් කිරීමෙහි ලා ප්‍රමාද කරන තැනැත්තා සිය පෙළපතේ කිර්ති නාමය නිසා යහකම් කිරීමෙහි ලා කඩිනම් කරනු නොලබන්නේය. (මූලාශ්‍ර මුස්ලිම්)

මෙහි පසුබිම:

මෙම හදීසයට අමතරව ඉමාම් මුස්ලිම් සහ ඉමාම් බුහාරි මෙය හා සම්බන්ධ පහත සඳහන් තවත් හදීසයක් දැන්වූහ.

“මුස්ලිම් වරයෙක් අනෙක් මුස්ලිම් වරයෙකුගේ සහෝදරයෙකි. ඔහු ඔහුට වරදක් නොකරන අතර, ඔහුට අවශ්‍යතාවක් තිබෙන විට ඔහුව අත හැර නොයයි. ඔහුගේ සොහොයුරෙකුගේ අවශ්‍යතාව කවරෙක් ඉෂ්ට කරන්නේද. ඔහුගේ අවශ්‍යතා අල්ලාහ් ඉෂ්ට කරයි. විශ්වාස වන්තයෙකුගේ පීඩාවක් කවරෙක් ඉවත් කරන්නේද, යළි නැගිටින බිහිසුණු අවසාන දිනයේ සිදු වන පීඩාව අල්ලාහ් ඉවත් කරයි. මුස්ලිම් වරයෙකුගේ වරද කවරෙක් සඟවා තබන්නේද, යළි නැගිටු වන දිනයේ ඔහුගේ වරද අල්ලාහ් සඟවා තබයි. මෙම හදීසය අනිත් මුස්ලිම් වරුන්ට අයත් යුතුකම ගැන අවධාරණය කරනු ලබන

අතර සහෝදරත්වයේ වගකීම පිළිබඳව බල කර පෙන්වා දෙන ලදී.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්:

මෙලොව පිළිබඳ යම් දුකක් කවරෙත් ඉවත් කරන්නේද, පරලොව සිදු වන දුකක් අල්ලාහ් ඔහුගෙන් ඉවත් කරයි.

ක්‍රියාවකට ලැබෙන තිළිණය එම ක්‍රියාව හා සමාන එකකි, නැතිනම් එම ක්‍රියාවට අදාළ එකකි. මෙම ප්‍රතිපත්තිය සනාථ කරන තවත් හදීස් වදන් කිහිපක් ඇත. මෙහිදී දුක යනු මුස්ලිම්වරයෙක් මුහුණ දෙන මහත් කරදරයක් හෝ පීඩාවක් ය. මෙම හදීසයේ එක් අනුවාදයක "පීඩාවට සහන සලසන්නෙක්" යනුවෙන්ද තවත් අනුවාදයක "පීඩාව ඉවත් කරන්නෙක්" යනුවෙන්ද සඳහන් කෙරේ. මෙහි දී සහන සලසනු යන්නහි අදහස පීඩාව අවම කිරීම ය. පීඩාව ඉවත් කිරීම යන්නේ සම්පූර්ණයෙන්ම මකා දැමීම වේ.

මුස්ලිම් වරයෙක් මුහුණ දෙන පීඩාව සම්පූර්ණයෙන් ඉවත් කරන්නා, සහන සලසන්නාට වඩා තිළිණ ලබන බව පහදා දෙන ඉමාම් ඉබ්නු රජබ්, මුස්ලිම්වරු අන් අය ලක් වන පීඩාව මුලිනුපුටා දමන්නට දිරි ගන්වනු ලැබිය යුතුය යනුවෙන් පවසයි.

මුස්ලිම්වරයෙක් මුහුණ දෙන පීඩාවට සහන සලසන්නට හෝ එය ඉවත් කිරීමට වෑයම් කරන මුස්ලිම්වරයෙකුට මතු ජීවිතයේ ඒ හා සමාන පීඩාවක් අල්ලාහ් ඉවත් කර සහන සලසයි. මෙලොව කෙනෙක් පත් වන පීඩාව මතු ලොවේ පීඩාව හා සමාන කළ නොහැකි හෙයින්, මෙලොව කුසල් ක්‍රියාවක් ඉටු කරන්නෙකුට දෙන ලද තිළිණය මතු ජීවිතය දක්වා අල්ලාහ් ප්‍රමාද කර තබා ඇත.

“ණය පියවීමට නොහැකිව අසීරු තත්ත්වයක සිටින දුප්පත් කෙනෙකුගේ අමාරුකම සැහැල්ලු කරන්නේ කවරෙක්ද අල්ලාහ් ඔහුගේ එලොව හා මෙලොව කටයුතු සැහැල්ලු කරයි.” යන වැකිය දෙස බලමු.

ණය පියවීමට කිසිදු මාර්ගයක් නොමැති කෙනෙකුගෙන් ණය ආපසු ගෙවන ලෙස ඉල්ලා කරදර කිරීම මුස්ලිම්වරයෙකුට නොමනා ක්‍රියාවක් බව රසූල් (සල්) තුමාණන් පැවසූහ. එම තැනැත්තාට ණය පියවීමට කල් දීම හෝ ණය සම්පූර්ණයෙන් ඉවත් කොට ඔහුට සමාව දිය යුතුය. මෙහි ප්‍රථම ක්‍රියාව අවශ්‍ය යෙන් සිදු කළ යුතු අතර, දෙවන විකල්පයේ ණයට මුදල් දුන් තැනැත්තා ණය කරුට සහන සලසා ඔහුගේ ණය අඩු කිරීමට සහය වීමය.

පහත සඳහන් හදීසය නබි (සල්) තුමාණන් දැන්වූයේ මෙසේ ය. “පැරණි යුගයේ ඉතා ධනවත් කෙනෙක් ජීවත් වූ අතර, ඔහුගෙන් ජනතාව ණයට මුදල් ලබා

ගනී. ඔහු ජනතාවට මුදල් ණයට දී යහකම් කළා පමණක් නොව, එම ණය මුදල ආපසු ලබා ගැනීමේ දී ජනතාවට සහන සලසන ලෙස ද, ණය පිය විය නොහැකි අසරණ අයට සමාව දෙන ලෙස තම පුත්‍රයන්ට උපදෙස් දෙයි. ඔහුගේ උදාර ගුණය සඳහා මරණයෙන් පසු ජීවිතයේ අල්ලාහ් ඔහුට සමාව දෙයි."

*"එදින සැබෑ ආධිපත්‍යය කරුණාභරිතයාණන්ටය. එය ප්‍රතික්ෂේප කයින්ට අසීරු දිනයක් විය."* යනුවෙන් අල් කුර්ආන් සූරා ෆුර්කාන් 25 වාක්‍ය 26 හි අල්ලාහ් පවසයි. මෙලොව ජීවිතයේ ජනතාවගේ අවශ්‍යතාවට කරුණාව දැක් වූ කෙනෙකුට මරණයෙන් පසුව අල්ලාහ් ඔහුගේ අසීමිත කරුණාවෙන් මහත් සහන ලබා දෙයි.

දැන් හදීසයේ තවත් කොටසක් දෙස බලමු.

"මුස්ලිම් වරයෙකුගේ වරද කවරෙක් සඟවා තබන්නේද, යළි නැගිටු වන දිනයේ ඔහුගේ වරද අල්ලාහ් සඟවා තබන්නේය."

ජනතාව කොටස් දෙකකට අයත් වේ.

1. පාප ක්‍රියාවක හෝ නීතිය උල්ලංඝනය කරන බවට කිසි දිනක චෝදනාවක් නො ලැබූ පිරිස. මේ අය, අත් වැරදීමකින් පාපයක් සිදු කළහොත්, එම පාපය ප්‍රසිද්ධ නොකළ යුතුය. ඒ වෙනුවට එම

විෂය සම්පූර්ණයෙන්ම සඟවා තබා, ඒ ගැන කිසිවක් පැවසිය නොයුතුය.

2. නිතර පාපයන් හි යෙදෙන සහ සැම විටම නීතිය උල්ලංඝනය කරන බව කවුරුත් දන්නා පිරිස. මෙම පිරිස තම පාප ක්‍රියාවන් ගැන මහත් සාඩම්බරයෙන් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරති. මෙවැනි පුද්ගලයන් පිළිබඳ ව නිරාවරණය කිරීමට අවශ්‍යතාවක් පැමිණියහොත් මුස්ලිම් සමාජයේ යහපත උදෙසා එසේ කළ යුතු යැයි ඉමාම් ඉබ්නු රජබ් උපදෙස් දෙයි.

ඒ නිසා ඉහත සඳහන් හදීසය මෙම දෙවන පිරිසට අදාළ නොවේ. මුස්ලිම් සහෝදරයන් සහ සහෝදරියන් ගේ කිසිදු වරදක් ප්‍රසිද්ධ නොකළ යුතුය යන්න ඉස්ලාමයේ පොදු නීතිය වේ. එහෙත් අද බොහෝ මුස්ලිම්වරු තම සහෝදරයන්ගේ ඉතාමත් සුළු වරදක් පවා මහත් විශාල දෙයක් බවට පත් කර කථා කරමින්, විනෝද වෙති. මුස්ලිම් වරයෙක් වශයෙන් එවැනි දේ ඉටු කිරීමෙන් අපි වැළකී සිටිය යුතුය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අල්ලාහ් අපේ වැරැදි ක්‍රියා අන් අයගෙන් සඟවා තබනු ඇත. ලෞකික ජීවිතයේ අපි සැම කෙනෙක්ම වැරදි කරමු. අපි අන් අයගේ වැරදි ආවරණය නොකළේ නම්, අපෙන් සිදු වන වැරදි අන් සියලු දෙනාට අල්ලාහ් අනාවරණය

කරන බවද, ජනතාව අප ගැන පහත් අයුරින් කථා කරන බවද අප මතකයේ තබා ගත යුතුය. එනිසා දඬුවම අපි කළ වරදට අදාළ හා එය හා සමාන එකක් වනු ඇත.

හදීසයේ "කෙනෙක් අල්ලාහ්ගේ ගැත්තෙකුට උදව් කරන තාක්කල් ඔහුට අල්ලාහ් උදව් කරමින් සිටියි." යන කොටස දෙස බලමු.

මෙය ඉස්ලාමීය ප්‍රතිපත්තිය හා සම්බන්ධ ප්‍රකාශයකි. මෙයට පෙර අන් අයට උදව් කරන අයට අල්ලාහ් උදව් කරන බව උදාහරණ තුනක් නබි (සල්) තුමාණන් සඳහන් කළහ.

මෙහි පැන නගින ප්‍රශ්නය නම් හදීසයේ සඳහන් කරන අයුරින් අවශ්‍යතා තිබෙන අයට පමණක් උදව් කිරීමට අපි සීමා කළ යුතු ද? මෙයට පිළිතුරු "නැත" යන්නයි. අප සහෝදරයන්ට හැකි අයුරින් උදව් කරන ලෙස රසූල් (සල්) තුමාණන් අණ කළහ. උදව් කිරීම සඳහා විවිධ මාර්ග තිබේ. අන්ධ පුද්ගලයෙකුට මර්ගය හරස් කිරීමට හෝ හදිස් අංක 25 සහ 26යේ සඳහන් වෙනත් කුසල් ක්‍රියාවන් තිබේ. අපි කරන උදව් විශාල වන ප්‍රමාණයට අප ලබන තිළිණයද විශාල වනු ඇත. මේ ගැන මුස්ලිම්වරු විශේෂ සැලකිලි දැක්විය යුතුය. අප සමාජයේ ජනතාව ගැන සැලකිලි දක්වන පිරිසක් සිටී නම්, ඔවුනතර එකිනෙකාට උදව් උපකාර කරන්නේ නම්, දුප්පත් අය කිසිවෙක් එහි ඉතිරි වන්නේ නැත.

සෑම මුස්ලිම් සහෝදරයන්ටම සහය දක්වන්නට අප පොලොඹවනු ලැබිය යුතුය.

හදීසයේ "කවරෙකු අධ්‍යාපනය හැදෑරීමේ මාර්ගයෙහි යෙදී සිටින්නේද අල්ලාහ් ඔහුට ස්වර්ගයට ඇතුළු වීමේ මග පහසු කරයි." යන වදන දෙස බලමු.

ඉස්ලාම් හි දැනුම ලබන්නට ජනතාව පොලොඹවන ආකාරය මෙයින් දැක ගත හැක. කෙනෙක් සොයන දැනුමෙන් ඔහුටද මුස්ලිම් සමාජයට ද යහපතක් සලසන්නේ නම්, දැනුම සොයන්නාට දැනුමට අමතරව තිළිණයද ලබා ගත හැක.

හදීසයේ මෙම වදනට අර්ථ කථන තුනක් දිය හැක.

1. දැනුම සොයන්නාට ඔහු සොයන දැනුම ලබන්නට අල්ලාහ් මාර්ගය පහසු කරනු ඇත.

2. දැනුම සොයන්නාට එම දැනුමෙන් ප්‍රයෝජනය ලබන්නට අල්ලාහ් පහසු කිරීමෙන් ඔහු ස්වර්ගය කරා ගෙන යනු ලබයි. දැනුම සොයන අය විශාල ප්‍රමාණයක් සිටින නමුත්, ඔවුන් සොයන දැනුමෙන් අල්ලාහ්ගේ ආශීර්වාදය ඔවුන් නොලබති. මෙහි ප්‍රධාන හේතුව උතුම් චේතනාවෙන් ඔවුන් දැනුම සෙවිය යුතුය.

3. උතුම් චේතනාවෙන් දැනුම සොයන්නාට බිහිසුණු අවසාන දිනයේ ආරක්ෂා සහිත ව යැමට අල්ලාහ් උපකාර කරයි.

දැනුම දෙවර්ගයට අයත් බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි.

1. දැනුමේ ප්‍රතිඵල ඔහුගේ හදවතෙ හි තබනු ලබයි. මෙයින් අල්ලාහ්ගේ ගුණාංගය පිළිබඳ අවබෝධයේ ප්‍රතිඵලයක් වශයෙන්, ඔහු තුළ අල්ලාහ් කෙරෙහි බිය බැතිමත්කම, අල්ලාහ් ව උත්කර්ෂයට පත්වීම සහ අල්ලාහ්ට ආදරය කිරීමට ඔහුට පහසු වනු ඇත.

   කෙනෙක් කට පාඩම් කිරීම සහ කට වචනයට පමණක් සීමා කරන නමුත් එයින් ඔහුගේ හදවතට කිසිදු ආභාසයක් හෝ බලපෑමක් සිදු නොවේ. මෙයින් අදහස් වන්නේ කෙනෙක් තමා ලැබූ දැනුමට එකඟව ජීවත් නොවන්නේ නම්, අල්ලාහ්ගේ දඬුවම ලැබිය හැකි අවදානම් සහිත තත්ත්වයට පත්වෙයි.

“අල්ලාහ්ගේ මස්ජිදය තුළ ජනයා එක්රැස් වී අල්ලාහ්ගේ අල් කුර්ආනය කියවීමට හා එය එකිනෙකා අතර ඉගැන් වීමට කටයුතු කරන්නේ නම් ඔවුන් අතරට අල්ලාහ්ගේ ශාන්තිය පහළ නොවූ

කිසිවෙත් නැත. අල්ලාහ්ගේ ආශීර්වාදය ඔවුන් වටා වෙළා ගනී. මලක්වරුන් ඔවුන් පිරිවරා ගෙන සිටිති. අල්ලාහ් ඔහු  අබියස සිටින මලාඉකාවරුන් ඉදිරියේ මෙම පිරිස ගැන විශේෂයෙන් සඳහන් කරයි." යන හදිස් වදන දෙස බලමු.

මස්ජිදයට යෑම, අල් කුර්ආනය පාරායනය කිරීම සහ අධ්‍යයනය කිරීම, දේශනාවන්ට සවන් දීම යන උතුම් ක්‍රියාවන් පිළිබඳ ව මෙම හදිසය සඳහන් කරයි. මෙලෙස දැනුම වර්ධනය කිරීම කුර්ආනයට පමණක් සීමා නොකර, සෑම අධ්‍යයනයටම ගැළපෙන බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි. මස්ජිදයේ රැස් වන ජනතාවට ත්‍යාග හතරක් හිමි වන බව හදීසය සඳහන් කරයි.

1. ඔවුන් අතරට පහළ වන අල්ලාහ්ගේ ශාන්තිය - මෙය පොදු ත්‍යාගයකි. මෙයින්  ආතතිය ඉවත් කර, කෙනෙකු තුළ ශාන්ත භාවය ඇති කරයි.

2. අල්ලාහ්ගේ මෛත්‍රිය ඔවුන් වටා වෙළා ගනී.

3. මලක්වරුන් ඔවුන් පිරිවරා ගෙන සිටිති.

4. අල්ලාහ් ඔහු  අබියස සිටින මලාඉකාවරුන් ඉදිරියේ මෙම පිරිස ගැන විශේෂයෙන් සඳහන් කරයි.

මෙම හදිසයේ අවසන වාක්‍ය දෙස බලමු.

යහකම් කිරීමෙහි ලා ප්‍රමාද කරන තැනැත්තා සිය පෙළපතේ කිර්ති නාමය නිසා යහකම් කිරීමෙහි ලා කඩිනම් කරනු නොලබන්නේය.”

මෙම හදීස් වදන පෙන්වන්නේ, ස්වර්ගයට පිවිසීමට තිබෙන එකම මාර්ගය කුසල් ක්‍රියා ඉටු කිරීමෙන් පමණක් බවයි. මෙයට හේතුව උත්තරීතර අල්ලාහ් ත්‍යාග පිරිනමන්නේ කෙනෙකුගේ කුසල් ක්‍රියාවන් පදනම් කර ගෙනය. මෙහිදී පෙළපත් නාමයට හෝ කීර්ති නාමයට වැදගත්කමක් නැත.

*“එදින ඔවුන් අතර ඥාති සබඳතාවක් නොමැත.”* සූරා අල් මූඃමිනූන් 23 වාක්‍ය 101.

අවසාන නිගමනය

“මුස්ලිම් වරයෙක් අනෙක් මුස්ලිම් වරයෙකුගේ සහෝදරයෙකි. ඔහු ඔහුට වරදක් නොකරන අතර, ඔහුට අවශ්‍යතාවක් තිබෙන විට ඔහුව අත හැර නොයයි. සොහොයුරෙකුගේ අවශ්‍යතාව කවරෙක් ඉෂ්ට කරන්නේද. ඔහුගේ අවශ්‍යතා අල්ලාහ් ඉෂ්ට කරයි.”

සෙසු මුස්ලිම්වරයෙකුට, විශේෂයෙන් අවශ්‍යතා තිබෙන අයට උදව් කරන ලෙස මෙම හදීස් වදන මුස්ලිම් වරුන්ව පොලඹවයි. මුස්ලිම්වරු එකිනෙකාට

උදව් උපකාර කරමින් ජීවත් වන සමාජයක් කෙතරම් වාසනාවන්ත එකක් විය හැකිද යැයි සිතා බලන්න. මෙ මගින් අපි සියලු දෙනාම වඩා හොඳ සමජයක සාමාජිකයන් වශයෙන් පත් වන බව නිසැකයි. මෙම සමාජයේ අසරණ අය සුළු පිරිසකි. ශක්තිමත් සමාජීය බැඳීම් දැක ගත හැක. මෙ මගින් මුස්ලිම් උම්මාවේ සමූහත්වය තවත් ශත්තිමත් වනු ඇත.